

# පාලි භාෂාවතරණය

## තෘතීය භාගය.



පාලිව්‍යාකරණ ද භාෂාව ද වාක්‍යරචනාව ද
එකවිට ඉගෙනීමට උපකාරවූ

# පාලිභාෂාවතරණය.

---

## තුන්වෙනි පොත.

දෙවෙනි සංස්කරණය.

---


අම්බලම්ගොඩ පොල්වත්තේ අගගාරාමාධිපති
ආභිධර්මිකාචාර්ය ශ්‍රී බුද්ධදත්ත ස්ථවිරපාදයන්වහන්සේ
විසින් සම්පාදිතයි.


---

# PĀLIBHĀSHĀVATARANAYA

## THIRD BOOK


BY

POLWATTE SRI BUDDHADATTA STHAVIRA

Author of Pàlipàthâvali, Tribhàshàratnákara, New Pali Course, etc.,
Editor of Visuddhimagga, Apadàna (Ceylon), Sammohavinodani,
Buddhadatta's Manuals, Nâmarùpaparicchoda etc, (England)


---


අම්බලම්ගොඩ පොල්වත්තේ ඕ. ඩැනියෙල් සිල්වා
විසින්
කොටහේනේ සාහිත්‍යයන්ත්‍රාලයෙහි මුද්‍රණයකරවා
පළකරනලදී.

---

1948

# විඥාපනය.

---

පාලිභාෂාවතරණයේ තෙවෙනි පොත පළමුවර පළකරන ලද්දේ 1930 හේදීය. පළමුවෙනි පොත දහසවෙනි වරට ද දෙවෙනි පොත සිවුවෙනිවරට ද මුද්‍රණය වී තිබෙන නමුත් තෙවෙනි පොතේ පිටපත් දෙදහ අවසන්වීමට අවුරුදු 15 ක පමණ කාලයක් ගතවිය. දැන් අවුරුදු දෙකක පමණ සිට ඒ පොතේ පිටපත් ලබාගත නොහැකිව තිබෙතත් යුධකාලයේ පැවති කඩදාසි අවහිරය නිසා මේතාක් පොත පළකරවිය නොහැකිවිය.

පොත පළමුවර පළවීමෙන් අවුරුදු 17 ක් පමණ ගතවූ බැවින් අප විසින් තවත් ප්‍රයෝජනවත් කරුණු සොයාගත හැකිවිය. එබැවින් මේ දෙවැනිවර පොත සම්පූර්ණයෙන්ම වාගේ සංස්කරණය ට පමුණුවනලදී. ප්‍රාචීන පණ්ඩිතවිභාගයේදී හෝ බී. ඒ., එම්. ඒ. ආදි උසස් විභාගවලදී හෝ පාලිගන්නා භවතුන්ට මේ පොතෙන් ලැබියහැකි ප්‍රයෝජනය ඉතා මහත්ය. ගැටලු—ගැඹුරු තැන් සියල්ල උදාහරණ පෙන්නා ලිහිල්කර දෙන මේ පොත නැත්නම් ඒවා සෙවීම සඳහා පොත් රැශියක් ඔවුන් විසින් කියවා බැලියයුතු වන්නේය.

මේ පොතේ විශෙෂාඞගයක් නම් දක්වියයුතු උදාහරණ සියල්ල ම වාගේ පෙළ-අටුවා-සඞග්‍රහග්‍රන්ථ ආදි පැරණිපොත්වලින් ම උපුටා දක්වීමයි. ඒ ඒ තැනට ඔබනැ කරන වචන සහිත උදාහරණ සෙවීමේදී ඇතැම්විට එක් උදාහරණයක් සොයාගැනීමට පැයක් දෙකක් පමණත් කාලය ගතකරන්ට සිදුවිය. ඒ ගත් වෙහෙසින් ආධුනිකයන්ට පහසුවක් සැලසෙන බැවින් ඒ වෙහෙස අපගේ ප්‍රීතිය පිණිසම පවත්නේය. පළමුවර පොතේ නිපාතාර්ථවිභාගය දැක්වූ නමුත් ඕනැවිටක ඕනැකරන වචනය බලාගැනීමට තරමක් අපහසු ඇතිවූ බැවින් මේ වර නිපාත සියල්ල අකාරාදි පිළිවෙළින් යොදා අර්ථ හා උදාහරණ දෙනලදී.

පළමුවර පොත පරිච්ඡේදවලට නොබෙදූ නමුත් මේ වර එය පරිච්ඡේද සතකට බෙදනලදී. එයින් පස්වෙනි පරිච්ඡේදයේ දැක්වෙන ක්‍රියාකාරකසම්බන්ධයක් සවෙනි පරිච්ඡේදයේ දැක්වෙන [illegible] . [illegible] අභිප්‍රායෙන් එක්කරනලද බව

සැලකියයුතුයි. පාලිවාක්‍යයන් විච්ඡේදකොට (ඒ ඒ කොටස්වලට) බෙද දැක්වීමක් හෝ අමිශ්‍රවාක්‍ය මිශ්‍රවාක්‍යාදි විභාග දැක්වීමක් හෝ අපේ පරණ ඉගැන්වීමේ ඇතුලත් නොවීය. වාක්‍යයක කර්තෘට අයත් කොටස කුමක්ද, කර්මයට හා ක්‍රියාවට සම්බන්ධ කොටස් මොනවා දැයි තේරුම් ගත්විටම ඒ වාක්‍යයේ අර්ථය නිවරදියේ දතහැකි වන්නේය. එසේම ප්‍රධානවාක්‍යය හා එහි ඇතුලත් අන්තර්වාක්‍ය මොනවාද යන්න දැනගතයුතුය. මේ වාක්‍යවිභාගක්‍රමය ඉංග්‍රීසි ව්‍යාකරණයෙහි "ඇනැලිසිස්" නමින් දැක්වේ. මාවිසින් ඒ ක්‍රමය පාලියට ගැලපෙනසේ යොද "පාලිවාක්‍යවිවේචනය" නැමැති ග්‍රන්ථයක් කලකට පෙර පළකරවනලදී. වාක්‍යරචනාව ගැන දත යුතු හැමවිස්තරයක් ම එහි ඇතුලත්වූ නමුත් ඒ පොත වඩා ප්‍රචලිත නොවීය. එබැවින් ඒ වෙනුවට ඊටත් විශාලවූ "පාලිවාක්‍ය රචනාව හා පරිවර්තනපරිචය" නැමැති පොතක් පසුගිය වර්ෂයේදී පළකෙරෙව්වෙමි. එසේවුවත් ඒ පොතේ ඇතුලත් නැති, ශිෂ්‍ය යන්ට අවශ්‍යයෙන්ම ඕනෑකරන, කරුණු ඇතුලත් මේ පස්වෙනි-සවෙනි පරිච්ඡේද දෙක මේ පොතට ඇතුලත් කෙළෙමි. එයින් ශිෂ්‍යයන්ට ලැබියහැකි ප්‍රයෝජනය ඉතාමහත් බව යන්තමින් වත් එය බලන්නකුට වැටහෙනවා ඇත.

උපග්‍රන්ථයෙහි දුර්ලභවූ ද තේරුම් ගැනීමට අපහසුවූ ද වචන රැශියක් පොත්වලින් උදාහරණ උපුටාදක්වමින් පැහැදිලි කොට අකාරාදික්‍රමයෙන් යොදනලදී. අවසන්හි සැලකියයුතු ව්‍යාකරණ ලක්ෂණාදිය හා අප්‍රකටවචන ඇතුලත් සූචියක් (Index එකක්) ද යොද ඇත.

ප්‍රථමමුද්‍රණයේදී උදාහරණ වශයෙන් දැක්වූ පාලිපාඨ සියල්ලට සිංහලඅනුවාදයක් විවරණයේදී දෙනලදී. මේ වර එසේ නොකොට තේරුම්ගැනීමට අපහසු වාක්‍යකොටස්වලටත් ගාථාවලටත් අර්ථදීම කරමින් ගැටපදයක් පොතේ අගට යොදනලදී.

අන්‍යොන්‍ය විරුද්ධාර්ථ ඇති ආමක (=අමු), පක්ක (=පැසුණු) ආදි ශබ්දයන්ගේ වචනමාලාවක් හා හඨ—පහඨ, ඛිරි—ඔතපප ආදී නිතර එක්ව යෙදෙන ශබ්දයන්ගේ වචනමාලාවක් මේ පොතට එක්කිරීම සඳහා මුලදී පිළියෙළ කළ නමුත් පොත විශාලවෙන නිසා ඒ කොටස් දෙක "පාලිවාක්‍යරචනා" පොතට ඇතුල්කරනලදී. එමෙන්ම ඒ ඒ ක්‍රියාපදයෙන් නිෂ්පාදනය වෙන පූර්වක්‍රියාපදයන් හා අතීතකෘදන්තශබ්දයන් එක්පෙළට යොද සැලසූ පිටු 12 ක් සැකිර [illegible] ක්‍රියාපදමාලාවක් ඒ පොතේ ඇතිබව සැලකියයුතු.

භාෂාරීති දක්වන පිටු අටක් ද පාලිභාෂාපරිවර්තනය ඉගනීම සඳහා පිටු 30 ක් ද ඒ පොතේ ඇති බැවින් "පාලිභාෂාවතරණය" ඉගෙන ගන්නන් විසින් ඒ පොත ද පරිශීලනය කළයුතු බව තරයේම කියම්හ. පාලිභාෂාවතරණයෙහි නොදක්වූ යම්කිසිවක් ඇත්නම් ඒ අඩුපාඩු 'වාක්‍යරචනා' පොතේ ඇතුළත් බව සැලකියයුතු

අන්‍ය පොත්වලින් උදාහරණ උපුටා දක්වීමේදී මෙරට සියලු දෙන පිළිගත් පිළිවෙළකින් මුද්‍රණය වූ පාලිපොත් පෙළක් නැති බැවින් ඒ වාක්‍ය තිබෙන පොත්වල පිටු දක්වීම සම්බන්ධයෙන් අපට කරදර ඇතිවිය. එබැවින් ඇතැම් තැනක එංගලන්තයේ මුද්‍රිතවූ පාලිපොත්වල කාණ්ඩය හා අංකය සඳහන් කරනලදී. අප විසින් ඉංග්‍රීසියෙන් මේ තෙවෙනි පොතට සමානවන සේ ලියූ Higher Pali Course පොතේදී අන්‍යපොත්වල පිටුදක්වීමේ කරදරයක් ඇති නොවිය.

මීට,

පොල්වත්තේ බුද්ධදත්ත මහාස්ථවිර.

අග්‍රාරාමය,
අම්බලම්ගොඩ,
23-7-1948.

# පටුන

## ප්‍රථම පරිච්ඡේදය පිටු


අක්ෂරයන්ගේ උත්පත්තිස්ථානාදිය 1
විශේෂ සන්ධි 2


## ද්විතීය පරිච්ඡේදය


විශේෂ ශබ්ද (පුංලිඞ්ගික විශේෂ ශබ්ද) 8
ස්ත්‍රීලිඞ්ගික විශේෂ ශබ්ද 14
නපුංසකලිඞ්ගික විශේෂ ශබ්ද 16
ත්‍රිලිඞ්ගික විශේෂ ශබ්ද 17
පළමුපොත්වල නොදැක්වූ සර්වනාම 19
අම්හ-තුම්හ ශබ්ද ගැන කිවයුතු විශේෂ 23
සංඛ්‍යා ශබ්ද 24


## තෘතීය පරිච්ඡේදය


ප්‍රථමා විභක්ත්‍යර්ථ විභාගය 30
විතීයා විභක්ත්‍යර්ථ විභාගය 32
තෘතීයා විභක්ත්‍යර්ථ විභාගය 34
චතුර්ථී විභක්ත්‍යර්ථ විභාගය 40
පඤ්චමී විභක්ත්‍යර්ථ විභාගය 44
ෂෂ්ටි විභක්ත්‍යර්ථ විභාගය 47
සප්තමී විභක්ත්‍යර්ථ විභාගය 49
අන්‍යවිභක්තීන්ගේ අර්ථයන්හි යෙදෙන අන්‍යවිභක්තීහු 54
තතියාව සමග යෙදෙන වචන කීපයක් 59
තෙමේම, තුමූම 60


## චතුර්ථ පරිච්ඡේදය


ක්‍රියා පිළිබඳ විස්තර
ගමු ධාතුකරූප-කර ධාතුකරූප 64
අස ධාතුකරූප - හූ ධාතුකරූප 68

වද ධාතුකරූප 71
ද ධාතුකරූප 75
දිස ධාතුකරූප 77
බ්‍රෑ ධාතුකරූප 79
ඤ - ධාතුකරූප සු-ධාතුකරූප 80
ගහ ධාතුකරූප- ඉ ධාතුකරූප 81
උ - පූර්ව පදධාතුකරූප 82
ලහ-වස-ධා-හන ධාතුන් පිළිබඳ විශේෂ 84
හර - හා - ජර- මර - ධාතුන් පිළිබඳ විශේෂ 86
කර්ම කාරක ක්‍රියා 89
සු-ධාතුහුගේ කර්ම කාරක රූප 91
ඊප්සාර්ථ ප්‍රකාශක ප්‍රත්‍යයෝ 95
උපමානාර්ථ ප්‍රත්‍යයෝ 97
මා යෝගයෙහි අජ්ජතනිය 100
අතීත්‍යර්ථයෙහි භවිස්සන්තිය 100

## පඤ්චම පරිච්ඡේදය

ක්‍රියා කාරක සම්බන්ධය 101

## සවෙනි පරිච්ඡේදය

වාක්‍ය විවේචන 107
මිශ්‍රවාක්‍ය, අන්තර්වාක්‍ය විභාගය 109
වාක්‍ය විච්ඡේදය 115
ආඛ්‍යාත විස්තාර 118
ආඛ්‍යාත පූරණය 121

## සත්වෙනි පරිච්ඡේදය

නිපාතාර්ථ විභාගය 125
උපග්‍රන්ථය (අප්‍රකට වචන) 162
ගැටපදය 187
පාලි- සිංහල වචන මාලාව 202
වැදගත් වචන හා කරුණුවල සූචිය 222

# පාලිභාෂාවතරණය.

## තෙවෙනි පොත

නමො තස්ස භගවතො අරහතො සම්මාසම්බුද්ධස්ස

## ප්‍රථම පරිච්ඡේදය

### අක්ෂරයන්ගේ උත්පත්තිස්ථානාදිය

1. අකුරු වනාහි සිත මුල්කොට හටගන්නා ශබ්දයන් දැක්වීමට යොදන ලකුණු විශෙෂයෙකි. අපේ අදහස් ප්‍රකාශ කළ හැක්කේ අකුරුවලින් යුත් වචනවලිනි. පළමුකොට සිතින් නොසිතා අදහස් පහළ කිරීම හැකි නොවේ. එබැවින් අවිශේෂයෙන් සියළු අකුරු චිත්තජ (සිතින් උපදනාහු) වෙති. නමුත් සිතින් උපන් වායුව මුඛය කරා පැමිණ බොටුව තල්ල ආදී ඒ ඒ තැන්වල හැපී විශෙෂ ශබ්දයන් උපදවන බැවින් ඒ ඒ ස්ථානයන්ගේ වශයෙන් අක්ෂරයෝ බෙදනු ලැබෙත්. හේ මෙසේයි. :-

අ ආ ක ඛ ග ඝ ඞ හ යන මොහු කණ්ඨජ
(=බොටුවෙන් උපදනාහු) වෙති.
ඉ ඊ ච ඡ ඣ ඤ ය යන තාලුජ (= තල්ලෙන් උපදනාහු) වෙති.
ට ඨ ඩ ඪ ණ ර ළ යන මුද්ධජ (=තල්ලේ මුදුනෙන් උපදනාහු) වෙති.
ත ථ ද ධ න ල ස යන දන්තජ (=දත්වලින් උපදනාහු) වෙති.
උ ඌ ප ඵ බ භ ම යන ඔට්ඨජ (= තොල්වලින් උපදනාහු) වෙති.
ඞ ඤ ණ න ම යන උඩ දැක්වූ ඒ ඒ තැන් හා එක්ව නාසයෙන් උපදිත්.

ඞ - කාරය බොටුවෙන් හා නාසයෙන් ආදී වශයෙනි.
එ - කාරය බොටුවෙන් හා තල්ලෙන් උපදී
ඔ - කාරය බොටුවෙන් හා තොලින් උපදී
ව - කාරය දතින් හා තොලින් උපදී
(අං) යන්න නාසයෙන් උපදී

2. තවද ව්‍යඤ්ජනයෝ **සිථිල** - **ධනිත** වශයෙන් බෙදනු ලැබෙති. ලිහිල්ව ශබ්දවෙන අකුරු **සිථිල** නම් වෙති. **ක ග ඞ, ච ජ ඤ, ට ඩ ණ, ත ද න, ප බ ම, ය ර ල ව, ස හ ළ** යන මොහුයි. අල්ප ප්‍රාණාක්ෂර යයි ද මොවුන්ට නමකි.

තදව ශබ්දවෙන **අකුරු ධනිත** නම් වෙති. **ඛ ඝ, ඡ ඣ, ඨ, ඪ, ථ, ධ, ඵ, භ** යන මොහුයි. මහාප්‍රාණාක්ෂර යයි ද මොවුන්ට නමකි,

**ඝොස** - **අඝොස** වශයෙන් ද බෙදනු ලැබෙති. වැඩි හඬ ඇත්තාහු **ඝොස** නම් වෙති. **ගඝඞ, ජඣඤ, ඩඪණ, දධන, බභම, යරල වහළ** යන මොහුයි. අඩු හඬ ඇත්තාහු අඝොස නම් වෙති: **ක ඛ ච ඡ ට ඨ ත ථ ප ඵ ස** යන මොහුයි.

## විශෙෂ සන්ධි

3. **නදී - පොක්ඛරණී ආදි ශබ්දයන් කෙරෙන් ඇතැම් විභක්ති වලට අයත් සවරයන් පරකල්හි ඊකාරයට යකාර වූ පසු ද්‍ය-ණ්‍ය-ත්‍ය-කාරයන්ට පිළිවෙලින් ජ්ජ- ඤ්ඤ - ච්ච - ආදෙශයෝ වෙති.**

නදී + යො = නද්‍ය + ඕ = නද්‍යො = නජ්ජො
නදී + නා = නද්‍ය + ආ = නද්‍යා = නජ්ජා
පොක්ඛරණී + යො = පොක්ඛරණ්‍ය + ඕ = පොක්ඛරණ්‍යො
= පොක්ඛරඤ්ඤො
පොක්ඛරණී + නා = පොක්ඛරණ්‍ය + ආ = පොක්ඛරණ්‍යා =
පොක්ඛරඤ්ඤා
ජාති + නා = ජාත්‍ය + ආ = ජාත්‍යා = ජච්චා

දිවාදිගණයෙහි කත්‍රෘකාරක - යවිකරණය ද කර්මකාරක ක්‍රියා සිද්ධිය පිණිස කරනු ලබන ය - ප්‍රත්‍යය ද යෙදුණු තැන්හිත්, ච්‍ය - න්‍ය - ද්‍ය- ධ්‍ය - හ්‍ය - ස්‍ය - ආදීන්ට පිළිවෙලින් ච්ච - ඤ්ඤ - ජ්ජ - ජ්ඣ බ්භ - ස්ස ආදීහු වෙති:

පච් + ය + ති = පච්‍යති - පච්චති . හන් + ය +ති = හන්‍යති
= හඤ්ඤති.
භිද් + ය + ති = භිද්‍යති = භිජ්ජති . බුධ් + ය + ති = බුධ්‍යති
= බුජ්ඣති.

විශෙෂ සන්ධි

දිස් + ය + ති = දිස්‍යති = දිස්සති . ලභ් + ය + ති = ලභ්‍යති = ලබ්භති

මත්තෙහි **කම්කාරක ක්‍රියා** විභාගය බැලිය යුතු.

**4. යථා - තථා දෙකින් පරවූ එව- ශබ්දයාගේ එකාරයට රිකාර වේ; පූර්වස්වරයට හ්‍රස්ව වේ.**

යථා + එව = යථරිව          තථා + එව = තථරිව.

පූර්වස්වරලොපයෙන් සන්ධි වී **යථෙව තථෙව** කියා ද සිටිති.

**5. ව්‍යඤ්ජන පරකල්හි පුථ - ශබ්දයාගේ අන්තයට කිසි තැනක උකාර වේ.**

පුථ + ජනො = පුථුජ්ජනො          පුථ+භූතො = පුථුභූතො

6. එසේම අව උපසර්ගයට ඔකාර වේ.

අව + කාසො = ඔකාසො          අව + නද්ධො = ඔනද්ධො
අව + සානං = ඔසානං          අව + වදති = ඔවදිති.

7. එසේම පර ශබ්දදිය කෙරෙන් ඕ ආගම වේ.

පර + සතං = පරොසතං     පර+ සහස්සං = පරොසහස්සං
සරද + සතං සරදෙසතං

සංලක්ෂ්‍යය.

රූපසිද්ධි - බාලාවතාර යන ව්‍යාකරණ ග්‍රන්ථයන්හි 'අතිප්පගො බො' යන උදාහරණයක් දක්වා අතිප්ප ශබ්දය කෙරෙන් ගකාර-ඔකාරයන් ආගම වීමෙන් එය සිද්ධවේ යයි කියන ලදී. ශබ්දනීතිව්‍යාකරණයෙහි 'පගො' යන්න 'පාතො' යන්නට සමාන නිපාතයකැයි කියන ලදී. දික්සහි (පාඨිය සූත්‍ර) අටුවාවෙහි වනාහි 'අතිප්පගො බොති අති විය පාතො බො, න තාව කුලෙසු යාගුභත්තං නිට්ඨිතන්ති' යි දක්වන ලදි. 'අතිප්පගො බො යන්නෙහි අර්ථය නම් අතිශයෙන් උදෑසනය. ඒතාක් ගෘහයන්හි කැඳබත් පිස නොනිමියේය.' යනු ඒ පාඨයාගේ භාවයයි. මෙහි

අති-ශබ්දය හා පාගො - ශබ්දය දෙකක් කොට පැහැදිලි ලෙසම දැක්වූ බැවින් අතිප්ප - ශබ්දයක් නැත්තේ යයි පිළිගතයුතු වේ. පාලි පොත්වල කිසි තැනකත් අතිප්ප - ශබ්දයක් දක්නට නොලැබේ. එබැවින් ශබ්ද නීතියේ කීම අවුවාව හා ගැළපේ.

**8. ස්වර පරකල්හි කිසි තැනක පුථ යන මොහුගේ අන්තයෙහි ගකාරයක් ආගම වේ.**

පුථ + එව = පුථගෙව

පා-එව යන තැන ගකාරාගමය හා හ්‍රස්වය වී පගෙව යන්න සෑදේයයි කච්චායනාදියෙහි කියන ලදී. නමුත් එය ද යට කී 'පගෝ' නිපාතය හා 'එව' ශබ්දය සන්ධි කිරීමෙන් සෑදීම යොග්‍ය වේ. (නිපාතාර්ථ විභාගය බැලිය යුතු)

9. එසේම ගො - ශබ්දයාගේ ඔකාරයට සමාසයේදී අව ආදෙශ වේ.

ගො + එළකං = ගවෙළකං. ගො + අස්සවළවං = ගවාස්සවළවං

**10. එසේම එක ශබ්දයෙන් පර වූ ඉධ ශබ්දයාගේ ධකාරයට දකාර වේ.**

එකං + ඉධ + අහං - එකමිදාහං.

**11. ස්වරයක් හෝ ව්‍යඤ්ජනයක් පරකල්හි පති උපසර්ගයට පටි - ආදේශ වේ.**

පති + අග්ගි = පටි + අග්ගි = පටග්ගි, පති + හඤ්ඤති = පටි හඤ්ඤති.

**12. නිග්ගහීතයෙන් පරස්වරය ලොප් කළ විට ඊට පසුව තිබෙන සංයෝගයේ හල් අකුරු මැකේ.**

එවං + අස්ස = එවංස්ස = එවංස
පුප්ඵං + අස්සා = පුප්ඵංස්සා = පුප්ඵංසා

**13. ලකාරය පරකල්හි නිග්ගහීතයට ලකාරාදෙශ වේ.**

**සං + ලක්ඛෙති = සල්ලක්ඛෙති. පුං + ලිඞ්ගං = පුලිලිඞ්ගං**

සං + ලාපො = සල්ලාපො

**14. සුඛොච්චාරණය සඳහා ඇතැම් තැනක අක්ෂර ලොප විපර්‍යාසාදිය කරනු ලැබේ.**

අභිජ්ඣදය + සච්ඡිකත්වා = අභිජ්ඣද **සච්ඡිකත්වා** } (අක්ෂර ලොප)
පටිසඞ්ඛාය + යොනිසො පටිසඞ්ඛා **යොනිසො**

වන + පගුම්බො = **වනප්පගුම්බො** } (විපර්‍යාස)
සුඛං, දුක්ඛං, ජීවො = **සුඛෙ, දුක්ඛෙ, ජීවෙ.**

බහු + ආබාධො = බහ්වාබාධො = **බව්හාබාධො** (හ්-ව්-පෙරළිය)

පරි + උදහාසි = පරියුදහාසි = **පයිරුදහාසි** (ර්-ය්-පෙරළිය)

තං + ඉමිනා = **තදමිනා** (ඉකාරයට අකාරද බින්දුවට දකාරද වේ.)

මට්ටකුණ්ඩලී + ඉති + එව = **මට්ටමකුණ්ඩලිත්‍වෙව.** } (ඉකාරයට වකාරවේ.)
විලපති + එව = **විලපත්වෙව.**

**15. ගාථාවන්ගේ ඡන්දස් රැකීම පිණිස ද ලෝප - විපර්‍යාසාදිය කරනු ලැබේ.**

තපෙථ'ච්පපතිං ජමාය = තපෙථ'ච පපතිං ජමා (ථෙරගාථා)

පණ්ඩිතෙහි සහ + වසෙ = පණ්ඩිතෙහි සහා වසෙ (ථෙරිගාථා)

අකරම්හසෙ + තෙ කිච්චං = අකරම්හස තෙ කිච්චං (ජාතක)

අයොනිසො + සුධිමත්වෙසං = අයොනි සුධිමන්වෙසං (ථෙරගාථා)

ඛන්ති + පරමං = ඛන්තී පරමං (ධම්මපද)

**1. පහත දැක්වෙන ධකාරාදීන්ට පිළිවෙළින් හකරාදීහු වෙති.**
ධ-කාරයට හ-කාර වේ. සාධු + දස්සනමරියානං = සාහු දස්සනමරියානං

| | |
|---|---|
| ද - කාරයට ත - කාරවේ. | කුසිදෙ = කුසීතො |
| ත - කාරයට ට - කාර වේ | පහතො = පහටො. කතත්තා - කටත්තා |
| ත්ත - කාරයට ත්‍ර - කාරවේ | අත්තජො = අත්‍රජො<br>ගොත්තභූ = ගොත්‍රභූ |
| ග - කාරයට ක - කාරවේ | කුලුපගො = කුලුපකො |

| | |
|---|---|
| රි-ද කාරයට රි ළ - කාර වේ | මහාසාරෙ = මාසාළො<br>පටි + දහො = පරිළාහො<br>පරි + බොධො = පළිබොධො |
| ව - කාරයට බ - කාර වේ | සීලවතං = සීලබ්බතං නිවාණං<br>නිබ්බාණං |
| ජ - කාරයට ය - කාර වේ | නිජංපුත්තං = **නියං පුත්තං** |
| ත - කාරයට ක - කාරවේ | නියතො = **නියකො** |
| ත - කාරයට ච - කාරවේ | හත්තො - **හච්චො** |
| ද - කාරයට ද්‍ර - කාර වේ | හද්දෙ = හද්‍රො, ඉන්දියං =<br>**ඉන්ද්‍රියං** |
| ජ - කාරයට ද - කාරවේ | පසෙනජි - **පසෙනදි** |
| ක - කාරයට ද - කාරවේ. | සකත්ථපසුතො=**සදත්ථපසුතො** |
| ය - කාරයට ව - කාර වේ | ආයුධං=**ආවුධං** දීඝායු=**දීඝාවු** |
| ම - කාරයට ප - කාර වේ | චිරමපවාසිං - **චිරප්පවාසිං** |
| ත්ථ - කාරයට ට්ඨ - කාර වේ | අත්ථකථා = **අට්ඨකථා**<br>පීළනත්ථො = **පීළනට්ඨො** |
| ප - කාරයට ඵ - කාර වේ | නිප්පත්ති = **නිප්ඵත්ති.** |
| ර - කාරයට ල - කාර වේ | තරුණ = **තලුන** |
| ණ - කාරයට න - කාර වේ | කරුණං = **කලුණං** . |
| ඤ්ච - කාරයට ණ්ණ-කාර වේ | පඤ්ච + වීසති = **පණ්ණවීසති.**<br>පඤ්ච + දස - **පණ්ණරස** |
| ඤ්ඤ - කාරයට ණ්ණ-කාර වේ | පඤ්ඤාසා - **පණ්ණාසා** |
| ප්‍ය - කාරයට ප්ප-කාර වේ | අපි + එකච්චෙ = අප්‍යෙකච්චෙ<br>= **අප්පෙකච්චෙ**) |

## උදහරණ i

1. 'දක්ඛිණං සමුද්දං **අජ්ඣොගාහෙත්වා පච්චුත්තරිත්වා** පච්ඡිමං දිසං පවත්ති, **අන්වදෙව** රාජා චක්කවත්තී' (චක්කවත්ති සුත්ත . දීඝ)

2. '**එකමිදහං** ආවුසො සමයං පාවාය කුසිනාරං අද්ධාන මග්ගපටිපන්නො මහතා භික්ඛුසඞ්ඝෙන සද්ධිං' (විනය අටුවා.)

3. '**පරොසහස්සං** භික්ඛූනං, සුගතං **පයිරුපාසති.**'
(වංගීසථෙර ගාථා)

4. '**පරිළාහො** සමුච්ඡින්නො, සීතිභූතාම්හි, නිබ්බුතා.'
(අභයමාතා ථෙරගාථා)

5. 'සො ච මෙ භගවා දිට්ඨො, විහාරෙ ච සහ වසිං
**බහුදෙව රත්තිං භගවා අබ්භොකාසෙ** වීතිනාමයි.'
(සොණකුටිකණ්ණථෙර ගාථා)

6. '**පණ්ණවීසති** වස්සානි යතො පබ්බජිතා අහං
න'ච්ඡරාසඞ්ඝාතමත්තමපි චිත්තස්සූ'සම'ම ජ්ඣගං'
(අපඤ්ඤතා ථෙරී ගාථා)

7. 'වඞ්කමං අභිරූහන්තො තත්ථේව **පපතිං ඡමා.**'
(භගුථෙර ගාථා)

8. 'වණ්ණ - **රූපෙන සම්පන්නා ධීතා මෙඝස්ස අත්‍රජා**'
පත්ථිතා රාජපුත්තෙහි, සෙට්ඨිපුත්තෙහ' භිජ්ඣිතා'
(අනොපමා ථෙරී)

9. '**බ්‍රහ්මජච්චො** පුරෙ ආසිං, උදිච්චො උභතො අහු'
(අඞ්ගුලිමාල ථෙර ගාථා)

10. 'අථ ඛො තෙසං භික්ඛූනං එතදහොසි, **අතිප්පගොඛො** තාව සාවත්ථියං පිණ්ඩාය චරිතුං'
(මහාදුක්ඛක්ඛන්ධ සුත්ත.)

11. 'තස්මා විනෙය්‍ය මච්ඡෙරං **දජ්ජා** දනං **මලාභිභූ**'
(දෙවතා සංයුක්ත.)

12. '**පච්චති** මුනිනො භත්තං ථොක ථොකං කුලෙ කුලෙ.'
(ධම්මපද.)

13. 'අන්ධකාරෙන ඔනද්ධා, පදීපං න ගවෙස්සථ?'
(ධම්ම පද.)

පාලිභාෂාවතරණය iii

14. 'එවං වුත්තෙ රාජා පසෙනදි කොසලො භගවන්තං එතදවොච.'
(කොසල සංයුත්ත.)

15. 'එකච්චො පුග්ගලො නීචෙ කුලෙ පච්චාජාතො හොති ...... සො ච හොති ....... බව්හාබාධො කාණො වා කුණී වා'
(තමොතම සුත්ත.)

16. 'දෙණ්ණිතෙ සුඛ - දුක්ඛෙ, නත්ථි හායන වඩ්ඪනෙ, නත්ථි උක්කංසාවකංසෙ' (සාමඤ්ඤපල සුත්තා. අවසානයේ තිබෙන අභ්‍යාස විවරණය)

# ද්විතීය පරිච්ඡේදය.

## විශේෂ ශබ්ද.

පුරිස- ශබ්දයට වෙනස්ව වරනැගෙන අකාරාන්ත පුල්ලිඞ්ගික ශබ්දයන් අතුරෙන් අත්ත - රාජ - දෙක දෙවෙනි පොතෙහි දක්වන ලදී. සඛ - බ්‍රහ්ම - යුව - පුම - ආදී වෙනස්ව වරනැගෙන තවත් ශබ්ද ඇත්තාහ.

### 17. පුල්ලිඞග සඛ ශබ්දය.

| | එකවචන | බහුවචන |
|---|---|---|
| පඨ: | සඛා ( = මිත්‍රයා) | සඛා, සඛිනො, සඛානො, සඛායො, සඛාරො |
| දුති: | සඛං, සඛාරං, සඛානං | සඛිනො, සඛානො, සඛායො |
| තති: | සඛිනා | සඛාරෙහි, - භි - සඛෙභී, සඛෙහි |
| චතු: ජට්ඨී: | සඛිනො, සඛිස්ස | සඛිනා, සඛාරානං, සඛානං |
| පඤ්ච: | සඛාරාස්මා, සඛීනා, සඛිම්හා, සඛිස්මා සඛම්හා, සඛස්මා | සඛාරෙහි-භි, සඛෙහි, සඛෙභි, |

විශෙෂ ශබ්ද

| | | |
|---|---|---|
| සත්‍ත: | සබෙ, සබ්මහි, සබ්ස්මිං | සබාරෙසු, සබෙසු. |
| ආල | (හෙ) සබ, සබා, සබි, සබෙ | (හෙ) සබිනො, සබානො, සබයො, සබාරො |

18. පුල්ලිඞග බ්‍රහ්ම ශබ්දය.

| | ඒකවචන | බහුවචන |
|---|---|---|
| පඨ: | බ්‍රහමා (බ්‍රහමතෙම) | බ්‍රහමා, බ්‍රහමානො |
| දුති: | බ්‍රහමානං, බ්‍රහමං | බ්‍රහමානො |
| තති: පඤ්ච: | බ්‍රහමනා | බ්‍රහෙමහි - හි බ්‍රහ්මුහි,බ්‍රහ්මූහි |
| චතු: ඡට්ඨි: | බ්‍රහ්මුනො, බ්‍රහමස්ස | බ්‍රහ්මානං බ්‍රහ්මූනං |
| සත්‍ත: | බ්‍රහමනි | බ්‍රහෙමසු |
| ආල: | (හෙ) බ්‍රහම, බ්‍රහෙම | (හෙ) බ්‍රහමානො. |

19. පුල්ලිඞග යුව - ශබ්දය.

| | එකවචන | බහුවචන |
|---|---|---|
| පඨ: | යුවා (= තරුණයා) | යුවානො, යුවා, |
| දුති: | යුවානං, යුවං | යුවානෙ, යුවෙ |
| තති: | යුවානා, යුවානෙන, යුවෙන | යුවානෙහි-භි, යුවෙහි, යුවෙභි |
| චතු: ඡට්ඨි: | යුවානස්ස, යුවස්ස | යුවානානං, යුවානං |
| පඤ්ච: | යුවානා, යුවානහ්මා, යුවානස්මා | යුවානෙහි, යුවානෙභි. යුවෙහි. |
| සත්‍ත: | යුවෙ, යුවම්හි, යුවස්මිං යුවානෙ, යුවානම්හි, යුවානස්මිං | යුවානෙසු, යුවාසු, යුවෙසු |
| ආල | (හෙ) යුව, යුවාන | (හෙ) යුවානො |

යුව - ශබදය මෙන් වර නැගෙන මඝව - ශබ්දයක් ඇතැයි ඇතැම් ආචාය්‍ය්‍යවරයෝ කියත්. තවත් කෙනෙක් එය ගුණවන්තු ශබ්දය මෙන් වර නැගෙන මඝවන්තු - ශබ්දය ම යයි කියත්.

## 20. පුල්ලිඞ්ග පුම - ශබ්දය.

| | | |
|---|---|---|
| පඨ: | පුමා (=පුරුෂතෙම) | පුමානො |
| දුති: | පුමානං | පුමානෙ |
| තති: | පුමානා, පුමුනා, පුමෙන | පුමානෙහි, පුමානෙභි |
| චතු:ඡ: | පුමුනො, පුමස්ස | පුමානං |
| පඤ්ච: | පුමානා, පුමුනා | පුමානෙහි, පුමානෙභි |
| සත්ත: | පුමානෙ, පුමෙ | පුමානෙසු, පුමාසු |
| ආල: | (හෙ) පුම, පුමං | (හෙ) පුමානො |

මෙය 'පුමො' ආදී වශයෙන් පුරිස ශබ්දය මෙන් ද වර නැගේ.

## 21. කාලයෙහි හෝ මාර්‍ගයෙහි වැටෙන පුල්ලිඞ්ග අද්ධ ශබ්දය

| | | |
|---|---|---|
| පඨ. | අද්ධා (=කාලය හෝ මාර්‍ගය) | අද්ධා, අද්ධානො |
| දුති. | අද්ධානං | අද්ධානෙ |
| තති. පඤ්ච | අද්ධුනා | අද්ධානෙහි, අද්ධානෙභි |
| චතු ඡට්ඨී | අද්ධුනො | අද්ධානං |
| සත්ත | අද්ධනි, අද්ධානෙ | අද්ධානෙසු |
| ආල | (හෙ) අද්ධ | (හෙ) අද්ධා, අද්ධානො |

(එකාන්තාර්ථයෙහි වැටෙන 'අද්ධා' යන නිපාතයක් ද දීඝ මාර්ගයෙහි වැටෙන අද්ධාන ශබ්දයක් ද තිබේ.)

## 22. පුල්ලිඞ්ග මුද්ධ ශබ්දය.

| | | |
|---|---|---|
| පඨ | මුද්ධා (= හිස, මුදුන) | මුද්ධා, මුද්ධානො |
| දුති. | මුද්ධං | මුද්ධෙ, මුද්ධානෙ |
| තති | මුද්ධානා, මුද්ධනා | මුද්ධෙහි, මුද්ධෙභි |
| චතු.ඡ | මුද්ධස්ස | මුද්ධානං |
| පඤ්ච | මුද්ධා, මුද්ධානා | මුද්ධානෙහි, මුද්ධානෙභි |
| සත්ත | මුද්ධනි | මුද්ධානෙසු |
| ආල | (හෙ) මුද්ධ | (හෙ) මුද්ධා මුද්ධානො |

## 23. සත්පුරුෂාර්ථයෙහි වැටෙන සන්ත - ශබ්දය

| | | |
|---|---|---|
| පඨ | සන්තො | සන්තො, සන්තා |
| දුති | සන්තං | සන්තෙ |
| තති. | සතා, සන්තෙන | සන්තෙහි, සන්තෙභි, සබ්භි |

විශෙෂ ශබ්ද

| | | |
|---|---|---|
| චතු.ච. | සතෙ, සන්තස්ස | සතං, සන්තාන, සතානං |
| පඤ්ච. | සතා, සන්තා, සන්තම්හා සන්තස්මා | සන්තෙහි, සන්තෙහි, සබ්භි |
| ආල. | (හෙ) සන්ත | (හෙ) සන්තා, සන්තො. |

විද්‍යමානාර්ථයෙහි වැටෙන **සන්ත** ශබ්දයක් ද වේ. එහි **සං සබ්භි** යන පද විද්‍යමාන නොවෙයි. සත්තමී එකවචනයෙහි සති යන්නක් විද්‍යමාන වේ.

## 24. අභිවෘද්ධි අර්ථ භවන්ත ශබ්දය

| | | |
|---|---|---|
| පඨ. | භවං, ( = භවතා, පින්වතා) | භවන්තො, හොන්තො (භවත්හු, පින්වත්හු.) |
| දුති. | භවන්තං | භවන්තෙ |
| තති. | භවතා, හොතා, භවන්තෙන | භවන්තෙහි, භවන්තෙහි |
| චතු.ඡ. | භවතො, හොතො, භවන්තස්ස | භවතං, භවන්තානං |
| පඤ්ච | භවතා, හොතා | භවන්තෙහි, භවන්තෙහි |
| සත්ත | භවති, භවන්තෙ, භවන්තම්හි, භවන්තස්මිං | භවන්තෙසු |
| ආල | හො. භන්තෙ | භවන්තො, හොන්තො |

ආලපනාර්ථයෙහි වැටෙන හො නිපාතයක් තිබේ. එය එකවචන බහුවචන දෙකෙහිම යෙදේ. භද්දන්තෙ යන්න - භදන්ත - ශබ්දයේ ආලපනයකි. භන්තෙ - .භද්දන්තෙ යන දෙකම 'ස්වාමීන් වහන්ස', 'පින්වතුන් වහන්ස' යන අර්ථ ඇත්තේයි. ස්ත්‍රීන්ට ආමන්ත්‍රණයෙහි පවත්නා 'සොඳුර' යන අර්ථ ඇති භද්දෙ යන්නද භවන්ත ශබ්දයෙන් සෑදේයයි ඇතැම් ආචාර්‍ය්‍යවරයෝ කියත්. ශබ්ද නීති ව්‍යාකරණයෙහි 'භන්තෙ භද්දේ' යන දෙකම ආලපනාර්ථයෙහි පවත්නා නිපාත පදයයි කියන ලදී.

## 25. ආකරාන්ත = පුල්ලිංගික සා - ශබ්දය

| | | |
|---|---|---|
| පඨ | සා ( = බල්ලා) | සා. සානො ( ,, බල්ලෝ) |
| දුකි. | සානං | සානෙ |
| තති. | සානා | සානෙහි, සානෙහි |
| චතු. ජට්ඨී | සාස්ස | සානං |

| | | |
|---|---|---|
| පඤ්ච | සානා | සානෙහි, සනෙහි |
| සත්ත | සානෙ | සානෙසු |
| ආල. | (හෙ) සා | (හෙ) සානො. |

රාජ ශබ්දය සමාසයෙහි යෙදී මහාරාජ දේවරාජ ආදි වශයෙන් සිටිකල්හි පුරිස - ශබ්දය මෙන් ද රාජ ශබ්දය මෙන් ද වර නැගේ.

| | | |
|---|---|---|
| පඨ. | මහාරාජො, මහාරාජා | මහාරාජා, මහාරාජානො |
| දුති | මහාරාජං, මහාරාජානං | මහාරාජෙ, මහාරාජානො |
| තති. | මහාරාජෙන, මහාරඤ්ඤා | මහාරාජෙහි, මහාරාජෙභි |
| | මහාරාජිනා | මහාරාජූහි, මහාරාජූභි |

ස්ත්‍රීවාචක වූ මාතුගාම, දර, ඔරොධ, ශබ්ද තුන පුල්ලිඞ්ගයෙහි වේ. පුරිස - ශබ්දය මෙන් වර නැගේ.

| | |
|---|---|
| මාතුගාමො (= ස්ත්‍රී තොමෝ.) | මාතුගාමා (= ස්ත්‍රීහු) |
| දරො, (= භාර්‍යාතොමෝ) | දරා (= භාර්‍යාවෝ) |
| ඔරොධො (අන්තඃපුර ස්ත්‍රිය) | ඔරොධා (අන්තඃපුර ස්ත්‍රීහු.) |

## උදාහරණ ii

1. 'තීහි ඛො අනුරුද්ධ ධම්මෙහි සමන්නාගතො මාතුගාමො කායස්ස භෙදා පරම්මරණා .............. නිරයං උප්පජ්ජති.' (තිකංගුත්තර.)

2. 'අථ ඛො රඤ්ඤො උදෙනස්ස ඔරොධො රාජානං උදෙනං එතදවොච' (චුල්ලවග්ග පඤ්චසතික්ඛන්ධක.)

3. A. 'සචාහං ඉමං න ඛමාපෙස්සාමි මුද්ධා මෙ සත්තධා ඵලෙය්‍ය.' (විනය අටුවා)

B. 'මුද්ධාපි තස්ස විපතෙය්‍ය.' (පාථියසුත්ත . දීඝ.)

4. 'තෙ මං දාරෙහි සම්මුවජ, සා'ච වාරෙන්ති සූකරං.' (බ්‍රාහ්මණ සංයුක්ත)

5. A. 'සො න කුම්භිමුඛා පටිගණ්හාති, න යස්ස සා උපට්ඨිතො හොති.' (තිකංගුත්තර)

පුල්ලිංගික විශෙෂ ශබ්ද

B. යො සා යසස ඩසෙ පාදං තසස පාදං න සො ඩසෙ.'
(රසවාහිනි)

6. 'සෙලෙ යථා පබ්බතමුද්ධනි ඨිතො, යථාපි පස්සෙ ජනතං සමන්තතො.' (මහාවග්ගපාළි)

7. 'අථ බො බ්‍රහ්මුනො සහම්පතිස්ස එතදහොසි, (බ්‍රහ්ම සංයුක්ත)

8. 'එවං වුත්තෙ භගවා බකබ්‍රහ්මානං එතදවොච' (බ්‍රහ්ම සංයුත්ත.)

9. අද්දසා බො සො බ්‍රහ්මා තෙ බ්‍රහ්මානො දූරතොව ආගච්ඡන්තෙ, දිස්වාන තෙ බ්‍රහ්මානො එතදවොච' (බ්‍රහ්ම සංයුක්ත)

10. 'ආයුං පජානාමි තවා'හං බ්‍රහ්මෙ' (බ්‍රහ්ම සංයුක්ත)

11. එවංහි සො භික්ඛවෙ තෙලප්පදීපො චිරං දීඝමද්ධානං ජලෙය්‍ය'
( සු.නි.)

12. 'සංවාසෙන බො මහාරාජ සීලං වෙදිතබ්බං, තං ච බො දීඝෙන අද්ධුනා' (කොසල සංයුක්ත)

13. අහුවා මෙ සගාමෙය්‍යො, අහුවා මෙ පුරෙ සඛා'
(බ්‍රහ්ම සංයුක්ත)

14. තස්මා සතං ච අසතං ච, නානා හොති ඉතො ගති
අසන්තො නිරයං යන්ති, සන්තො සග්ගපරායණං'
සබ්භිරෙව සමාසෙථ සබ්භි කුබ්බෙථ සන්ථවං'
(දෙවතා සංයුත්ත.)

15. 'පඨමයාමෙ චත්තාරො මහාරාජා චතුද්දිසං එකොභාසං කරොන්තා සත්ථු උපට්ඨානං ආගමිංසු.' (ධ. අ. ජම්බුකාජීවක.)

16. යථා බලාකයොනිම්හි න විජ්ජති පුමා සදා.' (උපාලිත්ථෙරාපදාන)

17. 'ත්වං යුවා බලසම්පන්නො, කිං තයා භතිං කත්වාපි යථා බලං දනං දතුං න වට්ටතීති.' (ධ. අ. පණ්ඩිතසාමණේර)

18. ' **සෙහි දරෙහි** සන්තුට්ඨො ..................... දීස්සති පරදරෙසු.'
(පරාභව සුත්ත)

19. 'පුත්තෙසු දරෙසු ච යා අපෙක්ඛා
එකං දළ්හං බන්ධනමාහු ධීරා.' (ධම්ම පද)

20. 'නිම්බකොසස්ස උදකපාතට්ඨානෙ ඨිතස්ස **මාතුගාමස්ස** සුප්පපාතො වා මුසලාපාතො වා සරූපචාරො නාම.' (විනය ඨුවා)

21. ' න ඛො පන මයං පස්සාම භොතො ගොතමස්ස යුගං වා නඞ්ගලං වා.......... අථ ච පන භවං ගොතමො එවමාහ.' (බ්‍රාහ්මණස.)

22. 'මාතුගාමෙසු පන විගතච්ඡන්දතාය තස්සා සාලාය මාතුගාමානං පත්ති නාදංසු.' (කුලාවක ජාතක.)
සංසරකඛිත, මාතුගාමෙ පහාරං දාතුං නාසක්ඛි. (ධ.අ.)

23. දීඝස්ස අද්ධුනො අච්චයෙන තස්ස මහානිරයස්ස පුරත්ථිමං ද්වාරං අවාපුරීයති.' ( දෙව දූත සුත්ත.)

24. සා ගද්දුලබද්ධො දළ්හෙ ඛිලෙ වා ථම්භෙ වා උපනිබද්ධො තමෙව ථම්භං වා ඛීලං වා අනුපරියායති.' (ඛන්ධ සංයුක්ත)

## ස්ත්‍රීලිංගික විශෙෂ ශබ්ද

### 28. ඉකාරාන්ත **රත්ති** = ශබ්දය

| | | |
|---|---|---|
| පඨ: | රත්ති ( = රෑ, රාත්‍රිය) | රත්තී, රත්තියෝ, රත්‍යො |
| දුති. | රත්තිං | රත්තී, රත්තියො, රත්‍යො |
| තති. පඤ්ච | රත්තියා, රත්‍යා | රත්තීහි, රත්තීභි |
| චතු. ඡට්ඨී | රත්තියා, රත්‍යා | රත්තීනං |
| සත්ත. | රත්තියා, රත්‍යා, රත්තියං රත්‍යං, රත්‍යො | රත්තීසු. |
| | (හෙ) රත්ති, | රත්තී රත්තියො, රත්‍යො. |
| ආල. | (හෙ) රත්තී, | රත්තී, රත්තියො, රත්‍යො |

### ස්ත්‍රීලිංගික විශෙෂ ශබ්ද

භූමි - නාභි ශබ්දයෝ ද ඇතැම් විට මෙසේ වරනැගෙති. 'රත්තො' යන්නට සමාන පදයක් ඒවාට නැත්තේය.

### 29. ඊකාරාන්ත නදී ශබ්දය

| | | |
|---|---|---|
| පඨ: ආල. | නදී (= ගඟ) | නදී, නදියො, නජ්ජො |
| දුති. | නදිං | නදී, නදියො, නජ්ජො. |
| තති. පඤ්ච | නජ්ජා, නදියා | නදීහි, නදීභි |
| චතු. ඡට්ඨි | නජ්ජා, නදියා | නදීනං |
| සත්ත. | නජ්ජං, නදියං, නදියා | නදීසු. |

### පොක්ඛරණී ශබ්දය

| | | |
|---|---|---|
| පඨ. ආල | පොක්ඛරණී (= පොකුණ) | පොක්ඛරණී, පොක්ඛරණියො, පොක්ඛරඤ්ඤො |
| දුති | පොක්ඛරණිං | පොක්ඛරණී, පොක්ඛරණියො, පොක්ඛරඤ්ඤො |
| තති. | පොක්ඛරණියා | පොක්ඛරණීහි, -ණීභි |
| පඤ්ච | පොක්ඛරඤ්ඤා | |
| චතු. ඡට්ඨි. | පොක්ඛරණියා, පොක්ඛරඤ්ඤා | පොක්ඛරණීනං |
| සත්ත | පොක්ඛරණියා, පොක්ඛරඤ්ඤා | පොක්ඛරණීසු· |
| | පොක්ඛරණියං, පොක්ඛරඤ්ඤං | පොක්ඛරණීසු·. |

### 30. ඌකාරාන්ත ජම්බු ශබ්දය

| | | |
|---|---|---|
| පඨ. ආල | ජම්බූ ( = දඹ) | ජම්බූ, ජම්බුයො |
| දුති. | ජම්බුං | ජම්බූ, ජම්බුයො |
| තති. | ජම්බුයා | ජම්බූහි, ජම්බූභි |

මේ ආදිය යාගු ශබ්දය මෙන් යෙදිය යුතු.

**භූ-වධූ-සරභූ- සරබූ-චමූ** ආදීහු ද ස්ත්‍රීවාචකවූ වදඤ්ඤූ කතඤ්ඤූ ආදීහු ද **ජම්බූ ශබ්දය** මෙන් වර නැගෙත්.

ඔකාරාන්ත ස්ත්‍රීලිංගික ශබ්ද නැත්තාහ. ගො ශබ්දය ස්ත්‍රී ලිඞ්ගයෙහි ද වැටේ යයි ඇතැම් කෙනෙක් කියත්.

# නපුංසක ලිංගික විශෙෂ ශබ්ද

## 31. අකාරාන්ත කම්ම ශබ්දය චිත්ත ශබ්දයට වෙනස්ව වර නැගේ

| | | |
|---|---|---|
| පඨ: | කම්මං (= කර්මය) | කම්මා, කම්මානි |
| දුති. | කම්මං | කම්මෙ, කම්මානි |
| තති. | කම්මෙන, කම්මුනා, කම්මනා | කම්මේහි, කම්මෙහි |
| චතු. ඡට්ඨී. | කම්මුනො, කම්මස්ස | කම්මානං |
| පඤ්ච | කම්මුනා, කම්මම්හා, කම්මස්මා | කම්මේහි, කම්මෙහි |
| සත්ත. | කම්මෙ, කම්මනී<br>කම්මම්හි, කම්මස්මිං | කම්මේසු |
| ආල. | (හෙ) කම්ම | (හෙ) කම්මා,<br>කම්මානි. |

චම්ම-සම්ම-වෙස්ම-හස්ම- පංසු ශබ්දයන්ගේ **චම්මනි-සම්මනි වෙස්මනි-හස්මනි - පංසුනි** යන සත්තමී එකවචන දක්නා ලැබේ.

## 32. ඌකාරාන්ත-ගොත්‍රභූ - ශබ්දය

| | | |
|---|---|---|
| පඨ. | ගොත්‍රභූ | ගොත්‍රභූ, ගොත්‍රභූනි |
| දුති. | ගොත්‍රභුං | ගොත්‍රභූ, ගොත්‍රභූනි |
| තති. | ගොත්‍රභුනා | ගොත්‍රභූහි, ගොත්‍රභුහි |
| චතු. ඡට්ඨී | ගොත්‍රභුනො, ගොත්‍රභුස්ස | ගොත්‍රභූනං |
| පඤ්ච | ගොත්‍රභුනා, ගොත්‍රභුම්හා<br>ගොත්‍රභුස්මා | ගොත්‍රභූහි, ගොත්‍රභුහි |
| සත්ත | ගොත්‍රභුම්හි, ගොත්‍රභුස්මිං | ගොත්‍රභූසු |
| ආල. | (හෙ) ගොත්‍රභු | (හෙ) ගොත්‍රභූ=<br>ගොත්‍රභූනි |

ගොත්‍රභූ නම් මාර්ග සිතට පළමු උපදනා සිතකි. පෘථග්ජන ගොත්‍රය මැඩ පවත්වන බැවින් එය ගොත්‍රභූ නම් වේ.

**චිත්තසහභූ - ශබ්දය ද මෙසේ වර නැගේ.**

නපුංසක ලිංගික විශෙෂ ෂබ්ද

# ත්‍රිලිංගික විශේෂ ශබ්ද

### 33. ස්වකීයාර්ථයෙහි පවත්නා ස - ශබ්දයක් තිබේ එය පුල්ලිඞ්ගයෙහි:

සො, සා, සං, සෙ, සෙන, සෙහි, සෙහි ආදි වශයෙන් පුරිස ශබ්දය මෙන් ද, නපුංසකයෙහි:

සං, සා, සානි, සං, සානි, සෙ ආදි වශයෙන් චිත්ත ශබ්දය මෙන් ද ස්ත්‍රීලිඞ්ගයෙහි වනිතා ශබ්දය මෙන් ද වර නැගේ.

සම්පත්-අර්ථයෙහි පවත්නා ස ශබ්දය පුල්ලිඞ්ග-නපුංසකලිඞ්ගයන්හි වේ.

34. කති - කතිපය ශබ්දයෝ තුන් ලිඟුවෙහි ම බහු වචනයෙහි වෙති.

| | පුල්ලිඞ්ග | ඉත්ථිලිඞ්ග | නපුංසකලිඞ්ග |
|---|---|---|---|
| පඨ | කති (පුරිසා) (= පුරුෂයෝ කී දෙනෙක්) | කති (ඉත්ථියො.) (ස්ත්‍රීහු කීදෙනෙක්) | කති (චිත්තානි) (= සිත් කීයක්) |
| දුති. | කති (පුරිසෙ) | කති (ඉත්ථියො) | කති (චිත්තානි) |
| තති පඤ්ච | කතීහි (පුරිසෙහි) | කතීහි (ඉත්ථීහි) | කතීහි (චිත්තෙහි) |
| චතු. ඡට්ඨි | කතීනං (පුරිසානං) | කතීනං (ඉත්ථීනං) | කතීනං(චිත්තානං) |
| සත්ත | කතීසු (පුරිසෙසු) | කතීසු (ඉත්ථීසු) | කතීසු (චිත්තෙසු) |

කතිපය - ශබ්දය පුල්ලිඞ්ගයෙහි පුරිස ශබ්ද- බහුවචන මෙන් ද ඉත්ථිලිඞ්ගයෙහි වනිතා ශබ්ද-බහුවචන මෙන් ද නපුංසකයේ දී චිත්තශබ්ද බහුවචන මෙන් ද වරනැගිය යුතු.

කතිපයා පුරිසා 'පුරුෂයෝ කීප දෙනෙක්' ආදී වශයෙන් අර්ථ දත යුතුයි.

35. ඞි-ශබ්දයට සමාන අර්ථ ඇති සර්වනාමික උභ-ශබ්දය හැම කල්හි බහු වචනාන්තයි.

| | | | |
|---|---|---|---|
| පඨ: | උභො (දෙදෙන,) | චතු ඡට්ඨි. | උභින්නං |
| දුති | උභො | පඤ්ච. | උභොහි, උභොභි |
| තති | උභොහි, උභොභි | සත්ත. | උභොසු. |

තුන් ලිඟුවෙහි ම සමාන ලෙස වරනැගේ.

## උදාහරණ iii

1. 'සෙහි දාරෙහි' සන්තුට්ඨො වෙසියාසු පදිස්සති' (පරාභවසුත්තං)
2. A. ' නෙව මං බාධයිස්සන්ති සම්හි ධම්මෙ පතිට්ඨිතං' (සං නි.)
   B. 'විප්පසන්නමනා සන්තා අට්ඨංසු සම්හි ආසනෙ.' (ජනවසභ. දීඝ)
3. සාමිකා යත්ථ යත්ථෙව සාති පස්සෙය්‍යුං, තත්ථ තත්ථෙව සාති හරෙය්‍යුං. (ම. i. 366)
4. 'නජ්ජො යථා නරගණසඞ්ඝසෙවිතා පුථූ සවන්ති උපයන්ති සාගරං' (සොතාපත්තිසං)
5. 'තෙන සමයෙන බුද්ධො භගවා උරුවෙලායං විහරති. නජ්ජා නෙරඤ්ජරාය තීරෙ බොධි රුක්ඛමූලෙ' (විනයමහා වග්ග)
6. 'ආරාමචෙත්‍යා වනචෙත්‍යා පොක්ඛරඤ්ඤො සුනිම්මිතා මනුස්ස රාමණෙය්‍යස්ස කලං නාග්ඝන්ති සොළසිං. (සක්කසංයුත්ත)
7. 'කම්මුනා වත්තතෙ ලොකො කම්මුනා වත්තතෙ පජා' (සුත්තනිපාත)
8. 'අකම්මනා දෙවසෙට්ඨ, සක්ක,විජෙඤ්ඤු යං සුඛං.' (සක්කසංයුත්ත)
9. 'උභො ජඞ්ඝුකසන්ධිහි ජඞ්ඝායො පපතන්තු මෙ' (ථෙරගාථා)
10. 'මයං උභොපි හත්ථිං කත්වා එකස්ස භික්ඛං දස්සාමාති වත්වා උභොපි ගෙහා නික්ඛමිත්වා හත්ථට්ඨානං අගමංසු.' (ධ. අ. පණ්ඩිත සාමණේර)
11. 'තතො රත්‍යා විවසානෙ සුරියුග්ගමනං පති ඉන්දෙ බ්‍රහ්මා ච ආගන්ත්වා මං නමස්සිංසු පඤ්ජලී.' (සුනීතථෙර ගාථා)
12. 'යථාපි භද්දෙ ආජඤ්ඤො ධුරෙ යුත්තො ධුරස්සහො මථිතො අතිභාරෙන සං යුගං නාති වත්තති' (ගොදත්ත ථෙර ගාථා)

13. අසමෙක්ඛිතකම්මන්තං තුරිතාභිනිපාතිනං
සානි කම්මානි තප්පෙන්ති උණ්හංව'ජ්ඣොහිතං මුඛෙ (සීගාලජාතක)

14. 'අලීනචිත්තං නිස්සාය පහට්ඨා මහතී චමූ
කොසලං සෙන'සන්තුට්ඨං ජීවගාහං අගාහයි.' (අලීන චිත්තජාතක)

15. 'තෙසං දිවා ච රත්තෝ ච' සදා පුඤ්ඤං පවඩ්ඪති.' (සංයුත්තනි)

16. 'එකපණ්ණො අයං රුක්ඛො, න භූම්‍යා චතුරඞ්ගුලො'
(එකපණ්ණ ජාතක)

17. 'කති ජාගරතං සුත්තා? කති සුත්තෙසු ජාගරා?
කතීහි රජමාදෙති? කතීහි පරිසුජ්ඣති?' (දෙවතාසං)

18. 'යං රාජතො හොති භයං මහන්තං
සබ්බස්සහරණාදිවධාදිකං ච,

අකතඤ්ඤුතා' සප්පුරිසෙන හොති.
තෙනෙව සො හෝ පරිවජ්ජනීයො.' (රසවාහිනි)

19. 'වාරිං යථා සමමති සමමතත්තො
වාචාභිකංඛාමි, සුතං පවස්ස (වංගීසථෙර ගාථා)

20. අප්පමත්තො උභො අත්ථෙ අධිගණ්හාති පණ්ඩිතො.'
(කොසල සංයුත්ත)

21. 'පරිසුස්සති ඛිප්පමිදං කලෙබරං
පුප්ඵං යථා පංසුනි ආතපෙ කතං' (කායවිච්ඡන්දිකජාතක)

22. 'මානො හි තෙ බ්‍රාහමණ ඛාරිභාරො,
කොධො ධූමො: භස්මනි මොසවජ්ජං' (පුණ්ණක සුත්තනිද්දෙස)

## පළමු පොත්වල නොදැක්වූ සව් නාමයෝ

උකාරාන්ත අමු- ශබ්දය (අමු=අසුවල්, අසවල්.) පුල්ලිඞ්ගයෙහි

| | | |
|---|---|---|
| පඨ. | අසු, අසුකො අමු. අමුකො (=අසවලා) | අමූ, අමුකා, අසුකා, (අසවල්ලු) |
| දුති. | අමුං, අමුකං, අසුකං | අමූ, අසුකෙ, අමුකෙ. |
| තති. | අමුනා, අමුකෙන අසුකෙන | අමූහි, අමූභි, අසුකෙහි,-භි, අමුකෙහි, අමුකෙභි |
| චතු, ඡට්ඨී. | අමුනො, අමුස්ස අමුකස්ස, අසුකස්ස | අමූසං, අමූසානං, අසුකානං, අමුකානං |
| පඤ්ච. | අමුනා, අමුම්හා, අමුස්මා, අමුකම්හා,-ස්මා, අසුකම්හා, අසුකස්මා | අමූහි, අමූභි , අසුකෙහි, -භි, අමුකෙහි, අමුකෙභි |

සත්ත. අමුම්හි, අමුස්මිං, අමුකම්හි,
අමුකස්මිං, අසුකම්හි,
අසුකස්මිං } අමූසු, අසුකෙසු, අමුකෙසු

ඉත්ථිලිඞ්ගයෙහි:

පඨ. අසු, අසුකා, අමු, අමුකා { අමූ, අමුයො, අසුකායො, අමුකායො.

දුති. අමුං, අමුකං, අසුකං { අමූ, අමුයො, අසුකායො, අමුකායො,

තති. පඤ්. අමුයා, අමුකාය,
අසුකාය { අමූහි, අමූභි, අසුකාහි, අසුකාභි,
අමුකාහි, අමුකාභි, අමුකාහි.

චතු. ඡට්ඨි. අමුස්සා, අමුයා,
අසුකාය, අමුකාය } { අමූසං, අමූසානං, අසුකානං,
අමුකානං

සත්ත අමුස්සං, අමුයං, අමුයා,
අසුකාය, අමුකාය,
අසුකායං, අමුකායං } අමූසු, අසුකාසු, අමුකාසු

නපුංසකයෙහි:

පඨ. දුති. අදුං, අසුකං, අමුකං, අදූනි, අසුකානි, අමුකානි
තති අමුනා, අමුකෙන,
අසුකෙන } අමූහි, අමූභි, අසුකෙහි-භි,
අමුකෙහි - භි
සෙස්ස පුල්ලිංගයෙහි මෙනි.

## 37. නිග්ගහීතාන්ත කිං - ශබ්දය.

පුල්ලිංගයෙහි:

| | | |
|---|---|---|
| පඨ. | කො(- කවරෙක්.) | කෙ. |
| දුති. | කං | කෙ. |
| තති. | කෙන | කෙහි, කෙභි. |
| චතු. ඡට්ඨි. | කස්ස, කිස්ස, කිස්සස්ස | කෙසං, කෙසානං |
| පඤ්ච. | කම්හා, කස්මා | කෙහි, කෙභි |
| සත්ත. | කම්හි, කස්මිං, කිම්හි, කිස්මිං | කෙසු |

පළමු පොත්වල නොදැක්වූ සර්ව නාමයෝ

ඉත්ථිලිංගයෙහි:

| | | |
|---|---|---|
| පඨ. | කා (= කවරියක්.) | කා, කායො |
| දුති. | කං | කා, කායො |
| තති. | කාය | කාහි, කාභි |
| චතු, ඡට්ඨි. | කස්සා කාය | කායං, කාසානං |
| පඤ්ච. | කස්සා, කාය | කාහි, කාභි |
| සත්ත. | කස්ස, කාය, කස්සං, කායං | කාසු |

නපුංසකයෙහි:

| | | |
|---|---|---|
| පඨ. | කං, කිං (කුමක්, කවරක්) | කානි |
| දුති. | කං, කිං | කානි |

සෙස්ස පුලිංගයෙහි මෙනි.

38. විභත්‍යන්ත වූ කිං ශබ්දය කෙරෙන් අනියමාර්ථයෙහි වූ චි චන යන නිපාතයන් යෙදීමෙන් සිඩ වූ කෝචි කෝචන ආදී පද ඇත්තාහ. මෙය වනාහි කිං ශබ්දයට පමණක් අයත් සිඩියක් සේ පෙනේ.

පුලිංගයෙහි:

| | | |
|---|---|---|
| පඨ. | කොචි | කෙචි, කෙචන. |
| දුති. | කඤ්ච, කිඤ්චි, කිඤ්චනං, | කෙචි, කෙචන |
| තති. | කෙනචි | කෙහෙචි |
| චතු. ඡට්ඨි. | කස්සචි | කෙසඤ්චි |
| පඤ්ච. | ....(අවිද්‍යමානයි) | කෙහිචි |
| සත්ත. | කිස්මිචි, කිසමිඤ්චි | කෙසුචි |

ඉත්ථිලිංගයෙහි:

| | | |
|---|---|---|
| පඨ. | කාචි | කාචි |
| දුති. | කඤ්චි, කිඤ්චි | කාචි |
| තති. පඤ්. | කායචි, කස්සාචි | කාසඤ්චි |
| සත්ත | කායචි | කාසුචි |

නපුංසකයෙහි:

| | | |
|---|---|---|
| පඨ. දුති. | කිඤ්චි | කානිචි |

සෙස්ස පුලිඟුවෙහි මෙනි.

39. සර්ව නාමයන් අතුරෙහි දක්වන ලද්දේ එක ශබ්දය පමණක් වුවත් එක ශබ්දයාගේ අර්ථයන් අතුරෙන් 'ඇතැම්' යන අර්ථයෙහි

වැටෙන - එකච්ච = එකතිය එකච්චිය යන ශබ්ද තුනක් ද විද්‍යමාන වේ.

එකච්ච - ශබ්දය.

පුලි‍ංගයෙහි:

| | | |
|---|---|---|
| පඨ. | එකච්චා (ඇතැමෙක්) | එකච්ච (ඇතැම් කෙනෙක්) |
| දුති. | එකච්චං (=ඇතැමෙකු) | එකච්ච (ඇතැමුන්) |

සෙස්ස පුරිස ශබ්දය මෙනි. (ආලපනයක් නැති බව සැලකිය යුතු)

ඉත්ථිලිංගයෙහි:

පඨ. එකච්චා එකච්චා, එකච්චායො.

ආදී වශයෙන් වනිතා ශබදය මෙන් වර නැගි යුතු.

නපුංසකයෙහි:

පඨ. දුති. එකච්චං එකච්චානි

ආදිය චිත්තශබ්දය මෙනි.

එකච්චිය ශබ්දය

පුලලිංග. පඨ. එකච්චියො (= ඇතැමෙක්) එකච්චියා

දුති. එකච්චියං එකච්චියෙ

ආදිය පුරිස - ශබ්දය මෙනි.

ඉත්ථිලිංග එකච්චියා එකච්චියා, එකච්චියායො

ආදිය වනිතා ශබ්දය මෙනි.

එකතිය ශබ්දය

පුලලි. පඨ. එකතියො (=ඇතැමෙක්) එකතියා.

දුති. එකතියං එකතියෙ.

සෙස්ස පුරිස ශබ්දය මෙනි.

ඉත්ථි ලිංග. එකතියා එකතියා, එකතියායො

වනිතාශබ්දය මෙනි.

නපුංසක. එකතියං එකතියානි

චිත්ත ශබ්දය මෙනි.

ඇතැම් සර්ව නාම

40. අම්හ - තුම්හ - ශබ්දයන් ගැන කියයුතු විශේෂ :-

අම්හ - ශබ්දයාගේ ප්‍රථමා බහු වචනයෙහි නො ආදෙශය ද තුම්හ ශබ්දයාගේ ප්‍රථමා බහුවචනයෙහි වො ආදේශය ද විද්‍යමාන වේ. ඒ ශබ්දයන්ගේ ද්විතීයා-තෘතීයා-සම්ප්‍රදාන-සම්බන්ධ විභක්තීන්හි ඒ ආදේශකයෝ පළමු පොතේ දක්වන ලදහ. මේ සියල්ලම වාක්‍යයක මැද හෝ අග මිස මුල නොයෙදිය යුතු.
'නො ගාමං ගවෙජයාම' යි යෙදීම යුතු නොවේ.
'ගාමං නො ගවෙජයාම' යෙදිය හැකිවේ.

## උදාහරණ iv

1. 'න විස්සසෙ එකතියෙසු එවං
අගාරීසු පබ්බජිතෙසු චාපි' (සාරිපුත්තථෙර ගාථා)
2. 'අජ්ජා'හං සච්චනාමො' මිහි න නං හිංසාමි කිඤ්චනං'
(අංගුලිමාලථෙර ගාථා)
3. 'සච්චංකිරෙවමාහංසු නරා එකච්චියා ඉධ;
කට්ඨං උප්ලාවිතං සෙය්‍යො, නත්වෙ'වේ' කච්චියො නරො'
(සච්චංකිර ජාතක.)
4. 'ඉධාහං භික්ඛවෙ එකච්චං පුග්ගලං එවං චෙතසා චෙතො
පරිච්ච පජානාමි' (සං. නි.)
5. 'එකච්චෙ භික්ඛූ සුසානං පක්කමිංසු පංසුකූලාය' (විනය මහා වග්ග)
6. 'න භික්ඛවෙ සුතවතො අරියසාවකස්ස එවං හොති' කින්නුඛො
කිස්මිං අසති කිං න හොති, කිස්ස නිරෝධා කිං, නිරුජ්ඣතීති
(සං. නි.)
7. 'තස්ස මය්හං භික්ඛවෙ එතදහොසි; කිම්හි නු ඛො සති ජරා
මරණං හොති, කිම්පච්චයා ජරාමරණන්ති' (නිදාන සං)
8. 'පටිච්චසමුප්පාදං වො භික්ඛවෙ දෙසිස්සාමි, තං සුණාථ සාධුක
මනසිකරොථ' (නිදාන සංයුත්ත)
9. 'ඉධ මහාරාජ එකච්චො පුග්ගලො උච්චෙ කුලෙ පච්ඡා ජාතො
හොති' (කොසලසංයුත්ත)
10. 'යෙහි කෙචි මහාරාජ කායෙන දුච්චරිතං චරන්ති.......
තස්මා තෙසං අප්පියො අත්තා.' (කොසල සංයුත්ත)
11. 'කිංසු ඡෙත්වා සුඛං සෙති? කිංසු ඡෙත්වා න සොචති?
කිස්සස්ස එකධම්මස්ස වධං රොචේසි ගොතම?' (දෙවතාසංයුත්ත.)

12. 'අත්ථි නුඛො භන්තෙ කිඤ්චි රූපං, කාචි වෙදනා, කාචි සඤ්ඤා, කෙචි සංඛාරා, කිඤ්චි විඤ්ඤාණං නිච්චං? (ඛන්ධසංයුත්ත)
13. 'අහං අසුකො අසුකස්ස ඤාතකො සුහදොති ආදිනි වත්වා සල්ලපන්තේපි තෙන සඞ්ං කථා න කාතබ්බා' (රසවහිනි.)
14. 'අජ්ජ බො ගාවො අමුකස්මිං අමුකස්මිංච පදෙසෙ චරිංසු' (අං., විසාඛුපොසථ)
15. 'යො වො ආනන්ද මයා ධම්මො ච විනයො ච පඤ්ඤත්තො, සො වො මමච්චයෙන සත්ථා' (මහාපරිනිබ්බාණං දීඝ.)
16. 'සුතමෙතං භන්තෙ, භගවා කිර පරිතො පරිතො ජන පදෙසු පරිචාරකෙ............... උපපත්තීසු ව්‍යාකරොති........... අසු අමුත්‍ර උප්පන්නො, අසු අමුත්‍ර උපපන්නොති' (දීඝ. ජනවසභ)

## සංඛ්‍යා ශබ්දයෝ

සංඛ්‍යාවන් පිළිබඳ කරුණු ස්වල්පයක් පළමුවෙනි පොතෙහි දක්වන ලදී.

41. වීසති ශබ්දය මෙසේ වරනැගේ

| | එකවචන | | එකවචන |
|---|---|---|---|
| පඨ. | වීසති | | |
| දුති. | වීසති | චතු. / ඡට්. | වීසතියා. |
| තති. / පඤ්ච. | වීසතියා | සත්ත. | වීසතියං |

තිංසති - සට්ඨි - සත්තති - අසීති - නවුති - කොටි යන මොහු ද මෙසේ වරනැගෙත්.

වීසං - තිංසං - චත්තාළීසං - පඤ්ඤාසං - පණ්ණාසං යි නිග්ගහීතාන්ත ප්‍රථමා එකවචනයද විද්‍යමාන වේ. එය නිග්ගහීතය නැතුව වීස - තිංස - චත්තාළීස - පඤ්ඤස යිද සිටී.

| | | | |
|---|---|---|---|
| පඨ. | වීසං: වීස | | |
| දුති. | වීසං | චතු. / ඡට්. | වීසාය |

| | | | |
|---|---|---|---|
| තති. } පඤ්ච. } | වීසාය | සත්ත. | වීසායං |

ඉතිරි ශබ්ද තුන ද මෙසේ වරනැගේ.

42. සත - සහස්ස - ශබ්දදිය සාමාන්‍යයෙන් නපුංසක එක වචනයෙන් සිටින නමුත් ඔවුන්ගේ බහු වචන ද බොහෝ තැන්හි තිබෙත්. එබැවින් සත ශබ්දය මෙසේ වර නැගිය යුතු :-

| | එක: | බහු: |
|---|---|---|
| පඨ. | සතං | සතා, සතානි |
| දුති. | සතං | සතෙ, සතානි |
| තති. | සතේන | සතෙහි, සතෙභි |
| චතු. ඡඨි. | සතස්ස | සතානං |
| පඤ්චමි. | සතා, සතම්හා, සතස්මා- | සතෙහි, සතෙභි |
| සත්තමි. | සතෙ, සතම්හි, සතස්මිං- | සතෙසු |

43. උසස් සංඛ්‍යාවෝ

| | |
|---|---|
| සත සහස්ස, ලක්ඛ | 100000 |
| දස ලක්ඛ | 1000000 |
| කොටි | 10000000 |
| දස කොටි | 100000000 |
| පකොටි | 100,000,000,000,000 |
| කොටිපකොටි | 100,000,000,000,000,000,000, |
| නහුත[1] | බින්දු 29. |
| නින්නහුත | බින්දු 36. |
| අක්ඛොභිණී | බින්දු 43. |
| බින්දු................................ | බින්දු 50. |
| අබ්බුද................................ | බින්දු 57. |
| නිරබ්බුද ............................ | බින්දු 64. |
| අහහ ................................ | බින්දු 71. |
| අබබ ............................... | බින්දු 78. |
| අටට ................................ | බින්දු 85. |
| සොගන්ධික........................ | බින්දු 92. |

[1] දසදහටද නහුත යයි නමකි.

උප්පල ................................ බින්දු 99.
කුමුද ................................ බින්දු 106.
පුණ්ඩරීක ........................ බින්දු 113.
පදුම ................................ බින්දු 120.
කථාන ................................ බින්දු 127.
මහාකථාන ...................... බින්දු 134.
අසංඛෙය්‍ය ......................... බින්දු 141.

පසුපසුව තිබෙන ගණන ලැබෙන්නේ මුලින් තිබෙන ගණන සියක් ලක්‍ෂයෙන් වැඩි කිරීමෙනි. අක්ඛොභිණී ශබ්දය හැර ඉතිරි ශබ්දය සත-ශබ්දය මෙන් වර නැගිය යුතු.

44. එකූනවීසති ශබ්දය පටන් සංඛ්‍යා ශබ්දයන්ට නියත ලිංග ඇති හෙයින් ඔවුහු අන්‍ය ලිංගික ශබ්දයන්ට විශේෂණ වන විට ඒ විශෙෂ්‍ය පදයන්ගේ ලිංගය නොගෙන ස්වකීය ලිංගයෙන් සිටිත්.

1. 'යෙසං ඛො විසාඛෙ සතං පියානි, සතං තෙසං දුක්ඛානි: යෙසං නවුති පියානි, නවුති තෙසං දුක්ඛානි: යෙසං අසීති පියානි.......... යෙසං පඤ්ඤාසං පියානි.................... යෙසං චත්තාරීසං පියානි, ............ යෙසං තිංසං පියානි, යෙසං වීසං පියානි.......... යෙසං දස පියානි........ යෙසං නව පියානි.................... යෙසං චත්තාරි පියානි...................... යෙසං තීණි පියානි.......... යෙසං ද්වෙ පියානි ද්වෙ තෙසං දුක්ඛානි.' උදානපාලි (විශාඛාවනි, යමකුට ප්‍රියවස්තු සියයක් වේ නම් ඔහුට දුක්ද සියයක් වේ. යමකුට ප්‍රිය වස්තු අනූවක් වේ නම් ඔහුට දුක් අනූවක් වේ යනාදී වශයෙන් මේ වාක්‍යයාගේ අර්ථ දත යුතුයි.)

මෙහි සතං යන එකවචනය 'පියානි', 'දුක්ඛානි' යන බහුවචනවලට විශේෂණ වේ. නවුති - අසීති-සත්තති-සට්ඨි-පඤ්ඤාසං-චත්තාරීසං-තිංසං-වීසං යන මොහු ස්ත්‍රීලිංග එක වචනයෙන් සිට 'පියානි දුක්ඛානි' යන නපුංසක බහුවචනයන්ට විශේෂණ වෙති. 'දස-නව-සත්ත-ඡ-පඤ්ච' යන මොවුන් තුන් ලිඟුවෙහි වැටෙන හෙයින් ද බහු වචනයෙන් පමණක් යුක්ත හෙයින් ද මෙහිදී නපුංසක බහුවචන වෙතියි දත යුතු. 'චත්තාරි = තීණි-ද්වෙ යන මොහු ද එසේම නපුංසක බහු වචන වෙති.

2. 'දස පි වීසතිම්පි තිංසම්පි දෙවතා සුඛුමෙ සුඛුමෙ අත්ත භාවෙ මාපෙත්වා අඨංසු' (=දේවතාවෝ දස දෙනෙක් ද විසි දෙනෙක් ද තිස්

දෙනෙක් ද සියුම් සියුම් අත් බැවි මවාගෙන සිටියහ. (මහා සමයුත්තවිධ කථා) මෙහි දස-ශබ්දය ස්ත්‍රී ලිංග බහු වචනාන්තයි. 'වීසතිං-තිංසං' දෙක ස්ත්‍රී ලිංග එක වචනවැ සිට 'දෙවතා' යන බහු වචනයට විශෙෂණ වේ.

3. සාපි ද්වත්තිංස සුණිසායො පක්කෝසාපෙත්වා.....ඔවදි'. (-ඕ-බන්ධුලමල්ලිකා - දෙතිස් ලේලියන් කැඳවා.......... අවවාද කළේය.) ධ.අ.

4. 'මනුස්සානං වාරෙන්තානං වාරෙන්තානං යෙව සට්ඨිසහස්සා බලවගාවො සට්ඨිසහස්සා ච ධෙනුයො නික්ඛන්තා' -මිනිසුන් වලක්වන කල්හිම හැට දහසක් දෙන්නු ද නික්මුණාහ) - විසාඛාවත්ථු. මෙහි සට්ඨිසහස්සා යන නපුංසක බහුවචනය පළමුවර පුල්ලිංග බහුවචනයටද දෙවැනි වර ස්ත්‍රීලිංග බහුවචනයට ද විශේෂණ වේ.

5. 'මහාඑකසාටකො චතුසට්ඨියා සාටකයුගෙසු ද්වෙ අග්ගහෙසි. අයං පන බත්තිංසාය ලද්ධකාලෙ ද්වෙ අග්ගහෙසි' (-මහා එකසාටක තෙමේ වස්ත්‍ර ජෝඩු සිවු සැටක් ලැබුණු කල්හි දෙකක් ගත්තේය. මේ තෙමේ දෙතිසක් ලැබුණ කල්හි දෙකක් ගත්තේය) - චූලෙකසාටක. ධ. අ.

45. 6 'කොටිසතානං නවුතීනං අසීතියා ච කොටිනං
එතෙ ආසුං තයො ඨානා විමලානං සමාගමෙ'

(-රහතන් වහන්සේගේ සමාගමයෙහි සියක්කෝටියකගේ ද අනූකෝටියකගේ ද අසූකෝටියකගේ දැයි රැස්වීම් තුනක් විය.) - බුඩවංශ පාළි. මෙහි නවුතීනං යි නවුතිශබ්දයාගේ බහුවචනය පෙනේ.

7. 'එකතිංසෙ ඉතො කප්පේ යං ච මෙ සරණං අදා'
- (සරණාගමනියත්ථෙරාපදාන 359)

යනාදි වශයෙන් අපදානපාළියෙහි නොයෙක් තැන නවුතෙ තිංසෙ වීසෙ ආදී සත්තමී එකවචන දක්නා ලැබේ. එවැනි තැන්හි ලිංග විපර්‍ය්‍යාසයයි සැලකිය යුතු.

8. 'ථෙරො අත්තනො පඤ්චසතාය පරිසාය පරිවුතො රාජ ගහං ගතො' යන දික්සඟි අටුවා පාඨයෙහි පෙනෙන 'පඤ්ච සතාය' යන්න ලිංගවිපර්‍ය්‍යාසයයි හෝ 'පඤ්චසතානි යස්සා සා පඤ්චසතා' (-පන්සියයක් යමකට ඇත්ද ඒ පිරිස 'පඤ්චසතා' නම් වේ.) යනා කාරයෙන් සිඬවූ බහුව්‍රීහි සමාසයයි හෝ සැලකිය යුතු.

## උදහරණ V

1. 'ඉතො මාරිසා වස්සසහස්සස්ස අච්චයෙන සබ්බඤ්ඤූ බුද්ධො ලොකෙ උප්පජ්ජිස්සති' (බුද්ධවංසට්ඨකථා.)
2. 'තදා වීසතියා කොටිසහස්සානං පඨමො ධම්මාභිසමයො අහොසි' (බුද්ධවංසට්ඨකථා.)
3. 'පඤ්චදසාය භික්ඛූසු ද්වෙපි භික්ඛූ එකොකාසෙ නාද්දසංසු' (දීඝට්ඨකථා 539)
4. පඤ්චසතා අච්ඡරායො රුක්ඛතො පුප්ඵානි ඔචිනන්තියො චවිත්වා නිරයෙ උප්පන්නා' (දීඝට්ඨකථා 539)
5. 'චත්තිංසාය පුත්තෙහි සද්ධිං සීසං ඡින්දිත්වා ආහරථාති තෙන සද්ධිං අඤ්ඤෙපි සමත්ථෙ යොධෙ පෙසෙසි' (විඩූඩභ ධ.අ.)
6. 'සට්ඨියා නගරසහස්සෙසු නවනවුතියා දොණමුඛ සහස්සෙසු ඡන්නවුතියා පට්ටනකොටිසතසහස්සෙසු ඡප්පණ්ණාසාය රතනා කරෙ සුති සකලජම්බුදීපෙ....... දෙවතා සන්නිපතිතා'. (මහාසමයසුත්තට්ඨකථා)
7. 'තාසං පරතො වීසති වීසති, තාසං පරතො තිංසති තිංසති, තාසං පරතො චත්තාරීසං චත්තාරීසං, තාසං පරතො පඤ්චදසං පඤ්චදසං, තාසං පරතො සට්ඨි සට්ඨි දෙවතා අට්ඨංසු' (මහාපරිනිබ්බාණ සුත්තට්ඨකථා)
8. 'අනෙකවිහිත, පුබ්බෙනිවාසං අනුස්සරති, සෙය්‍යථීදං? එකම්පි ජාතිං, ද්වෙපි ජාතියො, තිස්සොපි ජාතියො, චතස්සොපි ජාතියො..... දසපි ජාතියො, වීසංපි ජාතියො, තිංසම්පි ජාතියො, චත්තාළිසම්පි, ජාතියො, පඤ්චදසම්පි ජාතියො, ජාතිසතම්පි, ජාති සහස්සම්පි අනෙකා නිපි ජාතිසතානි, අනෙකානිපි ජාතිසහස්සානි' (බ්‍රහ්මජාල සු. දී)
9. 'අඤ්ඤං වස්සසතං අප්පත්වා වීසතිං වා තිංසං වා චත්තාළීසං වා පණ්ණාසං වා සට්ඨිංවා වස්සසතං ජීවති.... අනුරුද්ධ ථෙරො පන වස්සසතංචෙව පණ්ණාසං ච වස්සානි, බක්කුල ථෙරෝ වස්සසතං චෙව සට්ඨි ච වස්සානි ජීවි. (මහාපදානසුත්තට්ඨකථා)
10. A. 'වීසතියා භික්ඛුසහස්සානම්පි වීසති චීවරසහස්සානි අදංසු'
    B. 'ඉතො වීසංයොජනසතමත්ථකෙ සාවත්ථි නාම නගරං (මහකනප්පිතවත්ථු ධ. අ.)
11. 'සත්ත ච නහාතක සතානි චත්තාරිසා ච භරියා සාදිසියො අනෙකානි ච ඛත්තියහස්සානි................. අනුපබ්බජිංසු.' (මහාගොවින්දසුත්ත.)

### 46. ඇතැම් ශබ්දයන්ගේ විශේෂතා

A. අරහන්ත - මහන්ත - බ්‍රහන්ත ශබ්දයෝ ගච්ඡන්ත ශබ්දය මෙන් වර නැගෙත්. ඔවුන්ගේ ප්‍රථමා එකවචනයෙහි අරහා, මහා, බ්‍රහා යන පද විද්‍යමාන වේ.

B. ජන්තු ශබ්දය ගරු ශබ්දය මෙන් වර නැගෙතත් පඨමා දුතියා බහුවචනයන් හි ජන්තුනො, ජන්තුයො, යන පද දක්නා ලැබේ.

C. ආදී ශබ්දය අග්ගි මෙන් වර නැගෙතත් සත්තමී එක වචනයෙහි ආදි ආදො යන පද ඇත.

D. බ්‍රහ්මචාරී ශබ්දය පක්ඛී ශබ්දය මෙන් වර නැගිය යුතුය. එහි පඨමා - දුතියා බහුවචන බ්‍රහ්මචාරිනො විය යුතු වුවත් ඇතැම් තැනක බ්‍රහ්මචාරයො යන පදය දක්නා ලැබේ.

E. දීප ශබ්දයේ - පඨමා දුතියා බහුවචන දීපයො යි සිටින නමුත් ඇතැම් තැනක දීපිනො යන්න දක්නා ලැබේ.

F. මනොගණික ඇතැම් ශබ්දයන්ගේ ඔ-කාරාන්ත දුතියා එක වචනයක් පෙනේ. අයො, චෙතො, වචො, සිරො, ආදී වශයෙනි.

G. සෙය්‍ය ශබ්දය තුන් ලිඟුවෙහි වර නැගෙන විශේෂණ පදයකි. නමුත් හැම ලිංගයෙහිත් සංඛ්‍යාවන්හිත් වෙනස් නොවී යෙදෙන සෙය්‍යා යන්නක් ද පෙනේ. එය නිපාතයක් සේ ගත යුතු.

H. වර ශබ්දයද ගුණ වචනයකි. නමුත් ලිංගවිශෙෂය නොසලකා වරං යි යෙදෙන පදයක් වේ. එයද නිපාතයකි.

## උදාහරණ vi

1. 'අහං හි අරහා ලොකෙ, අහං සත්ථා අනුත්තරො.'
-(විනය මහා වග්ග.)

2. 'තථෙව ඉසයො හිංසං සඤ්ඤතෙ බ්‍රහ්මචාරයො
අධම්මචාරී ඛත්තියො සො සගෙහ විරුජ්ඣති.'
-(මහාබෝධි ජාතකය)

3. 'පුබ්බෙ දීපිනො එළකෙ ඛාදන්ති, අහම්පන එළකෙ දීපිනො
අනුබන්ධිවා මුරු මුරුති ඛාදනෙත අද්දසං.' (මහාසුපින ජාතකය)

4. 'සො පරසත්තානං පරපුග්ගලානං චෙතසා චෙතො පරිච්ච
පජානාති.' (දීඝ. සාමඤ්ඤඵල.)

5. බාලා කුමුදනාළෙහි පබ්බතං අභිමන්ථථ,
ගිරිං නඛෙන ඛණථ; අයො දන්තෙහි ඛාදථ.' (මරාසං)

6. පසන්නනෙත්තො සුමුඛො බ්‍රහා උජු පතාපවා
මජ්ඣෙ සමණසංඝස්ස ආදිච්චො ච විරොචති.' (සු.නි. 108)

## පාලිභාෂාවතරණය iii

7. කස්සපස්ස වචො සුත්වා අලාතො එතදබ්‍රවි.' (මහානාරදකස්සපජා.)
8. 'සො ඛො පනා' යං අකඛාතො වෙපුල්ලො පබ්බතො මහා
උත්තරො ගිජ්ඣකුටස්ස මගධානං ගිරිබ්බජෙ.' (සං.ii 185)
9. 'වරමස්සතරා දන්තා ආජානීය ච සින්ධවා;
කුඤ්ජරා ච මහානාගා; අත්තදන්තො තතොවරං'
10. 'වරං තෙ භික්ඛු තිණ්හෙන ගොවිකත්තනෙන කුච්ඡි පරිකන්තො,
නත්වෙව යා රත්තන්ධකාර-තිමිසායං කුච්ඡිහෙතු පිණ්ඩාය චරණා.'
(ම.i 449)
11. 'ගරහාව සෙය්‍යො විඤ්ඤූනං, යංචෙ බාලප්පසංසනා.'
(ගොදත්තථෙර ගාථා)
12. 'එකාහං ජීවිතං සෙය්‍යො විරියමාරභතො දළ්හං.' (ධම්ම පද 112)

# තෘතීය පරිච්ඡේදය

# විභක්ත්‍යර්ථ විභාගය

## 1. ප්‍රථමා

47. පඨමා විභත්තිය උක්තාර්ථයෙහි වේ. උක්තාර්ථය නම් ආඛ්‍යාතපදය විසින් දක්වන ලද ප්‍රථම පුරුෂාදිය හා එක වචනාදියයි.

"පුරිසො රුක්ඛං ඡින්දති" යන තැන 'ඡින්දති' යන්නේ ප්‍රථම පුරුෂත්වයෙන් ද එකවචනත්වයෙන් ද 'පුරිසො' යන්න උක්ත වේ. එබැවින් එහි ප්‍රථමාව යෙදේ. ඒ 'පුරිසො' යන්න **උක්ත කර්තෘ** නැමැත්තේ ද වේ.

"පුරිසෙන රුක්ඛො ඡින්දියති" යන තැන 'ඡින්දියති' යන කර්ම කාරක ක්‍රියාවෙන් 'රුක්ඛො' යන කර්ම පදය උක්ත වේ. එබැවින් එහිත් ප්‍රථමාව යෙදේ. එය **උක්ත කර්ම** නැමැත්තේ ද වේ.

48. කර්තෘ වනාහි (1) ශුද්ධ කර්තෘය (2) හෙතු කර්තෘය (3) කර්මකර්තෘ යයි ත්‍රිවිධ වේ.

(1) තෙමේම ක්‍රියාව කරන්නේ 'ශුද්ධ කර්තෘ' නම් වේ. 'පුරිසො රුක්ඛං ඡින්දති' යන්න උදාහරණයි.

(2) අන්‍යයකු ලවා කරවන්නේ "හෙතු කර්තෘ" නම් වේ. සෙට්ඨී පුරිසං රුක්ඛං ඡෙදාපෙති" (සිටුතුමා පුරුෂයා ලවා ගස කප්පවයි) යන්නෙහි සිටුතුමා (පුරුෂයා ලවා කැප්පවීම කරවන බැවින්) හෙතු කර්තෘයි.

(3) තෙමේම අන්‍යකාරකයට පැමිණෙන්නේ 'කර්ම කර්තෘ' නම් වේ. භිජ්ජතෙ (=කොටුව බිඳේ), ඔදනො පච්චතෙ" (=බත පැසේ)

1. අන් කිසිවක් හා සම්බන්ධයක් නැතිව "මිනිහා", "ලෝකය", "ගස" ආදී වශයෙන් ශබ්දයක අර්ථය පමණක් කියයුතු කල්හිත් පඨමාව යෙදේ. එයට ලිංගාර්ථයයි කියත්. මනුසෙසා, ලොකො, රුක්ඛො, ආදිය උදහරණයි.

2. උඩ දැක්වූ උක්ත කර්තෘට හා උක්ත කර්මයට විශෙෂණව සිටින පද ද පඨමාවෙන් යෙදෙත්. තෙන ඛොපන සමයෙන රාජා මාගධො අජාතසත්තු වෙදෙහිපුත්තො තදහුපොසථෙ.......................... රාජාමච්චපරිවුතො උපරිපාසදවරගතො නිසින්නොහොති." (දී. සාමඤ්ඤඵල)

මෙහි කර්තෘ රාජා යන්නයි, කළු අකුරෙන් දැක්වුණු ඉතිරි පද සය එයට විශෙෂණයි. ඒ සියල්ල පඨමාවෙන් යුක්තයි.

3. ආලපනාර්ථයෙහි ද පඨමා විභක්තිය වේ.

ආලපනය නම් ආමන්ත්‍රණය (ඇමතීමයි) සි, ආමන්ත්‍රණය නම් අන්‍යයකු තමහට අභිමුඛ කිරීමයි. (මෙසේ අභිමුඛ කරවිය හැක්කේ ප්‍රාණීන් පමණක් බැවින් ආලපනය සප්‍රාණිකයන්ට සීමා කටයුතු වුවත් අප්‍රාණික ද්‍රව්‍යයන් ද අද්‍රව්‍ය වූ චෛතසික ගුණාදියද ප්‍රාණීන් මෙන් සලකා ඔවුන්ටත් ආලපනය යොදනු ලැබේ.)

ආමන්ත්‍රණය කොට අභිමුඛ වූ පසු ඔහුට 'යව, එව' ආදී කිසියම් විධානයක් කරනු ලැබේ. ආමන්ත්‍රණාවස්ථාවේදී ක්‍රියාවක් නොයෙදේ. එබැවින් මේ ආලපනය කර්තෘකාරකාදි කාරකයක ඇතුළත් නොවේ. (පඨමා විභත්තිය ආලපනයෙහි යෙදුනත් ආලපනය වෙන් වූ විභතක් මෙන් යොදා මේ පොතේ පෙන්වන බැවින් ආලපන රූපයන්ගේ වෙනස දැනගැන්ම අපහසු නොවේ.)

# දුතියා

**48. දුතියා විභත්තිය කර්මාර්ථයෙහි වේ.**

'පුරිසො රුක්ඛං ඡින්දති' යන වාක්‍යයෙහි 'රුක්ඛං' යන්න කර්මයයි, හේ ක්‍රියාව ලබන්නායි. ඒ කර්මය 'ඡින්දති' යන්නෙන් කියන ලද්දේ නොවේ. ('ඡින්දති' යන්න එකවචනය වූ නිසා 'රුක්ඛං' එක් වචනය වූයේ නොවේ. 'රුක්ඛෙ ඡින්දති' බහුවචනයද එහි යෙදිය හැකි වේ.) එබැවින් මෙය අනුක්ත කර්මයයි කියනු ලැබේ. **දුතියා විභත්තිය යෙදෙන්නේ අනුක්ත කර්මයෙහි යයි දත යුතු.**

'පුරිසෙන රුක්ඛා ඡින්දීයති (-පුරුෂයා විසින් ගසතෙම සිඳිනු ලැබේ.) යන තැන 'ඡින්දීයති' යන්න 'රුක්ඛා' යන කර්ම පදය අපෙක්ෂා කරයි: එබැවින් ඒ කර්මපදය උක්ත යයි කියනු ලැබේ. **ඒ උක්ත කර්මය දුතියාවෙන් නොව පඨමාවෙන්ම යෙදිය යුතුයි.** 'ඡින්දියති' යන්න 'රුක්ඛා' යන්න අපෙක්ෂා කෙරේ යයි කෙසේ දත හැකිද යත්? 'රුක්ඛා ඡින්දීයති' යි කර්මය බහු වචනයෙන් ද සිටුවීම මෙහි නො හැකිවේ. උක්ත කර්මය වූ 'රුක්ඛා' යන්න බහුවචනය වේ නම් ක්‍රියාවද 'ඡින්දීයන්ති' යි බහුවචනයෙන් සිටිය යුතුයි. **එබැවින් කර්ම කාරකයේදී ක්‍රියාව කර්තෘ නොව කර්මය අපෙක්ෂා කෙරේ යයි දත යුතු.** 'පුරිසෙහි රුක්ඛා ඡින්දීයති' යන තැන කර්තෘ බහුවචනයෙන් සිටියත් ක්‍රියාව එය අපෙක්ෂා නොකොට කර්මයම අපෙක්ෂා කරන බැවින් එකවචනයෙන් ම සිටී.

49. කර්මය වනාහි (1) **නිබ්බත්තිකම්ම** (2) **විකතිකම්ම** (3) **පත්තිකම්ම** යයි ත්‍රිවිධ වේ.

(1) 'වඩ්ඪකී රථං කරොති මාතා පුත්තං විජායති: ආහාරො සුඛං ජනෙති' යන මොහු **නිබ්බත්තිකම්ම**යට උදාහරණයි. (නිබ්බත්තිය නම් කලින් නොතිබුණු දෙයක් ඉපදවීමයි)

(2).'කට්ඨමඞ්ගාරං කරොති' (-කාෂ්ටය අඟුරු කරයි) යනු **විකතිකම්ම**යට උදාහරණයි. (විකෘතිය නම් අන්‍යාකාරයකට පැමිණ වීමයි)

(3) 'සො ගෙහං පවිසති: චක්ඛුමා රූපානි පස්සති: සීලවා ධම්මං සුණාති: උපාසකා බුද්ධං නමස්සන්ති' යන මොහු **පත්ති කම්ම**යට උදාහරණයි. ('පත්ති' නම් පැමිණීමයි.)

## විභක්ත්‍යර්ථ විභාගය

1. අත්‍යන්තසංයොගහිද දුතියා වේ. අත්‍යන්ත සංයෝගය නම් කාල -මාර්ග දෙදෙනාගේ ද්‍රව්‍ය-ගුණ-ක්‍රියා වශයෙන් අතරක් නැතිව බැඳීමයි. 'අස්සො යොජනං ධාවි' යන තැන මාර්ගය මුළුල්ලම (අතර නොහැර) දිවූ බැවින් අත්‍යන්තසංයොග යයි. 'භගවා බොධිරුක්ඛ මූලෙ සත්තාහං එක පල්ලඞ්කෙන නිසීදි' (විනය මහාවග්ග) යන තැන සත් දිනක් මුළුල්ලෙහි (අතර නොනැගිටම) වැඩහුන් බැවින් අත්‍යන්ත සංයොගයයි. (ප්‍රථම උදාහරණය මාර්ග වශයෙනි. දෙවැන්න කාල වශයෙනි.)

2. ගමනාර්ථ ප්‍රකාශක ධාතුන්ගේ යෝගයෙහි දුතියාව වේ.

A. පුරිසො ගාමං ගච්ඡති.

B. රාජ භගවන්ත මුපසඞ්කමි.

3. වාර ගණන දක්වන සංඛ්‍යාශබ්දයෝ ද දුතියාවෙන් යෙදෙත්:-

සො දුතියම්පි තතියම්පි තථේ'ව යාචි.

4. අනු-පති-අධි-උප-අභි-ධි-අන්තරා-සමන්තා යන නිපාත හා උපසර්ගයන්හිත් දුතියාව වේ.

අනු: 'චතුරාසීති පාණසහස්සානි..... විපස්සිං බොධිසත්තං.... පබ්බජිතං අනුපබ්බජිංසු (දී. මහාපදාන) අසූහාරදහසක් පුරුෂයෝ පැවිදි වූ විදර්ශී බෝසතුන් අනුව පැවිදි වූහ.

පති: 'සො අහමපි ගමිස්සාමි, නගරංමිථිලංපති' (ථෙරී ගාථා 319)

අධි: 'අධි බ්‍රහ්මානං මයං භන්තෙ භගවන්තං අපුච්ඡිම්හා' (=ස්වාමීනි, අපි බ්‍රහ්මයා ගැන භාග්‍යවතුන් වහන්සේ විචාළෙමු.) (91 සූත්‍රය. මජ්ඣිම)

උප: එකං යෙව චතුදොණිකං පිටකං උපනිසිදිත්වා චතුරංගනියා සෙනාය ඡම්මාසිකං භත්තං අදාසි' (=ද්‍රෝණසතරක් දැමිය හැකි එකම භාජනයක් ළඟ හිඳ සිවුරඟ සෙනඟට හයමාසයකට සෑහෙන ආහාර දුන්නේය.) (මහාවග්ගපාළි)

අභි. 'තං බොපන භවන්තං ගොතමං එවං කල්‍යාණො කිත්තිසද්දො අබ්භුග්ගතො' (= ඒ භවත් ගෞතමයන් වහන්සේ පිළිබඳ මෙවැනි යහපත් කීර්තිරාවයක් පැන නැංගේ වේ.) (අම්බට්ඨ, දීඝ)

ධීː "ධී බ්‍රාහ්මණස්ස හන්තාරං" බ්‍රාහ්මණයකු නසන්නකුට නින්දා වේවා. (ධම්මපද 389)

අන්තරා : 'භගවා අන්තරාච රාජගහං අන්තරා ච නාලන්දං අද්ධානමග්ගපටිපන්නො හොති.' (දී. බ්‍රහ්මජාල)

සමන්තාː 'එථ තුම්හෙ භික්ඛවෙ, සමන්තා වෙසාලිං යථා මිත්තං................. වස්සං උපෙථ' (දී. මහාපරිනි)

5. ක්‍රියා විශේෂණයෙහි ද ද්‍විතියාව වේ.

(1) 'පුබ්බෙ ත්වං ඔලම්බකං ඔතාරෙන්තා විය උජුකමෙව එලානි පාතෙසි' (=පෙර දී තෝ ලඹයක් බස්වන්නා සේ කෙළින්ම ගෙඩි හෙළුවෙහි.) (කුරුංගමිග ජාතක)

(2) 'තුම්හෙ ඉමස්මිං මතෙ යෙව සුඛං ජීවිස්සථ, ජීවන්තේ තු දුක්ඛං ජීවථ' (=තෙපි මොහු මළ කලම සැපසේ ජීවත් වන්නේව්. (ඔහු ජීවත් වන කල්හි දුකසේ ජීවත්වහුය.) (ධ. අ. උදෙනවත්ථු....)

(3)දළ්හං පග්ගණ්හ විරියං' 'මානිවත්ත, අභික්කම' (=වීර්‍යය දැඩි කොට ගනුව, නොනතුව ඉදිරියට යව.) (බුඩවංස පාළි)

## තතියා

50. තතියාවිභක්තිය (1) කරණාර්ථයෙහිද (2) අනුක්ත කර්තෘ කෙරෙහිද (3) සහාර්ථයෙහිද (4) සහයෝගයෙහිද වේ. (සහයෝගය නම් 'සමග' යන අර්ථ ඇති නිපාතයන් හා යෙදීමයි; ඒ නිපාතයන්ගේ යෙදීමක් නැතිව තතියාවෙන් පමණක් සමග යන අර්ථය ප්‍රකාශ කරන තැන සහාර්ථයයි දත යුතු)

(1) කරණː පුරිසො .ඵරසුනා රුක්ඛං ඡින්දති.

(2) අනුක්ත කර්තෘː පුරිසෙන රුක්ඛො ඡින්දියති.

(3) 'සහ-සද්ධිං-සමං' යන මොහු සහාර්ථයෙහි නිපාතයෝයි. ඔවුන් හා යෙදීම සහයෝගයයි.

A. "සහ භණ්ඩකෙන චොරං චූළාය ගණ්හන්ති විය මං විප්පකාරං පාපෙයා' (=බඩු සමග සොරහු කුඩුම්බයෙන් අල්වා ගන්නියක් මෙන් මා විකාරයට පමුණුවන්නේය.) (ධ. අ. අඤ්ඤතර භික්ඛු)

B. 'පඤ්චසතා භික්ඛු තෙන සද්ධිං මග්ගං පටිපජ්ජිංසු' (-පන්සියයක් භික්ෂූහු ඔහු සමග මගට පිළිපන්හ.) (ධ. අ. මහාධනවාණිජ)

C. 'යං කරොමසෙ බ්‍රහ්මුනො සමංදෙවෙහි මාරිස තදජ්ජ තුයහං කස්සාම' (- පින්වත දෙවියන් සමග අපි බ්‍රහ්මයාට යම් වැඳීමක් කරමුද එය අද පින්වතාට කරන්නෙමු.) (සක්කපඤ්හ. දීඝ)

සහාර්ථයෙහි :-

(1) 'සබ්භිරෙව සමාසෙථ පණ්ඩිතෙන'ත්ථදස්සිහි' (-අර්ථ දක්නා නුවණැති සත්පුරුෂයන් හාම ආශ්‍රය කරව්) (ථෙරගාථා 4)

(2) 'පාපො කාපුරිසෙන සංගමො' (-අසත්පුරුෂයා හා එක්වීම ලාමකය) (ථෙරගාථා 1018)

(3) 'සත්ථා ආනන්දත්ථෙරෙන පච්ඡාසමණෙන තත්ථ අගමාසි' (-සර්වඥයන් වහන්සේ පසුව යන අනඳ මහතෙරුන් හා වැඩිසේක.) (ධ.අ.)

51. නානා - විනා-අලං-කිං - අඤ්ඤත්‍ර යන නිපාත යෝගයෙහි ද සමාන - මිශ්‍ර ඌනාර්ථයන්හිද හෙත්වර්ථයෙහිද තතියාව වේ.

නානා :- 'න ඛො මය්හෙවෙකස්ස සබ්බෙහෙව පියෙහි මනාපෙහි නානාභාවො' (පඤ්චක.අඞ්ගුත්තර) සියලු ප්‍රියමනාපයන් හා වෙන්වීම හුදකලා මට පමණක් ඇත්තේ නොවේ.

විනා: 'තෙන හා 'යස්මතා සහාපි විනාපි න සක්කා ධම්ම සංගීතිං කාතුං (-ඒ ආයුෂ්මතුන් සමග ද වෙන්ව ද ධම්සංගීතිය කරන්නට නොහැකියි)' (විනය අටුවා)

අලං: 'අලං තෙ ඉධ වාසෙන' (-තට මෙහි විසීමෙන් පමණය හෙවත් කම් නැති) (පාතිමොක්ඛ)

කිං: සම්ම: කිං තෙ නිගණ්ඨෙහි' (-මිත්‍රය තට නිවටුන්ගෙන් කම් කිම?) (ධ. අ. ගරහදින්න)

අඤ්ඤත්‍ර: 'අඤ්ඤත්‍රෙ'ව භගවතා අඤ්ඤත්‍ර භික්ඛුස්ංඝෙන උපොසථං කරිස්සාමි' (ධ. අ. දෙවදත්ත) භාග්‍යවතුන් වහන්සේ ගෙන්ද, භික්ෂුසංඝයාගෙන් ද වෙන්ව උපොෂථය කරන්නෙමි.

සමානාර්ථ: 'ඉමිනා අග්ගිනා සදිසො අග්ගිනාමනත්ථි' (විසාඛාවත්ථු.) මේ ගින්න හා සමාන ගින්නක් නම් නැත.

හෙත්වර්ථ: a 'න ජච්චා වසලො හොති' (=ජාති හේතුවෙන් වසලයෙක් නොවේ. 'කෙන තෙ තාදිසො වණ්ණො' (=කවර හෙයකින් තාගේ මෙවැනි වර්ණයෙක් වේද?)

මිශ්‍රාර්ථ: කලීරපනසාදිහි මිස්සෙත්වා මංසං පචන්ති' (=කරටි කොස් ආදිය හා මිශ්‍ර කොට මස් පිසති)

ඌනාර්ථ: 'ඉමං ද්වීහි ඌන පුරිස සහස්සං විනාසං පත්තං' (=දෙදෙනෙකුගෙන් අඩු වූ මේ සොරුන් දහස විනාශයට පැමිණියේය.) (වෙදබ්භජා)

52. (1) ඉත්ථම්භූත (2) ක්‍රියාපවග්ග (3)අංගවිකාර (4) විශෙෂණ (5) උපලක්ෂණාර්ථයන්හිද (6)කච්චාදිප්‍රත්‍යයෝගයෙහිද තතියාව වේ.

(1) ඉත්ථම්භූතාර්ථය නම් 'මේ ආකාරයට පැමිණියේ' යන අර්ථයයි. 'ත්වං දෙවසිකං සෙදෙහි මුච්චමානෙහි පිණ්ඩාය චරසි' (=තෝ දවස්පතා වැගිරෙන ඩහදියෙන් යුක්තව පිඩු පිණිස හැසිරෙන්නෙහි) (මහිලාමුඛ ජාතක)

(2) ක්‍රියාපවග්ගය නම් ක්‍රියාව වහා නිෂ්ඨාවට පැමිණ වීමයි. 'විසාඛා යපි පාසාදෙ කම්මං නවහි එව මාසෙහි නිට්ඨිතං' (=විශාඛාවගේ ප්‍රාසාදයෙහි කර්මාන්තය නව මසකින් නිමියේය.) (ධ.අ.)

ක්‍රියාවගේ වහා නිෂ්ඨාවට පැමිණවීමක් නැතත් අතර නොහැර පැවැත්ම ඇති කල්හිත් තතියාව යෙදෙන බව පෙනේ. 'සත්ථා නවහි මාසෙහි චාරිකං චරිත්වා පුන සාවත්ථිං අගමාසි (ධ. අ. විසාඛා)

(3)අංගවිකාරය නම් ශරීරාවයවයක් ස්වභාවිකාකාරයෙන් වෙනස්ව පිහිටීමයි; පාදෙන ඛඤ්ජො (=පයින් කොරවූයේ) අක්ඛිනා කාණො (=ඇසින් කණවූයේ) මේ යෝගය දෙශනා පාළියක දකින්නට නොලැබුණේය. පරීක්ෂණය කළයුතු.

(4) විශේෂණය නම් නාමයක්හුගේ විශේෂයක් දක්වන ගොත්‍රනාමශිල්ප ආදියයි. 'සිඛී භික්ඛවේ භගවා.......................... කොණ්ඩඤ්ඤො ගොත්තෙන අහෝසි' (=මහණෙනි, සිඛී භාග්‍යවතුන් වහන්සේ ගොත්‍රයෙන් කෞණ්ඩිණ්‍ය වූ සේක.) (මහාපදාන දි.)

(5) 'උපලක්ෂණාර්ථය' නම් යුක්ත වූ යන අර්ථයයි. A 'කාය දුච්චරිතෙන සමන්නාගතො' (කායදුශ්චරිතයෙන් යුක්තවූයේ)

B 'භගවා මහතා බුද්ධානුභාවෙන නගරං පිණ්ඩාය පාවිසි' (=භාග්‍යවතුන් වහන්සේ මහත් බුඩානුභාවයෙන් යුක්තව නුවරට පිඬු පිණිස ඇතුළ් වූ සේක) (ධ. අ.)

C 'රාජා ආනන්ද, මහාසුදස්සනො ඉමහි චතුහි ඉද්ධීහි සමන්නාගතො අහොසි' (ආනන්දය, මහාසුදර්ශන රජමේ සෘධි සතරින් යුක්ත විය) (සුදස්සන දීඝ)

(6) කිච්චාදිප්‍රත්‍යයෝ නම් තබ්බ - අනීය - ණ්‍ය - රිච්ච යන මොහුයි.

A 'සො භරියං මෙ නිස්සාය උප්පන්නෙන භයෙන භවිතබ්බංති චින්තෙත්වා' හෙතෙම 'මාගේ භාර්‍යාව නිසා උපන් භයක් වියයුතුය' යි සිතා (ධ. අ. කුමුදප්පල)

B. 'අඤ්ඤෙහි චීහි චොරෙහි භවිතබ්බං (වෙදබ්භ ජා.)
අන්‍ය සොරුන් දෙදෙනෙකුන් සිටිය යුතුය.

C. 'සබ්බෙහි විනාසං පත්තෙහි භවිතබ්බං' (=සියල්ලන් විනාශයට පැමිණියා විය යුතුයි.) (වෙදබ්භ ජා.)

D 'ඉදංතෙ යාවජීවං අකරණීයං' (විනය මහාවග්ග) මෙය තා විසින් ජීවිතාන්තය දක්වා නොකටයුතුය.

මෙහි තතියාව වන්නේ මේ ප්‍රත්‍යයන් භාවකර්ම දෙකෙහි යෙදෙන බැවිනි. භාවාර්ථකර්මාර්ථයන්හි කළ අන්‍යප්‍රත්‍යයන්ගේ යෝගයෙහි ද තතියා වේ.

53. A යමක් මිලදී ගැනීමේදී දුන් මිල ගණන ද
B යම් මගකින් යේ නම් ඒ මග ද තතියාවෙන් සිටී.
A සතසහස්සෙන මෙ කීතං' (අපදාන)
B ඉමිනා මග්ගෙන ගච්ඡාහි.

54. ක්‍රියාවිශේෂණ තතියාවෙන් ද සිටින බව පෙනේ.

A 'සම්මාසම්බුද්ධස්ස සන්තිකෙ මයහං පබ්බජ්ජා, සා ච පන මෙ දුක්කෙන ලද්ධා' - (මාගේ පැවිද්ද සම්මා සම්බුදුන්ගේ සමීපයෙහිය, එය ද මා විසින් දුකසේ ලද්දීය.) නිග්‍රොධමිගජා

B 'කිච්ඡෙන මෙ අධිගතං, හලං දානි පකාසිතුං' (=මා විසින් මේ ධර්මය අපහසුවෙන් අවබෝධ කරන ලදී. එය දැන් ප්‍රකාශ කිරීම ඕනෑ නොවේ.) (විනය මහාවග්ග)

C 'ඉදානි පන මෙ චිත්තං නිබ්බුතං භවිස්සති, සුඛෙන ච සයිතුං ලභිස්සාමි' (=දැන් එනාහි මාගේ සිත නිවියාක් වන්නේය. සැපසේ ද නිදන්ට ලැබන්නෙමි) (ධ. අ. උදෙනවත්ථු)

## උදහරණ vii

1. 'උපකට්ඨාය පවාරණාය සබ්බෙවසහපටිසම්භිදාහි අරහත්තං පාපුණිංසු (ධ. අ. චක්ඛුපාල)

2. ඉමෙහි ලක්ඛණෙහි සමන්නාගතො නාම අගාරමජ්ඣෙ වසන්තො රාජා හොති චක්කවත්තී' (ධ. අ. අග්ගසාවක)

3. 'සා උදකබින්දූහි පග්ඝරන්තෙහෙව අඩ්ඪුල්ලිබ්බෙහි කෙසෙහි වෙගෙනා'ගන්ත්වා තුවටං බො අය්‍යපුත්ත, ආගච්ඡෙය්‍යාසි' ති ආහ.' (ධ. අ. නන්දථෙර)

4. 'අවසෙසං ලොහිතබින්දූහි පග්ඝරන්තෙහි කාජෙනා'දාය දාරකෙ තොසෙන්තො සරං අගමාසි.' (කණ්ඩින ජාතක)

5. 'විසාඛා චත්තාරො මාසෙ අන්තොවිහාරෙ බුද්ධපමුඛස්ස සංඝස්ස දානං අදාසි.' (ධ. උ. විසාඛා)

6. A. 'තෙමාසං වායමන්තො මහාසමත්තං වා.... උප්පාදෙතුං නාසක්ඛි' B. 'බග්ගහත්ථො තියාමරත්තිං ආරක්ඛං ගහෙත්වා ඨිතකො'ව අරුණං උට්ඨාපෙසි. (අපණ්ණකජා)

7. 'තස්මිං කිර නගරෙ අනුසංවච්ඡරං විවටනක්ඛත්තං නාම හොති.' (ධ. අ. විසාඛා)

8. සො තං ආදාය සාවත්ථිං එකරත්තිවාසෙන ගච්ඡන්තො එකං ඵාසුකට්ඨානං ගන්ත්වා නිවාසං ගණ්හි.' (ධ. අ. විසාඛා)

9. 'රාජා පසෙනදි කොසලො...... මහන්තේන රාජානුභාවෙන නගරං පදකඛිණං කරොති' (ධ. අ. කුමුදුප්පලානීත)

10. 'කින්තෙ ජටාහි දුම්මෙධ? කින්තෙ අජිනසාටියා'?
(ගොධාජා. ධම්මප අ. 394)

11. 'සුප්පබුද්ධ.......... අහං තෙ අපරිමිතං ධනං දස්සාමි............. අලංමෙ බුද්ධෙන, අලංමෙ ධම්මෙන, අලංමෙ සඞ්ඝෙනාති වදෙහි.' (උදානට්ඨකථා)

12. A. 'න ස තත්ථ මයා විනා වසිස්සති;
B. 'තෙ තාය විනා'ව ගෙහං ගන්ත්වා (තක්කජාතක)

13. මහාදුග්ගතො ගාළ්හං කච්ඡං බන්ධිත්වා මහුස්සාහප්පත්තො වාසිං පහාය ඵරසුංගණ්හනෙතා ඵරසුං පහාය වාසිං ගණ්හනෙතා දරුනි ඵාලෙති.' (ධ. අ. පණ්ඩිත සාමණේර)

14. 'අධිවත්තමානෙ ජරාමරණෙ කිමස්ස කරණීයං අඤ්ඤත්‍ර ධම්මචරියාය සමචරියාය කුසලකිරියාය' (කෝසලසංයුත්ත)

15. විපස්සී භික්ඛවෙ අරහං සම්මාසම්බුද්ධො ඛත්තියො ජාතියා අහොසි..... කොණ්ඩඤ්ඤො ගොත්තෙන.' (දීඝ. මහාපදාන)

16. භනෙත අයෝන සමානනාමකො තිසෙසා නාම භවිස්සති.

17 'සචෙ තෙ ඌනං කාමෙහි, අහං පරිපූරයාමි තෙ' (මහාගොවින්දසුත්ත දීඝ.)

18. 'ආයස්මා අඞගුලිමාලො භින්නෙන සීසෙන ලොහිතෙන ගලන්තෙන, භින්නෙන පත්තෙන, විප්ඵාලිතාය සංඝාටියා යෙන භගවා තෙනුපසඞකමි' (ම. අංගුලිමාලසුත්ත)

19. 'රාජා ආදිත්තං වෙළුවනං විය පක්ඛිත්තලොණං උද්ධනං විය ච රොසෙන තටතටායන්තො වෙගෙන සපරිවාරං සාමාවතිං පක්කෝසථාති ආහ.' (අංගුත්තරට්ඨකථා)

20. 'සා.....යාවතිකා යානස්ස භූමි යානෙන ගන්ත්වා යානා පච්චෝරොහිත්වා පත්තිකාව සත්ථාරං උපසඞ්කමිත්වා වන්දිත්වා එකමන්තං අට්ඨාසි.' (ධ. අ. විසාඛා)

## චතුත්ථි

55. යමකුට දෙනු කැමති ද යමකුට රුච්වේද එහි චතුත්ථි විභක්තිය වේ.

A 'මම අයො උපසඞ්කමිත්වා තෙසං දානං දෙහි' (=මාගේ ආයඝීයන්වහන්සේලා කරා එළඹ උන් වහන්සේලාට දන් දෙව) (ධ. අ. ගුරහදින්න)

B 'මා ආයස්මන්තානම්පි සංඝභෙදො රුච්චිත්ථ' (=ආයුෂ් මතුන්ටත් සංඝභෙදය රුචි නොවේවා) ' අත්තනො රුච්චනක වෙලාය ගෙහං ගච්ඡති' (=තමහට කැමති වෙලාවක ගෙට යයි)

(1) අතිකකු සඳහා දැරීමෙහි (2) ඊෂ්‍යාකිරීමෙහි (3) කෝප වීමෙහි (4) ප්‍රිය වීමෙහි හෝ අප්‍රිය වීමෙහි (5) දැනුම්දීමෙහි (6) ඒ සඳහා යන අර්ථයෙහි (7) යොග්‍යාර්ථයෙහි (8) ප්‍රතික්ෂෙපයෙහි (9)නමො-සොත්ථි-ස්වාගත අලං යොගයෙහි (10) කර-දුහ ධාතුයොගයෙහි (11) පති-ආ පුව් සු-ධාතුයෝගයෙහි ද (14) පහිණයොගයෙහිද චතුත්ථිය වේ.

(1) අතිකකු සඳහා දැරීමෙහි

'ජාතසස ඛො පන විපසසිසස කුමාරසස සෙතච්ඡත්තං ධාරයිත්ථ' (දි. මහාපාදන) උපන් විදර්ශීකුමරුට සුදු කුඩයක් දරනු ලැබීය.

(2)ඊෂ්‍යා කිරීමෙහිඃ

' කා උසූයා විජානතං' (මහාවග්ග විනය) විශේෂයෙන් දන්නවුන්ට කිනම් ඊෂ්‍යාවක් ද?

(3) කෝපවීමෙහිඃ

'මා මෙ කුජ්ඣ මහාවීර' (ථෙරිගා. 293) මහාවීරයන් වහන්සඃ මට නොකිපුණ මැනවි.

(4) A. ප්‍රියකිරීමෙහිඃ

'දෙවා පි තෙසං පිහයන්ති සම්බුද්ධානං සතිමතං' (ධම්මපද 181)

B. අප්‍රිය වීමෙහිඃ 'ගෙහෙ ඉත්ථීනම්පි පුත්තධීතානම්පි අමච්ච-බ්‍රාහ්මණ - ගහපතාදීනම් අප්පියො අමනාපො අහොසි.'

(මහාපිඞ්ගල ජා.)

**(5) දැනුම්දීමෙහි හෙවත් ආරෝචනයෙහි:**
'තෙ අත්තනා ලද්ධගුණං තථාගතස්ස ආරොචෙසුං' (ධ. අ.) ඒ භික්ෂූහු තමන් ලත් ගුණය බුදුරදුන්ට සැලකළහ.

**(6) 'ඒ සඳහා, ඒ පිණිස' ආදී අර්ථයන්හි යෙදෙන චතුර්ථිය බෙහෝ සේ ආයාදෙශයෙන් යුක්තවන බව පෙනේ:**

'තිට්ඨතු සුගතො කප්පං බහුජනහිතාය බහුජනසුඛාය ලොකානුකම්පාය අත්ථාය හිතාය සුඛාය දෙවමනුස්සානං.' (දී. මහපරිනි.) සර්වඥතෙමේ බොහෝ දෙනාට හිත පිණිස, බොහෝ දෙනාට සැප පිණිස, ලෝකයාට අනුකම්පා පිණිස, දෙව්මිනිසුන්ට වැඩ පිණිස, හිත පිණිස සැප පිණිස, කල්පයක් මුළුල්ලේ වැඩ සිටිවා.!

**(7) යෝග්‍යාර්ථයෙහි:**
'නයිදං දෙවදත්තස්ස අනුච්ඡවිකං: සාරිපුත්තථෙරස්ස අනුච්ඡවිකං.'
(ධ. අ. දෙවදත්ත.)

**(8) ප්‍රතික්ෂෙපයෙහි:**

A මය්හං එවරූපාය ජටාය කිච්චං නත්ථි. (ධ. අ.)

B 'අලං මෙ ඉමාය: ත්වමෙව හරියං ගණ්හ.' (ජා.)

**(9)** 'නමො තෙ පුරිසාජඤ්ඤ, නමො තෙ පුරිසුත්තම.'
(ථෙරගාථා 629)

**B. සොත්ථියෝගයෙහි:-**

'සොත්ථි භදන්තෙ හොතු රඤ්ඤො සොත්ථි ජපනදස්ස.' (දී. අම්බට්ඨ) පින්වත්නි, රජුට යහපතක් වේවා, ජනපදයට යහපතක් වේවා.!

**C. ස්වාගතයෝගයෙහි:-**

'තස්සා තෙ ස්වාගතං භද්දෙ, අථො තෙ අදුරාගතං' (ථෙරගාථා 337) සොඳුර ඒ තිට ශුභාගමනයක් වේවා: තවද තිට නපුරු ගමනක් නොවේවා.

**D. අලංයෝගයෙහි:-**

'දෙස්සා ච මෙ අලං මෙ, ආපුච්ඡා'හං ගමිස්සාමි' (ථෙරීගා. 416) 'මට අප්‍රියය, මට ඕනෑ නැත. මම විචාරා යන්නෙමි.'

10. A. කර-යෝගයෙහි:-

'සා මය්හං කතරං නාම උපද්දවං න කරෙය්‍ය' (ජා.අ.)

B. දුහයෝගයෙහි:-

යසො කිත්තිං ච පප්පොති යො මිත්තානං න දූහති' (මිත්තානිසංස) යමෙක් මිත්‍රයන්ට ද්‍රොහ නොකෙරේ නම් හෙතෙම යශසටත් කීර්තියටත් පත්වේ.

(11) පති+ආ+සු යෝගයෙහි:-

'භදන්තෙති තෙ භික්ඛූ භගවතො පච්චස්සොසුං; භගවා එතදවොච.' (දී. මහාසතිපට්ඨාන) ස්වාමීන්වහන්සැ'යි ඒ භික්ෂූහු භාග්‍යවතුන්වහන්සේට ප්‍රතිවචන දුන්හ.

(12) උප+ඨායෝගයෙහි:-

A. 'සෙට්ඨිපුත්තො දිවසස්ස තික්ඛත්තුං රඤ්ඤො උපට්ඨානං ගච්ඡති.' (ධ. අ. මහාධනසෙට්ඨි)

B. 'අප්පමත්තා අය්‍යස්ස උපට්ඨානං කරොහි' (ජා.)

13. වැටහීමෙහි:-

'දිසාපි මෙ න පක්ඛායන්ති' (දී. මහාපරිනි)
මට දිශාවෝ ද නො වැටහෙත්.

14. පහිණයෝගයෙහි:-

'පිතරා මෙ තුම්හාකං පණ්ණං පෙසිතං.' (ධ. අ. උදේන)

(15) කීම් අර්ථවත් ධාතුන්ගේ යෝගයෙහි:-

A. 'පුත්තස්ස තෙ පඤ්චමහානිධිං ආචික්ඛාහි.' (ධ. අ. ආනන්දසෙට්ඨි.)

B. 'මය්හං අකථෙත්වා කස්ස කථෙසි තාත?' (ජා.)

16. පොහෝනා අර්ථයෙහි:-

'තුය්හං ච මය්හං ච පහොනකං කත්වා පචාමි.' (ධ. අ. මච්ඡරියකොසිය)

17. පහළවීමේ අර්ථයෙහි:-

A. 'රඤ්ඤො මහාසුදස්සනස්ස දිබ්බං චක්කරතනං පාතුරහොසි' (දී. මහාසුදස්සන)

B. 'අථ ඛො සාලවතියා ගණිකාය එතදහොසි' (විනයමහාවග්ග) ඉක්බිති සාලවතී ගණිකාවට මෙවැනි සිතක් පහළ විය.

## උදාහරණ viii

1. 'අයං කුටතාපසො මං රාජකුමාරං අගණෙත්වා තිරච්ඡාන ගතානං සම්මානං කරොති' (සච්චංකිර ජාතක)

2. අහං ඤාතකානං ආරොචෙත්වා රත්තසාලියො ආහරා පෙත්වා දාතුං සක්කොමි' (සච්චකිරජාතක)

3. 'සතං හි සො පියො හොති අසතං හොති අප්පියො'.(ධම්ම පද)

4. 'තෙ මාණවා එකදිවසං දාරුආහරණත්ථාය අරඤ්ඤං ගන්ත්වා දරුනි උද්ධරිංසු.' (වරණජාතක)

5. 'හො පුරිස, ඉමිනා මග්ගෙන ගච්ඡ; මය්හං පන වසනට්ඨානං මා කස්සචි ආචික්ඛ (සීලවනාගරාජ ජා.)

6. යං ලොකෙ බ්‍රාහමණාදයො බිපිත්වා පක්ඛලිත්වා නමො මහාබ්‍රහ්මුනො'ති වදනති, සො එස මහාබ්‍රහමා.' (ධ. අ. ජම්බුකාජීවක.)

7. චරථ භික්ඛවේ චාරිකං බහුජනහිතාය, බහුජනසුඛාය, ලොකානුකම්පාය, අත්තාය හිතාය සුඛාය දෙවමනුස්සානං" (මාරසංයුත්ත)

8. 'අනංගණස්ස පොසස්ස, නිච්චං සුචිගවෙසිනො
වාලග්ගමත්තං පාපස්ස අබ්භාමත්තං'ව ඛායති.' (ථෙරගාථා 1001)

9. 'නරාධමා අත්තානං උපකාරකානං හිතෙසීනං සප්පුරිසානං අනත්ථමෙව කරොනති.' (රසවාහිනී)

10. 'පුරොහිතස්ස දහරිත්ථියා උපට්ඨානං කුරුමානා වසාමි.' (අණ්හුත ජා.)

11. "අකතඤ්ඤුස්ස පොසස්ස මෙත්තිං යො න කරිස්සති,
කස්ස මෙත්තිං හි සො කයිරා? තමානු චරියං බුධා' (රසවාහිනී)

12. 'එවං දෙවාති ඛො සො මහාමත්තො රඤ්ඤො මාගධස්ස සෙණියස්ස බිම්බිසාරස්ස පටිස්සුත්වා ආයස්මතො පිලින්දිවච්ඡස්ස පඤ්චා රාමිකසතානි පාදසි.' (විනයමහාවග්ග)

13. 'සපත්තරාජා ආගන්ත්වා........රජ්ජං වා දෙතු යුද්ධං වා ති රඤ්ඤො සාසනං පෙසෙසි' (ජා. අ.)

14. 'බන්ධුමා රාජා විපස්සිස්ස කුමාරස්ස ධාතියො උපට්ඨපෙසි.'

15. 'විපස්සී කුමාරො බහුනො ජනස්ස පියො අහොසි මනාපො.' (දීඝ. මහාපදාන)

17. 'ස්වාගතං භන්තෙ භගවතො. චිරස්සං ඛො භන්තෙ භගවා ඉමං පරියායමකාසි' (පාථිකසුත්ත දීඝ)

18. 'කිං පන භන්තෙ භගවා අරහත්තස්ස මච්ඡරායතීති?' (පාථිකසුත්ත දීඝ.)

## පඤ්චමී.

පඤ්චමිය ප්‍රධාන වශයෙන් යොදනු ලබන්නේ වෙන්වීමක් ප්‍රකාශ කිරීම සඳහායි.

A. ගෙහා නික්ඛමති. B. රුක්ඛම්හා ඵලං පතති. C. අස්සපිට්ඨිතො ඔතරි. යානා ඔරුහි යන උදාහරණයන්හි මුල් දෙක නොසෙල්වෙන ද්‍රව්‍ය බැවින් අචලාපදන යයි ද පසු දෙක සෙලවෙන ද්‍රව්‍ය බැවින් චලාපදන යයි ද කියත්.

(1) භයවීමෙහි (2) වැළැක්වීමෙහි (3) විරමණයෙහි (4) දූරාර්ථයෙහි (5) සමීපාර්ථයෙහි (6) කාලය හෝ මාර්ගය ප්‍රමාණ කිරීමෙහි (7) දිශාර්ථයෙහි (8) හෙත්වර්ථයෙහි (9) මිදී යාමෙහි (10) පූර්වාර්ථ-පරාර්ථයන්හි (11) ප්‍රමාණාර්ථයෙහි (12) තෙක් -දක්වා අර්ථයන්හි (13) අඤ්ඤත්‍ර, ආරකා, ඔරං, උද්ධං, අධො යන නිපාතයෝගයෙහි (14) පටන් යන අර්ථයෙහි (15) ඊට වඩා යන අර්ථයෙහි (16) උ+ඨා-ධාතු යෝගයෙහි (17) ආකාරාර්ථයෙහි ද පඤ්චමිය වේ.

(1) භයවීමෙහි :- 'න මෙ පියො ආසි අකණ්ණහෙනෙත්තො භායාමි පච්චාගමනාය තස්ස' (240 මහාපිඞ්ගල ජාතක) කළු නොවූ ඇස් ඇති හෙතෙම මට ප්‍රිය නොවීය. මම ඔහුගේ හැරීඒමට භය වෙමි.

(2) වැළැක්වීමෙහි:-
'පාපා චිත්තං නිවාරයෙ' (ධම්මපද 116) පාපයෙන් සිත වළක්වන්නේය.

(3) විරමණයෙහි:-
A. 'ආරති විරති පාපා මජ්ජපානා ච සඤ්ඤමො'
B. 'ඛෙත්තවත්ථුපටිග්ගහණා පටිවිරතො හොති.' (දී සාමඤ්ඤ) හෙතෙම කුඹුරු හා වතු පිළිගැන්මෙන් වෙන්වූයේ වෙයි.

(4) දූරාර්ථයෙහි:-

'කීවදූරෙ ඉතො සාවත්ථි?' (ධ. අ.) සැවත් නුවර මෙතැනින් කොපමණ දුර ද?

(5) සමීපාර්ථයෙහි:-

'සො කිර සාවත්ථිතො අවිදූරෙ එකං ඛෙත්තං කසති.'

(6) මාර්ගීය ප්‍රමාණ කිරීමෙහි:-

'රාජගහතො පඤ්චචත්තාළීසයොජනමත්ථකෙ සාවත්ථි. (ධ. අ.)

B. කාලය ප්‍රමාණ කිරීමෙහි:-

'ඉතො තිණ්ණං මාසානං අච්චයෙන තථාගතො පරිනිබ්බායිස්සති.' (දී. මහාපරිනි.) මින් තුන්මසක් ඇවෑමෙන් බුදුරද පිරිනිවෙන්නේය.

(7) දිශාර්ථයෙහි:-

'දක්ඛිණතො නගරස්ස භගවතො සරීරං ඣාපෙස්සාමි.' (දී. මහාපරිනි) නුවරට දකුණෙන් භාග්‍යවතුන්ගේ ශරීරය දවන්නෙමු.

(8) හෙත්වර්ථයෙහි:-

A. 'කාමතො ජායතී සොකො: කාමතො ජායතී භයං' (ධම්මපද. ගා. 215) කාමහේතුවෙන් ශොකය උපදී: භය උපදී.

B. 'කස්මාන තුම්හං දහරා න මියරෙ?' (මහාධම්මපාල ජා.) කුමක් හෙයින් තොපගේ ළදරුවෝ නො මැරෙත්ද?

(9) මිදීයාමෙහි:-

A. 'මුත්තො සො මාරබන්ධනා.' (ථෙරගා. 680)

B. 'මුත්තො' හං සබ්බපාසෙහි, යෙ දිබ්බා යෙ ච මානුසා.' (සංග 106) දිව්‍යමය වූ ද මනුෂ්‍යමය වූ ද සියලු පාශයන්ගෙන් මිදුනේ වෙමි.

(10) A. පූර්වාර්ථයෝගයෙහි : 'න මෙ දිට්ඨො ඉතො පුබ්බෙ' (ධ. අ. යමක පාටිහාරිය)

B. පරාර්ථයෝගයෙහි:- 'තතො පරං පච්චන්තිමා ජනපදා' (=ඉන් එහා ප්‍රත්‍යනත ජනපදයෝ වෙති.) (ජාතකනිදන)

(11) ප්‍රමාණාර්ථයෙහි:-

'ගම්භීරතො ගාවුතං, පුථුලතො ද්වෙ ගාවුතා දෙව.' (ධ. අ. මහාකප්පින) දේවයන්වහන්ස, (මේ ගඟ) ගැඹුරෙන් ගව්වකි, පලළින් දෙගව්වකි.

(12) තෙක්-දක්වා අර්ථයන්හි:-

A. උඩං පාදතලා අධො කෙසමත්ථකා තචපරියන්තං පූරං නානප්පකාරස්ස අසුචිනො පච්චවෙක්ඛති.) (දී. සතිපට්ඨාන) පාතලයෙන් උඩ, කෙස් අගින් යට, සම කෙළවරකොට (මේ සිරුර) නොයෙක් අසුචියෙන් පිරුණු සැටි සලකා බලයි.

B. 'යාව බ්‍රහ්මලොකා සද්දෝ අබ්භුග්ගච්ඡි'

(13) A. අඤ්ඤත්‍රයෝගයෙහි:-

'සො.................... අඤ්ඤත්‍ර උච්චාරපස්සාවකම්මා අඤ්ඤත්‍ර නිද්දකිලමථපටිවිනොදනා....... වස්සසතං ගන්ත්වා.' (දෙවපුත්තසං) හෙතෙම මලමුත්‍ර පහකරණ වේලාවන් හැර නිදීම හා වෙහෙස දුරු කරන කාලය හැර අවුරුදු සියයක් ගමන් කොට.

B. ආරකා යෝගයෙහි:-

'ආරකා හොති සද්ධම්මා නභසො පථවී යථා' (ථෙරගා. 1078) අහසින් පොළොව දුරවන්නාසේ හෙතෙම සද්ධර්මයෙන් දුරුවේ.

C. ඔරං-යෝගයෙහි:-

ඔරං මෙ ඡහි මාසෙහි කාලකිරියා භවිස්සති.'

D. උඩං-අධො යෝගය මෙහි 12 වෙනි අංකයෙහි ද පෙනේ.

(14) පටන් අර්ථයෙහි:-

'අරුණුග්ගමනතො පට්ඨාය යාව මජ්ඣන්තිකසමයා' අරුණ නැගීම පටන් මධ්‍යාහ්නය දක්වා.

(15) ඊට වැඩි අර්ථයෙහි:-

A තතොමලා මලතරං අවිජ්ජා පරමං මලං' (ධම්මපද 244) ඒ මලයට වඩා අවිද්‍යාව බලවත් මලයකි. එය ඉතා නපුරු කිලුටකි.

B. 'අසප්පුරිසා තිරච්ඡානගතෙහිපි ගුණහීනාති වෙදිතබ්බා' (රසවාහිනී කාණසිගාල) අසත්පුරුෂයෝ තිරිසනුන්ටත් වඩා ගුණයෙන් හීනයෝයයි දතයුත්තාහ.

(16) උ+ඨා-යෝගයෙහි:-

A. 'වුට්ඨාසි ච භගවා තම්හා ආබාධා' (බොජ්ඣංග සං.) භාග්‍යවත් තෙමේ ඒ ආබාධයෙන් නැගිසේක.

B. 'සායණ්හසමයං පතිසල්ලානා වුට්ඨිතො.' (සං එම.) සවස් කාලයෙහි හුදකලා විවේකයෙන් නැගී සිටියේ.

(17) අකාරාර්ථයෙහි:-

'යො සුඛං දුක්ඛතො'ද්දක්ඛී.' (සං. සඩ 207) යමෙක් සැපය දුක වශයෙන් දැක්කේද.

(18) කාරණාර්ථයෙහි:-

'චතුන්නං භික්ඛවෙ ධම්මානං අනනුබොධා අප්පටිවෙධා එවමිමං දීඝමද්ධානං...... සංසරිතං මමං චෙව තුම්හාකං ච' (අං. චතු)

'මහණෙනි, ධර්ම සතරක් අවබොධ නොකිරීම නිසා, ප්‍රතිවෙධ නොකිරීම නිසා මා විසිනුත්, තොප විසිනුත් මේ දීර්ඝකාලය සසර ඇවිදින ලදී.

(19) 'සහ පරිනිබ්බාණා ආයස්මා ආනන්දො ඉමං ගාථං අභාසි' (දී. මහාපරිනි) පිරිනිවීම සමගම ආනන්ද ස්ථවිරතෙමේ මේ ගාථාව කීයේය. මේ වාක්‍යයෙහි යෙදී තිබෙන්නේ සහයෝගයෙහි පඤ්චමියයි කියත්.

# ෂෂ්ඨී

57. යමකුගේ සම්බන්ධය හෝ අයිතිය ප්‍රකාශ කිරීමේදී ෂෂ්ඨී විභක්තිය යෙදේ.

සම්බන්ධවන දෙය ශරීරය පිළිබඳ දෙයක් හෝ ඉන් පිටත් දෙයක් විය හැක. ශරීරය පිළිබඳ දෙය ද ද්‍රව්‍යයක් හෝ ගුණයක් විය හැක.

(1) පුරිසස්ස හත්ථො (සිරුර පිළිබඳ අවයවයකි)

(2) භගවතො ගුණඝොසො (පුද්ගලයා පිළිබඳ ගුණයකි)

(3) සෙට්ඨිනො පුත්තො (සිරුරෙන් පිටත් දෙයකි)

58. සම්බන්ධය වනාහි (1) සමීප සම්බන්ධය (2) සමූහ සම්බන්ධය (3) ක්‍රියා සම්බන්ධය (4) ප්‍රමාණ සම්බන්ධය (5) භාවසම්බන්ධය (6) භාග සම්බන්ධය (7) දිශා සම්බන්ධය (8) ස්වාමිසම්බන්ධයයි නානාවිධ වේ.

1. සමීපසම්බන්ධය:

A. අම්බවනස්ස අවිදූරෙ B. 'නිබ්බාණස්සෙව සන්තිකෙ'

2. සමූහසම්බන්ධය:

A. භික්ඛූනං සමූහො B. වීහීනං රාසි

3. ක්‍රියා සම්බන්ධය:-

A. හත්ථස්ස සම්මිඤ්ජනං (අත හැකිලීම)

B. ඛන්ධානං පාතුභාවො (සකන්ධයන්ගේ පහළ වීම)

4. ප්‍රමාණ සම්බන්ධයඃ-

A. තිලානං මුට්ඨි, (තලමිටක්) B. සිප්පිකානං සතං (සිප්පි කටු සියයක්)

5. භාවසම්බන්ධයඃ-

A. රූපස්ස ලහුතා, (රූපයාගේ සැහැල්ලු බව) B. "තෙසං අනොතරණභාවං ඤත්වා" (ඔවුන් නොබසින බව දැක)

6. භාග සම්බන්ධයඃ-

A. කප්පස්ස තතියො භාගො (කල්පයාගේ තෙවෙනි කොටස)

B. "උභින්නං ගෙහානං මජ්ඣෙ." (ගෙවල් දෙක මැද)

7. දිශා සම්බන්ධයඃ-

A. දක්ඛිණතො නගරස්ස." (නුවරට දකුණෙන්)

B. "උත්තරෙන උත්තරං නගරස්ස හරිත්වා" (නගරයාගේ උතුරෙන් උතුරට ගෙනගොස්) (දී. මහාපරිනි)

8. ස්වාමිසම්බන්ධයඃ-

A. සක්කො දෙවානමින්දො B. "අහු රාජා විදෙහානං"

9. කාලසම්බන්ධයඃ-

"ඉතො තිණ්ණං මාසානං අච්චයෙන තථාගතො පරිනිබ්බායිස්සති." (දි මහාපරිනි)

59. අනාදරයෙහි ද නිර්ධාරණාර්ථයෙහි ද දක්‍ෂාර්ථයෙහි ද ෂට්ඨිය යෙදේ.

අනාදරය නම් අන්‍යයන්ගේ ක්‍රියා ගැන නො සැලකීමයි. නිර්ධාරණය නම් සමූහයක් අතුරෙන් එකක් වෙන් කොට තෝරා ගැනීමයි.

1. අනාදරාර්ථයෙහිඃ-

"සමණො ඛලු භො ගොතමො, අකාමකානං මාතාපිතුන්නං අස්සුමුඛානං රොදන්තානං.... පබ්බජිතො" (දි. සොණදණ්ඩ) භවත් ශ්‍රමණගෞතමතෙමේ නොකැමැති මවුපියන් කඳුලු මුසු මුහුණින් යුක්තව හඬන කල්හි (ඔවුන් ගැන නොසලකා) පැවිදි විය.

11. **නිර්ධාරණාර්ථයෙහි:-** A. 'අඤ්ඤතරො බො පනායස්මා සුභද්දො අරහතං අහොසි.' (දී මහාපරිනි) ආයුෂ්මත් සුභද්‍රතෙමේ රහතන්ගෙන් එක් නමක් විය.

B. 'සො තෙසං සබ්බපච්ඡතො ගච්ඡන්තං සත්තියා පහරිත්වා මාරෙත්වා.' (ධ. අත දෙවදත්ත) ඔවුන් (ගේ) සියල්ලට පසුව යන (ඇතා) ශස්ත්‍රයෙන් ඇන මරා.

12. **දක්ෂාර්ථයෙහි:-**

'කුසලො අහං දිට්ඨධම්මිකානං අත්ථානං' (දී. මහාගොවින්ද) මම මෙලොව කටයුතුවලට දක්ෂයෙක්මි.

13. **අන්තරෙන යන නිපාත යෝගයෙහිත් ෂෂ්ඨිය යෙදෙන බව පෙනේ:-**

'ඉඩස මෙ ත්වං ආනන්ද අන්තරෙන යමකසාලනං උත්තර සීසකං මඤ්චං පඤ්ඤපෙහි' (දී. මහාපරිනි) දැන් ආනන්දය, මා සඳහා බදසල්ගස් අතරෙහි උතුරට හිස දැමූ ඇඳක් පිළියෙල කරව.

14. **එක් ක්‍රියා සිඬියක් පවත්නා කල්හි තවත් ක්‍රියා සිඬියක් වේ නම් පළමු සිඬිය ෂෂ්ඨියෙන් යොදනු ලැබේ.**

සාකුණිකස්ස ගුම්බතො ජාලං මොචෙන්තස්සේ ව විකාලො ජාතො' :(සම්මොදමානජා) පක්ෂිවැද්දා කටු පඳුරෙන් දැල මුදන කල්හිම විකාලය විය.

## සත්තමී

60. **යමක් යමකට ආධාර වේ නම් ඒ ආධාර වන දෙය සත්තමියෙන් යෙදේ.**

'පීඨෙ නිසීදති' යි කී කල පුටුව හිඳීමට ආධාර වේ. එබැවින් පුටුව සත්තමියෙන් යෙදේ.

ආධාරය වනාහි **(1)** ඔපසිලෙසික **(2)** සාමීපික **(3)** වෙසයික **(4)** ව්‍යාපිකයයි සිව්වැදෑරුම් වේ.

**(1)** **ඔපසිලෙසිකාධාරය නම් හැපී ඇලී පවත්නා ආධාරයයි.** 'මඤ්චෙ සයති. චාටියං පචති' ඊට උදාහරණයි.

**(2) සාමීපිකාධාරය නම් සමීපාර්ථය ප්‍රකාශකරන ආධාරයයි.** සාවත්ථියං විහරති ජේතවනෙ (=සැවත්නුවර සමීපයෙහි ජේතවනයෙහි වසනසේක) 'ලභෙය්‍යාම මයං භන්තෙ භගවතො සන්තිකෙ පබ්බජ්ජං' (අපි භාග්‍යවතුන් වහන්සේ සමීපයෙහි පැවිද්ද ලබන්නෙමු.)

**3. වෙසයිකාධාරය නම් විෂයකොට පවත්නා අධාරයයි.** ආකාසෙ සකුනා චරන්ති. (=අහසෙහි පක්ෂීහු හැසිරෙත්) බුද්ධසාසනෙ පසන්නො (=බුදුසස්නෙහි පැහැදුණේ). 'ගාමෙ චරති' (=ගමෙහි හැසිරේ)

**4. ව්‍යාපිකාධාරය නම් තල ඇටයේ තෙල් ඇටය සැම තැනම පැතිරී පවත්නා සේ ආධෙය්‍යයෙන් පැතිර පවත්නා ආධාරයයි,** (යථොක්ත නිදර්ශනයෙහි තල ඇටය ආධාරයයි, තෙල ආධෙය්‍යයයි)

'ඛීරෙ ජලං (=කිරෙහි ජලයඃ) දධිම්හි සප්පි (=දීකිරෙහි ගිතෙල්) යනු උදහරණයි.

61. **1. කාලාර්ථයෙහි හා කාලයෙහි ද, 2. නිමිත්තාර්ථයෙහි ද, 3. අධිපති අර්ථයෙහි ද, 4. නිර්ධාරණාර්ථයෙහි ද, 5. දක්‍ෂාර්ථයෙහි ද, 6. අනාදරාර්ථයෙහි ද, 7. උපලක්‍ෂණාර්ථයෙහි ද සතතමි වේ.**

1. **කාලාර්ථයෙහිඃ-**

A. 'අනුප්පන්නෙ යෙව බුද්ධෙ (=බුදුරදුන් නූපන් කල්හිම)

B. බ්‍රහ්මදත්තෙ රජ්ජං කාරෙන්තෙ' (= බඹදත් රජු රාජ්‍යය කරවන කල්හි)

1. **කාලයෙහිඃ-**

A. අපරභාගෙ මහාකාලො උපසම්පදං ලභිත්වා' (ධ. අ.)

B. 'අථෙකා කුලධීතා.......... සායණ්හසමයෙ අමිලාතා අකිලන්තා කාලමකාසි.' (ධ. අ. චූලකාළ මහාකළ) ඉක්බිති එක් කුලදුවක් නොමැලවුනී නො වෙහෙසුනීම හවස් කාලයෙහි කලුරිය කළාය.

**2.නිමිත්තාර්ථයෙහිඃ-**

'**සම්පජානමුසාවාදෙ** පාචිත්තියං' (=දැන දැන බොරු කීමෙහි හෙවත් බොරුකීම නිමිති කොට පාචිත්තිය ඇවැත සිදුවේ.)

**3. අධිපති අර්ථයෙහි :-**

'අන්ධබාලොසි'ති මහාරාජ.... චීසු රට්ඨෙසු රජ්ජං කාරෙසි; පඤ්ඤ පන තෙ මන්දා.' (ධ. අ. කුමුදුපපලාතිකං) මහරජ, අඥානවෙහි; කාශි - කෝශල දෙරටෙහි; රාජ්‍යය කෙරෙහි; නමුත් ඔබගේ ප්‍රඥව මදය.)

4. නිර්ධාරණයෙහි :-
නිර්ධාරණය කුමක්දැයි ෂට්ඨීයෝගයේදි විස්තර කරන ලදී.

තෙසු ජනෙසු ඛත්තියෙසු....... අනුරුද්ධො පුවෙත පරාජිතො පූවභ්ථාය පහිණි.' (ධ. අ. දෙවදත්ත2) ඒ ක්ෂත්‍රියයන් සදෙන අතුරෙන් අනුරුද්ධතෙමේ කැවුම්වලින් පැරදුනේ කැවුම් ගෙන ඒම පිණිස පණිවිඩ යැවීය.

5. දක්ෂාර්ථයෙහි:-
A. 'සොසකො කිර ගුළකීළාය ඡෙකො' (ධ. අ. උදෙන)
B. 'ගවෙසමානො පසෙසයා භූතවිජ්ජාසු කොවිදං' (උපාලිථෙරාපදාන) හෙතෙම සොයන්නේ භූතවිද්‍යාවන්හි දක්ෂයෙකු දකින්නේය.

C. 'තෙජොධාතුසු කුසලො මනුස්සනාගො පි තත්‍ථ පජ්ජලි.' විනයමහාවග්ග) තෙජෝධාතුවෙහි දක්ෂ වූ මනුෂ්‍ය ශ්‍රේෂ්ඨයා ද එහිදී දැල්වුණේය.

6. අනාදරාර්ථයෙහි:-
'සො ..................... තාය පාදෙ සම්මිස්සජිතෙ නික්ඛමිත්වා වෙගෙන විහාරං ගන්ත්වා......... පබ්බජි.' (ධ. අ. 169 වත්ථු) ඇය පය හකුළා ගත් කෙණෙහි හෙතෙම ගෙයින් පිටවී වේගයෙන් විහාරයට ගොස් පැවිදි විය.

7. උපලක්ෂණාර්ථයෙහි:-
'අථ ඛො බ්‍රාහමණො පොක්ඛරසාති.............. උක්කාසු ධාරියමානාසු උක්කට්ඨාය නියාසි.' (දී. අම්බට්ඨ) ඉක්බිති පොක්ඛරසාති බ්‍රාහමණතෙමේ පන්දම් දරන කල්හි උක්කට්ඨානුවරින් පිටත් විය.

6. යමෙක් යමක් කිරීමෙහි බලවත් සැලකීමක් දක්වන්නේ නම් එහි ද සත්තමිය යෙදේ.

'අභික්කන්තෙ පටික්කන්තෙ සම්පජානකාරී හොති, ආලොකිතෙ විලොකිතෙ සම්පජානකාරී හොති.' (දී. මහාසතිප) හෙතෙම ඉදිරියට යාමෙහි පස්සට යාමෙහි නුවණින් ක්‍රියා කරන්නේ වෙයි. ඉදිරිය බැලීමෙහි හා හාත්පස බැලීමෙහි නුවණින් යුක්ත වෙයි.

62. ගෞරව කිරීම, ආදරය පෙන්වීම, වැඳීම, අල්ලා ගැනීම, සිඹීම, පහරදීම, ආශාවීම යන අර්ථවත් පදයන් හා යෙදීමේදීත් සත්තමිය වේ.

පාලිභාෂාවතරණය iii

A. ඇල්ලීම:- 'ගහපතිකො ඔතරිත්වා කෙසෙසු ගහෙත්වා නාමෙත්වා කප්පරප්පහාරෙහි කොට්ටෙත්වා ගලෙ ගහෙත්වා ආගත මග්ගාභිමුඛං ඛිපිත්වා පක්කාමි' (ඉල්ලීස ජා) ගෘහපතියා කරත්තෙන් බැස කෙස්වලින් අල්වාගෙන නමා වැලමිටිවලින් ඇන බෙල්ලෙන් අල්ලා ආ මගට අභිමුඛ කොට දමා ගියේය.

B. පහරදීම:- 'අසනිං පාතෙන්තො විය ඛන්ධෙ පහරිත්වා රථං ආදාය අගමාසි' (ඉල්ලීස ජා.) හෙනයක් හෙළන්නා සේ පිටට ගසා රථය ගෙන ගියේය.

C. සිඹීම: 'අථ නං සෙට්ඨි........... සීසෙ චුම්බිත්වා........... තං අත්තනො ජෙට්ඨධීතුට්ඨානෙ ඨපෙසි.' (ධ. උදෙන) සිටුතෙම ඇගේ හිස සිඹ ඇය දෙටු දූ තනතුරෙහි තැබීය.

D. ආශාවීම :- 'පාපස්මිං රමතී මනො' (ධම්මපද ගා. 116)

E. ගෞරව කිරීම 'තෙසු අසස සාගරවො.' (සං. 1, 178)

## උදාහරණ ix

1. 'බොධිසත්තෝ ඉදනෙ'ස හත්ථිපිට්ඨා පතිත්වා මරිස්සතීති හත්ථිතො අපතනත්ථං භීමසෙනං යොත්තෙන පරික්ඛිපිත්වා ගණ්හි.' (භීමසෙන ජා.)

2. 'ඉතො පන වීසං යොජනසතමත්ථකෙ ගන්ධාරරට්ඨෙ තක්කසිලා-නගරං නාම අත්ථි, තත්ථ ගන්තුං සක්කොන්තො ඉතො සත්තමෙ දිවසෙ රජ්ජං ලච්ඡසි.' (තෙලපත්ත ජා.)

3. 'මනුස්සාපි ථෙරං නිස්සාය මහාදුක්ඛතො මුත්තම්හා'ති තුස්සිංසු.' (ධ.අ.)

4. 'පුරත්ථිමතො නගරස්ස මකුටබන්ධනං නාම මල්ලානං චෙතියං, තත්ථ භගවතො සරීරං ඣාපෙස්සාම.' (දීඝ මහාපරිනි)

5. 'ථෙරෙහි පුරෙතරමෙව එකපස්සෙන ගන්ත්වා සිරිවඩ්ඪකස්ස නිවෙසනද්වාරෙ අට්ඨාසි' (අග්ගසාවක ධ. අ.)

6. 'රාජගහතො අවිදූරෙ උපතිසසගාමො කොලිතගාමො'ති ද්වෙ බ්‍රාහමණගාමා අහෙසුං' (ධ. අ. අග්ගසාවක)

7. 'දීඝතො තිංසයොජනං, විත්ථාරතො පඤ්ඤරසයොජනං අසසමං මාපෙහි.' (ජාතකනිදාන)

8.A. ලද්ධාන විත්තං න දදන්ති මොහා' (ථෙර ගා. 784)
B. 'තස්මා හි පඤ්ඤා ව ධනෙන සෙය්‍යා.' (ථෙර ගාථා 776)

9. A 'කුටුම්බිකස්ස තෙ ගෙහෙ හත්තං භුඤ්ජනතො වරතරං මීළහං ඛාදිතුං' B 'ආම ජම්බුක: අහං බ්‍රහ්මුනාපි අතිබ්‍රහමා.' (ධ. අ. ජම්බුකාජීවක)

10. 'පිතා පනසස දානාදීනං පුඤ්ඤනං කතත්තා දෙවලොකෙ සක්කො හුත්වා නිබ්බත්ති.' (ඉල්ලීස ජාතක)

11. 'අථ බො ආයසමා මහාකස්සපො තසස සත්තාහසස අච්චයෙන තමහා සමාධිමහා උට්ඨාසි' (ධ. අ. ෂ, 427)

12. 'දසහි ච ලොකධාතුහි දෙවතා යෙභුය්‍යෙන සන්නිපතිතා හොන්ති' (දීඝ ii, 253)

13. 'අථ බො අහං........... උක්කට්ඨායං සුභගවනෙ සාලරාජමූලෙ අන්තරහිතො අවිහෙසු දෙවෙසු පාතුරහොසිං' (දීඝ. මහාපදාන)

14. 'එවං නිසින්නෙ තස්මිං ආයසමන්තෙ මහාකස්සපත්ථෙරො භික්ඛු ආමන්තේසි.' (විනය අටුවා)

15. 'පවත්තති නු බො මෙ දානග්ගං උදහු නොති ආවජ්ජෙන්තො තසස ච අප්පවත්තිං පුත්තසස ච කුලවංසං නාසෙත්වා............ එකකසෙස'ව සුරං පිවනභාවඤ්ච දිසවා.' (ඉල්ලීස ජාතක.)

16. රඤ්ඤො පන අපරෙපි තයො පුත්තා අහෙසුං, තෙසු ජෙට්ඨසස පඤ්චයොධසතානි පරිවාරා.' (ධ අග්ගසාවකවත්ථු)

17. 'පච්චෙකබුද්ධස්ස ජාතස්සරං ඔරුය්හ නහායන්තස්ස තීරෙ ඨපිතෙසු කාසාවෙසු චීවරං ථෙනෙත්වා තෙසං හත්ථිනං ගමනාගමන මග්ගෙ සසීසං පාරුපිත්වා නිසීදති.' (ධ. අ. දෙවදත්ත)

18. 'සත්ථා තිණ්ණං ගමනානං අඤ්ඤතරෙන ගමෙනෙන ධම්මසභං ගන්ත්වා.' (අ. ධ.)

19. 'තාවතකෙසු පුත්තනත්ත - සහසෙසසු එකොපි අන්තරා මරණ පත්තො නාම නාහොසි.' (ධ. අ. විසාඛාවත්ථු)

20. 'තථාගතො අතීතෙ බුද්ධෙ ජාතිතොපි අනුස්සරති නාමතොපි.......... ගොත්තතොපි.................... අයුප්පමාණතොපි අනුස්සරති.' (දීඝ. ii, 10)

21. 'යො ඉමෙසං සොළසන්නං මහජනපදානං පහූත සත්තර තනානං ඉස්සරියාධිපච්චං රජ්ජං කාරෙය්‍ය.' (තිකංගුත්තර)

22. 'අතීතෙ බාරාණසියං බ්‍රහ්මදත්තෙ රජ්ජං කරෙන්තෙ බොධිසත්තො සබ්බසිප්පෙසු නිප්ඵත්තිං පත්තො තස්සෙව අච්චෝ අහොසි.' (මහාසාරජාතක)

23. 'අහං හි භො එතරහි රාජා ච රඤ්ඤං, බ්‍රහ්මා ච බ්‍රාහ්මණානං, දෙවතාච ගහපතිකානං.' (මහාගොවින්ද සුත්තාදීඝ)

24. 'මාතාපිතූන්නං අපස්සන්තානං යෙව බහි ගන්ත්වා පබ්බජිස්සාමි.' (ධ. අ. 169 වත්ථු)

## අන්‍ය විභක්තීන්ගේ අර්ථයන්හි යෙදෙන විභක්තීහු

63. ද්‍විතියාවිභක්තිය තතියා - චතුත්ථි - ඡට්ඨි - සත්තමීන්ගේ අර්ථයන්හිද වේ.

තෘතීයාර්ථයෙහි: 'සචෙ මං සමණො ගොතමො ආලපිස්සති අහම්පි තං ආලපිස්සාමි.' (=ඉදින් ශ්‍රමණ ගෞතම තෙමේ මා හා කථා කරන්නේ නම් මම ද ඔහු හා කථා කරන්නෙමි.) (බ්‍රාහ්මණ සංයුත්ත)

'අහම්භන්තෙ තීණි සරණානි විනා වත්තිතුං න සක්කොමි.'

(=ස්වාමීනි, මම තුන්සරණින් වෙන්ව වසන්ට නොහැක්කේ වෙමි.) (බුද්ධ වංසට්ඨ කථා)

ෂෂ්ඨ්‍යර්ථයෙහි: (මෙය 'අන්තරා' ආදි නිපාත කීපයකගේ යෝග යෙහිදී පමණකි.) 'අන්තරා ච රාජගහං අන්තරාච නාලන්දං අද්ධාන මග්ගපටිපන්නො හොතු' (= රාජගහවට ද නාලන්දාවට ද අතරෙහි දීර්ඝ මාර්ගයට පිළිපන්නේ වේ) (බ්‍රහ්මජාල සුත්ත)

සප්තම්‍යර්ථයෙහි: A. 'අථ බො භගවා පුබ්බණ්හසමයං නිවා සෙත්වා රාජගහං පිණ්ඩාය පාවිසි.' (= ඉක්බිති භාග්‍යවතුන්වහන්සේ පෙරවරු කල්හි (සිවුරු) හැඳ රජගහවට පිඬු පිණිස පිවිසි සේක.) B. 'එකං සමයං භගවා සාවත්ථියං විහරති.'

64. තතියා විභත්තිය දුතියා - පඤ්චමී-සත්තමීන්ගේ අර්ථයන්හි ද වේ.

ද්විතීයාර්ථයෙහි: 'සචේ භවං රේණු රජ්ජං ලභෙථ, සංවිභජෙථ නො රජ්ජේන' (= ඉදින් භවත් රේණු තෙමේ රාජ්‍යය ලබන්නේ නම් අපට ද රාජ්‍යය බෙදා දෙනු මැනවි.) (මහාගොවින්ද දීඝ)

මෙවැනි යෙදීම් දුර්ලභ වෙති.

පඤ්චම්‍යර්ථයෙහි : 'අලං ආවුසො මා සොචිත්ථ. මා පරිදෙවිත්ථ, සුමුත්තා මයං තෙන මහා සමණෙන (=ඇවැත්නි, පමණය, ශෝක නොකරව්, විලාප නොකියව්, අපි ඒ මහා ශ්‍රමණයාගෙන් මනා කොට මිදුණෙමු.) (පරිනිබ්බාණ දීඝ)

'සප්තම්‍යර්ථයෙහි: A. තෙන සමයෙන බුද්ධො භගවා වෙරඤ්ජායං විහරති.' B. 'කාලෙන ධම්මසවණං' (=යෝග්‍ය කාලයෙහි ධර්ම ශ්‍රවණය) C. 'යෙන භගවා තෙනුපසංකමි' (භාග්‍යවතුන් වහන්සේ යම් තැනෙක්හි ද එතැන්හි එළඹියේය.)

65. ජට්ඨීවිභත්තිය දුතියා-තතියා-පඤ්චමීසත්තමීන්ගේ අර්ථයන්හි ද වේ.

ද්විතියාර්ථයෙහි (දතා, ලාභී' ආදී කිතකපදයෝගයෙහි මෙය බෙහෝ සේ පෙනේ.) A. 'අමතස්සදාතා' (අමෘතය දෙන්නා) B. 'ලාභිනී බොධිසත්ත මාතා හොති පඤ්චන්නං කාමගුණානං' (=බෝසත් මව

පස්කම් සැප ලබන්නී වේ.) C. 'නත්ථි චන්දිමසූරියා නං දසසාවී' (=චන්ද්‍ර සූර්‍යයන් දක්නෙක් නැත)

D න ත්වං තාත රට්ඨපාල, කස්සචි දුක්ඛස්ස ජානාසි' )= දරුව රට්ඨපාල, තෝ කිසි දුකක් නොදන්නෙහි) (රට්ඨපාල සුත්ත ම)

තෘතියාර්ථයෙහිඃ A 'පූරති බාලො පාපස්ස' (=අඥනයා පාපයෙන් පිරේ. B. 'අද්දසා..... විපස්සී..... කුමාරො නානාරත්තානං දුස්සානං විලාතං කයිරමානං' (=විදර්ශීකුමාරතෙමේ නානාවර්ණවත් වස්ත්‍රවලින් කරන තුම්බයක් දුටුවේය). (මහාපදාන. දීඝ)

පඤ්චම්‍යර්ථයෙහිඃ A. 'බ්‍රාහ්මණ, කුසලො ත්වං රාජගහගාමිස්ස මග්ගස්ස?' (බමුණ, තෝ රජගහවට යන මාර්ගයෙහි දක්‍ෂවෙහිද?) (107 සූත්‍රය ම)

66. සත්තමීවිභත්තිය දුතියා-චතුත්ථීන්ගේ අර්ථයන්හිද වේ.

ද්විතියාර්ථයෙහිඃ 'නාරදෙ රත්තිං නික්ඛමන්තො තස්ස ජටාසු අකකමී.' (= නාරද තෙම රාත්‍රියෙහි නික්මෙන්නේ ඔහුගේ ජටාවන් පෑගුවේය.)

චතුර්ථ්‍යර්ථයෙහි සංඝෙ ගොතමී දෙහි, සංඝෙ තෙ දින්නෙ අහංඤ්චෙව පූජිතො භවිස්සාමි' (=ගෞතමිය, සංඝයාට දෙව, සංඝයාට දුන් කල්හි මමද පුදන ලද්දේ වන්නෙමි.)

(දක්ඛිණා විභංග. මජ්ඣිම)

භවමත්ථු භවන්තං ජොතිපාලං මාණවං' (භවත් ජොතිපාල මාණවකයාට අභිවෘධියක් වේවා) යන ගොවින්ද සූත්‍රයේ ඇතුළත් වාක්‍යයෙහි දුතියා විභත්තිය චතුර්ථියගේ අර්ථයෙහි යැයි කියයුතු වේ. මෙවැනි තැන් දුර්ලභ වේ.

67. චතුර්ථිය දුතියාවගේ අර්ථයෙහි යෙදී තිබෙනු කලාතුරකින් දක්නා ලැබේ.

'අප්පො සගගාය ගච්ඡති' = ස්වල්ප පිරිසක් ස්වර්ගයට යති.

(ධම්මපද)

## උදාහරණ X

1. 'තෙන ඛො පන සමයෙන ආයස්මා මහාකස්සපො පාවාය කුසිනාරං අද්ධානමග්ගපටිපන්නො හොති මහතා භික්ඛු සංඝෙන සද්ධිං'
(මහාපරිනිබ්බාණ)

2. 'පඨව්‍යා එකරජ්ජෙන සග්ගස්ස ගමනෙන වා
සබ්බලොකාධිපච්චෙන සොතාපත්තිඵලං වරං' (ධම්මපද 178)

3. 'කො නුඛො භො පහොති ඉමං මහාපඨවිං උත්තරෙන ආයතං දක්ඛිණෙන සකට මුඛං සත්තධා සමං සුවිභත්තං විභජිතුං.'
(මහාගොවින්ද දීඝ)

4. තෙසු ආයස්මා භද්දියො තෙනෙව'න්තරවස්සෙන තෙවිජ්ජො අහොසි. (ධ. අ. දෙවදත්ත 27)

5. 'ඡින්නං ගෙහානමන්තරෙ උභතො දීඝං ආවාටං ඛණාපෙත්වා ගූථකලලස්ස පූරාපෙසි.' (ධ. අ. ගරහදින්න)

6. තත්‍ර'ස්ස දොවාරිකො............... මෙධාවි අඤ්ඤාතානං නිවාරෙතා ඤාතානං පවෙසෙතා.' (මහාපරිනිබ්බාණ දීඝ)

7. 'රඤ්ඤො ඉමං පාටිහාරියං පස්සන්තස්ස පීතියා නිරන්තරං ඵුටසරීරස්ස අඤ්ජලිම්පග්ගහෙත්වා ඨිතස්සෙ'ව මහාබොධි මූල සතෙන සුවණ්ණකටාහෙ පතිට්ඨාසි.' (විනය අ.)

8. 'මයං මරණස්ස අභායනකසත්තො නාම නත්ථීති කන්දිම්හාති.'
(ධ. අ. ධම්මික උපාසක)

9. සො ඉමමෙව කායං උද්ධං පාදතලා අධො කෙසමත්ථකා තචපරියන්තං පූරං නානාප්පකාරස්ස අසුචිනො පච්චවෙක්ඛති.'
(මහාසතිපට්ඨාන)

10. A. 'සො තත්ථ ලාභී හොති අන්නස්ස පානස්ස මාලාලංකාරස්ස.

B. 'සො ලාභී හොති දිබ්බානං පඤ්චකාමගුණානං'
(දසකංගුත්තර)

11. 'චත්තාරි'මානි ආනන්ද සද්ධස්ස කුලපුත්තස්ස දස්සනීයානි ඨානානි.' (දීඝ මහාපරිනිබ්බාණ)

12. 'රාජා දිසම්පති හෝතො ජොතිපාලස්ස මාණවස්ස දස්සනකාමො.' (දීඝ)

13. 'සො එවං පබ්බජිතො සමානො..... අද්දස භගවන්තං අන්තරා'ච නාලන්දං අන්තරා'ච රාජගහං බහුපුත්තකෙ චෙතියෙ නිසින්නං.' (කස්සපසංයුත්ත)

14. 'අථ ඛො ථූණෙය්‍යකා බ්‍රාහ්මණගහපතිකා උදපානං තිණස්ස ච භුසස්ස ච යාව මුඛතො පූරෙසුං.' (උදාන)

15. 'එසො මහාරාජ මං ජටාසු ච ගීවායං ච අක්කමි; නා'හං එතං කූටජටිලං ඛමාපෙමි.' (ධ. අ. චූල්ලතිස්සථෙර)

16. 'අමතං තෙසං භික්ඛවෙ අපරිභුත්තං යෙසං කායගතා සති අපරිභුත්තා.' (අංගුත්තර)

17. 'තස්ස පිට්ඨිං අභිරූහිත්වා සිංගෙ ගණ්හිත්වා ඔලම්බන්තො නඞ්ගුට්ඨෙ ගහෙත්වා දෙලායන්තො කීළි.'

18. 'අද්ධා හි නූන මිගරාජ, පූටකම්මස්ස කොවිදො.'
(මහිසජාතක)

19. 'විචිත්ත-වත්ථාභරණා ආමුත්තමණිකුණ්ඩලා
කුසලා නච්චගීතස්ස සක්කස්ස පරිචාරිකා.'

20 'උක්කාසු ධාරියමානාසු රාජගහම්හා නිය්‍යාසි මහච්චා රාජානුභාවෙන.' (සාමඤ්ඤඵලදීඝ)

## තතියාව සමග යෙදෙන වචන කීපයක්

68. සක්කා යන්න 'හැකි' යන අර්ථ ඇති නිපාතයකි. එය සමග තතියාව යෙදේ:-

'අම්හෙහි ඉමස්මිං ඨානෙ වසිතුං න සක්කා' (=අප විසින් මෙතැන නොවිසිය හැක) යනාදී වශයෙනි.

69. වට්ටති යන්න 'වටී' යන අර්ථ ඇති ක්‍රියා පදයකි. එය යෙදිය හැක්කේ තතියාව සමගය.:-

70. ලබ්භා යන්න 'ලැබිය හැක' යන අර්ථවත් නිපාතයකි. එයත් තතියාව හා යෙදේ. 'තං කුතෙ'ත්ථ ලබ්භා' (=එය මෙහිදී කොහෙන් ලැබිය හැකිද?) මෙහි අධ්‍යාහාර කටයුතු කර්තෘ පදය තුම්හෙහි විය යුතුය.

න ලබ්භා තයා ගන්තුං (= තා නො යායුතුය; නොහොත් තට යන්ට නොලැබේ.)

මේ හැම උදාහරණයන්හිම තුං-ප්‍රත්‍යයාන්ත ශබ්දයක් යෙදී තිබේ. වාක්‍යයේ කර්තෘපදය වන්නේ ඒ පදයයි. ' අප විසින් මෙහි විසීම නො හැකිය' යන තැන 'නොහැකි වන්නේ කුමක්ද?' විසීමයි. එබැවින් එය කර්තෘපදය සේ ගතයුතු. අන් උදාහරණයන්හිත් එසේ විමසා බැලිය යුතු.

තතියාවක් යෙදී තිබුණත් මේ වාක්‍ය කර්මකාරකයෙහි නොවෙත්. අම්හෙහි වසිතුං න සක්කා යන තැන හොති යන ක්‍රියා පදය අධ්‍යාහාර කටයුතුයි. එවිට 'අප විසින් මෙහි විසීම නොහැකි වේ යන අර්ථය ලැබේ. වට්ටති යන්න ක්‍රියාවක් ම බැවින් එය යෙදී ඇති වාක්‍යයකට තවත් ක්‍රියාවක් ඕනෑ නොවේ. එය ද කර්මකාරක ක්‍රියාවක් නොවන බව සැලකිය යුතු. ගන්තුං වට්ටති = 'යන්ට වටී' යයි අර්ථ කීවත් නියම අර්ථය වශයෙන් ගත යුත්තේ 'යෑම වටී' යන්නයි.

## උදාහරණ xi

1. ' න සක්කා සෙට්ඨිනා චිරකාලං අම්හාකං භරණං පොසනං කාතුං' (ධ. අ. විසාඛාවත්ථු)

2. 'සක්කා චක්ඛුමතා කුලපුත්තෙන ඉමං උන්දූරං ගහෙත්වා දාරාභරණං වා කාතුං, කම්මන්තෙ වා පයොජෙතුං.' (චූල්ලසෙට්ඨි ජාතකය)

3. 'තං කුතෙ'ත්ථ ආනන්ද ලබ්භා, යං මෙ පරො අනභිරතිං විනොදෙත්වා අභිරතිං උප්පාදෙය්‍ය.' (මහාපරිනිබ්බාණ සුත්ත)

4. 'තං කුතෙ'ත්ථ ආනන්ද ලබ්භා, යං තං ජාතං භූතං සංඛතං පලොකධම්මං, තං වත මා භිජ්ජති.' (මහාපරිනිබ්බාණ සුත්ත)

5. 'කතඤ්ඤුනා මෙ භවිතුං වට්ටතීති එකං සතසහස්සං ගහෙත්වා චූලසෙට්ඨිස්ස සමීපං ගතො.' (චූල්ලසෙට්ඨි ජාතක)

6. 'සබ්බෙහි එකප්පහාරනෙව නිසීදිතුං වට්ටති.'

(ධ. අ. ගරහදින්න වත්ථු)

තෙමේම: තුමූම

71. 'හෙතෙම එය තමාම කළේය' යන වාක්‍යයෙහි තමාම යන්න පාළියෙන් අත්තනා යි යෙදිය යුතු වේ.

'ඔවුහු එය තුමූම කළහ' යන බහුවචන යුත් වාක්‍යයෙහි තුමූම යන්න යෙදෙන්නේත් අත්තනා යන එකවචනයෙනි.

## උදාහරණ xii

1. 'යන්නූනා'හං අත්තනාව අත්තනො අනභිරතිං විනොදෙත්වා අභිරතිං උප්පාදෙය්‍යං.' (සං. i 184)

2. 'අත්තනා ච පාණාතිපාතී හොති , පරංච පාණාතිපාතෙ සමාදපෙති.' (අං. i. 289)

3. 'එත්තකෙ නාම භොගෙ විජ්ජමානෙ නෙ'ව අත්තනා පරිභුඤ්ජි, න........... පුඤ්ඤකම්මං අකාසි.' (ධ.අ. v 79 අපුත්තක සෙට්ඨිවත්ථු)

4. 'කථං හි නාම අත්තනා අගණ්හන්තා මය්හම්පි අදාපෙත්වා පක්කමිස්සන්ති.' (බ්‍රහ්මසංයුත්තට්ඨ කථා)

# චතුර්ථ පරිච්ඡේදය

## ක්‍රියා පිළිබඳ විස්තර

73. යාමෙහි වැටෙන ගමු-දාතුවගේ අන්තයට හැම ආඛ්‍යාත විභක්තීන් පරකල්හි ච්ඡ-ආදෙශ වේ. ඒ ආදෙශය නොවී සෑදෙන පද ද විද්‍යාමානවන නමුත් වත්මානයෙහි ගමතී-ගමන්ති ආදී පද නොපෙනෙත්. අතීත-අනාගත කාලයන්හි දෙයාකාරයෙන්ම යුත් රූප විද්‍යාමාන වෙත්.

භුවාදිගණික-ගමුධාතුරූප
කත්තුකාරකපද පමණක් දක්වනු ලැබේ.
වත්තමානා පරස්ස පද

| | |
|---|---|
| සො ගච්ඡති | තෙ ගච්ඡන්ති |
| ත්වං ගච්ඡසි | තුම්හෙ ගච්ඡථ |
| අහං ගච්ඡාමි | මයං ගච්ඡාම |

අත්තනො පද

| | |
|---|---|
| සො ගච්ඡතෙ. | තෙ ගච්ඡන්තේ |
| ත්වං ගච්ඡසෙ | තුම්හෙ ගච්ඡව්හෙ |
| අහං ගච්ඡෙ | මයං ගච්ඡාම්හෙ |

පඤ්චමී, පරස්ස පද

| | |
|---|---|
| සො ගච්ඡතු | තෙ ගච්ඡන්තු |
| ත්වං ගච්ඡ, ගච්ඡාහි | තුම්හෙ ගච්ඡථ |
| අහං ගච්ඡාමි | මයං ගච්ඡාම |

අත්තනො පද

| | |
|---|---|
| සො ගච්ඡතං | තෙ ගච්ඡන්තං |
| ත්වං ගච්ඡස්සු | තුම්හෙ ගච්ඡව්හො |
| අහං ගච්ඡේ | මයං ගච්ඡාමසෙ |

සත්තමී, පරස්ස පද

| | |
|---|---|
| සො ගච්ඡේ, ගච්ඡේය්‍ය, | තෙ ගච්ඡෙය්‍යුං |
| ත්වං ගච්ඡෙය්‍යාසි, | තුම්හෙ ගච්ඡේය්‍යාථ |
| අහං ගච්ඡෙය්‍යාමි, | මයං ගච්ඡෙය්‍යාම |

අත්තනො පද

| | |
|---|---|
| සො ගවෙජථ, | තෙ ගවෙජරං |
| ත්වං ගවෙජථො, | තුම්හෙ ගවෙජයාව්හෙ |
| අහං ගවෙජයං, | මයං ගවෙජයාම්හෙ |

පරොක්ඛා, පරස්ස පද

| | |
|---|---|
| සො ගච්ඡි: ජගාම, | තෙ ගච්ඡු, ජගමු. |
| ත්වං ගවෙජ, ජගමෙ, | තුම්හෙ ගච්ඡිත්ථ, ගඤ්ඡිත්ථ, ජගම්ත්ථ |
| අහං ගවෙජ, ගං ජගම, | මයං ගච්ඡිම්හ, ගඤ්ඡිම්හ, ජගම්ම්හ |

අත්තනො පද

| | |
|---|---|
| සො ගච්ඡිත්ථ, ගඤ්ජිත්ථ, ජගම්ත්ථ, | තෙ ගච්ඡිරෙ, ජගම්රෙ |
| ත්වං ගච්ඡිත්ථො, ජගම්ත්ථො, | තුම්හෙ ගච්ඡිව්හො, ජගම්ව්හො |
| අහං ගච්ඡිං, ගඤ්ජිං, ජගමි. | මයං ගච්ඡිම්හෙ, ජගම්ම්හෙ |

හීයත්තනී, පරස්ස පද.

| | |
|---|---|
| සො අගච්ඡි, අගමා, අගා, | තෙ අගච්ඡු, අගමු. |
| ත්වං අගච්ඡා, | තුම්හෙ අගච්ඡිත්ථ |
| අහං අගච්ඡිං, අගච්ඡිං, | මයං අගච්ඡිම්හා |

අත්තනො පද

| | |
|---|---|
| සො අගච්ඡිත්ථ | තෙ අගච්ඡත්ථුං |
| ත්වං අගච්ඡසෙ | තුම්හෙ අගච්ඡිව්හං |
| අහං අගඤ්ජිං, අගච්ඡිං | මයං අගච්ඡිම්හසෙ |

අජ්ජතනී, පරස්ස පද

සො අගච්ඡි, ගච්ඡි, අගඤ්ඡි, ගඤ්ඡි, අගමි, ගමි, අගමාසි,
තෙ අගච්ඡුං: ගච්ඡුං, අගමුං, ගමුං, අගච්ඡිංසු, ගච්ඡිංසු, අගමිංසු, ගමිංසු, අගමංසු.
ත්වං අගච්ඡො, ගච්ඡො, අගච්ඡි, ගච්ඡි, අගඤ්ජි, ගඤ්ජි අගමො, ගමො අගමි, ගමි.

තුම්හෙ අගච්ඡිත්ථ, ගච්ඡිත්ථ, අගඤ්ඡිත්ථ, ගඤ්ඡිත්ථ, අගමිත්ථ, ගමිත්ථ, අගමුත්ථ, ගමුත්ථ, අගමත්ථ.
අහං අගච්ඡිං, ගච්ඡිං, අගඤ්ඡිං, ගඤ්ඡිං අගමිං ගමිං, ආගමාසිං.
මයං අගච්ඡිම්හ,-ම්හා, ගච්ඡිම්හ, ම්හා අගඤ්ඡිම්හා-ම්හා ගඤ්ඡිම්හ,-ම්හා, අගමිම්හ,-ම්හා, ගමිම්හ, ගමිම්හා.

## අත්තනො පද

සො අගච්ඡිත්ථ, ගච්ඡිත්ථ, අගමිත්ථ, ගමිත්ථ, අගච්ඡා, අගමා, ගමා, අගඤ්ඡිත්ථ: ගඤ්ඡිත්ථ
තෙ අගච්ඡු, ගච්ඡු, අගමු, ගමු, අගූ.
ත්වං අගමිසෙ, අගච්ඡසෙ
තුම්හෙ අගච්ඡිව්හං අගමිව්හං
අහං අගමං, ගමං, අගච්ඡං, ගච්ඡං, අගච්ඡ.
මයං අගච්ඡිම්හෙ, ගච්ඡිම්හෙ.

## භවිස්සන්ති පරස්ස පද

සො ගච්ඡිස්සති, ගමිස්සති
ත්වං ගච්ඡිස්සසි, ගමිස්සසි
අහං ගච්ඡිස්සාමි, ගමිස්සාමි
තෙ ගච්ඡිස්සන්ති, ගමිස්සන්ති
තුම්හෙ ගච්ඡිස්සථ, ගමිස්සථ
මයං ගච්ඡිස්සාම, ගමිස්සාම

## අත්තනො පද

සො ගච්ඡිස්සතෙ, ගමිස්සතෙ
ත්වං ගච්ඡිස්සසෙ, ගමිස්සසෙ
අහං ගච්ඡිස්සෙ, ගමිස්සෙ
තෙ ගච්ඡිස්සන්තෙ, ගමිස්සන්තෙ
තුම්හෙ ගච්ඡිස්සව්හෙ, ගමිස්සව්හෙ
මයං ගච්ඡිස්සාම්හෙ

## කාලාතිපත්ති පරස්ස පද

සො අගච්ඡිස්ස,-ස්සා, අගමිස්ස,-ස්සා, ගච්ඡිස්ස:-ස්සා, ගමිස්ස,-ගමිස්සා
තෙ අගච්ඡිස්සංසු, ගච්ඡිස්සංසු, අගමිස්සංසු, ගමිස්සංසු
ත්වං අගච්ඡිස්සෙ, ගච්ඡිස්සෙං, අගමිස්සෙ, ගමිස්සෙ
තුම්හෙ අගච්ඡිස්සථ, ගච්ඡිස්සථ, අගමිස්සථ, ගමිස්සථ
අහං, අගච්ඡිස්සං, ගච්ඡිස්සං, අගමිස්සං, ගමිස්සං
මයා අගච්ඡිස්සම්හා, ගච්ඡිස්සම්හා, අගමිස්සම්හා, ගමිස්සම්හා

අත්තනො පද

සො අගච්ඡිස්සථ, ගච්ඡිස්සථ, අගමිස්සථ, ගමිස්සථ
තෙ අගච්ඡිස්සිංසු, ගච්ඡිස්සිංසු, අගමිස්සිංසු, ගමිස්සිංසු
ත්වං අගච්ඡිස්සසෙ, ගච්ඡිස්සසෙ, අගමිස්සසෙ, ගමිස්සසෙ
තුම්හෙ අගච්ඡිස්සව්හෙ, ගච්ඡිස්සව්හෙ, අගමිස්සව්හෙ, ගමිස්සව්හෙ.
අහං අගච්ඡිස්සං, ගච්ඡිස්සං, අගමිස්සං, ගමිස්සං
මයං අගච්ඡිස්සාම්හසෙ, ගච්ඡිස්සාම්හසෙ, අගමිස්සාම්හසෙ.
ගමිස්සාම්හසෙ

## 74. කර ධාතුරූප

(කර ධාතුව තනාදිගණයෙහි වේ)

සො කරොති; කබ්බති; කයිරති
තෙ කරොන්ති; කුබ්බන්ති; කයිරන්ති
ත්වං කරොසි; කුබ්බසි; කයිරසි
අහං කරොමි; කුබ්බාමි; කයිරාමි
මයිං කරොම; කුබ්බාම; කයිරාම

අත්තනො පද

| | |
|---|---|
| සො කුරුතෙ; කුබ්බතෙ | තෙ කුබ්බනෙත |
| ත්වං කුරුසෙ; කුබ්බසෙ | තුම්හෙ කුරුව්හෙ; කුබ්බව්හෙ |
| අහං කරෙ; කුබ්බෙ | මයං කුරුම්හෙ; කුබ්බම්හෙ |

පඤ්චමී පරස්ස පද

| | |
|---|---|
| සො කරොතු; කුබ්බතු; කයිරතු | තෙ කරොන්තු; කුබ්බන්තු |
| ත්වං කරොහි; තුබ්බහි | තුම්හෙ කරොථ; කුබ්බථ |
| අහං කරොමි; කුබ්බාමි | මයං කරොම; කුබ්බාම |

අත්තනො පද

| | |
|---|---|
| සො කුරුතං; කුබ්බතං | තෙ කුබ්බන්තං |
| ත්වං කරස්සු; කුබ්බස්සු; කුරුස්සු | තුම්හෙ කුරුව්හො; කුබ්බව්හො |
| අහං කරෙ; කුබ්බෙ | මයං කරොමසෙ; කුබ්බාමසෙ |

## ක්‍රියා පිළිබඳ විස්තර

### සත්තමී, පරස්ස පද

| | |
|---|---|
| සො කරෙ: කරෙය්‍ය: කයිරා: කුබ්බෙ: කුබ්බෙය්‍ය | තෙ කරෙය්‍යුං: කුබ්බෙය්‍යුං: කයිරුං |
| ත්වං කරෙය්‍යාසි: කුබ්බෙය්‍යාසි | තුම්හෙ කරෙය්‍යාථ: කුබ්බෙය්‍යාථ |
| අහං කරෙය්‍යාමි: කුබ්බෙය්‍යාමි | මයං කරෙය්‍යාම: කුබ්බෙය්‍යාම |

### අත්තනො පද

| | |
|---|---|
| සො කයිරාථ: කුබ්බෙථ | තෙ කුබ්බෙරං |
| ත්වං කුබ්බෙථො | තුම්හෙ කුබ්බෙය්‍යව්හො |

අහං කුබ්බෙය්‍යං: කරෙ: මයං කරෙය්‍යාම්හෙ, කුබ්බෙය්‍යාම්හෙ, කරෙය්‍යං

### හීයත්තනී, පරස්ස පද

| | |
|---|---|
| සො අකා: අකරා | තෙ අකරු |
| ත්වං අකරො | තුම්හෙ අකරත්ථ: අකත්ථ: අකරොථ |
| අහං අකරං, අකං | මයං අකරම්හා: අකම්හා |

### අත්තනො පද

| | |
|---|---|
| සො අකත්ථ | තෙ අකත්ථුං |
| ත්වං අකුරුසෙ | තුම්හෙ අකරව්හං |
| අහං අකරිං | මයං අකරම්හසෙ |

### අජ්ජතනී, පරස්ස පද

සො අකරි: කරි: අකරී: කරී: අකාසි
තෙ අකරුං: කරුං: අකරිංසු: කරිංසු: අකංසු: අකාසුං
ත්වං අකරො: කරො: අකරි: කරි
තුම්හෙ අකරිත්ථ: කරිත්ථ: අකාසිත්ථ
අහං අකරිං: කරිං
මයං අකරිම්හ: කරිම්හ: අකරිම්හා: කරිම්හා

### අත්තනො පද

| | |
|---|---|
| සො අකරා: කරිත්ථ: අකරිත්ථ | තෙ අකරු |
| ත්වං අකරිසෙ | තුම්හෙ අකරිව්හං |
| අහං අකර | මයං අකරිම්හෙ |

### භවිස්සන්ති, පරස්ස පද

සො කරිස්සති: කාහති: කාහිති
තෙ කරිස්සන්ති: කාහන්ති: කාහින්ති
ත්වං කරිස්සි: කාහසි: කාහිසි
තුම්හෙ කරිස්සථ: කාහථ
අහං කරිස්සං: කස්සං: කාහාමි
මයං කරිස්සාම: කස්සාම: කාහාම

### අත්තනො පද

සො කරිස්සතෙ: කාහතෙ
තෙ කරිස්සන්තෙ: කාහන්තෙ
ත්වං කරිස්සසෙ: කාහසෙ
තුම්හෙ කරිස්සව්හෙ, කාහව්හෙ
අහං කරිස්සෙ: කාහෙ
මයං කරිස්සම්හෙ: කාහම්හෙ

### කාලාතිපත්ති පරස්ස පද

සො අකරිස්සා: අකරිස්ස
තෙ අකරිස්සංසු
ත්වං අකරිස්සෙ
තුම්හෙ අකරිස්සථ
අහං අකරිස්සං
මයං අකරිස්සම්හා

### අත්තනො පද

සො අකරිස්සථ
තෙ අකරිස්සිංසු
ත්වං අකරිස්සසෙ
තුම්හෙ අකරිස්සව්හෙ
අහං අකරිස්සං
මයං අකරිස්සාම්හසෙ

### පරොක්ඛා, පරස්ස පද

සො කර
තෙ කරු
ත්වං කරෙ
තුම්හෙ කරිත්ථ
අහං කරිං
මයං කරිම්හා

### අත්තනො පද

සො කරිත්ථ
තෙ කරිරෙ
ත්වං කරිත්ථො
තුම්හෙ කරිව්හො
අහං කරි
මයං කරිම්හා

## උදහරණ xiii

### ගමු-කර-ධාතුරූප

මෙහි කළු අකුරෙන් දැක්වෙන ක්‍රියා කිනම් ආඛ්‍යාත විභත්තීන්හි වෙත්දැයි කිය යුතු.

1. 'අත්ථාය වත මෙ බුද්ධො, නදිං නෙරඤ්ජරං අගා'
(නදීකස්සප ථෙර)
2. 'කථංහි සික්ඛං පච්චක්ඛ, කාලං කුබ්බෙත පණ්ඩිතො?'
(සප්පදාසත්ථෙර)
3. 'න ලභෙ පිණ්ඩං, කථං මහං කස්ස?' (තෙකිච්ඡාකානි ථෙරො)
4. පුඤ්ඤං චෙ පුරිසො කයිරා කයිරාථෙ' තං පුනප්පුනං තම්හි
ඡන්දං කයිරාථ සුඛො පුඤ්ඤස්ස උච්චයො.' (ධම්මපද)
5. 'සො'හං නූන ඉතො ගන්ත්වා, යොනිං ලද්ධාන මානුසිං
වදඤ්ඤූසීලසම්පන්නො, කාහාමි කුසලං බහුං' (රේවතී විමානවත්ථු)
6. 'ගණම්හා වූපකට්ඨො සො, අගමාසි වනන්තරං'
(441 වීහිතකම්ඤ්ජිය හෝ මහානාගථෙරාපදාන)
7. 'මා'කාසි පාපකං කම්මං, ආවි වා යදි වා රහො' (පුණ්ණාථෙරී)
8. 'සමාදියාහි සිලානි, තං තෙ අත්ථාය හෙහිති.' (පුණ්ණා ථෙරී)
9. කාහින්ති ඛු තං කාමා, ජනා සුනඛං' ව චණ්ඩාලා.' (සුමෙධා ථෙරී)
10. 'අඤ්ඤෙනෙ'ව තානි චතුරාසීතිපබ්බජිතසහස්සානි අගමංසු
අඤ්ඤෙන විපස්සි බොධිසත්තො' (මහාපදාන)
11. 'ගහකාරක දිට්ඨොසී' පුන ගෙහං න කාහසී' (උදානපාළි)
12. 'නිහච්ච ජාණුං වන්දිත්වා, සම්මුඛා අඤ්ජලිං අකං'
(කුණ්ඩලකෙසා ථෙරී)
13. A 'තස්සා'හං සන්තිකෙ ගච්ඡං: සො මෙ සත්ථා භවිස්සති.'
(චාලාථෙරී)
B 'ආපුච්ඡිතූන ගච්ඡං මතුරියෙ, පබ්බජිස්සං වා' (ඉසිදාසි ථෙරී)
14 A 'අසජ්ජමානා අගමා: භූමියම්පි නමුඤ්ජථ:
අභිජ්ජමානෙ උදකෙ අගඤ්ජි මහියා යථා'
B 'යුගන්තෙ විය ලොකං සා ජාලාමාලාකුලං අකා.'
(මහා පජාපති අපාදන)
15. 'භො පබ්බජිත, අම්හාකං ගෙහමගමත්ථාති? ආම බ්‍රාහ්මණ,
අගමම්හාති.' (විනය අට්ඨුවා)
16. 'යාදිසං කුරුතෙ මිත්තං, යාදිසං චූපසෙවති,
ස වෙ තාදිසකො හොති: සහවාසො හි තාදිසො' (ඉතිවුත්තක)

17. A ' දුද්දදං දදමානානං, දුක්කරං කම්ම කුබ්බතං
අසන්තො නා'නුකුබ්බන්ති: සතං ධම්මො දුරන්නයො.'
B 'සබ්භිරෙව සමාසෙථ: සබ්භිකුබ්බෙථ සන්ථවං' (දෙවතාසං)
18. A 'යාමුනා ධතරට්ඨා ච ආගු නාගා යසස්සිනො
එරාවනො මහානාගො සො පා'ග සමිතිං වනං'
B 'නිම්මාණරතිනො ආගු අථා'ගු වසවත්තිනො'
C 'තෙ ච ආතප්පමකරුං සුත්වා බුද්ධස්ස සාසනං'
(මහාසමය දීඝ)
19. 'පදුමුත්තරබුද්ධස්ස ආජානීයමදාස'හං:
නීය්‍යාදෙත්වාන සම්බුද්ධං අගමාසිං සකං සරං' (ඔපවය්‍යථෙරාපදාන)
20. A 'ඉමම්හි බුද්ධථූපම්හි කස්සාම කඤ්චුකං මයං'
B අහම්පි කාරං කස්සාමි ලොකනාථස්ස තාදිනො'
(උපවානථෙරාපදාන)
21. හිසං මූලාලං ගණ්හිත්වා අගමං බුද්ධසන්තිකං' (හිසදායකථෙරාපදාන)
22. මනුස්සා චෙව දෙවා ච බුද්ධථූපං අකංසු තෙ' (උපවානථෙරාපදාන)

## 75. අස-ධාතුරූප (භූවාදිගණිකයි)
## කත්තුකාරක - පරස්සපද පමණකි

### වත්තමානා

| | |
|---|---|
| සො අත්ථි (= ඇත්තේය) | තෙ සන්ති (-ඇත්තාහ) |
| ත්වං ආසි (-වෙහි) | තුම්හෙ අත්ථ (-වව්) |
| අහං අස්මි: අම්හි (-වෙමි) | මයං අස්ම: අම්හ (-වෙමු) |

### පඤ්චමී

| | |
|---|---|
| සො අත්ථු (-වේවා) | තෙ සන්තු (-වෙත්වා) |
| ත්වං ආහි (-වෙහිවා) | තුම්හෙ අත්ථ (වව්වා) |
| අහං අස්මි: අම්හි (-වෙමිවා) | මයං අස්ම: අම්හ (-වෙමුවා) |

### සත්තමී

| | |
|---|---|
| සො සියා, අස්ස (-වන්නේ නම්) | තෙ සියුං: අස්සු: (-වන්නාහුනම්) |
| ත්වං අස්ස (-වන්නෙහි නම්) | තුම්හෙ අස්සථ (-වන්නෙව් නම්) |
| අහං අස්ස (-වන්නෙමි නම්) | මයං අස්සාම (-වන්නෙමු නම්) |

හූධාතුරූප

අජ්ජතනී

| | |
|---|---|
| සො ආසී (=වීය) | තෙ ආසිංසු (=වූහ) |
| ත්වං ආසි (=වූයෙහි) | තුම්හෙ ආසිත්ථ (=වූවහු) |
| අහං ආසිං (=වීමි) | මයං ආසිම්හ (= වීමු) |

අන්‍ය විභක්තිකරූප ද අත්තනො පද ද දුර්ලභ වෙති

76. හූ ධාතුකරූප (භූවාදිගණිකයි)
කර්තෘකාරකරූප පමණක් ඇත්තේයි.

වත්තමානා

හොති: හොන්ති: හොසි හොථ හොමි: හොම

පඤ්චමී

හොතු: හොන්තු, හොහි: හොථ: හොමි: හොම.

සත්තමී, පරස්ස පද

| | |
|---|---|
| සො හුවෙය්‍ය: හෙය්‍ය (=වන්නේ නම්) | තෙ හුවෙය්‍යුං, හෙය්‍යුං (=වන්නාහු නම්) |
| ත්වං හුවෙය්‍යාසි: හෙය්‍යාසි (=වන්නෙහි නම්) | තුම්හෙ හුවෙය්‍යාථ: හෙය්‍යාථ (=වන්නාහු නම්) |
| අහං හුවෙය්‍යාමි: හෙය්‍යාමි (=වන්නෙමි නම්) | මයං හුවෙය්‍යාම: හෙය්‍යාම (=වන්නෙමු නම්) |

අත්තනො පද

| | |
|---|---|
| සො හුවෙථ: හෙථ | තෙ හුවෙරාං: හෙරං |
| ත්වං හුවෙථො: හෙථො | තුම්හෙ හුවෙය්‍යාව්හො: හෙය්‍යාව්හො |
| අහං හුවෙය්‍යං: හෙය්‍යං | මයං හුවෙය්‍යාම්හෙ: හෙය්‍යාම්හෙ |

හීයත්තනි, පරස්ස පද

| | |
|---|---|
| සො අහුවා | තෙ අහුවූ |
| ත්වං අහුවො | තුම්හෙ අහුවත්ථ |
| අහං අහුවං | මයං අහුවාම්හෙ |

අත්තනො පද

| | |
|---|---|
| සො අහුවත්ථ | තෙ අහුවත්ථුං |
| ත්වං අහුවසෙ | තුම්හෙ අහුවව්හ |
| අහං අහුවිං | මයං අහුවම්හසෙ |

### අජ්ජතනී, පරස්ස පද

| | |
|---|---|
| සො අහොසි; අහු (=විය) | තෙ අහුං; අහෙසුං; (=වූහ) |
| ත්වං අහුවා; අහොසි (=වූයෙහි) | තුම්හෙ අහුවත්ථ; අහොසිත්ථ (=වූහු) |
| අහං අහොසිං; අහුං; අහුවිං; අහුවාසිං (=වීමි) | මයං අහුම්හා; අහොසිම්හා (=වීමු) |

### අත්තනො පද

| | |
|---|---|
| සො අහුවා | තෙ අහුවූ |
| ත්වං අහුවසෙ | තුම්හෙ අහුවිව්හං |
| අහං අහුව, අහුං | මයං අහුවිම්හා |

### භවිස්සන්ති, පරස්ස පද

සො හෙස්සති; හෙහිති; හොහිති; හෙහිස්සති; හොහිස්සති
තෙ හෙස්සන්ති; හෙහින්ති; හොහින්ති; හෙහිස්සන්ති; හොහිස්සන්ති
ත්වං හෙස්සහි; හොහිසි; හෙහිසි; හෙහිස්සසි; හොහිස්සසි
තුම්හෙ හෙස්සථ; හෙහිථ; හොහිථ; හෙහිස්සථ; හොහිස්සථ
අහං හෙස්සාමි; හෙහාමි; හොහාමි; හෙහිස්සාමි; හොහිස්සාමි
මයං,. හෙහිස්සාම, හෙහාම, හොහාම, හෙහිස්සාම, හොහිස්සාම

### අත්තනො පද

සො හෙස්සතෙ; හෙහිස්සතෙ; හොහිස්සතෙ
තෙ 'හොස්සන්තෙ, හෙහිස්සන්තෙ; හොහිස්සන්තෙ
ත්වං හෙස්සසෙ; හෙහිස්සසෙ; හොහිස්සසෙ
තුම්හෙ හෙස්සව්හෙ; හෙහිස්සව්හෙ; හොහිස්සව්හෙ
අහං හෙස්සං; හෙහිස්සං; හොහිස්සං
මයං හෙස්සාම්හෙ; හෙහිස්සාම්හෙ; හොහිස්සාම්හෙ

### කාලාතිපත්ති

| | |
|---|---|
| සො අහුවිස්සා | තෙ අහුවිස්සංසු |
| ත්වං අහුවිස්සෙ | තුම්හෙ අහුවිස්සථ |
| අහං අහුවිස්සං | මයං අහුවිස්සම්හා |

### අත්තනො පද

| | |
|---|---|
| සො අහුවිස්සථ | තෙ අහුවිස්සංසු |
| ත්වං අහුවිස්සසෙ | තුම්හෙ අහුවිස්සව්හෙ |
| අහං අහුවිස්සං | මයං අහුවිස්සාම්හසෙ |

## වද වච ආදී ධාතුරූප

### 77. කීමෙහි වැටෙන වද-ධාතුකරූප

වත්තමානා පරස්ස පද

| | |
|---|---|
| සො වදති: වදෙති: වජ්ජති | තෙ වදන්ති, වදෙන්ති, වජ්ජන්ති |
| ත්වං වදසි: වදෙසි: වජ්ජසි | තුම්හෙ වදථ: වදෙථ: වජ්ජථ |
| අහං වදාමි: වදෙමි: වජ්ජාමි | මයං වදාම: වදෙම: වජ්ජාම |

පඤ්චමී -පරස්ස පද

| | |
|---|---|
| සො වදතු: වදෙතු: වජ්ජතු | තෙ වදන්තු: වදෙන්තු: වජ්ජන්තු |
| ත්වං වද: වදාහි: වදෙහි: වජ්ජාහි | තුම්හෙ වදථ: වදෙථ: වජ්ජථ |
| අහං වදාමි: වදෙමි: වජ්ජාමි | මයං වදම: වදෙම: වජ්ජාම |

සත්තමී-පරස්ස පද

| | |
|---|---|
| සො වදෙ: වදෙය්‍ය: වජ්ජෙ: වජ්ජෙය්‍ය | තෙ වදෙය්‍යුං, වජ්ජුං |
| ත්වං වදෙය්‍යාසි, වජ්ජාසි | තුම්හෙ වදෙය්‍යාථ, වජ්ජුං |
| අහං වදෙය්‍යාමි: වජ්ජාමි | මයං වදෙය්‍යාම, වජ්ජාම |

සත්තමී-අත්තනො පද

| | |
|---|---|
| සො වදෙථ | තෙ වදෙරං, වජ්ජෙරං |
| ත්වං වදෙථො | තුම්හෙ වදෙය්‍යව්හො |
| අහං වදෙය්‍යං, වජ්ජං | මයං වදෙය්‍යාම්හෙ |

අජ්ජතනී පරස්ස පද

| | |
|---|---|
| සො අවදි: වදී: අවදිත්ථ: වදිත්ථ | තෙ අවදුං: වදුං: අවදිංසු: වදිංසු |
| ත්වං අවදො: වදො: අවදි: වදි | තුම්හෙ අවදිත්ථ: වදිත්ථ |
| අහං අවදිං, වදිං | මයිං අවදිම්හ: වදිම්හ: අවදිම්හා: වදිම්හා |

### 78. කීමෙහි වැටෙන වච ධාතුකරූප

'වචති, වචන්ති' ආදි වචධාතුවගේ ශුද්ධකර්තෘක ක්‍රියාපද දුර්ලභ වෙති. නමුත් 'වාචෙති (=කියවයි) වාචෙන්ති (කියවත්) ආදී හේත්වර්ථපද සුලභ වෙති. වද-ධාතුවගේ 'වාදෙති, වාදෙන්ති ආදී පද විද්‍යමාන වෙයි. නමුත් ඒ පද බෙහෝසේම කියවීම අර්ථයෙහි නොව බෙර ආදිය වාදනය කිරීමෙහි වැටෙති.

මේ වැයීමෙහි හෙවත් වාදනය කිරීමෙහි වැටෙන 'වද' ධාතුව චුරාදිගණයෙහි වේ. එබැවින් 'වාදෙති' යනාදි පද භූවාදිගණිකවද ධාතුවගේ හෙත්වත්ථපද නොව චුරාදිගණික වදි-ධාතුවගේ ශුද්ධ කර්තෘක ක්‍රියාපද ම යයි දතයුතු. මෙසේ භූවාදිගණිකවද-ධාතුවගේ හෙත්වත්ථරූපත් චුරාදිගණික වද-ධාතුවගේ ශුද්ධ ක්‍රියාරූපත් සමාන ලෙස සිටින බැවින් කියවීම් අර්ථයෙහි 'වාදෙති' යනාදිය ව්‍යවහාරයට නොගෙන 'වාචෙති' ආදී වච-ධාතුරූපම ගන්නා ලදැයි සිතිය හැක.

**හීයත්තනී, පරස්ස පද**

| | |
|---|---|
| සො අවචා | තෙ අවචූ |
| ත්වං අවචො | තුම්හෙ අවචුත්ථ |
| අහං අවචං | මයං අවචිම්හ |

අත්තනො පද

| | |
|---|---|
| සො අවචත්ථ | තෙ අවචත්‍ථුං |
| ත්වං අවචසෙ | තුම්හෙ අවචව්හං |
| අහං අවචිං | මයං අවචම්හසෙ |

අජ්ජතනී,පරස්ස පද

| | |
|---|---|
| සො අවචි, අවචාසි | තෙ අවොචු, අවිසිංසු |
| ත්වං අවොචො, අවචො | තුම්හෙ අවොචුත්ථ |
| අහං අවොචිං | මයං අවොචුම්හා |

අත්තනො පද

| | |
|---|---|
| සො අවොච | තෙ අවොචුං |
| ත්වං අවචසෙ | තුම්හෙ අවොචිව්හං |
| අහං අවොචිං | මයං අවොචිම්හෙ |

හවිස්සන්තියෙහි වච-හට වක්ඛාදෙශ වේ

| පරස්ස පද | අතතනො පද |
|---|---|
| (සො) වක්ඛති: වක්ඛිස්සති | වක්ඛතෙ: වක්ඛිස්සතෙ (-කියන්නේය) |
| (තෙ) වක්ඛන්ති: වක්ඛිස්සන්ති | වක්ඛනෙත: වක්ඛිස්සන්තෙ (-කියන්නේය) |
| (ත්වං) වක්ඛසි: වක්ඛිස්සසි | වක්ඛසෙ: වක්ඛීස්සසෙ (-කියන්නෙහිය) |

මෙසේ ඉතිරි පද ද යොදා ගත යුතු

### වද වච ආදී ධාතුරූප

මේ වචධාතුහුගේ වර්තමාන-කර්තෘකාරක-ප්‍රථම පුරුෂ එක වචනයෙහි වත්ති යන පදයක් විද්‍යාමාන වේ. කම්කාරකයේදී වච ධාතුවගේ වකාරයට වුකාර වී 'වුච්චති, වුච්චන්ති' ආදී පද ද වකාරයට උකාර වී 'උච්චති' ආදී පද ද සෑදෙති.

## උදහරණ xiv
(වද-වච-අස-භූ-ධාතුරූප)

1. 'නගරෙ බන්ධුමතියා, වෙජ්ජා ආසිං සුසික්ඛිතො'
(තෙකිච්ඡකාතිථෙරාපදාන)

2. A 'තතො මෙ ආසි සංවෙගො, අබ්භුතො ලොමහංසනො'
(උරුවෙලකස්සපත්ථෙරො)

B 'පස්සිය වරපුක්ඛලක්ඛණං, චක්ඛු ආසී යථා පුරාණකං' (සුභාථෙරී)

3. A 'නගන්තරෙ විටපිසමො සයිස්සං,
තං මෙ මුදු හෙහිති තූලසන්නිභං'

B 'තථො නිමිත්තං විමනො න හෙස්සං'

C 'දායාදකො හෙහිසි අග්ගවාදිනො' (කාලුදායී ථෙරො)

4. 'අභූවා මෙ සඟාමෙය්‍යා, අභූවා මෙ පුරෙ සඛා' (දෙවතා සංයුත්ත)

5. 'බ්‍රහ්මජ්වෙචා පුරෙආසිං, උදිච්චා උභතො අහු' (අංගුලිමාලත්ථෙරො)

6. 'අහුබුද්ධස්ස දායාදො භික්ඛු හෙසකලාවනෙ' (සිගාලපිතත්ථෙරො)

7. 'උපජ්ඣායො-මං අවචාසිඃ ඉතො ගච්ඡාමි සීවක' (සිවකත්ථෙරො)

8. 'දුග්ගතා'හං පුරෙ ආසිං විනා මිත්තෙහි ඤාතිහි' (චන්දාථෙරී)

9. කල්‍යාණමිත්තෙ භජමානො, අපි බාලො පණ්ඩිතො අසස'
(කිසාගොතමීථෙරී)

10. 'සියා ඛො පන භික්ඛවෙ එකභික්ඛුස්සාපි කඞ්ඛා වා විමති වා.............. පුච්ඡථ භික්ඛවෙ, මා පච්ඡා විප්පටිසාරිනො අහුවත්ථඃ 'සම්මුඛීභූතො නො සත්ථා අහොසි, න මයං සක්ඛිම්හ භගවන්තං සම්මුඛා පටිපුච්ඡිතු'න්ති. එවං වුත්තෙ තෙ භික්ඛූ තුණ්හී අහෙසුං.' (මහාපරිනිබ්බාණ සුත්ත)

11. A 'තෙසු අසස සගාරවො..... තෙ ච'සසු සාධු පූජිතා.'
(බ්‍රාහ්මණ සංයුත්ත)

B. 'එවං වාදිනො භික්ඛවෙ අඤ්ඤතිත්ථියා පරිබ්බාජිකා එවමස්සු වචනීයා' (මහාදුක්ඛන්ධ සුත්ත)

12. 'අහං භදන්තෙ ආහුවාසිං පුබ්බෙ,
සුමෙධනාමසස ජිනසස සාවකො' (අනෙකවණ්ණවිමාන වත්ථු)

13. 'සො'හං අජ්ජ කථං වජ්ජං අහං තිවෙචා'ම්හි සසසතො?'
(මහාමොග්ගල්ලානථෙරගාථා)

14. 'උපකො ආජීවකො හුවෙය්‍ය පාවුසොති වත්වා සීසං ඔකම්පෙත්වා උම්මග්ගං ගහෙත්වා පක්කාමි.' (මහාවග්ගපාළි)
15. A 'සබ්බාභිභූ සබ්බවිදූ'හ'මස්මි' B 'මහාබන්ධන මුත්තො'මිහි නිහතො ත්වං'සි අන්තක' (මහාවග්ගපාළි)
16. 'එහි සාරථී, ගච්ඡාහි රථං නීයාතයාහි මං;
අරොග්‍යං බ්‍රාහමණිං වජ්ජා, පබ්බජිතො'දනි බ්‍රාහ්මණො' (සුන්දරීථෙරී ගාථා)
17. A 'වන්දනංදනි වජ්ජාසි ලොකනාථං අනුත්තරං'
B 'වන්ද නංදානි තෙ වජ්ජං ලොකනාථං අනුත්තරං' (චාපාථෙරී)
18. 'අහං තව වසානුගො සියං,
යදි විහරෙමසෙ කානනන්තරෙ' (සුභා ථෙරී)
19. A 'මාතා පුත්තො පිතා භාතා අය්‍යකා ච පුරෙ අහුං'
B 'තදා'හ හංසවතියං ජාතා'මච්චකුලෙ අහුං' (මහාපජාපතී ගොතමී)
20. 'එහි භද්දෙති මං අවච; සා මෙ ආසූ'පසම්පදා' (භද්ද කුණ්ඩලකෙසා)
21 'තස්ස ධම්මෙසු දායාදො ඔරසො ධම්මනිම්මිතො
සාරිපුත්තොති නාමෙන හෙස්සති සත්ථුසාවකො' (සාරිපුත්තථෙරාපදාන)

## උද්ධරණ xv
### (වද-වච-අස-හූ ධාතුරූප)

1. 'අරුණකා සත්ත ජනා චක්කවත්තී මහබ්බලා
ජත්තිංසතිම්හි ආසිංසු කප්පම්හි මනුජාධිපා' (වත්ථදායකත්ථෙරාපදාන)
2. පබ්බජ්ජා වා හෙහිති, මරණං වා, න චෙව වාරෙය්‍යං'
3. 'න තාව ආහාරං ආහරියාමි ගහට්ඨා;
මරණවසං ගතාව හෙස්සාමි' (සුමෙධා ථෙරී)
4. 'තුම්හෙ.................. ඉමස්මිං අධිකරණෙ නො සහායකා අහුවත්ථ' (විනය අ.)
5. 'නමො තෙ බුද්ධවීරත්ථු, විප්පමුත්තො'සි සබ්බධි' (උජ්ජයො ථෙරො)
6. 'නො'ති පඨමං අවචා'හං භන්තෙ,
පච්ඡා තෙ වචනං තථෙව'කාසිං' (ඡත්තමාණවකවිමානවත්ථු)
7. 'යං හි කයිරා තංහි වදෙ; යං න කයිරා න තං වදෙ' (හාරිතත්ථෙරො)
8. A 'අථ ඛො කොසිනාරකා මල්ලා ආයස්මන්තං අනුරුද්ධං එතදවොචුං' B 'ඉදමවොච භගවා, ඉදං වත්වා සුගතො උට්ඨායාසනා විහාරං පාවිසි.'
9 'නා,හං සක්කොමි විත්ථාරෙන ධම්මං දෙසෙතුං; අපි ච තෙ සංඛිත්තෙන අත්ථං වක්ඛාමීති.'

10. "අප්පං වා බහුං වා භාසස්සු, අත්ථඤ්ඤෙව මෙ බ්‍රෑහි. අත්ථෙනෙව මෙ අත්ථො, කිං කාහසි ව්‍යඤ්ජනං බහුං." (වි. මහාවග්ග)

11. A "තුම්හෙ හීයො අම්හාකං ගෙහෙ කිඤ්චි අලද්ධායෙව ලභිම්හාති අවොචුත්ථ" B "අපේ'තං පටිසන්ථාරං උපාදාය එව මවොචුම්හාති." (විනය අට්ඨුවා)

12. "සා........ තුම්හෙහි දිට්ඨධම්මස්ස භාගිනී අස්සන්ති පත්ථනං අකාසි." (විමානවත්ථු අට්ඨකථා)

13. "සාධු භන්තෙ භික්ඛූ යාවජීවං ආරඤ්ඤකා අස්සු, පිණ්ඩපාතිකා." (දෙවදත්ත ව. ධ. අ.)

14. "පුන පි යක්ඛ වජ්ජාසි යා පස්සසි එදිසං" (වනසංයුක්ත)

15. "සියා ච'ස්ස කායෙ බලමත්තා: තස්ස එවමස්ස: අහං ඛො පුබ්බෙ ආබාධිකො අහොසිං,.................. න ච මෙ ආසි කායෙ බලමත්තා: සො'ම්හි එතරහි තම්හා ආබාධා මුත්තො........ අත්ථි ච මෙ කායෙ බලමත්තා" (සුභසුත්ත දීඝ)

16. "තත්‍ර චෙ තුම්හෙ භික්ඛවෙ අස්සථ කුපිතා වා අනත්තමනා වා තුම්හං යෙව'ස්ස තෙන අන්තරායො." (බ්‍රහ්මජලසුත්ත)

## 79. ද-ධාතුරූප (ද-දීමෙහි: භූවාදි)

### වත්තමානා: පරස්ස පද

| | |
|---|---|
| සො දදාති: දෙති (=දේ) | (තෙ) දදන්ති: දෙන්ති (=දෙත්) |
| (ත්වං) දදාසි: දෙසි (=දෙහි) | (තුම්හෙ) දදාථ: දෙථ (=දෙව්) |
| (අහං) දදාමි: දෙමි: දම්මි (=දෙමි) | (මයං) දදාම: දෙම: දම්ම (=දෙමු) |

### පඤ්චමී පරස්සපද

| | |
|---|---|
| (සො) දදාතු: දෙතු (=දේවා) | (තෙ) දදන්තු: දෙන්තු (=දෙත්වා) |
| (ත්වං) දදාහි: දෙහි | (තුම්හෙ) දදාථ: දෙථ |
| (අහං) දදාමි: දෙමි: දම්මි | (මයං) දදාම: දෙම: දම්ම |

### සත්තමී - පරස්සපද

(සො) දදෙ: දදෙය්‍ය: දජ්ජා: දජ්ජෙය්‍ය (දෙන්නේය)
(තෙ) දදෙය්‍යුං දෙය්‍යුං: දජ්ජුං: දජ්ජෙය්‍යුං (දෙන්නාහු නම්)
(ත්වං) දදෙය්‍යාසි: දෙය්‍යාසි: දජ්ජාසි: දජ්ජෙය්‍යාසි
(තුම්හෙ)දදෙය්‍යාථ: දජ්ජාථ: දජ්ජෙය්‍යාථ
(අහං) දදෙය්‍යාමි: දජ්ජාමි: දජ්ජෙය්‍යාමි
(මයං) දදෙය්‍යාම: දජ්ජාම: දජ්ජේය්‍යාම

සත්තමි අත්තනො පද

(සො) දදෙථ: දජ්ජෙථ (තෙ) දදෙරං, දජ්ජෙරං
(ත්වං) දදෙථො, දජ්ජෙථො (තුම්හෙ) දදෙය්‍යාව්හො, දජ්ජව්හො
(අහං) දදෙය්‍යං, දජ්ජං (මයං) දදෙය්‍යාම්හෙ: දජ්ජාම්හෙ

විනය මහාවග්ග පාළියේ භෙසජ්ජක්ඛන්ධකයෙහි වූ 'සචෙපි මෙ අය්‍යපුත්තා වෙසාලිං සාහාරං දජ්ජෙය්‍යාථ, නෙව දජ්ජාං තං භත්තං' (=ඉදින් ආයර්‍ය්‍යපුත්‍රයෝ අයබදු සහිත විශාලා නුවර දෙන්නාහු නමුත් මම ඒ බත නොදෙන්නෙමි.) යන වාක්‍යයෙහි ද එහිම චීවරක්ඛන්ධකයෙහි වූ 'යදා අරොගා අහොසි, තදා යං ඉච්ඡෙය්‍යාසි තං දජ්ජෙය්‍යාසී ති' (=යම් කලක නිරෝගිනී වෙහි ද එකල යමක් කැමති වන්නෙහි නම් එය දෙන්නෙහිය') යන වාක්‍යයෙහි ද දජ්ජෙය්‍යාසි, දජ්ජෙය්‍යාථ යන සත්තමියට අයත් පද දක්නා ලැබේ. නමුත් ශබ්දනීතියෙහි එවැනි පද ඇතැයි පිළි නොගන්නා ලදී.

හීයත්තනී: පරස්සපද

(සො) අදදා: අදා (=දුන්නේය) (තෙ) අදදූ: දදූ (=දුන්නාහ)
(ත්වං) අදදෙ: අදෙ (තුම්හෙ) අදදත්ථ: අදත්ථ
(අහං) අදදං: අදං (මයං) අදදම්හා: අදම්හා

හීයත්තනි: අත්තනො පද

(සො) අදදත්ථ: අදත්ථ (තෙ) අදදත්ථුං: අදත්ථුං
(ත්වං) අදදසෙ (තුම්හෙ) අදදව්හං
(අහං) අදදිං (මයං) අදදම්හසෙ

අජ්ජතනී: පරස්ස පද

(සො) අදදි: දදි: අදාසි (දුන්නේය) (තෙ) අදදිංසු: දදිංසු: අදංසු: අදදුං (=දුන්නාහ)
(ත්වං) අදදෙ: අදෙ: අදාසි (තුම්හෙ) අදදත්ථ: අදත්ථ
(අහං) අදදිං: දදිං: අදාසිං (මයං) අදදිම්හා-ම්හ: දදිම්හා-ම්හ: අදසිම්හ: අදම්හ

භවිස්සන්තී පරස්ස පද

(සො) දදිස්සති: දස්සති (=දෙන්නේය) (තෙ) දදිස්සන්ති: දස්සන්ති (=දෙන්නාහ)
(ත්වං) දදිස්සසි: දස්සසි (තුම්හෙ) දදිස්සථ: දස්සථ
(අහං) දදිස්සාමි: දස්සාමි: දස්සං (මයං) දදිස්සාම: දස්සාම

කලාතිපත්තියෙහි

(සො) අදදිස්සා: දදිස්සා (තෙ) අදදිස්සංසු: දදිස්සංසු

ආදිය යෙදිය යුතු.

80. (දැක්මෙහි හෝ බැලීමෙහි) දිස–ධාතුව

භූවාදිගණයෙහි වූ මේ දිස-ධාතුවට 'පස්ස-දක්ඛ' යන ආදෙශ වෙති.

පස්සති (-බලයි:) දක්ඛති (දකී හෝ බලයි)

හීයත්තනියෙහිදී දිස-ගේ ඉකාරයට ඇතැම්විට අකාර වේ.

(සො) අදදස: අදදස: අදදක්ඛා අපස්සා: අදිස්සා: -(දුටුවේය) | (තෙ) අදක්ඛු: අදදක්ඛුං: අදදසුං (-දුටහ)

(ත්වං) අදක්ඛො: අපස්සො (තුම්හෙ) අදක්ඛිත්ථ: අපස්සිත්ථ

(අහං) අදක්ඛං: අපස්සං (මයං) අදදක්ඛම්හා: අපස්සම්හා

අජ්ජතනියෙහි:

(සො) අපස්සි: පස්සි: අදක්ඛි: අදදක්ඛි දක්ඛි: අදස්සි: අදදසාසි | (තෙ) අපස්සිංසු: පස්සිංසු: අදක්ඛිංසු: දක්ඛිංසු: අදදසංසු: අදදසුං

(ත්වං) අදක්ඛො: අපස්සි: පස්සි (තුම්හෙ) අපපස්සිත්ථ: පස්සිත්ථ: අදක්ඛිත්ථ: දක්ඛිත්ථ

(අහං) අපස්සිං: පස්සිං: අදදක්ඛිං: දක්ඛිං: අදදසාසිං: අදදසං (මයං) අපපස්සිම්හ: පස්සම්හ: අදක්ඛිම්හ: දක්ඛිම්හ

භවිස්සන්තියෙහි

(සො) පස්සිස්සති: දක්ඛිති: දක්ඛිස්සති (තෙ) පස්සිස්සන්ති: දක්ඛිත්ති: දක්ඛිස්සන්ති

ආදිය යෙදිය යුතු වේ.

## උදහරණ xvi

### (දා-දිස-ධාතුකරූප)

1 A "දිස්වාන'හං දෙවදෙවං බීජපූරං අදස'හං"
B "ඉමස්මිං එකකප්පස්මිං යං ඵලං අදදිං තදා."

(මහානාගත්ථෙරාපදාන)

2. "හිමවන්තස්ස අවිදූරෙ අම්බා'සුං ඵලිනො දුමා,

'තතො පක්කං ගහෙත්වාන අම්බං සමධුකං අදං.'
(අම්බදයකථෙරාපදාන)

3. තථා මච්චු කරිස්සා'මී, න මෙ මග්ගම්පි දක්ඛසි.' (වංගීසත්ථෙරො)

4. 'දිවාවිහාරා නික්ඛම්ම ගිජ්ඣකූටම්හි පබ්බතෙ
අද්දසං විරජං බුද්ධං භික්ඛු සඞ්ඝපුරක්ඛතං' (කුණ්ඩලකෙසා ථෙරී)

5 A 'අනිච්චං අනිච්චතො'ද්දක්ඛුං: දුක්ඛමද්දක්ඛු දුක්ඛතො'
(චතුක්කංගුත්තර)

6. 'පඤ්චකාමගුණං එතෙ ඉත්ථිරූපම්හි දිස්සරෙ' (සබ්බකාමො ථෙරො)

7. 'බුද්ධො ච මෙ වරං දජ්ජා, සො ච ලබ්භෙථ මෙ වරො.'
(ලකුණ්ටකභද්දියො)

8. A 'අද්දස බ්‍රාහ්මණෝ බුද්ධං විප්පමුත්තං නිරූපධිං' (සුන්දරී ථෙරී)
B සො අද්දසාසි සම්බුද්ධං දෙසෙන්තං අමතං පදං (චාපාථෙරී)

9. 'යත්තකං තුලිතා එසා තුය්හං ධීතා අනොපමා
තතො අට්ඨගුණං දස්සං හිරඤ්ඤං රතනානි ච' (අනොපමා ථෙරී)

10. 'අථ'ද්දසාසිං සම්බුද්ධං සත්ථාරං අකුතොභයං' (අනුරුද්ධො ථෙරො)

11. 'නදතො පරිසායං තෙ වාදීදප්පාපහාරිනො
යෙ තෙ දක්ඛන්ති වදනං ධඤ්ඤා තෙ නරපුංගව.'
(ගොතමී ථෙරී අපදන)

12. 'එතා'හං භන්තෙ වෙළුවනං උය්‍යානං බුද්ධපමුඛස්ස සංඝස්ස දම්මි'
(විනය මහාවග්ග)

13. A 'අථ බ්‍රාහ්මණො යන්නූනාහං යං මෙ තීහි මාසෙහි දාතබ්බං සියා තං සබ්බං එකදිවසෙනෙව දදෙය්‍යාති චින්තෙත්වා 'අධිවාසෙතු මෙ භවං ගොතමො'ති ආදිමාහ.' B 'සො ගෙහං ගන්ත්වා පුච්ඡි: තස්ස පබ්බජිතස්ස කිඤ්චි අදත්ථාති? න කිඤ්චි අදම්හාති.' (විනය අටුවා)

14. 'දිබ්බගන්ධං පවායන්තං යො මෙ පුප්ඵග්ඝියං අදා.'
(චුන්දථෙරාපදාන)

15. ධම්මාගදං ගවෙසන්තො අද්දක්ඛිං සක්‍යසාසනං
අග්ගං සබ්බොසධානං තං සබ්බසල්ලවිනොදනං.' (උපාලි ථෙරාපාන.)

16. A 'ඉතො පට්ඨාය එවරූපානං මම පුත්තස්ස සන්තිකං උපසඞ්කමිතුං

මා'දක්ඛ' B 'කොණ්ඩඤ්ඤො......අසංසයං එස බුද්ධො භවිස්සතී'ති එකමෙව ගතිං අද්දස.' (ජාතකනිදාන)

17. A' අදංසු තෙ මමො'කාසං සොධෙතුං අඤ්ජසං තදා.'
B විචිනන්තො තද දක්ඛිං දුතියං සීලපාරමිං.' (බුද්ධවංස)

18. 'විමලො සුරියො හොති, සබ්බා දිස්සන්ති තාරකා.' (බුද්ධවංස)

19. 'කිමෙම චොරෙහි...... වාණිජස්ස සඤ්ඤං දස්සාමීති.'

20 'න ත්වං අද්දස මනුස්සෙසු පඤ්චමං දෙවදූතං පාතුභූතන්ති? සො එවමාහ: නාද්දසං භන්තෙති.'' (දෙවදූතසුත්තං)

21 'යෙ පි හි කෙචි භික්ඛවෙ අනාගතමද්ධානං සමණා වා බ්‍රාහ්මණා වා යං ලොකෙ පියරූපං සාතරූපං, තං අනිච්චතො දක්ඛින්ති, දුක්ඛතො දක්ඛින්ති, අනත්තතො දක්ඛින්ති.' (නිදානසං ii 110)

22. 'සතං එකෙ සහස්සානං, අමනුස්සානමද්දසුං
අප්පෙකෙ'නන්තමද්දක්ඛුං, දිසා සබ්බා ඵුටා අහු.'
(මහාසමයසුත්ත. දීඝ)

## 81. බ්‍රූ-ධාතුකරූප

බ්‍රූ ධාතුව කීමෙහි වැටේ. (භවාදිගණිකයි)

**වත්තමානයෙහි:**

(සො) බ්‍රූති: බ්‍රවීති: බ්‍රූවීති (= කියයි) (තෙ) බ්‍රූවන්ති (=කියත්)
(ත්වං) බ්‍රූසි (තුම්හෙ) බ්‍රූථ
(අහං) බ්‍රූමි (මයං) බ්‍රූම

පඤ්චමියෙහි: 'බ්‍රූතු: බ්‍රූවන්තු: බ්‍රූහි: බ්‍රූථ: බ්‍රූමි: බ්‍රූම' ආදිය ද
සත්තමියෙහි: බ්‍රූවෙ: බ්‍රූවෙය්‍ය: බ්‍රූවෙය්‍යුං: බ්‍රවෙය්‍යාසි: බ්‍රූවෙය්‍යාථ ආදිය ද යෙදිය යුතුය.

පරොක්ඛාවෙහිදී බ්‍රූ-හට ආහ-ආදෙශ වේ.

(සො) ආහ (=කීයේලු) (තෙ) ආහු: ආහංසු (කීවෝලු)
(ත්වං) බ්‍රවෙ (තුම්හෙ) බ්‍රවිත්ථ
(අහං) බ්‍රවං (මයං) බ්‍රවිම්හ

**හීයත්තනියෙහි**

අබ්‍රවා: අබ්‍රවුං: අබ්‍රවො: අබ්‍රවිත්ථ: අබ්‍රවං: අබ්‍රවම්හා ආදිය වේ.

**අජ්ජතනියෙහි:**

අබ්‍රවි: අබ්‍රවුං: අබ්‍රවො: අබ්‍රවත්ථ, අබ්‍රවිං, අබ්‍රවිම්හා ආදිය වේ.

හවිස්සන්තියෙහි:
බ්‍රවිස්සති: බ්‍රවිස්සන්ති: බ්‍රවිස්සථ ආදිය වේ.

### 82. ඤා-ධාතුකරූප

(ඤා-ධාතුව අවබෝධයෙහි හෙවත් දැනගැන්මෙහි වේ.)

මෙය කියාදිගණික බැවින් ධාතුවටත් විභක්තියටත් අතරෙහි නා-විකරණය වේ. ඤ-හට ජා-ජං-නා යන ආදේශ ද වෙති.

වත්තමානයෙහි

ජානාති, (-දනී) ජානන්ති: ජානාසි, ජානාථ: ජානාමි, ජානාම ආදිය වේ.

සත්තමියෙහි ඤා-ධාතුවෙන් පරවූ එය්‍ය හට 'ඉයා-ඤා-' ආදේශයෝ වෙති.

| | |
|---|---|
| (සො) ජානියා: ජඤ්ඤා: ජානෙය්‍ය | (තෙ) ජානෙය්‍යුං |
| (ත්වං) ජානෙය්‍යාසි | (තුම්හෙ) ජානෙය්‍යාථ |
| (අහං) ජානෙය්‍යාමි | (මයං) ජානෙය්‍යාම: ජානෙමු |

අජ්ජතනයෙහි දී අතැම්විට නා-විකරණයට ලොප් වේ.

| | |
|---|---|
| (සො) අජානි: ජානි: අඤ්ඤාසි | (තෙ) අඤ්ඤාසුං: අජානිංසු |
| (ත්වං) අජානො: ජානො | (තුම්හෙ) අජානිත්ථ: ජානිත්ථ |
| (අහං) අජානිං: ජානිං: අඤ්ඤාසිං | (මයං) ජානිස්සාම: ඤස්සාම |

### 83. සු-ධාතුකරූප

ස්වාදිගණික සු-ධාතුව ශ්‍රවණයෙහි හෙවත් කනින් ඇසීමෙහි වැටේ. ස්වාදිගණික ධාතූන් කෙරෙන් 'ණු-ණා-උණා' යන විකරණ වෙති. සු-ධාතුව කෙරෙන් ණු-ණා-දෙක පමණකි.

වත්තමානයෙහි:

| | |
|---|---|
| (සො) සුණොති: සුණාති | (තෙ) සුණොන්ති: සුණන්ති |
| (ත්වං) සුණොසි: සුණාසි: සුණසි | (තුම්හෙ) සුණොථ: සුණාථ: සුණථ |
| (අහං) සුණොමි: සුණාමි | (මයං) සුණොම: සුණාම |

පඤ්චමියෙහි ද යෝග්‍යාකාරයෙන් යෙදිය යුතු.

සත්තමියෙහි:

සුණෙ: සුණෙය්‍ය: සුණෙය්‍යුං: සුණෙය්‍යාසි: සුණෙය්‍යාථ: සුණෙය්‍යාමි: සුණෙය්‍යාම.

සද-සු-ඉ - ධාතුරූප

**අජ්ජතනීයෙහි**

(සො) අසුණි: සුණි: අසොසාසි (තෙ) අසුණිංසු: සුණිංසු: අසොසාසුං
(ත්වං) අසුණො, සුණො: අසොසාසි. (තුම්හෙ) අසුණිත්ථ: සුණිත්ථ
(අහං) අසුණිං: සුණිං: අසොසාසිං (මයං) අසුණිම්හ: සුණිම්හ: අසසුම්හ

භවිස්සන්තියෙහි:

සුණිස්සති, සුණිස්සන්ති, සුණිස්සසි ආදිය වේ.

## 84. ගහ-ධාතුකරූප

ගැනීමෙහි වැටෙන ගහ-ධාතුව කියාදිගණයෙහි වේ. එය 'ගහාදිගණ' යන විශේෂ ගණයක් ලෙස ද ඇතැම් වෛයාකරණයෝ දක්වත්. මේ ධාතුව කෙරෙන් කර්තෘකාරකයෙහි ණ්හා ප්‍රත්‍යය වේ.

'ගණ්හාති, ගණ්හන්ති: ගණ්හාසි: ගණ්හාථ: ගණ්හාමි: ගණ්හාම' ආදිය වේ.

**අජ්ජතියෙහි**

(සො) අගණ්හි: ගණ්හි: අගගහි: අගගහෙසී (=ගත්තේය)
(තෙ) අගණ්හිංසු: ගණ්හිංසු: අගගහෙසුං: අගගහුං
(ත්වං) අගණ්හො: ගණ්හො: අගගහි: අගගිහෙසි
(තුම්හෙ) අගණ්හිත්ථ: ගණ්හිත්ථ: අගගහිත්ථ: අගගහෙසිත්ථ
(අහං) අගණ්හිං: ගණ්හිං: අගගහිං: අගගහෙසිං
(මයං) අගණ්හිම්හ: ගණ්හිම්හ: අගගහිම්හ: අගගහෙසිම්හ

## 85. ඉ-ධාතුකරූප

භුවාදිගණික ඉ-ධාතුව ගමනාර්ථයෙහි වේ. මොහුගේ පරොක්ඛා-හීයත්තනී-අජ්ජතනී රූප නොදක්නා ලැබෙත්. එසේම උපසර්ග - වියුක්ත රූපද නොපෙනේ. එති යන්න ආ-පූර්ව ඉ-ධාතු වෙන් සිධවූසේ පෙනේ. එය මෙසේ වරනැගේ:-

**වත්තමානා, කත්තුකාරක-පරස්ස පද**

| | | | |
|---|---|---|---|
| සො | එති | තෙ | එන්ති |
| ත්වං | එසි | තුම්හෙ | එථ |
| අහං | එමි | මයං | එම |

**සත්තමී පරස්ස පද**

| | | | |
|---|---|---|---|
| සො | එය්‍ය | තෙ | එය්‍යුං |
| ත්වං | එය්‍යාසි | තුම්හෙ | එය්‍යාථ |
| අහං | එය්‍යාමි | මයං | එය්‍යාම |

**භවිස්සන්ති පරස්ස පද**

| | | | |
|---|---|---|---|
| සො | එස්සති: එහිති | තෙ | එස්සන්ති: එහින්ති |
| ත්වං | එස්සසි: එහිසි | තුම්හෙ | එස්සථ |
| අහං | එස්සාමි | මයං | එස්සාම |

**ඉ-ධාතුවෙන් සිද්ධවන අන්‍යරූප නම්**

| | | |
|---|---|---|
| උ+ඉ+අ+ති | -උදෙති | (උදාවේ: හටගනී) |
| උප+ඉ+අ+ති | -උපෙති | (සමීපයට පැමිණේ) |
| අප+ඉ+අ+ති | -අපෙති | (පහව යේ) |
| අනු+ඉ+අ+ති | -අන්වෙති | (අනුවයයි: ලුහුබඳී) |
| සං+උප+ඉ+අ+ති | -සමුපෙති | (යුක්ත වේ) |
| සං+ඉ+අ+ති | -සමෙති | (ගැළපේ: සමාන වේ) |
| අභි+සං+ඉ-අ+ති | -අභිසමෙති | (අවබොධ කෙරේ) |

**86. (උ-පූර්ව-) පද ධාතුකරූප**

පද-ධාතුව දිවාදිගණයෙහියි. එය යාමෙහි වැටේ. එහෙත් උ පූර්ව වූ විට ඉපදීමෙහි වැටේ. දිවාදිගණික-ධාතුන් කෙරෙන් ය-විකරණය වේ.

උ-පූර්ව පද-ධාතුහුගේ ප-කාරයට ද්විත්ව වේ. දකාරය හා ය-ප්‍රත්‍යයට ජ්ජ-ආදෙශ වේ. එවිට උ+පද+ය+ති යි තිබුණු තැන 'උප්පජ්ජති' යි සිද්ධ වේ.

'උප්පජ්ජති (-උපදී), උප්පජ්ජන්ති (-උපදිත්)' මේ ආදිය යෙදිය යුතු. 'උප්පජ්ජති' ආදි පද ද විද්‍යමාන වෙති.
හීයත්තනියේ දි පූර්ව ප-කාරයට ද -කාරවී උදපජ්ජා ආදී පද සැදෙති.

**හියත්තනී, කත්තුකාරක-පරස්ස පද**

| | | | |
|---|---|---|---|
| සො | උදපජ්ජා | තෙ | උදපජ්ජු |
| ත්වං | උදපජ්ජෝ | තුම්හෙ | උදපජ්ජිත්ථ |
| අහං | උදපජ්ජං | මයං | උදපජ්ජම්හා |

**අජ්ජතනි, කත්තුකාරක-පරස්ස පද**

| | | | |
|---|---|---|---|
| සො | උදපජ්ජි: උදපාදි | තෙ | උදපජ්ජිංසු: උදපාදුං |
| ත්වං | උදපජ්ජෝ: උදපාදො | තුම්හෙ | උදපජ්ජිත්ථ: උදපාදිත්ථ |
| අහං | උදපජ්ජිං: උදපාදිං | මයං | උදපජ්ජිම්හා: උදපාදිම්හා |

| | | |
|---|---|---|
| ආ+පද+ය+ති | =ආපජ්ජති | (පැමිණේ) |
| සං+ආ+පද+ය+ති | =සමාපජ්ජති | (සමවදී: ඇතුල්වේ) |
| පටි+පද+ය+ති | =පටිපජ්ජති | (පිළිපදී) |
| සං+උ+පද+ය+ති | =සමුප්පජ්ජති | (හටගනී) |

යන මේ පද ද මේ ධාතුවෙන් සිද්ධවෙති.

## උදාහරණ xvii

(බ්‍රෑ-කද-සු ගහ-ඉ-පදධාතුන් පිළිබඳයි)

1. 'එවං විලපමානං තං ආනන්දං ආහ ගොතමී:
   න යුත්තං සොචිතුං පුත්ත, හාසකාලෙ උපට්ඨිතෙ.'
   (මහාපජාපතී අපදාන)
2. 'වුට්ඨහිත්වා සමාධිම්හා සත්ථා ලොකෙ අනුත්තරො
   මම කම්මං පකිත්තෙන්තො ඉදං වචනමබ්‍රවි.' (සුභූතිත්ථේරාපදාන)
3. 'තං වෙ දෙවා තාවතිංසා ආහු සප්පුරිසො ඉති' (කුලාවකජාතක)
4. A 'භගවා එථ භික්ඛවේ'ති හත්ථං පසාරෙසි'
   B සුදෙධාදන මහාරාජා....... පුත්තං මෙ ගණ්හිත්වා එහිති ආහ.'
   (ජාතක නිදාන)
5. 'සම්මොදමානා ගච්ඡන්ති ජාලමාදාය පක්ඛිනො
   යදා ච විවදිස්සන්ති තදා එහින්ති මෙ වසං' (ජාතකපාළි)
6. A 'තත්ථ පායාසමග්ගය්හ නෙරඤ්ජරමුපෙහිති'
   B 'පටියත්ත-වරමග්ගෙන බොධිමූලං හි එහිති' (බුඬවංස)
7. අලංකත්වා අලංසිරා සබ්බෙච පඤ්ජලීකතා
   බුද්ධස්ස පාදෙ නිපතිත්වා ඉදං වචනමබ්‍රවුං.' (උපාලිත්ථේරාපදාන)
8. 'ආගතො වදතං සෙට්ඨො, ධම්මං සොස්සාම තං මයං'
   (පිණ්ඩොලභාරවාජ අපදාන)
9. 'භගවා.......ආවජ්ජිත්වා චිත්තං අඤ්ඤාසි' (ජාතක නිදන)
10. 'අථ තෙසං ගච්ඡන්තානං අකාලමෙසො උදපාදි.' (ධ.අ.)
11. 'තව රතනවරස්ස ධම්මං සුත්වා
    කරිස්සාමීති බ්‍රැවිත්ථ ජන්තො.' (විමානව)
12. 'සචෙ එන්ති මනුස්සත්තං දළිද්දෙ ජායරෙ කුලෙ.' (මච්ඡරසුත්ත සං)

13. 'එවං චේ'තං ජනො ජඤ්ඤා යතා ජානාමි තං අහං
ආරකා පරිවජ්ජෙය්‍ය ගූථට්ඨානං'ව පාවුසෙ.'
(මහාමොග්ගල්ලානත්ථෙරගාථා)

14. 'හිත්වා සතපලං කංසං සොවණ්ණං සතරාජිකං
අග්ගහිං මත්තිකාපත්තං, ඉදං දුතියාභිසෙචනං.' (භද්දියත්ථෙරො)

15. 'යං ත්වං කාමරති බෲසි, අරතී දනි. සා මම.' (සෙලාථෙරී)

16. 'අත්තානං චෙ පියං ජඤ්ඤා, න නං පාපෙන සංයුජෙ.'
(කොසලසංයුත්ත)

17. A 'විපස්සිස්ස බොධිසත්තස්ස එවං චෙතසො පරිවිතක්කො උදපාදි.'
B අචිරපක්කන්තස්ස භගවතො අයමන්තරාකථා උදපාදි.'
(දීඝනිකාය)

18. අස්සොසුං ඛො සෙතව්‍යකා බ්‍රාහ්මණගහපතිකා සමණො ඛලු
භො කුමාරකස්සපො....... සෙතව්‍යං අනුප්පත්තො.... ති.' (දීඝමහාවග්ග)

19. 'අච්චයෙන අහොරත්තං පදුමුත්තරනාමකො
සබ්බං තමං විනොදෙත්වා ලොකෙ උප්පජ්ජි චක්ඛුමා.'
(උපාලිත්ථෙරාපදාන)

20. A 'සුචාරුරූපං දිස්වාන විත්ති මෙ උපපජ්ජථ.' (ආනන්දත්ථෙරාපදාන)
B 'මා ජාතු කොචි ලොකස්මිං පාපිච්ඡො උදපජ්ජථ.
(චූළවග්ගපාළි)

## ලභ-වස-ඨා-හන-ධාතුන් පිළිබඳ විශේෂ

87. ලභ-ධාතුව කෙරෙන් අජ්ජතනී ඊ-ඉං විභත්තීන්ට ත්ථ-ත්ථං ආදේශ වෙති. ධාතුහුගේ අන්තයට ලොප් වේ.

(සො) අලත්ථ: අලභි: ලභි (-ලැබුවේය) (තෙ) අලභිංසු: ලභිංසු (-ලැබූහ)
(ත්වං) අලභි: ලභි (තුම්හෙ) අලභිත්ථ, ලභිත්ථ
(අහං) අලත්ථිං: අලභිං, ලභිං (මයං) අලභිම්හ, ලභිම්හ

භවිස්සන්තියෙහිදී ස්ස-හට ඡ-ආදේශ වේ: ධාත්වන්තයට ච-කාරවේ. (සො) ලච්ඡති: ලභිස්සති: (ලබන්නේය) ලච්ඡන්ති: ලභිස්සන්ති ආදිය යොදා ගතයුතුය.

වස-ආස-ධාතුන් කෙරෙන් ද භවිස්සන්තීයගේ ස්ස-හට ඡකාරාදේශ වේ: ධාතුහුගේ ස - කාරයට ච කාරවේ.

වච්ඡති: වසිස්සති (වසන්නේය) වච්ඡන්ති: වසිස්සන්ති
අච්ඡති, (-හින්නේය) අච්ඡන්ති (-හින්නාහ)

ආදිය යෙදා ගත යුතු යි.

## ලභ-වස-ආදී ධාතුරූප

88. ඨා - ධාතුහට ඇතැම් තැනක තිට්ඨ - ආදෙශ වේ.

වත්තමානා - පරස්ස පද

(සො) ඨාති: තිට්ඨති (=සිටී) (තෙ) ඨන්ති: තිට්ඨන්ති (=සිටිත්)
(ත්වං) ඨාසි, තිට්ඨසි (තුම්හෙ) ඨාථ: තිට්ඨථ
(අහං) ඨාමි, තිට්ඨාමි (මයං) ඨාම: තිට්ඨාම

සත්තමී, පරස්ස පද

සො තිට්ඨෙ, තිට්ඨෙය්‍ය තෙ තිට්ඨෙය්‍යුං
ත්වං තිට්ඨෙය්‍යාසි තුම්හෙ තිට්ඨෙය්‍යාථ
අහං තිට්ඨෙය්‍යාමි මයං තිට්ඨෙය්‍යාම

අජ්ජතනී, පරස්ස පද

සො අට්ඨාසි තෙ අට්ඨංසු
ත්වං අට්ඨො: අට්ඨාසි තුම්හෙ අට්ඨත්ථ
අහං අට්ඨාසිං මයං අට්ඨම්හ

භවිස්සන්ති, පරස්ස පද

සො ඨස්සති තෙ ඨස්සන්ති
ත්වං ඨස්සසි තුම්හෙ ඨස්සථ
අහං ඨස්සාමි මයං ඨස්සාම

අතීත-අනාගත-කාලයන්හි ඨා-හට තිට්ඨ-ආදේශ නොවන බව පෙනේ..

89. හන-ධාතුවට වධ - ඝාත යන ආදේශ වෙති.

වත්තමානා - පරස්ස පද

(සො) හන්ති: හනති: වධෙති: ඝාතෙති: (=නසයි)
(තෙ) හනන්ති: හන්ති: වධෙන්ති: ඝාතෙන්ති (=නසත්)
(ත්වං) හනසි: වධෙසි: ඝාතෙසි
(තුම්හෙ) හනථ: වධෙථ: ඝාතෙථ
(අහං) හනාමි: වධෙමි: ඝාතෙමි
(මයං) හනාම: වධෙම: ඝාතෙම

සත්තමී, පරස්ස පද

සො හනෙ, හනෙය්‍ය: හඤ්ඤෙ: වධෙය්‍ය: ඝාතෙය්‍ය
තෙ හනෙය්‍යුං: හඤ්ඤෙය්‍යුං: වධෙය්‍යුං ඝාතෙය්‍යුං
ත්වං හනෙය්‍යාසි: වධෙය්‍යාසි: ඝාතෙය්‍යාසි

ආදිය යෙදිය යුතු.

**අජ්ජතනී, පරස්ස පද**

සො අහනි: හනි: අවධී: වධී: අසාතයි: සාතයි
තෙ අහනිංසු: හනිංසු: අවධිංසු: වධිංසු: සාතයිංසු
ත්වං අහනො: හනො; අහනි: හන: අවධො: අසාතයො: සාතයො
තුම්හෙ අහනිත්ථ: හනිත්ථ: අවධිත්ථ: වධිත්ථ: අසාතයිත්ථ
අහං, අහනිං: හනිං: අවධිං; වධිං: අසාතයිං: සාතයිං
මයං අහනිම්හා: හනිම්හා: අවධිම්හා: වධිම්හා: අසාතයිම්හා: සාතයිම්හා

**හර-හා-ජර-මර-ධාතූන් පිළිබඳ විශේෂ**

90. ගෙන යාමෙහි වැටෙන හර-ධාතුවගේ අජ්ජතනී රූපවල විශෙෂයක් තිබේ. -

**අජ්ජතනී, පරස්ස පද**

| | |
|---|---|
| සො අහරි: හරි: අහාසි | තෙ අහරිංසු: හරිංසු: අහංසු |
| ත්වං අහරො: හරො: අහරි: හරි අහාසි | තුම්හෙ අහරිත්ථ: හරිත්ථ: අහාසිත්ථ |
| අහං, අහරිං: හරිං: අහාසිං | මයං අහරිම්හ: හරිම්හ: අහාසිම්හ, අහරිම්හා: හරිම්හා |

91. මේ ධාතුව වි පූර්ව - වූ කල වාසය කිරීමෙහි වැටේ. අජ්ජතනී-භවිස්සන්ති දෙකෙහි විහර -මූලයාගේ විශෙෂ දක්නා ලැබේ.

**අජ්ජතනී, පරස්ස පද**

| | |
|---|---|
| සො විහරි: විහාසි | තෙ විහරිංසු: විහංසු |
| ත්වං විහරො: විහරි | තුම්හෙ විහරිත්ථ: විහාසිත්ථ |
| අහං විහරිං: විහාසිං | මයං විහරිම්හ; විහාසිම්හ |

**භවිස්සන්ති - පරස්ස පද**

| | |
|---|---|
| සො විහරිස්සති: විහස්සති | තෙ විහරිස්සන්ති: විහස්සන්ති |
| ත්වං විහරිස්සසි: විහස්සසි | තුම්හෙ විහරිස්සථ: විහස්සථ |
| අහං විහරිස්සාමි: විහරිස්සං: විහස්සං | මයං විහරිස්සාම; විහස්සාම |

සත්තමී උත්තම-බහුවචනයෙහි (විහරෙමු) යන්න ද සිද්ධවේ.

92. A දුරුකිරීමෙහි වැටෙන හා-ධාතුවෙන් 'ජහති, ජහනති' ආදි පද සිද්ධවෙති.

'එක් සවරයක් ඇති ධාතුන්ට ඇතැම් තැනක ද්විත්ව වේ' යන නියමයට අනුව හා-ධාතුවට ද්විත්ව වේ. ද්විත්වයට පැමිණි පසු මුලින් සිටි වර්ණයට අබ්භාසය යි කියනු ලැබේ. අබභාසය දීර්ඝසවරයකින් යුක්ත වේ නම් ඔහුට හ්‍රසව වේ. 'හාහා' යි තිබුණ තැන මුල් හා-කාරය හ්‍රසවකොට නැවත ඒ හකාරයට ජකාරදෙශ කරනු ලැබේ. එවිට 'ජහාති' යි පදසිද්ධිය වේ.

B ජහාති ආදිරූප සෑදෙන්නේ භුවාදිගණික හා -ධාතුවෙනි. දිවාදිගණයෙහි වූ තවත් හා - ධාතුවක් වේ. එයින් පිරිහීම, ගෙවී යාමාදී අර්ථ කියවේ. ඒ ධාතුවෙන්

හායාති; හායන්ති; අහායි; හායි; හායිස්සති ආදි රූප සිද්ධ වෙති. හායති (=පිරිහේ)

93. දිරීමෙහි වැටෙන ජර-ධාතුවට ජීර-ජීය-ආදේශයෝ ද මැරීමෙහි වැටෙන මර -ධාතුවට මීය -ආදේශය ද වෙති.

ජීරති; ජීයති (=දිරයි)
අජීරි; ජීරි; ජීයි (=දිරුවේය)
ජීරිස්සති, ජීයිසසති (=දිරන්නේය)
මරති; මීයති (මැරේ)
අමරි; මරි; අමීයි; මීයි (=මළේය)
මරිස්සති; මීයිස්සති (=මැරෙන්නේය)

ජීරති යන්නේ හෙතවර්ථපදය වූ ජීරාපෙති යන්නෙන් කෑම දිරවීම අදහස් කරනු ලැබේ.

ජීරති යන්න ඇතැම්විට අභිවෘද්ධි අර්ථය ප්‍රකාශ කෙරේයයි ද 'අප්පස්සුතා'යං පුරිසො බලිවද්දෙ'ව ජීරති' යන්න ඊට උද හරණයයී ද කියත්. 'අල්පශ්‍රැත (=නූගත්) මිනිසා ගොණෙකු මෙන් වැඩේ' යන්න එහි අර්ථය දී තිබේ. මේ අර්ථය දෙන අන්කිසි තැනක් දක්නට නො ලැබේ. එබැවින් මෙය ගාථාවේ අකුරක වැරදීමක් විය හැක. ජීරති යන්න ජීවති යයි ගතහොත් කිසි පැටලිල්ලක් නැතුව ගැළපෙන අර්ථයක් ලැබේ.

## උදහරණ xviii

**ලභ-වස-ආස-ඨා-හන-හර-හා-ධාතුන් පිළිබඳ යි.**

1. A 'ආකඩ්ඛමානො ආනන්ද තථාගතො කප්පං වා තිට්ඨෙය්‍ය'
B 'එවම්පි ඛො ත්වං ආනන්ද න තථාගතං යාචි: තිට්ඨතු භගවා කප්පං............ ති' (දි. මහාවග්ග)

2 'අලත්ථුං බො භික්ඛවෙ තානි චතුරාසීති පබ්බජිත සහස්සානි විපස්සිස්ස භගවතො............ සන්තිකෙ පබ්බජ්ජං' (එම)
3. 'තව ධම්මං සුණන්තස්ස අවධී වච්ඡපාලකො' (විමාන ව.)
4. 'සබ්බෙපි'මෙ ගාමවාසිනො මං හන්තු වා බන්ධන්තු වා' (විමාන අ.)
5. A' න ච මෙ හිංසති කිඤ්චි න වා; හං ඉසිදාසියා සහ වච්ඡං' (ඉසිදසී ථෙරී)
B 'පක්කමිස්සං ච නාලාතො, කො'ධ නාලාය වච්ඡති' (චාපාථෙරී)
6. 'අලත්ථං පරමං පීතිං දිස්වා දන්තං ජුතින්ධරං' (ආත්තසංසාවක-අපදාන)
7. A 'මහාබ්‍රහ්මා සෙතච්ඡත්තං ධාරයමානො අට්ඨාසි'
B දසසහස්සචක්කවාළදෙවතා පන මහ සත්තස්ස ථුතියො වදමානා අට්ඨංසු' (ජාතක නිදාන)
8. A ' න පාණො පාණිනං හඤ්ඤෙ: පාණඝාතී හි සොචති' (ධ අ. කුමුදුප්පලානීත)
B 'සුසඤ්ඤතානං හි වචො නිසම්ම
ගජුත්තමො සබ්බගුණෙසු අට්ඨා.' (මහිලා මුඛ ජා)
9. 'ජානපද මනුස්සා බහු ලොණම්පි............. සකටෙසු ආරොපෙත්වා අවඡන්ති.' (විනය මහාවග්ග)
10. A කුතොදනි භන්තෙ ධාතුයො ලච්ඡාමාති'......................
B 'අද්ධා තස්මිං ඨානෙ ධාතුයො ලච්ඡසීති' (විනය අටුවා)
11. 'කායෙ විසං න කමති, සත්ථානි න ච හන්ති මං' (ථෙරාපදාන)
12. A 'අපි කිඤ්චි ලභිත්ථාති? ආම බ්‍රාහ්මණ, ලභිම්හාති'
B 'එකදිවසම්පි උළුංකමත්තං වා යාගුං කටච්ඡුමත්තං වා භත්තං නාලත්ථ' (විනය අටුවා)
13. 'පාණං න හානෙ න ච, දින්න මාදියෙ,
මුසා න භාසෙ, න ච මජ්ජපො සියා.' (තිකඞ්ගුත්තර)
14. 'යො ඉමස්මිං ධම්මවිනයෙ අප්පමත්තො විහෙස්සති,
පහාය ජාතිසංසාරං දුක්ඛස්සන්තං කරිස්සති.' (අභිභූතත්ථෙරෝ)
15. 'කදනු' හං පබ්බතකන්දරාසු
එකාකියො අද්දුතියො විහස්සං?' (තාලපුටොථෙරො)
16. A ' පඤ්ච උප්පලහත්ථානි ආවෙලත්ථං අහංසු මෙ' (අඤ්චහත්ථියත්ථෙරාපදාන)
17. 'අනාගතම්හි අද්ධානෙ ලච්ඡසෙ තං මනොරථං' (වඞ්ගීසත්ථෙරාපදාන)
18. තස්සාහං වචනං සුත්වා විහාසිං සාසනෙ රතො' (සොණො කොළිවිසො)
19. A 'වෙපථමගමාසිං චොරමජ්ඣෙධ

උදාහරණ xviii

තෙ මං තත්ථ වධිංසු භොගහෙතු.

B 'තෙ මයං පුනරෙව ලද්ධ මානුසත්තං

පටිපන්නා විහරෙමු සීලවන්තො' (ජත්තමාණවක විමාන)

20. A 'තස්ස චක්කයුගං න විඤ්ඤාමි,

තෙන දුක්ඛෙන ජහිස්සං ජීවිතං.' (මට්ටකුණ්ඩලී විමාන)

21. 'පතීසු ධම්මං පචරිත්ව සබ්බා

ලජ්ජාමසෙ භාසති යං අයං ලතා' (ලතාවිමාන ව.)

22. 'ඵලං වෙ කදලිං හන්ති, ඵලං වෙළුං, ඵලං නළං;

සක්කාරො කාපුරිසං හන්ති ගබ්භො අස්සතරිං යථා' (බ්‍රහ්මසංයුත්ත)

## කර්‍මකාරක ක්‍රියා

94. මින් පෙර දැක්වූ ක්‍රියාවෝ කර්තෘකාරකයෙහි වෙති. සකර්‍මක-ක්‍රියාවන්ට කර්‍මකාරක පද ද විද්‍යමාන වෙති. අකර්‍මක ක්‍රියාවෝ ද බොහෝ විට උපසර්ගයන් හා යෙදීමෙන් සකර්‍මක වෙති.

කර්තෘකාරකයෙහි ධාතුවටත් ආඛ්‍යාත විභක්තියටත් අතරෙහි වන අ-ණු-ණා ආදී විකරණප්‍රත්‍යයෝ කර්‍මකාරකයෙහි නො වෙති. එහි ඒ ස්ථානයෙහි ධාතුගණවශයෙන් විශේෂයක් නැතිව ය-ප්‍රත්‍යය වේ.

පරස්ස පද-අත්තනො පද වශයෙන් ආඛ්‍යාතවිභක්ති දෙ කොටසකි. මෙයින් පරස්මෛ පද විභක්තීහු කර්තෘකාරකය සඳහාත්, ආත්මනෙපද විභක්තීහු කර්‍මකාරය සඳහාත් පළමුවෙන් සම්පාදිත වූ නමුත් පසුකලක මේ දෙ වර්ගයම කර්තෘ-කර්‍මකාරකද්වයෙහි අවිශෙෂයෙන් යොදන ලදී.

කර්‍මකාරක ය-ප්‍රත්‍යය ධාතුව හා ගැළපෙන සැටි දෙවෙනි පොතේ ප්‍රතිසංස්කෘත මුද්‍රණයේ 108 වෙනි අධිකයෙහි (111 පිට) දක්වන ලදී.

95. පිසීමෙහි වැටෙන පච-ධාතුව කර්‍මකාරකයෙහි මෙසේ වර නැගේ.

වත්තමානා පරස්ස පද

| | | | |
|---|---|---|---|
| සො ඔදනො | පච්චති | තෙ ඔදනා | පච්චන්ති |
| ත්වං ඔදනො | පච්චසි | තුම්හෙ ඔදනා | පච්චථ |
| අහං ඔදනො | පච්චාමි | මයං ඔදනා | පච්චාම |

### අත්තනො පද

| | | | |
|---|---|---|---|
| සො ඔදනො | පචතෙ | තෙ ඔදනා | පචන්තෙ |
| ත්වං ඔදනො | පචසෙ | තුම්හෙ ඔදනා | පචව්හෙ |
| අහං ඔදනො | පචෙ | මයං ඔදනා | පචාම්හෙ |

### පඤ්චමී-පරස්ස පද

| | | | |
|---|---|---|---|
| සො ඔදනො | පචතු | තෙ ඔදනා | පචන්තු |
| ත්වං ඔදනො | පච: පචාහි | තුම්හෙ ඔදනා | පචථ |
| අහං ඔදනො | පචාමි | මයං ඔදනා | පචාම |

### අත්තනො පද

| | | | |
|---|---|---|---|
| සො ඔදනො | පචතං | තෙ ඔදනා | පචන්තං |
| ත්වං ඔදනො | පචස්සු | තුම්හෙ ඔදනා | පචව්හො |
| අහං ඔදනො | පචෙ | මයං ඔදනා | පචාමසෙ |

### සත්තමී පරස්ස පද

| | | | |
|---|---|---|---|
| සො ඔදනො | පචෙ: පචෙය්‍ය | තෙ ඔදනා | පචෙය්‍යු |
| ත්වං ඔදනො | පචෙය්‍යාසි | තුම්හෙ ඔදනා | පචෙය්‍යාථ |
| අහං ඔදනො | පචෙය්‍යාමි | මයං ඔදනා | පචෙය්‍යාම |

### අත්තනො පද

| | | | |
|---|---|---|---|
| සො ඔදනො | පචෙථ | තෙ ඔදනා | පචෙරං |
| ත්වං ඔදනො | පචෙථො | තුම්හෙ ඔදනා | පචෙය්‍යාව්හො |
| අහං ඔදනො | පචෙය්‍යං | මයං ඔදනා | පචෙය්‍යාම්හෙ |

### පරොක්ඛා පරස්ස පද

| | | | |
|---|---|---|---|
| සො ඔදනො | පපච | තෙ ඔදනා | පපචු |
| ත්වං ඔදනො | පපචෙ | තුම්හෙ ඔදනා | පපචත්ථ |
| අහං ඔදනො | පපච | මයං ඔදනා | පපචිම්හ |

### අත්තනො පද

| | | | |
|---|---|---|---|
| සො ඔදනො | පපචිත්ථ | තෙ ඔදනා | පපචිරෙ |
| ත්වං ඔදනො | පපචිත්ථො | තුම්හෙ ඔදනා | පපචිව්හො |
| අහං ඔදනො | පපචි | මයං ඔදනා | පපචිම්හෙ |

### හීයත්තනී, පරස්ස පද

| | | | |
|---|---|---|---|
| සො ඔදනො | අපචා | තෙ ඔදනා | අපචූ |
| ත්වං ඔදනො | අපචො | තුම්හෙ ඔදනා | අපචත්ථ |
| අහං ඔදනො | අපචිං | මයං ඔදනා | අපචම්හා |

## කම්කාරක ක්‍රියා

### අත්තනො පද

| | | | |
|---|---|---|---|
| සො ඔදනො | අපච්චත්ථ | තෙ ඔදනා | අපච්චත්ථුං |
| ත්වං ඔදනො | අපච්චසෙ | තුම්හෙ ඔදනා | අපච්චව්හං |
| අහං ඔදනො | අපච්චිං | මයං ඔදනා | අපච්චම්හා |

### අජ්ජතනී, පරස්ස පද

| | | | |
|---|---|---|---|
| සො ඔදනො | අපච්චි: පච්චි | තෙ ඔදනා | අපච්චිංසු: පච්චිංසු<br>අපච්චුං: පච්චුං |
| ත්වං ඔදනො | අපච්චො: පච්චො<br>අපච්චි පච්චි | තුම්හෙ ඔදනා | අපච්චිත්ථ: පච්චිත්ථ<br>අපච්චි: පච්චි |
| අහං ඔදනො | අපච්චිං: පච්චිං | මයං ඔදනා | අපච්චිම්හා:<br>පච්චිම්හා |

### අත්තනො පද

| | | | |
|---|---|---|---|
| සො ඔදනො | අපච්චිත්ථ: පච්චිත්ථ | තෙ ඔදනා | අපච්චූ: පච්චූ |
| ත්වං ඔදනො | අපච්චිසෙ: පච්චිසෙ | තුම්හෙ ඔදනා | අපච්චිව්හං:<br>පච්චිව්හං |
| අහං ඔදනො | අපච්ච: පච්ච<br>අපච්චං: පච්චං | මයං ඔදනා | අපච්චිම්හෙ |

භවිස්සන්තියෙහි පදයෙදීම අපහසු නොවේ.

### කාලාපත්ති, පරස්ස පද

| | | | |
|---|---|---|---|
| සො ඔදනො | අපච්චිස්සා | තෙ ඔදනා | අපච්චිස්සංසු |
| ත්වං ඔදනො | අපච්චිස්සෙ | තුම්හෙ ඔදනා | අපච්චිස්සථ |
| අහං ඔදනො | අපච්චිස්සං | මයං ඔදනා | අපච්චිස්සම්හා |

### අත්තනොපද

| | | | |
|---|---|---|---|
| සො ඔදනො | අපච්චිස්සථ | තෙ ඔදනා | අපච්චිස්සිංසු |
| ත්වං ඔදනො | අපච්චිස්සසෙ | තුම්හෙ ඔදනා | අපච්චිස්සව්හෙ |
| අහං ඔදනො | අපච්චිස්සං | මයං ඔදනා | |

අපච්චිස්සාම්හසෙ

96. ඇසීමෙහි වැටෙන සු-ධාතුගේ කම්කාරකරූප
සු-ධාතුවෙන් ය-ප්‍රත්‍යය වූ විට ධාතුවගේ උකාරයට දීර්ඝ වේ.

වත්තමානාහි: සූයති: සූයන්ති: සූයතෙ: සූයන්තෙ: ආදිය ද
පඤ්චමියෙහි: සූයතු: සූයතං ආදිය ද
සත්තමියෙහි: සූයෙය්‍ය: සූයෙථ ආදිය ද
අජ්ජතනියෙහි: අසූයි: අසූයිත්ථ ආදිය ද
භවිස්සන්තියෙහි: සූයිස්සති: සූයිස්සතෙ ආදිය ද
යෙදිය යුතු

97. කම්කාරක ය-ප්‍රත්‍යය පරකල්හි ඇතැම් ධාතුන්ගේ මුල් ස්වරය උ-කාර බවට පැමිණේ.

වච+ය+ති =වුච්චති (කියනු ලැබේ)
වහ+ය+ති =වුය්හති (පාවේ: උසුළනු ලැබේ)
වස+ය+ති =වුස්සති (වෙසේ: පිළිපදිනු ලැබේ)

98. ය-ප්‍රත්‍යය පරකල්හි ආකාරාන්ත ධාතුන්ගේ ආකරය ඊ-බවට පැමිණේ:-

ධා+ය+ති =ධීයති (දරනු ලැබේ)
දා+ය+ති =දීයති (දෙනු ලැබේ)
හා+ය+ති =හීයති (පිරිහේ)
උප+මා+ය+ති = උපමීයති (උපමාකරනුලැබේ)

මේ තැන්වල ය-කාරය ද්විත්ව කළ හොත් ඊ-කාරය හ්‍රස්ව බවට පැමිණේ:-

දා+ය+ති =දිය්‍යති (දෙනු ලැබේ)

99. ය-ප්‍රත්‍යය ද්විත්ව නො කළවිට ධාත්වන්තයෙහි වූ ඉ-උ- දෙදෙන දීර්ඝ වෙති:-

නි+ය+ති =නීයති (ගෙන යනු ලැබේ)
චි+ය+ති =චීයති (රැස්කරනු ලැබේ)
සු+ය+ති =සූයති (ඇසේ)

ඌ කාරාන්ත ධාතුන් කෙරෙන් ය-ප්‍රත්‍යය වූ විට ස්වරයට කිසි වෙනසක් නොවේ:-

ලූ+ය+ති =ලූයති (ගොයම් ආදිය - කපනු ලැබේ)
භූ+ය+ති =භූයති (සිදුවේ)

100. බොහෝ ධාතුන් හා-ය ප්‍රත්‍යය යොදනු ලබන්නේ එයට මුලින් ඊ-කාරයක් යෙදීමෙනි.

කර+ඊ+ය+ති =කරීයති (කරනු ලැබේ)
හර+ඊ+ය+ති =හරීයති (ගෙනයනු ලැබේ)

හේත්වර්ථපදයන් හා ය-ප්‍රත්‍යය යොදනු ලබන්නේ එයට මුලින් ඊ-කාරයක් යෙදීමෙනි.

කර+ආපෙ+ඊ+ය+ති =කාරාපීයති (කරවනු ලැබේ)
පච+ආපෙ+ඊ+ය+ති =පාචාපීයති (පිසවනු ලැබේ)

## කර්මකාරක ක්‍රියා

101. ඇතැම් ධාතූන්ගේ කර්මකාරක පද සිඩවන්නේ කර්තෘකාරක-විකරණය සමග යෙදුණු ක්‍රියාමූලය හා ය-ප්‍රත්‍යය යෙදීමෙන් බව පෙනේ:-

ඡිද+ංඅ -ඡින්ද+ඊ+ය+ති+ඡින්දියති (කපනුලැබේ)
භිද+ංඅ-භින්ද+ඊ+ය+ති -භින්දීයති (බිඳිනු ලැබේ)
මුච+ංඅ-මුඤ්ච+ඊ+ය+ති-මුඤ්චීයති (මුදනු ලැබේ)
රුධ+ංඅ-රුන්ධ+ඊ+ය+ති-රුන්ධීයති (හිරකරනු ලැබේ)
ගහ+ණ්හා+ගණ්හා+ඊ+ය+ති-ගණ්හීයති (ගනු ලැබේ)

102. (දෙවෙනි පොතෙහි දැක්වූ පරිදි) ය ප්‍රත්‍යය ධාත්වන්තය සමග විකාරයට පැමිණීමෙන් සෑදෙන කර්මකාරක පද සමහරක් මෙසේයි:-

භිද+ය+ති-භිද්‍යති -භිජ්ජති (බිඳේ)
දිස+ය+ති-දිස්‍යති -දිස්සති (පෙනේ)
හන+ය+ති-හන්‍යති -හඤ්ඤති (නැසේ)
ඡිද+ය+ති-ඡිද්‍යති -ඡිජ්ජති (කැපේ: සිඳිනු ලැබේ)
මුච+ය+ති-මුච්‍යති -මුච්චති (මිදේ: නිදහස් වේ)
ඩහ+ය+ති -ඩය්හති (දැවේ)
ගහ+ය+ති -ගය්හති (ගනු ලැබේ)
සුස+ය+ති -සුස්‍යති -සුස්සති (වියලේ)
ඩය්හති, ගය්හති යන දෙතැන ය-හ දෙක මාරුවේ.

ලභ-ධාතුවෙන් ය-ප්‍රත්‍යයට භ-කාරවූවිට පූර්ව භ-කාරයට බ-කාරවීමෙන් ලබ්භති යි සෑදේ.

103. ඇතැම් ධාතූන්ගේ කර්මකාරක පද දෙවිධියකින් සිටිත්:-

පච: පචීයති: පච්චති
හන: හනීයති: හඤ්ඤති
බන්ධ: බන්ධීයති: බජ්ඣති
ගහ: ගණ්හීයති: ගය්හති
ඡිද: ඡින්දීයති: ඡිජ්ජති
මුච: මුඤ්චීයති: මුච්චති
ඛාද: ඛාදීයති: ඛජ්ජති
භිද: භින්දියති: භිජ්ජති
තුද: තුදීයති: තුජ්ජති

## පාලිභාෂාවතරණය iii

## උදාහරණ xix

1. 'තස්මිං ඛො පන බ්‍රාහ්මණ යඤ්ඤෙ නෙව ගාවො හඤ්ඤිංසු ...............: න රුක්ඛා ඡිජ්ජිංසු යූපත්ථාය: න දබ්බා ලූයිංසු බරිහිසත්ථාය.'
(දීඝ. කූටදන්ත)

2. A තස්ස මය්හං භන්තෙ චතුසු වාරෙසු දානං දියිත්ථ'
B 'දෙවස්ස'ව ඛො දානං දීයති; අම්හාකං දානං න දීයති' (දෙවපුත්තසං)

3. අසෙසා'ව ජිණ්ණා නිබ්භොගො ඛාදනා අපනීයති.' (බ්‍රාහ්මණසං)

4. 'යථා ඛො මාරිසා නිමිත්තා දිස්සන්ති, ආලොකො සඤ්ජායති, ඔභාසො පාතුභවති, බ්‍රහ්මා පාතුභවිස්සති' (දී. ජනවසභං)

5. 'තමෙනං ජනො දිස්වා එවං වදෙය්‍ය අම්භො, කිමෙවිදං හරීයති ජඤ්ඤ ජඤ්ඤං වියාති' (ම. i 147)

6. 'නයිදං භික්ඛවෙ බ්‍රහ්මචරියං වුස්සති ජනකුහනත්ථං' (අං 11.26)

7. 'දිට්ඨිබන්ධනබද්ධා තෙ තණ්හාසොතෙන වුය්හරෙ:
තණ්හාසොතෙන වුය්හන්තා න තෙ දුක්ඛා පමුච්චරෙ (විසුද්ධිමග්ග 603)

8. 'අථ තෙ: 'මනුස්සසද්දෙවිය සූය්‍යතී' ජානිස්සාම තංති සද්දානු සාරෙන ගන්ත්වා තං පුරිසං දිස්වා....... සරෙ සන්නය්හිංසු' (ජා. vi 160)

9. A චිත්තෙන නීයති ලොකො චිත්තෙන පරිකස්සති'
B නිබ්බාණාභිරතො මච්චො සබ්බදුක්ඛා, පමුච්චති.' (දෙවතාසංයුත්ත)

10. අජෙළකා ච ගාවො ච විවිධා යත්ථ හඤ්ඤරෙ
න තං සම්මග්ගතා යඤ්ඤං උපයන්ති මහෙසිනො' (කොසලසංයුත්ත)

11. 'මධුවා මඤ්ඤති බාලො යාව පාපං න පච්චති' (ධම්මපද)

12. 'නවිජ්ජතී සො ජගතිප්පදෙසො,
යත්ථට්ඨිතො මුඤ්චෙය්‍ය පාපකම්මා' (ධම්මපද)

13. යො දෙති සීලාදිගුණොදිතානං
සබ්බංදදෙ නාම පවුච්චතෙ සො' (බුද්ධවංසට්ඨකථා)

14. 'රූපඤ්ච හිදං භිකඛවෙ අතතා අභවිසස, නයිදං රූපං ආබාධාය සංවත්තෙය්‍ය ලබ්හෙථ ච රූපෙ: එවං මෙ රූපං හොතු, එවං මෙ රූපං මා අහොසී' ති' (අනත්තලක්ඛණ සුත්ත)

15. 'තථෙව්' මෙ චතුබබණ්ණා පබබජිත්වා තවනතිකෙ
ජහනති පුරිමං නාමං බුද්ධපුත්තාති ඤායරෙ.' (සාරිපුත්තථෙරාපදාන)

16. 'මතං ව අමම රොදනති, යො වා ජීවං න දිසසති.' (යක්ඛ සංයුත්ත)

17. 'තං තසස හොති අත්ථාය, නො ව යං තත්ථ ඩය්හති.'
(දෙවතා සංයුත්ත)

18. 'විහඤ්ඤති ඛො අයං බ්‍රාහ්මණො සකෙන චිතෙතන.'
(සො) ණදණ්ඩ දීසං)

19. A' චක්ඛුනි තෙ නස්සන්තු වා භිජ්ජන්තු වා බුඩසාසන මෙව ධාරෙහි, මා චක්ඛුනි.'
B 'අපුබබං අචරිමං අක්ඛීනි චෙව කිලෙසා ච පභිජ්ජිංසු.'
(චක්ඛුපාලථෙර ධ. අ.)

20. 'වොළං පිණෙඩා රතී බිඩ්ඩා යත්ථ කිවෙජන ලබ්හති.' (දෙවතාසං)

## ඊප්සාර්ථප්‍රකාශක ප්‍රත්‍යයයෝ

104. ධාතුවකින් යම් අර්ථයක් ප්‍රකාශ කෙරේ නම් එය කරනු කැමති බව මේ ප්‍රත්‍යයන් විසින් දක්වනු ලැබේ.

විකරණ ප්‍රත්‍යයන් මෙන් ධාතුවටත් ආඛ්‍යාත විභක්තියටත් අතරෙහි යෙදෙන මේ ප්‍රත්‍යයෝ නම් ස, ඡ, ඛ, යන මොහුයි. මේ ප්‍රත්‍යයන් යෙදුණු විට ධාතුවගේ මුලකුර ද්විත්ව බවට පැමිණේ. ද්විත්ව යට පැමිණි විට ඒ දෙකෙන් පළමු එකට අබ්හාස යයි කියනු ලැබේ.

A. ද්විත්ව වෙන විට මහාප්‍රාණාක්ෂරය වෙනුවට අල්පප්‍රාණාක්ෂරයක් යෙදේ:- භුජ යන්න බුභුජ යි සිටී.

B. හ-කාරය ද්විත්ව වූ විට මුල් හ-කාරයට ජකාර වේ:- හා හා යි සිටි තැන ජා හා යි සිද්ධව ඉන් පසුව මුල් ආකාරයට හ්‍රස්ව වී ජහායි සිටී.

C. සකාරය ද්විත්ව වූ විට ද මුල් ස-කාරයට ජ-කාරවේ. සස-ධාතුවේ ස-කාරයට ද්විත්ව වී සසස සිටි විට මුල් ස-හට ජකාර වීමෙන් ජසස යි සිටී. ඒ ජකාරයේ ස්වරයට ඉකාරයක් වී නැවත ජිසස යි සිද්ධ වේ.

A. ස-ප්‍රත්‍යය

1. සු (ඇසීමෙහි)+ස+ති යන තැන සු හට ද්විත්ව වූ විට ස+සු+ස+ති යි සිටී.

දෙවෙනි සකාරය ද්විත්ව කළ විට **සුස්සූසති** වේ.

**සුස්සූසති**=අසනු කැමති වේ.

2. ජි (ජය ගැන්මෙහි)ධාතුවෙන් ස-ප්‍රත්‍යය යෙදූ විට ජී හට ජිං-ආදෙශ වේ. ජි-හට ද්විත්ව කළ විට ජිජිංස යි සිටී. ද්විතීය ජකාරයට ග-කාර කළ විට ජිගිංස වේ. ජිගිංසති=දිනනු කැමති වේ; ලබනු කැමති වේ.

3. බීමෙහි වැටෙන පා ධාතුවෙන් ස-ප්‍රත්‍යය වූ විට පාහට පිවා ආදේශ වේ.

පිවා+ස+ති=පිවාසතී (බොනු කැමති වේ)

4. ස-ප්‍රත්‍යය යෙදූවිට මන ධාතුවට වීමං ආදෙශ වේ:-

වීමං+ස+ති විමසතිං (විමසයි: දැන ගනු කැමති වේ.)

B. ඡ-ප්‍රත්‍යය

1. ඡ-ප්‍රත්‍යය පරකල්හි රෝගාපහරණයෙහි වූ කිත-ධාතුවට චිකිච් ආදේශ වේ.

චිකිච්+ඡ+ති = චිකිච්ඡති (පිළියම් කෙරේ)

ප්‍රථම චි-යන්නට-ත් කාරයක් වී තිකිච්ඡති යි සිටිනු නොයෙක් විට දක්නා ලැබේ.

2. ඡ-ප්‍රත්‍යය පරකල්හි ගුප-ධාතුවට ද්විත්ව වී ගුගුප+ඡ යි සිටී. ඉන්පසු මුල් ග්-කාරයට ජ්-කාරයක් වී උකාරයට ඉ-කාර වීමෙන් ජිගුප+ඡ යි සිටී. ධාත්වන්තය ලොප් වූ පසු ජ්-කාරයට ච්වීමෙන් ජිගුච්+ඡ යි සිටී.

ජිගුච්+ඡ+ති=ජිගුච්ඡති (පිළිකුල් කෙරේ.)

3. කෑමෙහි වැටෙන සස-ධාතුවෙන් ඡ-ප්‍රත්‍යය පර වූ විට සස-හට ජිසස රූපය ලැබෙන සැටි මින් උඩ C අකුරෙන් දක්වන ලදී.

**ජිසස+ඡ+ති** යි සිටි තැන ස-කාරයට-ච කාරවීමෙන් ජිඝච්ඡති (කනු කැමති වේ.) යන්න සෑදේ.

ඊප්සාර්ථප්‍රකාශක ප්‍රත්‍යයයෝ

C. ඛ ප්‍රත්‍යය

1. අනුභව කිරීමෙහි වූ භුජ-ධාතුවට ඛ-ප්‍රත්‍යය පරවූ විට ද්විත්ව වී බුභුජ+ඛ යි සිටී. ධාත්වන්ත ජ්-කාරයට ක්-වූ විට බුභුක්+ඛ+ති=බුභුක්ඛති (අනුභව කරනු කැමති වේ) යි සිද්ධ වේ.

2. ඉවසීමෙහි වූ තිජ-ධාතුව කෙරෙන් ඛ-ප්‍රත්‍යය වූ විට ති-කාරයට ද්විත්ව වී තිතිජ+ඛ යි සිටී. ධාත්වන්ත ජ්-හට ක්-වූ විට තිතික්+ඛ+ති=තිතික්ඛති යි සිද්ධ වේ.

## උපමානාර්ථ ප්‍රත්‍යයෝ

105. අන් දෙයක් හා සමාන කොට හැසිරීමක් දක්වනු කැමති විට ඒ උපමානය සඳහා ගනු ලබන නාමය කෙරෙන් ආය ඊය යන ප්‍රත්‍යයෝ වෙති. ඒ ප්‍රත්‍යය සහිත නාමය ආඛ්‍යාත මූලයක් සේ සලකා ඉන් පරව ආඛ්‍යාත විභක්ති යොදනු ලැබේ.

A. පබ්බත+ආය+ති =පබ්බතායති (තමා පර්වතයක් මෙන් කොට කම්පා නොවී හැසිරේ.)

B. පුත්ත+ඊය+ති=පුත්තීයති (පුත්‍ර නොවූවකු පුත්‍රයකු මෙන් සලකා ක්‍රියා කරයි.)

C. සමුද්ද+ආය+ති+=සමුද්දයති (තමා සමුද්‍රය මෙන් ගැඹුරු වූවකු සේ පෙන්වයි.)

D. ඡත්ත+ඊය+ති=ඡත්තීයති (ඡත්‍රයක් නොවූ දෙය ඡත්‍රයක් මෙන් සලකා පාවිච්චි කරයි.)

E. දෙලා+ආය+ති=දෙලායති (දේලාවක් මෙන් කෙරේ හෙවත් ඒමේ අත වැනේ.)

F. ධූම+ආය+ති=ධූමායති (දුම් දමයි; දුමක් මෙන් පෙන්වයි.)

106. තමා යමක් ලැබීමට කැමැති වේ නම් ඒ ඊප්සිත වස්තුව කෙරෙන් ද ඊය - ප්‍රත්‍යය වේ.

පත්ත+ඊය+ති=පත්තීයති =(පාත්‍රයක් ලැබීමට කැමති වේ.)
වත්ථ+ඊය+ති=වත්ථීයති =(වස්ත්‍රයක් ලැබීමට කැමති වේ.)
ධන+ඊය+ති=ධනීයති =(ධනය ලබනු කැමති වේ.)

107. යමකින් පීඩිත හෝ ප්‍රමුදිත වේ නම් එහි ද ඊය-ප්‍රත්‍යය යෙදෙන බව පෙනේ.

තණ්හා+ඊය+ති =තණ්හීයති (තෘෂ්ණාවෙන් මැඩේ.)

හිරි+ඊය+ති =හිරීයති (ලජ්ජාවෙන් මැඩේ.)
දුක්ඛ+ඊය+ති =දුක්ඛීයති (දුකින් මැඩේ.)
අට්ට+ඊය+ති =අට්ටීයති (පිළිකුළින් මැඩේ)
සුඛ+ඊය+ති =සුඛීයති (ප්‍රමුදිත වේ.)

## අනුකරණ ශබ්ද ප්‍රකාශක ක්‍රියා

108. අනුකරණ ශබ්දයන් කෙරෙන් ආය-ප්‍රත්‍යය යෙදූ පසු ආඛ්‍යාතවිභක්තීහු යෙදෙත්:-

තට+තට+ආය+ති=තටතටායති (තට-තට- යන ශබ්ද පවත්වයි)
චිටි+චිටි+ආය+ති=චිටිචිටායති (චිටි චිටි යන ශබ්ද පවත්වයි)
චිච්+චිටි+ආය+ති=චිච්චිටායති (චිච් චිටි යන ශබ්ද පවත්වයි)
ගල+ගල+ආය+ති=ගලගලායති (ගල ගල යන ශබ්ද පවත්වයි)

## උදාහරණ XX

1. 'අහං හි බො බ්‍රාහමණ ජිගුච්ඡාමි කායදුච්චරිතෙන......... ජිගුච්ඡාමි අනෙකවිහිතානං පාපකානං අකුසලානං ධම්මානං සමාපත්තියා' (අං.සඩ 178)

2. 'අථේ' කො ලොල-මක්කටො රුක්ඛා ඔතරිත්වා තස්ස පිට්ඨිං අභිරුහිත්වා............... නංගුට්ඨං ගහෙත්වා දෙලායන්තො කීළි' (ජා. ii 385)

3. 'ඉධූ' රගානං පවරො පවිට්ඨො
සෙලස්ස වණ්ණෙන පමොක්ඛමිච්ඡං:
බ්‍රහ්මඤ්ච වණ්ණං අපචායමානො
බුභුක්ඛිතො නො විසහාමි භොත්තුං' (උරග ජා ii 14)

4. 'න තං යාචෙ යස්ස පියං ජිගිංසෙ:
දෙස්සො හොති අතියාචනාය' (ජා. ii 285)

5. 'දෙවො ච වස්සති, දෙවො ච ගලගලායති:
එකකො චා'හං හෙරවෙ බිලෙ විහරාමි.' (සම්බුලකච්චානාථෙරගාථා)

6. 'එකම්පි චෙ පාණ මදුට්ඨචිත්තො
මෙත්තායති කුසලී තෙන හොති.' (අං iv 151)

7. එස වාතාහත තාලපණ්ණං විය කටකටායති, ඉමස්ස කථාය පරියන්තො යෙව නත්ථීති නින්දන්ති' (ධ. අ. iii 328)

8. 'දද්දභායති භද්දන්තෙ, යස්මිං දෙසෙ වසාම'හං' (ජා. iii 77)

9. 'සො..............තතො'ව වසන්තො තාව පණ්ඩිතං විමංසතුති අමච්චස්ස දූතං පට්පෙසෙසි.' (උම්මග්ගජාතක)

10. ඉමං බො අහං, කෙවට්ට, ඉද්ධිපාටිහාරියෙ ආදීනවං සමපස්ස මානො ඉද්ධිපාටිහාරියෙන අට්ටියාමි, හරායාමි, ජිගුච්ඡාමි, (දි. කෙවට්ට සු.)

11. සො ගෙහා නික්ඛමිත්වා.............. අක්ඛිනි මෙ ධූමායන්තීති වත්වා නලාටෙ හත්ථං ඨපෙත්වා උද්ධං ඔලොකෙන්තො.' (ධ. අ. මහාකස්සප-පිණ්ඩපාතදින්න)

12. 'යො හවෙ බලවා සන්තො දුබ්බලස්ස තිතික්ඛති
තමාහු පරමං ඛන්තිං: නිච්චං ඛමති දුබ්බලො.' (සක්ක සංයුත්ත)

13. 'භයානු මඝවා සක්ක, දුබ්බල්‍යා නො තිතික්ඛසි
සුණන්තො ඵරුසං වාචං සම්මුඛා වෙපචිත්තිනො?' (සක්ක සංයුත්ත)

14. 'අද්දසා බො භික්ඛවෙ වෙපචිත්ති අසුරින්දො සක්කං දෙවානමින්දං දූරතොව ආගච්ඡන්තං: දිස්වාන සක්කං දෙවානමින්දං එතදවොච. තිකිච්ඡ මං දෙවානමින්දාති' (සංක්ක සංයුත්ත)

15. '...............අසද්දං වෙජ්ජං පක්කොසිත්වා තිකිච්ඡාපෙහීති වත්වා............. නික්ඛමි.' (මට්ටකුණ්ඩලී ධ. අ.)

16. 'යථාපි ව්‍යාධිතො පොසො විජ්ජමානෙ තිකිච්ඡකෙ
න තිකිච්ඡාපෙති තං ව්‍යාධිං, න සො දෙසො තිකිච්ඡකෙ' (බුඩවංස පාළි.)

17. සෙය්‍යථාපි නාම එලොදිවසසන්තත්තො උදකෙ ඡක්කිත්තෙ' චිච්චිටායති, චිටිචිටායති, සන්ධූපායති, සම්පධූපායති.' (බ්‍රාහ්මණසං.)

18. සෙය්‍යථාපි නාම දෙවෙ ගලගලන්තෙ විජ්ජුල්ලතා
නිච්ඡරති එවමස්ස මුඛතො ජිව්හාපි නිච්ඡරති.' (මාරසංයුත්ත)

19. "ඉධානන්ද භික්ඛු සබ්බසංඛාරෙහි අට්ටීයති හරායති. ජිගුච්ඡති."
(ගිරිමානන්ද දසංගුත්තර)

20. "බාලො පුත්තතණ්හාය චෙව ධනතණ්හාය ච හඤ්ඤති විහඤ්ඤති, දුක්ඛීයති." (ධ. අ. ii 28)

## 109. මා යෝගයෙහි අජ්ජතනිය

මා-යන්න වැළැක්වීමෙහි (=ප්‍රතිෂෙධාර්ථයෙහි) නිපාතයකි. එය හා අජ්ජතනික ක්‍රියාපද යෙදුණු විට ඒවායින් අතීතාර්ථය පමණක් නොව අන්‍යකාලයන්ගේ අර්ථ ද ප්‍රකාශ කරනු ලැබේ.

1. "මය්හං පන වසනට්ඨානං මා කස්සචි ආචික්ඛි."
= මා වසන තැන කිසිවකුට නොකියව. (සීලවනාං ජාතක)

2. මා මුනිකස්ස පිහයිඃ ආතුරන්නානි භුඤ්ජති."
=මුනික නම් ඌරාට ප්‍රිය නොකරවඃ හෙතෙම ගිලන් අහර අනුභව කරයි.
(මුනික ජාතක)

3. "මා ආයස්මන්තානම්පි සංඝභෙදෙ රුච්චිත්ථ"
= ආයුෂ්මත්වරුන්ටත් සංඝභෙදය රුචි නොවේවා. (පාතිමොක්ඛ)

4. "අසුකෙන මෙ තෙලං පක්කංති මාවදිත්ථ."
= අසුවලා විසින් මට තෙලක් පිසින ලදැයි නොකිව මැනවි. (ධ. අ. චක්ඛුපාල)

## 110. අතීතාර්ථයෙහි භවිස්සන්තිය

භවිස්සන්ති විභක්තිය ඇතැම් විට අතීතාර්ථයෙහිත් වේ යයි රූප සිද්ධි ව්‍යාකරණයෙහි කියන ලදී. ශබ්ද නීති ව්‍යාකරණයෙහි වනාහි අජ්ජතනී - උත්තම - එකවචන ඉං-විභක්තියට ස්සං ආදේශ වේ යයි ද එය ගාථා විෂයෙහි පමණකැයි ද දක්වන ලදී.

1. "අනෙක ජාතිසංසාරං සංන්ධාවිස්සං අනිබ්බිසං" = මම (ශරීරය මවන වඩුවා) සොයා ගත නොහැකිව බොහෝ ඉපදීම් ඇති සංසාරයෙහි ඇවිද්දෙමි. (උදානපාළි.)

2. "උපොසථං උපවසිස්සං සදා සීලෙසු සංවුතා." =මම අනාගතයේදී ශීලයන්හි සංවර ඇත්තී පෙහෙවස් වසන්නෙමි. (උත්තරා විමානවත්ථු)

මෙය ගාථා විෂයෙහි පමණක් නොවන බව දේවදූත සූත්‍රයෙහි පෙනෙන "නාසක්ඛිස්සං භන්තෙඃ පමාදස්සං භන්තෙ" යන වාක්‍යවලින් පෙනේ.

උපනාමාර්ථ ප්‍රත්‍යයයෝ

## උදහරණ xxi

1. 'එවංරූපානං මම පුත්තස්ස සන්තිකං උපසංකමිතුං මාදත්ථ.' (ජාතකනිදාන)
2. 'කුඩ්ඩමූලං ච නිස්සාය ආලොපං තං අභුඤ්ජිසං' (මහාකස්සපථෙරගාථා)
3. 'අයොනිසො මනසිකාරා, මණ්ඩනං අනුයුඤ්ජිසං' (නන්දථෙරගාථා)
4. තත්ථ නං උපසංකම්ම, වන්දිස්සං පුරිසුත්තමං' (සොපාකථෙරගාථා)
5. 'තාදිසං භික්ඛු මා හනි: මාතත්තානං බණ්ඩි බ්‍රාහ්මණ.' (මහාමොග්ගල්ලානථෙරගාථා)
6. 'තුවං ච භන්තෙ අනුකම්පකං විදූං
   උපෙච්ච වන්දිං කුසලං පුච්ඡිසං' (උච්ඡුදායිකාවිමාන)
7. අනුචංකමිස්සං විරජං සබ්බසත්තාන මුත්තමං.' (සොපාකථෙරගාථා)
8. 'නත්ථීති මෙ වචනස්ස සවණං මා හොතු, භොජනුප්පත්තියා ජානනං මා හොතු තී පත්ථනා කතා.' (ධ. අ. දේවදත්ත)
9. 'භික්ඛවෙ..... මා පමාදත්ථ; මා පච්ඡා විප්පටිසාරිනො අහුවත්ථ; අයං වො අම්හාකං අනුසාසනී.' (පඤ්චකංගුත්තර)
10. 'තමෙනං භික්ඛවෙ යමො රාජා එවමාහ: අම්භො පුරිස, තස්ස තෙ විඤ්ඤුස්ස සතො මහල්ලකස්ස න එතදහොසි; අහම්පි බො'ම්හි ජාතිධම්මො........... හන්ද'හං කල්‍යාණං කරොමි කායෙන වාචාය මනසාති? සො එවමාහ: නාසක්ඛිස්සං භන්තෙ: පමාදස්සං භන්තෙති.' (ම. දේවදූත 130)

# පසළොස්වන පරිච්ඡේදය

## ක්‍රියාකාරක සම්බන්ධය

111. කර්තෘ පදයක් හා ක්‍රියා පදයක් නැතිව වාක්‍යයක් සෑදිය නොහැකි බව යට කියන ලදී. නමුත් ඇතැම් තැනක 'ගච්ඡ, අමුම්හි ඔකාසෙ තිට්ඨාහි' (=යව අසවල් තැන සිටුව,) 'ආගච්ඡාහී තී වත්තබ්බො' (=එව යි කිය යුතුය) යනාදී වශයෙන් කර්තෘ පද නොදැක් වුවත් අර්ථාවබෝධයට බාධා නැති බැවින් එසේ කියන ලදී. 'යව; සිටුව එව' යන ක්‍රියාවන් මධ්‍යම පුරුෂ එකවචන බැවින් ඒවායේ කර්තෘපදය නො දක්වන ලද්දේ නම් ක්‍රියා පදයේ පුරුෂයත් සංඛ්‍යාවත් බලා නොකියා හරන ලද කර්තෘ පදය (අධ්‍යාහාර කොට) යොදා ගත යුතුයි.

මෙසේම ක්‍රියා පද නොයෙදූ වාක්‍ය ද දක්නා ලැබේ. ධම්ම පදට්ඨ කථාවේ චක්ඛුපාලවස්තුවෙහි දෙතැනකම 'තුම්හෙ පන භන්තේති' යන

වාක්‍ය පෙනේ. මෙහි තිබෙන්නේ කර්තෘ පදය පමණකි. එබැවින් 'කිං කරිස්සථ' යි කර්මයත් ක්‍රියාවත් අධ්‍යාහාර කොට වාක්‍යය සම්පූර්ණ කළ යුතු වේ. 'ඔබ වහන්සේ වනාහි කුමක් කරන්නාහුදැයි' යි ඇසීම සඳහා මේ වාක්‍යය යොදා තිබේ. මෙසේ යම් තැනක ක්‍රියාව යොද නැත්නම් එතැන්හි කර්තෘට අයත් පුරුෂය බලා ඊට ගැළපෙන ක්‍රියාවක් යොද ගත යුතු.

112. එක් කර්තෘ පදයකට සම්බන්ධ කොට එකකට වැඩි ගණනක් ක්‍රියාපද යෙදිය හැක:

. 'පදුමරාජා බාරාණසියං රජ්ජං කාරෙති, සකලජම්බුදීපං සංඛොභෙත්වා දනං දෙති, සො තං දිස්වා තුස්සිස්සති, තුට්ඨො බහුං ධනං **දස්සති**' (චුල්ලපදුම ජාතක)

මෙහි 'කාරෙති, දෙති' යන ක්‍රියාවයට කර්තෘ වූයේ 'පදුමරාජා' යන්නයි. 'තුස්සිස්සති, දස්සති' දෙකට කර්තෘ වූයේ 'සො' යන්නයි. පදුමරාජා රජ්ජං කාරෙති, පදුමරාජා........... දනං දෙති සො............. තුස්සිස්සති, සො තුට්ඨො බහුං ධනං දස්සති' යි එක් එක් ක්‍රියාවට වෙන් වශයෙන් කර්තෘ පද යොද අර්ථාවබෝධය කළ යුතු.

2. 'කිං භණෙ තිට්ඨථ? ඉමං කුමාර ගණ්හථ, හනථ, පලාපෙථ' (ජාතකනිදන)

මෙහි 'තුම්හෙ කිං තිට්ඨථ? තුම්හෙ ඉමං කුමාරං ගණ්හථ; තුම්හෙ............... හනථ; තුම්හෙ............ පලාපෙථ' යි, තුම්හෙ යන කර්තෘ පදය ක්‍රියාවක් පාසා අධ්‍යාහාර කටයුතුයි.

3. 'භගවා නෙව තාසං වචනං මනසි අකාසි; න අක්ඛීනි උම්මිලෙත්වා ඔලොකෙසි;..................... විවේකසුඛඤ්ඤෙව අනුභවන්තො **නිසීදි**' (ජාතකනිදන)

4. 'අම්හෙ පන තිංසමත්තා ජනා පාණං න හනාම; අදින්නං නාදියාම; මිච්ඡා න චරාම; මුසාවාදං න කථෙම; මජ්ජං න පිවාම; මෙත්තං භාවෙම; දනං දෙම; මග්ග සමං කරොම; පොක්ඛරණියො ඛණාම. සාලං කාරොම' (කුලාවක ජාතක)

මෙහි සියලු ක්‍රියාවන්ට 'අම්හෙ' යන්න කර්තෘ වේ.

113. කර්තෘ පද වෙන්ව සිටියත් ඔවුන්ගේ ක්‍රියාව එකක් වී නම් (කර්තෘ පද දෙකකට හෝ වැඩි ගණනකට) එක් ක්‍රියා පදයක් බහු වචනයෙන් යෙදිය හැක.

1. 'තස්මිං ඛණෙ මහාමොග්ගල්ලානත්ථෙරො ච ආනන්දත්ථෙරො ච චින්තෙසුං.' (ධ. අ. 299)

මෙහි කර්තෘ පද දෙකක් ඒකවචනයෙන් සිටි නමුත් කර්තෘන් දෙදෙනාගේ සිතීම් ක්‍රියාව එකක්ම වූ බැවින් එක් ක්‍රියාපදයක් යොදන ලදී.

2. 'එකස්මිං පබ්බතපාදෙ සීහො ච ව්‍යග්ඝො ච එකිස්සායෙව ගුහාය වසන්ති.' (මාලුත ජාතක)

3. 'සාවත්ථි අග්ගාළවෙ චෙතියෙ විහරන්තෙ බහූ උපාසිකා ච භික්ඛුනියො ච විහාරං ධම්මසවනාය ගච්ඡන්ති:................ ගච්ඡන්තෙ පන කාලෙ උපාසිකා ච භික්ඛුනියො ච න ගච්ඡිංසු, භික්ඛූ චෙව උපාසකා ච අහෙසුං' (තිපල්ලත්ථමිග ජාතක)

මෙහි එක් එක් ක්‍රියාවට බහුවචනය වූ කර්තෘ පද දෙක බැගින් වෙති.

4. රාජා ච රාජපුත්තා ච ජනපදෙ නියුත්තකපුරිසො ච භණ්ඩාගාරිකො ච අනුපුබ්බෙන කාලංකත්වා සද්ධිං පරිසාය සග්ගෙ උප්පජ්ජිංසු' (තිරොකුඩ්ඩවණ්ණනා)

මෙහි බහුවචනයක් ද ඒක වචන තුනක් ද 'උප්පජ්ජිංසු' යන එකම ක්‍රියාවට කර්තෘපදව සිටිති.

114. පුද්ගලයන් වශයෙන් බොහෝ දෙනෙකුන් වුවත් සමූහයක් වශයෙන් ගනු ලබන කල්හි කර්තෘ පදය එකවචනයෙන් සිටී. ක්‍රියාපදයත් එය අනුව යේ:

1. අථ ඛො රඤ්ඤො උදෙනස්ස ඔරොධො යෙනා'යස්මා ආනන්දො තෙනුපසඞ්කමි................ එකමන්තං නිසින්නං ඛො රඤ්ඤො උදෙනස්ස ඔරොධං ආයස්මා ආනන්දො ධම්මියා කථාය.................. සම්පහංසෙසි. අථ ඛො................ ඔරොධො.................. ආයස්මතො ආනන්දස්ස පඤ්ච උත්තරාසඞ්ගසතානි පාදසි.' (චුල්ලවග්ගපාළි)

මෙහි 'ඔරොධ' නම් අන්තඃපුර ස්ත්‍රීසමූහය යි. (මාතුගාම ශබ්දය මෙන් මෙයත් පුල්ලිඞ්ගිකයි.) උදෙනරජුගේ අන්තඃපුර ස්ත්‍රීසමූහය පන්සියයක් පමණ වූ නමුත් මෙහි සමූහවශයෙන් ගෙන එකවචනය යොදන ලදී.

2. 'තෙසු ගච්ඡන්තෙසු සඤ්ජයස්ස පරිසා භිජ්ජි:...... ආරාමො තුච්ඡො අහොසි.' (අග්ගසාවකවත්ථු)

3. 'මහාජනො අත්තනො අත්තනො පුත්ත-ධීතු-ඤාතීනං අත්ථාය පරිදෙවමානො මහාසද්දමකාසි.' (ධ. අ. 218)

115. බොහෝ දෙනෙකුගේ ක්‍රියාව එකක් වුවත් කර්තෘන් ගෙන් ඇතැම් කෙනෙකුන් 'සමග' යන්නෙන් සම්බන්ධකරනු ලැබුවහොත් ප්‍රථමාවෙන් සිටි පදය අපෙක්ෂාකොට ක්‍රියාව යොදනු ලැබේ.

1. 'අජ්ජාහං පඤ්චහි භික්ඛුසතෙහි සද්ධිං විහාරෙයෙව නිසීදිස්සාමි' (=අද මම පන්සියයක් භික්ෂූන් සමග විහාරයෙහිම හිඳින්නෙමි.) (මච්ඡරියකොසියවත්ථු.)

මෙහි පන්සියයක් භික්ෂූන්ගේත්, අම්හ ශබ්දයෙන් වාච්‍යවූ සර්වඥයන් වහන්සේගේත් හිඳීම එකක්ම වුවත් 'සද්ධිං' යන්නෙන් සම්බන්ධකරනු ලැබූ බැවින් ප්‍රථමාවෙන් සිටි 'අහං' යන්න අනුව ක්‍රියාව යොදන ලදී.

2. 'සූරියකුමාරො 'අහම්පි භාතිකෙහි සද්ධිං ගමිස්සාමී' ති තෙහි සද්ධිං යෙව නික්ඛමි' (=සූර්‍ය්‍යකුමාරතෙමේ 'මමත් බෑයන් සමග යන්නෙමි' යි ඔවුන් සමගම නික්මුණේය) (දෙවධම්මජාතකය)

සූර්‍ය්‍යකුමාරයාත් සොහොයුරෝත් එක් මගක එක්වම ගියාහුය, නමුත් බෑයන් 'සමග' යන්නෙන් සම්බන්ධ කළ බැවින් 'සූරිය' කුමාරො' යන්න අනුව 'නික්ඛමි' යන්නත් 'අහං' යන්න අනුව 'ගමිස්සාමි' යන්නත් ඒකවචනයෙන් යොදන ලදී.

3. 'සත්ථා ආනන්දත්ථෙරෙන පච්ඡාසමණෙන පිණ්ඩාය චරන්තෝ ...... තං පවත්තිං ආචික්ඛි' (=සර්වඥතෙමේ පසුව යන ආනන්දමහතෙරුන් හා පිඬුපිණිස හැසිරෙන්නේ....... ඒ ප්‍රවෘත්තිය කීය) (ධ. ආනන්ද සෙට්ඨිවත්ථු)

4. 'තෙ අත්තනො අන්තෙවාසිකෙහි අඩ්ඪතෙයොහි පරිබ්බාජකසතෙහි සද්ධිං වෙළුවනං අගමංසු' (=ඔවුහු තමන්ගේ අතවැසිවූ දෙසියපණහක් පරිව්‍රාජකයන් සමග වේළුවනයට ගියහ.) (අග්ගසාවකවත්ථු)

මෙහි බහුවචන ක්‍රියාව අතවැසියන් සලකාගෙන නොව 'තෙ' යන බහුවචනය සලකාගෙනයි.

116. එක් ක්‍රියාවකට කර්තෘපද කීපයක් වූ කල්හි ඒ කර්තෘපද ප්‍රථමාදී පුරුෂයන් අතුරෙන් එක් පුරුෂයකුට අයත්වීනම් ක්‍රියාපදය යෙදීම අපහසු නොවේ. 'උඹත් මමත් ගමට යමු.' යන වාක්‍ය යෙහි මෙන් කර්තෘන් වෙන් වෙන් පුරුෂවලින් යුක්තවූ විට ක්‍රියාව කිනම් පුරුෂයකින් යුක්තවිය යුතුදැයි සෙවිය යුතු වේ.

එවැනි වාක්‍යයන්හි පසුවූ පුරුෂය අනුව ක්‍රියාව බහුවචන යෙන් යෙදිය යුතු.

ප්‍රථම පුරුෂයට මධ්‍යම පුරුෂයත්, මධ්‍යම පුරුෂයට උත්තම පුරුෂයත් පසුවූ පුරුෂය නම් වේ. (යම් වාක්‍යයක ප්‍රථමපුරුෂයත් මධ්‍යම පුරුෂයත් යෙදී තිබේ නම් ක්‍රියාව මධ්‍යම පුරුෂ බහුවචනයෙන් සිටී. යම් වාක්‍යයක ප්‍රථම-උත්තම-පුරුෂද්වය හෝ මධ්‍යම-උත්තම පුරුෂද්වය හෝ පුරුෂත්‍රයම හෝ යෙදී තිබේ නම් ක්‍රියාව උත්තමපුරුෂ බහුවචනයෙන් සිටී.)

1. ත්වං ච අහං ච වාපිං ගච්ඡාම (=තෝත් මමත් වැවට යමු) මෙහි ත්වං මධ්‍යම පුරුෂ එකවචනයි, අහං උත්තම පුරුෂ එකවචනයි.

2. තෙපි තුම්හෙපි වනං ගච්ඡථ (=ඔවුහුත් තෙපිත් වනයට යව්.)

3. තෙ ච තුම්හෙ ච අහං ච භත්තං භුඤ්ජාම (=ඔවුහුත් තෙපිත් මමත් බත් අනුභව කරමු.)

4. 'ධම්මෙන රජ්ජං කාරෙන්තං රට්ඨා පබ්බාජයිත්ථ මං
'ත්වං ච ජනපද වෙව නෙගමා ච සමාගතා'

(=තෝ ද ජනපදවැසියෝ ද නියම්ගම්වැසියෝ ද එක්වූවහු ධර්මයෙන් රාජ්‍යයකරවන මා රටින් පිටිවහල් කළාහුය. (වෙස්සන්තර ජාතක)

5. 'අහං ච මද්දිදෙවී ච ජාලි කණ්හාජිනා උභො
අඤ්ඤමඤ්ඤං සොකනුද වසාම අස්සමෙ තද'
(මම ද මද්‍රිදේවිය ද ජාලී-කෘෂ්ණාජිනා දෙදෙන ද එකල්හි එකිනෙකාගේ ශෝක දුරුකරමින් ආශ්‍රමයෙහි වසමු) (එම. ජා.)

මේ යෙදීම කළහැක්කේ සියලු දෙනාගේ ක්‍රියාවන් එක් කාලයක් ප්‍රකාශ කරතොත් පමණයි.

117. එක් කර්තෘපදයක් හා එක් අවසාන ක්‍රියාපදයක් ඇති වාක්‍යයක පූර්වක්‍රියා බොහෝ ගණනක් යෙදිය හැක.

1. බ්‍රාහ්මණො නදිං ගන්ත්වා, නහායිත්වා ගෙහං ආගන්ත්වා, පචිත්වා, භුඤ්ජිත්වා, සයි.

2. ලුද්දකො කොට්ඨකා නික්ඛමිත්වා මිගං උක්කන්තිත්වා අග්ගිං කත්වා............. මධුරමංසං පචිත්වා, ඛාදිත්වා, පානීයං පිවිත්වා, අවසෙසං............. කාජෙනාදය................සරං අගමාසි.' (කණ්ඩින ජාතක)

3. 'සො ගච්ඡන්තො................ සකටානි මොචාපෙත්වා සකටපරිවත්තෙන ඛන්ධාවාරං ඛන්ධාපෙත්වා කාලස්සෙව මනුස්සෙ ච ගොණෙ ච .................. භොජාපෙත්වා මනුස්සානං මජ්ඣෙ ගොණෙ නිපජ්ජාපෙත්වා සයං බලනායකෙ ගහෙත්වා ඛග්ග හත්ථො.......... ඨිතකොව අරුණං උට්ඨාපෙසි.' (අපණ්ණක ජාතක)

4. 'පුනදිවසෙ පාතොව සබ්බකිච්චානි නිට්ඨාපෙත්වා, ගොණෙ භොජෙත්වා දුබ්බලසකටානි ඡඩ්ඩෙත්වා ථිරානි ගාහාපෙත්වා අප්පග්ඝං භණ්ඩං ඡඩ්ඩාපෙත්වා මහග්ඝං ආරොපෙත්වා යථාධිප්පෙතං ඨානං ගන්ත්වා...... භණ්ඩං වික්කිණිත්වා සබ්බං පරිසං ආදය පුන අත්තනො නගරමෙව අගමාසි' (එම ජාතක)

118. මුලදී බහුවචනයෙන් එක්ව කියැවුණු කර්තෘන් පසුව එකිනෙක වෙන්ව වෙනස් වූ ක්‍රියාවන් කළහොත් ක්‍රියාපද මුල් කර්තෘපද අනුව නොයත්.

1. ' තෙ කිර ද්වෙ සහායකා ධම්මසවණත්ථං ගච්ඡන්තෙන මහාජනෙන සද්ධිං ජෙතවනෙ ගන්ත්වා එකො ධම්මකථං අස්සොසි එකො අත්තනො ගය්හූපගං ඔලොකෙසි.' (ධ. අ. ගණ්ඨිභෙදකචොරවත්ථු)

මෙහි බහු වචනයෙන් සිටි කර්තෘපදය 'ගන්ත්වා' යන පූර්ව ක්‍රියාවට පමණක් කර්තෘ විය. (පසුව දෙදෙන වෙනස් ක්‍රියාවන්හි යෙදුණු බැවින්) අවසාන ක්‍රියාවන්ට කර්තෘ නොවීය.

# සවෙනි පරිච්ඡෙදය

## වාක්‍ය විවේචන

12.0. වාක්‍යයෝ වනාහි

1. අමිශ්‍රවාක්‍ය
2. මිශ්‍රවාක්‍ය
3. සංහතවාක්‍ය වශයෙන් ත්‍රිවිධ වෙති.

1. එක් කර්තෘවාක්‍යයකින් හා එක් අවසාන ක්‍රියාවකින් යුක්තවූයේ අමිශ්‍රවාක්‍ය නම්. උදහරණ:

(1) පුරිසො ඛෙත්තං කසති
(2). 'න පුප්ඵගන්ධො පටිවාතමෙති'
(3) 'කො න සම්මොහමාපාදි' ?

කර්තෘ - කර්ම - ක්‍රියාවන්ට අයත් විශේෂණ පදදිය නිසා වාක්‍යය කොතරම් දික් වුවත් ඇත්තේ එක කර්තෘවාචකයක් හා එක් අවසානක්‍රියාවක් නම් එය අමිශ්‍ර වාක්‍යයක් මය.

(4) 'පාතුභූත සත්තරතනො රාජා කාලිඞ්ගා චක්කවත්ති එකදිවසං සබ්බාලඞ්කාර-පතිමණ්ඩිතො මාලාවිලෙපනධරො සබ්බ සෙතං කෙලාසකූටපටිභාගං ගජරතනමාරුය්හ මාතාපිතූන්නං අස්සමපදං පායාසි.'

2. ප්‍රධානාන්තර්වාක්‍යයක් ඇතිව ඊට යටත් පැවතුම් ඇති උපාන්තර්වාක්‍ය එකකින් හෝ වැඩි ගණනකින් යුක්ත වූයේ "මිශ්‍රවාක්‍ය" නම්.

(අ) අන්තර්වාක්‍යයක් කර්තෘපදයකින් හා අවසාන ක්‍රියාවකින් යුක්ත විය යුතුය. කෝසම්බක වත්ථුවෙහි පෙනෙන 'තථාගතස්ස තත්ථ

හත්ථිනාගෙන උපට්ඨියමානස්ස වසනභාවො සකල ජම්බුදීපෙ පාකටො අහොසි' යන වාක්‍යයෙහි 'තථාගතස්ස තත්ථ හත්ථිනාගෙන උපට්ඨියමානස්ස වසනභාවො' යන පදසමුදයම කර්තෘවාචකය වේ. (සියලු දඹදිව කුමක් ප්‍රකටවීද? තථාගතයන් වහන්සේ එහි ඇත්රජු විසින් උපස්ථාන කරනු ලබමින් වසන බව ප්‍රකට විය.) නමුත් ඒ පදසමුදයෙහි ආඛ්‍යාතයක් නැති බැවින් එය පද සමූහයක් මිස වාක්‍යයක් නොවේ.

(ආ) යටත් පැවතුම් ඇතිබව නම් ප්‍රධානාන්තර්වාක්‍යයාගේ සම්බන්ධය නැතිව අර්ථය සම්පූර්ණ නොවීමයි.

'සචා'හං ගෙහං ගමිස්සාමි, මාතාපිතරො මං සන්තජ්ජෙස්සන්ති' යන්න මිශ්‍ර වාක්‍යයකි.

මෙහි පළමු කොටසින් 'ඉදින් මම ගෙට යන්නෙම් නම්' යි කියැවුණු විට සම්පූර්ණාර්ථයක් ප්‍රකාශ නොවේ. 'මවුපියෝ මට තර්ජනය කරන්නාහ' යන ප්‍රධාන වාක්‍යයාගේ සම්බන්ධය ඇති කල්හිම එය සම්පූර්ණ වේ.

'සචාහං ගෙහං ගමිස්සාමි' යන්න උපාන්තර්වාක්‍යය යි. අනික ප්‍රධානාන්තර්වාක්‍යය යි.

3. **එකිනෙකට යටත් පැවතුම් නැති අමිශ්‍ර වාක්‍යයන් හෝ මිශ්‍ර වාක්‍යයන් දෙකකින් හෝ වැඩි ගණනකින් යුක්ත වූයේ සංහතවාක්‍ය නම්.**

එවැනි අමිශ්‍ර වාක්‍ය දෙකකින් හෝ වැඩි ගණනකින් යුක්ත වූයේ සංහත වාක්‍යය යි ද මිශ්‍රාමිශ්‍ර - වාක්‍යද්වයක් හෝ වැඩි ගණනක් ඇත්තේ ද මිශ්‍රවාක්‍යද්වයක්ම හෝ වැඩි ගණනක් ඇත්තේ ද සංකරවාක්‍ය යයි ද දෙකොටසකට බෙදීම ද හැකිය. (උදහරණ පසුව දැක්වේ)

121. **කර්තෘවාච්‍යය වනාහි ශුඬ නාමපදයක් හෝ සර්වනාමයක් හෝ සමස්ත නාමයක් හෝ විශේෂණ පද සහිත නාමයක් හෝ පද සමුදයක් හෝ අනතර්වාක්‍යයක් හෝ විය හැකිː-**

අමිශ්‍ර වාක්‍යයන්ට උදහරණ වශයෙන් දැක්වූ (1) වෙනි වාක්‍යයෙහි 'පුරිසො' ශුද්ධ නාමපදයකි, (2) වෙනි වාක්‍යයෙහි 'පුප්ඵ ගන්ධා' සමස්ත නාමයකි: (3) වෙනි වාක්‍යයයෙහි (i) පාතුභූත සත්තරතනො, (ii) කාලිංගො, (iii) චක්කවත්තී (iv) සබ්බාලඞ්කාරපතිමණ්ඩිතො,

(v) මාලාවිලෙපනධරෝ යන පද 'රාජා' යන කර්තෘ පදයට විශෙෂණව සිටිත්.

'තීණි ඵලානි පත්තෙන අරියසාවකෙන ඔලොකිත - ඔලො කිතඨානං කම්පි' (=ඵලත්‍රයට පැමිණි ආයර්‍ය්‍යශ්‍රාවකයා විසින් බැලූ බැලූ තැන කම්පා විය) යන වාක්‍යයෙහි 'තීණි ඵලානි පත්තෙන අරියසාවකෙන ඔලොකිත - ඔලොකිතටඨානං' යන පදසමුදයක කර්තෘ වාචකය වේ. එයත් අමිශ්‍ර වාක්‍යයකි.

'සුනඛකාලෙ පවෙචකබුඩෙ සිනෙහෙන පවත්තිත - භුඩ්කරණ මත්තමෙව තං රක්ඛති' (=බලුව සිටිකල පසේබුදුන් කෙරෙහි ස්නේහයෙන් පැවැත්වූ බිරීම් මාත්‍රයම ඔහු රකී) යන වාක්‍යයෙහි ක්‍රියාව 'රක්ඛති' යන්නයි. 'තං' කර්‍මයයි. කවරෙක් ඔහු රකීද? භුඩ්කරණමාත්‍රය රකී. කුමන භුඩ්කරණයක්ද? පසේ බුදුන් කෙරෙහි ස්නේහයෙන් පැවැත්වූ භුඩ්කරණයයි. කොයි කලකදී කළ බිරීමක්ද? බලුව සිටි කල්හි කළ බිරීමයි. මෙසේ 'සුනඛ කාලෙ පවෙචකබුද්ධෙ සිනෙහෙන පවත්තිතභුඩ්කරණමත්තං' යන මේ පදසමුදය මේ වාක්‍යයේ කර්තෘවාචකයයි.

122. කර්‍මයද කර්තෘවාචකයට කී ලක්‍ෂණවලින් යුක්තවිය හැක. (වාක්‍යවිච්ඡෙදයේදී කර්‍මය ආඛ්‍යාතයට අයත්වන බැවින් වාක්‍ය ප්‍රභෙද දැක්වීමේදී කර්‍මය විශෙෂාවයවයක් ලෙස නොදක්වන ලදී.)

අන්තර්වාක්‍යයක් කර්තෘවාචකය හෝ කර්‍මය වුවහොත් එය මිශ්‍ර වාක්‍යයක් වෙයි.

## මිශ්‍ර වාක්‍ය

'යො හවෙ දහරො භික්ඛු යුඤ්ජති බුද්ධසාසනෙ,
සො ඉමං ලොකං පභාසෙති අබ්භාමුත්තෝ'ව චන්දිමා.'

යම් තරුණ භික්‍ෂුනමක් බුඩානුශාසනයෙහි යෙදේ නම් ඒ භික්‍ෂු නම වලාගැබින් මිදුණු චන්ද්‍රයා සේ මේ ලෝකය ප්‍රභාවත් කෙරේ.

මෙහි ප්‍රධානාන්තර්වාක්‍යය 'සො ඉමං ලොකං පභාසෙති' යන්නයි. යො දහරො භික්ඛු බුද්ධාසාසනෙ යුඤ්ජති' 'අබ්භා මුත්තො චන්දිමා ඉව පභාසෙති' යන දෙක උපාන්තර්වාක්‍යයි. ප්‍රධාන අන්තර්වාක්‍යය නැතිව උපාන්තර්වාක්‍යයන්ගේ අර්ථය සම්පූර්ණ නොවේ.

# අන්තර්වාක්‍ය විභාගය

123. අන්තර්වාක්‍යයෝ වනාහි:

(1) නාමන්තර්වාක්‍ය

(2) නාම විශෙෂණාන්තර්වාක්‍ය

(3) ක්‍රියාවිශෙෂණාන්තර්වාක්‍ය යයි ත්‍රිවිධ වෙති.

(1) හුදු නාමපදයක් නොවූවත් නාමයකගේ ස්වභාවය ගෙන කර්තෘවාචකය හෝ කර්මය වී සිටින වාක්‍යය නාමාන්තර්වාක්‍යයයි.

A. 'සච්චං කිර ත්වං නන්ද සම්බහුලානං භික්ඛූනං එව මාරොචෙසි' (=නන්දය, තෝ බොහෝ භික්ෂූන්ට මෙසේ දැන්වූයෙහිය. යන්න සැබෑවක් වේද? (ධ. අ. 60)

මෙහි ආඛ්‍යාතය 'සච්චං (හොති)' යන්නයි. කර්තෘවාචකය සෙවීම පිණිස 'කුමක් සත්‍යවේදැ' යි ප්‍රශ්නය නැඟිය යුතු වේ. ඊට 'තෝ බොහෝ භික්ෂූන්ට මෙසේ දැන්වූයෙහි' යන්න උත්තරය වේ. එබැවින් 'ත්වං නන්ද සම්බහුලානං භික්ඛූනං එවමාරොචෙසි' යන මුළු අන්තර්වාක්‍යය කර්තෘගේ ස්ථානය ගනී.

B. 'න මෙ හොති අහොසිංති භවිස්සන්ති න හොති මෙ' (=මම පෙර වීමියි සිතක් මට නොවේ; මම වන්නෙමියයි ද සිතක්ද මට නොවේ.) (අධිමුත්තථෙරගාථා)

පළමු 'නහොති' යන්නට 'අහං අහොසිං' යන්නද දෙවෙනි 'න හොති' යන්නට 'අහං භවිස්සං' යන්නද කර්තෘවාචකව සිටිත්.

කර්තෘවාචකය වන නාමාන්තර්වාක්‍යයන් පාලියෙහි ඉතා සුලභ නොවන නමුත්, කර්මයාගේ ස්ථානය ගන්නා ඒවා ඉතා සුලභ වෙති. වද-වච-බ්‍රෑ ආදි ධාතුන්ගෙන් සිඩ වූ ක්‍රියාවන්ට කර්මවශයෙන් යෙදුණු බොහෝ අන්තර්වාක්‍ය දක්නා ලැබේ.

C. 'ගච්ඡං වදෙසි සමණට්ඨිතො'ම්හි,
මමං ච බ්‍රෑසි ඨිතමට්ඨිතොති'
(=ශ්‍රමණය: තෝ යන්නේම 'මම සිටියේ වෙමි' යි කීයෙහිය: සිටි මට 'නොසිටියේ වෙහි' යි කීයෙහි.) (අඞ්ගුලිමාලථෙරගාථා)

d. 'සත්‍ථා තතොපි ජීවකම්බවනං ගන්තුකාමො 'තත්ථ මං නෙථා' ති ආහ.' (ජීවකපඤ්හවත්ථු ධ. අ.)

E. 'භික්ඛු සත්‍ථාරං පුච්ඡිංසු: 'කද පන ථෙරෙන පත්ථනා ඨපිතාති.' (ධ. අ. 295)

2. නාමවිශෙෂණයකගේ ස්වභාවයෙන් යුක්තව අන්‍ය නාමයක් වෙසෙසන ආකාරයෙන් සිටින්නේ නාම විශෙෂණාන්තර් වාක්‍යය යි. (එය කර්තෘ හෝ කර්මය හෝ වෙසෙසන්නක් විය හැක.)

124. කර්තෘ වෙසෙසන අන්තර්වාක්‍ය:-
B. 'සුඛං සුපන්ති මුනයො යෙ ඉත්ථීසු න බජ්ඣරෙ.' (ගොථමත්‍ථෙරගාථා)

මෙහි 'යෙ ඉත්ථීසු න බජ්ඣරෙ' යන උපාන්තර්වාක්‍යය ප්‍රධානාන්තර්වාක්‍යයේ කර්තෘ වූ 'මුනයො' යන්න වෙසෙසයි. යම් කෙනෙක් ස්ත්‍රීන් කෙරෙහි නොබැඳෙත් ද, ඒ මුනිහු සැපසේ නිදත්.

B. 'යං නිස්සිතා ජගතිරුහං විහඞ්ගමා
ස්වායං අග්ගිං පමුඤ්චති.' (සකුණජාතක)

C. යස්ස සබ්‍රහ්මචාරීසු ගාරවො නූපලබ්භති
ආරකා හොති සද්ධම්මා නභසො පඨවි යථා'
(මහාකස්සපත්‍ථෙරගාථා)

මේ දෙකෙහි කළු අකුරෙන් දැක්වූ අන්තර්වාක්‍යද්වයත් කර්තෘට විශෙෂණ වශයෙන් සිටී.

125. කර්මය වෙසෙසන අන්තර්වාක්‍ය:-
A. යො මෙ ඤාණං පකිත්තෙසි
පසන්නො සෙන චෙතසා

තමහං කිත්තයිස්සාමි
සුණොථ මම භාසතො (ඤාණත්‍ථවිකථෙරාපදාන)

කළු අකුරෙන් අංකිත වාක්‍යය 'තං' යන කර්මය වෙසෙසයි.

B. 'අසන්තං යො පගණ්හාති: අසන්ත මුපසෙවති
තමෙව ඝාසං කුරුතෙ ව්‍යග්ඝො සඤ්ජීවිකං යථා' (සඤ්ජීවජාතක)

මෙහි 'තං' යන කර්මය වෙසෙසන අනතර්වාක්‍ය දෙකකි. ප්‍රධාන කර්තෘපදය අන්තර්ලීනයි. '(සො) තං එව සාසං කුරුතෙ' යන්න ප්‍රධාන වාක්‍යයයි.

126. ක්‍රියාවිශෙෂණාන්තර්වාක්‍ය

3.ක්‍රියාවිශේෂණයකගේ ස්වභාවයෙන් යුක්තව ස්ථාන-කාල-ආකාර-උපමාන-හේතු ආදිය ප්‍රකාශ කරන්නේ ක්‍රියා විශෙෂණාන්තර් වාක්‍යය ය.

'යත්ථෙකො ලභතෙ බබ්බු දුතියො තත්ථ ජායති' (බබ්බු ජාතක 137) ස්ථානය ප්‍රකාශ කෙරේ.

B. යදා බලාකා සුචිපණ්ඩරච්ඡදා
කාලස්ස මෙඝස්ස භයෙන තජ්ජිතා
පලෙහිති ආලයමාලයෙසිනී
තදා නදී අජකරණී රමෙති මං.'
(සප්පකථෙරගාථා) කාලාර්ථයෙහි වේ.

C. යෙන යෙන සුභික්ඛානි සිවානි අභයානි ච
තෙන පුත්තක ගච්ඡස්සු: මා සොකොපහතො භව'
(කස්සපථෙරගාථා) ස්ථානප්‍රකාශකයි

D. 'යථා මෙ ධනච්ඡෙදො න හොති තථා කරිස්සාමීති'
(ධ. අ. මට්ටකුණ්ඩලීවත්ථු) ආකාරාර්ථයෙහි වේ.

E. 'සචෙ යුජ්ඣිතුකාමොසි ජයං සම්ම දදාමි තෙ'
(සූකර ජාතක) පරිකල්පාර්ථයෙහි

F. 'යාව සො මත්තමඤ්ඤාසි භොජනස්මිං විහඞ්ගමො.
තාව අද්ධානමාපාදි මාතරං ච අපොසයි'
(සුකජාතක) කාලාර්ථයෙහි යි.

G. සරෙ හත්ථෙහි භඤ්ජිත්වා කත්වාන කුටිමච්ඡිසං:
තෙන මෙ සරභංගොති නාමං සම්මුතියා අහු.'
(සරභඞ්ගථෙරගාථා) හෙතුවර්ථයෙහියි

H. 'එයාසි භනෙත පුරා'හං හඤ්ඤුම්' (පාරාජිකපාළි)
'මා නැසෙන්ට මත්තෙන් එනු මැනව, ස්වාමිනි,' යන අර්ථ ඇත්තේයි. 'යාව අහං න හඤ්ඤුම් තාව ත්‍වං එයාසීති අත්‍ථො'යි ඒ පාඨය අටුවාවෙහි ව්‍යාඛ්‍යාතයි. මේ 'පුරාහං හඤ්ඤුම්' යන අන්තර්වාක්‍යය කාලාර්ථයෙහි යි.

1. 'සො ඉමං ලොකං පභාසෙති අබ්භා මුත්තොව චන්දිමා' (අංගුලිමාලත්‍ථෙරගාථා) උපමානයෙහි වේ.

127. යට දැක්වුණු නිදර්ශනවලින්-
(1) නාමාන්තවාක්‍යයක් 'ඉති' ශබ්දයෙන්ද,
(2) නාමවිශෙෂණාන්තවාක්‍යයක් 'ය' ශබ්දයෙන් ද උප ලක්ෂිත බව ප්‍රකට විය.

(3) ක්‍රියා විශෙෂණාන්තවාක්‍යයෝ වනාහි:

| | |
|---|---|
| A. යථා, (ථා:එවං) | B. යද, (තද) |
| C. යත්‍ථ, (තත්‍ථ.) | D. යතො, (තතො) |
| E. යෙන: (තෙන) | F. ඉව, විය |
| G. චෙ, සචෙ, යදි | H. යාව, (තාව) |
| L. යාවතා, (තාවතා) | J. යද-අථ |

K. සෙය්‍යථාපි (එවමෙව)

1 යනාදියෙන් උපලක්ෂිත වෙතියි දතයුතු.

## උදහරණ xxii

මේ වාක්‍යයන්හි අන්තර්වාක්‍යයන්ගේ නම් දැක්විය යුතු:

1. A. 'කීදිසො නිරයො ආසි යත්‍ථ දූසි අපච්චථ?'
B. 'යො වෙජයන්තපාසාදං පාදං ගුට්ඨෙන කම්පයි.
තාදිසං භික්ඛු මාසජ්ජ කණ්හ දුක්ඛං නිගච්ඡසි
(මහාමොග්ගල්ලානත්‍ථෙරගාථා)

2. 'එවමෙතං මහාවීර යථා සමණ භාසසි
එත්‍ථ චේ'කෙ නිසීදන්ති පඩිකම්භි'ච ජරග්ගවො' (එම ථෙරගාථා)

3. 'යද තෙ විවදිසසන්ති තද එහින්ති මෙ වසං' (සම්මොදමානජාතක)

4. 'නො චෙ ලභෙථ නිපකං සහායං
සද්ධිං චරං සාධුවිහාරි ධීරං
රාජාව රට්ඨං විජිතං පහාය
එකො චරෙ මාතඞ්ග රඤ්ඤෙව නාගො' (ධ. අ. කොසම්බකවත්ථු)

5. 'යතො ච ඛො බහුතරං භොජනං අජ්ඣුපාහරි,
තතො තත්ථෙව සංසීදි, අමත්තඤ්ඤූ හි සො අහු.' (සුකජාතක)

6. 'යථා සාරදිකං බීජං ඛෙත්තෙ වුත්තං විරූහති
එවං රූහතු තෙ නාසා; පදුමං දෙහි යාචිතො' (පදුම ජාතකය 261)

7. 'පුරා ආගච්ඡතෙ එතං අනාගතං මහබ්භයං;
සුබ්බචා හොථ සඛිලා අඤ්ඤමඤ්ඤං සගාරවා' (ථුස්සථෙරගාථා)

8. 'මඤ්ඤෙ සොවණ්ණයො රාසි සොණ්ණමාලා ච නන්දකො
යත්ථ දසො ආමජාතො ඨිතො ථුල්ලානි ගජ්ජති.' (නන්දජාතක 39)

9. 'සෙය්‍යථාපිනාම සුද්ධං වත්ථං අපගතකාළකං සම්මදෙව රජනං පටිග්ගණ්හෙය්‍ය, එවමෙව තෙසං චතුරාසීතිපාණසහස්සානං තස්මිං යෙව ආසනෙ විරජං වීතමලං ධම්මචක්ඛුං උදපාදි.' (මහාපදානසුත්ත)

10. 'ආගමෙන්තු තාව භවන්තො චොරඝාතකා.... ය්වාහං තෙසං උද්දස්සෙත්වා ආගච්ඡාමි.' (පායාසිරාජඤ්ඤසුත්ත)

## 128. සංහත වාක්‍ය

(1) 'ථෙරො මූලසිරිං පක්කොසාපෙසි, අථ මහජනකායො සන්නිපති.' (ධ. අ. ආනන්දසෙට්ඨිවත්ථු) මෙය අමිශ්‍ර වාක්‍යවයකින් යුක්තයි. මේ දෙක වෙන්ව සිට සම්පූර්ණාර්ථයන් ප්‍රකාශ කිරීමට සමර්ථ බැවින් එකක් අනිකට යටත් පැවතුම් ඇත්තේ නොවේ. නමුත් 'අථ' යන්නෙන් මේ දෙකේ සම්බන්ධයක් ඇත්තේ යයි දැක් වේ.

(2) 'අම්හෙ පන තිංසමත්තා ජනා පාණං න හනාම, අදින්නං නාදියාම, මිච්ඡා න චරාම. මුසාවාදං න කථෙම, මජ්ජං න පිවාම,

මෙත්තං භාවෙම, දනං දෙම, මග්ගං සමං කරොම, පොක්ඛරණියො ඛණාම, සාලං කරොම' (කුලාවක ජාතක) මෙහි අමිශ්‍ර වාක්‍ය දශයක් විද්‍යමානයි. 'අමෙහ' යන්න සියලු වාක්‍යයන්හි කර්තෘ මෙන් යෙදේ.

(3) භවං හි ආනන්‍දෙ තස්ස භොතො ගොතමස්ස දීඝ රත්තං උපට්ඨාකො සන්තිකාවචරො සමීපචාරී; භවමෙතං ආනන්‍දෙ ජානෙය්‍ය යෙසං සො භවං ගොතමො ධම්මානං වණ්ණවාදී අහොසි. යත්ථ ච ඉමං ජනතං සමාදපෙසි, නිවාසෙසි, පතිට්ඨාපේසි.' (සුභ සුත්ත. දීඝ) මිශ්‍රාමිශ්‍ර වාක්‍යද්වයකි.

(4) 'සචස්ස ගෙහද්වාරං ගමිස්සාමි, ඉමස්ස භරියා මං දට්ඨුං න සක්ඛිස්සති; යාවස්ස භත්තං ආදය මග්ගං පටිපජ්ජති, තාව ඉධෙව භවිස්සාමි (ධ. ආ. උත්තරාවත්ථු) මිශ්‍රවාක්‍යද්වයකි.

## වාක්‍ය විච්ඡේදය

වාක්‍යයන්හි කර්තෘ-කර්මාදියට අයත් ඒ ඒ කොටස් වෙන්කොට බැලීමෙන් යථාභූතාර්ථය වටහා ගැන්ම පහසු වේ.

129. යට දැක්වූ ත්‍රිවිධ ප්‍රභෙද ඇති සියලු වාක්‍යයන්ම ප්‍රථමයෙන් (1) උක්තාධීනය (2) ආඛ්‍යාතාධීනය යන දෙකොටසකට බෙදිය යුතු වේ.

(1) උක්ත කර්තෘට හෝ උක්ත කර්මයට අයත් කොටස උක්තාධීනයයි.

(2) ක්‍රියාවට අයත් කොටස ආඛ්‍යාතාධීනයයි. (කර්මය ද මෙහිම අන්තර්ගත වේ)

අමිශ්‍ර වාක්‍යයන්ට උදහරණ වශයෙන් දැක්වූ (4) වෙනි වාක්‍යය මෙසේ විච්ඡේද කටයුතු වේ.

(1) උක්තාධීනය:

පාතුභූතසත්තරතනො රාජා කාළිඞ්ගො චක්කවත්ති සබ්බාලඞ්කාරපතිමණ්ඩිතො මාලාවිලෙපනධරො.

(2) ආඛ්‍යාතාධීනය:

(i) එකදිවසං (ii) සබ්බසෙතං කෙලාසකූටපටිභාගං ගජරතනමාරුය්හ (iii) මාතාපිතූනනං අස්සමපදං පායාසි

තවත් දුරට විච්ඡේද කිරීමේදී

1. උක්තය — 2. උක්තවිශෙෂණය
3. කර්‍මය — 4. කර්‍මවිශෙෂණය
5. ආඛ්‍යාතය — { 6. ආඛ්‍යාත විස්තාරය / 7. ආඛ්‍යාත පූරණය }

යන කොටස්වලට බෙදිය යුතුය.

යථොක්ත වාක්‍යය ඒ කොටස්වලට බෙදෙන සැටි මෙසේයි:-

| උක්තය | උක්ත විශෙෂණ | කර්‍මය | කර්‍ම විශෙෂණ | ආඛ්‍යාතය | ආඛ්‍යාත විස්තාර |
|---|---|---|---|---|---|
| රාජා | (1) කාලිඞ්ගො (2) චක්කවත්ති (3) පාතුභූත සත්තරතනො (4) සබ්බාලංකාර පතිමණ්ඩිතො (5) මාලාවිලෙපනධරො | අසමපදං | මාතා පිතූනං | | (1) එක දිවසං (2) සබ්බ සෙතං කෙලාසකූට පටිභාගං ගජරතන මාරුය්හ |

ආඛ්‍යාතපූරණයක් මෙහි නැත.

130. මිශ්‍ර වාක්‍යයක් විච්ඡෙදකටයුතු ආකාරය:-

'සා තෙසං කථං සුත්වා 'ඉමෙ නිල්ලජ්ජා මයා සද්ධිං අභිරමිත්වා ඉදනි මං මාරෙතුකාමා' ජානිස්සාමි නෙසං කත්තබ්බයුත්තක'න්ති තෙහි මාරියමානා 'අහං යක්ඛිනී හුත්වා යථා මං එතෙ මාරෙන්ති එවමෙවෙතෙ මාරෙතුං සමත්ථා භවෙය්‍යා'න්ති පත්ථනං අකාසි.' (ධ. අ. සුප්පබුද්ධකුට්ඨි)

| උක්තය | උක්ත විශේෂණ | කර්මය | කර්ම විශේෂණ | ආඛ්‍යාතය | ආඛ්‍යාත විස්තාර | ආඛ්‍යාත පූරණ |
|---|---|---|---|---|---|---|
| 1 සා. | මාරියමානා | පත්‍ථනං | අහං යක්ඛිනී -පෙ- මාරෙතුං සමත්‍ථා භවෙය්‍යන්ති | අකාසි | (1) තෙසං කථං සුත්වා (2) ඉමෙතිල්ලජ්ජා -පෙ-කත්තබ්බයුත්තකන්ති (චින්තෙත්වා) (3) තෙහි | |
| 2 ඉමෙ | තිල්ලජ්ජා | මං | | (හොන්ති) | (1) මයා සද්ධිං අභිරමිත්වා (2) ඉදනි | මාරෙතුකාමා |
| 3 (අහං) | | කත්තබ්බයුත්තකං | නෙසං | ජානිස්සාමි | | |
| 4 අහං | | එතෙ | | භවෙය්‍යං | (1) යක්ඛිනීභූත්වා (2) එවමෙව | මාරෙතුං සමත්ථා |
| 5 එතෙ | | | | මාරෙන්ති | යථා | |

මෙහි 1 වෙනි කොටසින් 'සා තෙසං කථං සුත්වා.......... තෙහි මාරියමානා............... පත්‍ථනං අකාසි' යන ප්‍රධාන වාක්‍යය ද 2 වෙනි කොටසින් 'චිනෙතත්වා' යන අන්තර්ලීන පූර්වක්‍රියාපදයට කර්ම වශයෙන් සිටින 'තිල්ලජ්ජා මයා සද්ධිං අභිරමිත්වා ඉදනි මං මාරෙතුකාමා' යන අන්තර්වාක්‍යයද 3 වෙනි කොටසින් ඒ 'චිනෙතත්වා' යන්නටම කර්ම වශයෙන් සිටින 'ජානිස්සාමි නෙසං කත්තබ්බයුත්තකං' යන අන්තර්වාක්‍යයද 4-5 වෙනි කොටස් දෙකින් 'පත්‍ථනං' යන්නට විශේෂණ වශයෙන් සිටින 'අහං යක්ඛිනී හුත්වා යථා මං එතෙ මාරෙන්ති, එවමෙවෙතෙ මාරෙතුං සමත්‍ථා භවෙය්‍යං' යන අන්තර්වාක්‍යවයද විච්ඡේද කරන ලදී.

# ආඛ්‍යාත විස්තාර

131. ආඛ්‍යාතවිස්තාරය වනාහි ක්‍රියා විශෙෂණයන්ගෙන් පමණක් යුක්ත නොවන බව යට දැක්වූ වාක්‍යවිච්ඡේදයන් බැලීමෙන් වැටහේ. එය සාමාන්‍යයෙන්

(1) කාලප්‍රතිබඬ විස්තාර
(2) ස්ථානප්‍රතිබඬ විස්තාර
(3) ආකාරප්‍රතිබඬ විස්තාර
(4) හෙතුප්‍රතිබඬ විස්තාරයයි

කොටස් හතරකට බෙදිය හැක.

132. කාලප්‍රතිබඬ විස්තාරයට උදාහරණ:-

A. 'න භික්ඛවෙ තථාගතො ඉදානෙව ලොකස්ස අත්ථං චරති, පුබ්බෙපි චරියෙව.' (දුම්මෙධ ජාතක)

B. 'අජාතසත්තු කුමාරො දෙවදත්තස්ස ගයාසීසෙ විහාරං කාරෙත්වා............. දිවසෙ දිවසෙ පඤ්චථාලිපාකසතානි අභිහරි' (මහිලාමුඛ ජාතක)

C. 'පාපොපි පස්සති භද්‍රං යාව පාපං න පච්චති,
යදා ච පච්චති පාපං අථ පාපො පාපානි පස්සති' (ධම්මපද)

D. 'අජ්ජ ඛො ආනන්ද රත්තියා පච්ඡිමෙ යාමෙ කුසිනාරායං උපවත්තනෙ මල්ලානං සාලවනෙ අන්තරෙන යමකසාලානං තථාගතස්ස පරිනිබ්බාණං භවිස්සති.' (මහාපරිනිබ්බාණසුත්ත)

133. කාලාර්ථ සප්තමියද මෙහි අන්තර්ගත වේ.

**'සත්ථරි හි පඨමගමනෙන කපිලපුරං ගන්ත්වා, කණිට්ඨ භාතිකං නන්දකුමාරං පබ්බාජෙත්වා, කපිලපුරා නික්ඛම්ම අනුපුබ්බෙන සාවත්ථිං ගන්ත්වා විහරන්තෙ ආයස්මා නන්දො.....** අනභිරතො උප්පණ්ඩුප්පණ්ඩුක ජාතො ධමනිසන්ථතගත්තො අහොසි' (සඞ්ගාමාවචර ජාතක)

මෙහි කළු අකුරෙන් දැක්වෙන සියල්ල ආඛ්‍යාත විස්තාරයට අයත් වේ. (මෙය අමිශ්‍ර වාක්‍යයකි)

134. පූර්වක්‍රියාවන් අවසාන ක්‍රියාවට පූර්වකාලයක් ප්‍රකාශ කරන බැවින් එයින් යුත් වාක්‍යාංශයෝ ද කාලප්‍රතිබඬ ආඛ්‍යාතවිස්තාරයෙහි ඇතුළත් වෙති.

'එවං මහසත්තො බුද්දකමක්ඛිකාය පීවනමත්තම්පි ලොහිතං අනුප්පාදෙත්වා සත්ත රාජානො පලාපෙත්වා කණිට්ඨභාතරං ඔලොකෙත්වා කාමෙ පහාය, ඉසිපබ්බජ්ජං පබ්බජිත්වා අභිඤ්ඤා ච සමාපත්තියො ච නිබ්බත්තෙත්වා ජීවිතපරියොසානෙ බ්‍රහ්ම ලොකූපගො අහොසි.' (අසදිස ජාතක 181)

135. සථානප්‍රතිබද්ධ ආඛ්‍යාත විස්තාරයට උදහරණ:-

A. 'එකං සමයං භගවා සාවත්ථියං විහරති ජේතවනෙ අනාථ පිණ්ඩිකස්ස ආරාමෙ තත්‍ර ඛො භගවා භික්ඛු ආමන්තෙසි'

B. 'අථ ඛො රාජා මාගධො අජාතසත්තු වෙදෙහිපුත්තො ............. උක්කාසු ධාරියමානසු රාජගහම්හ නියාසි' (සාමඤ්ඤඵලසුත්ත)

C. 'ගාමෙ වා යදි වා රඤ්ඤෙ නින්නෙ වා යදි වා ථලෙ යත්ථාරහන්තො විහරන්ති, තං භූමිං රාමණෙය්‍යකං' (ධම්මපද)

D. 'යද යද යත්ථ යද යත්ථ යත්ථ යද යද
ආජඤ්ඤෙ කුරුතෙ වෙගං හායන්ති තත්ථ වාළවා'

(24. ආජඤ්ඤජාතක)

126. ආකාරප්‍රතිබද්ධ ආඛ්‍යාත විස්තාරයට උදහරණ:-

1. A. 'තං තථාවාදිනිං බුද්ධො මමං සො එතදබ්‍රවිං
නහෙ'වං වන්දියා බුද්ධා යථා වන්දසි ගොතමි.'

B. 'කථං චරහි සබ්බඤ්ඤූ වන්දිතබ්බා තථාගතා?
කථං අවන්දියා බුද්ධා? තං මෙ අක්ඛාහි පුච්ඡිතො'

(මහාපජාපතිගොතමී අපදාන)

2. 'අනුපුබ්බෙන මෙධාවී ථොක-ථොකං ඛණෙ ඛණෙ
කම්මාරො රජතස්සෙ'ව නිද්ධමෙ මලමත්තනො.' (ධම්මපද)

3. 'දනවෙය්‍යාවටිකොපි පණ්ණො ආරොපිතනියාමෙනෙව තෙසං තෙසං ගෙහානි භික්ඛු පහිණි' (පණ්ඩිතසාමණේරවත්ථු)

4. 'සබ්බං තිස්සකුමාරස්ස වත්ථුම්හි වුත්තනයෙනෙව වෙදිතබ්බං' (ධ. අ. පණ්ඩිතසාමණේර)

5. 'සාවත්ථියං කිර එකො උපාසකො ධම්මෙන සමෙන අගාරං අජ්ඣාවසති. (ධ. අ. ධම්මිකත්ථෙර)

6. 'ඉමෙ සත්තා නාම යෙභුය්‍යෙන භවනිස්සිතා භවෙසු එව ලග්ගා විහරන්ති.'

සීඝං, සනිකං, තුවටං, අද්ධා, සාධුකං, ඛණෙන, තුරිතං, ආදී බෙහෝ පද මේ ආකාර ප්‍රතිබද්ධවිස්තාරයෙහි වැටෙත්.

(අ)A කරණයද B සහයෝගයෙහි හා C සහාර්ථයෙහි තතියාව ද, D අනුක්තකර්තෘ ද මෙහිම අන්තර්ගත වේ.

A. (1) 'එකො කුටුම්බිකො එකස්ස ථෙරස්ස විහාරං කත්වා තං තත්ථ විහරන්තං චතූහි පච්චයෙහි උපට්ඨහි' 'සොපි තෙසං ගත භාවං ඤත්වා ...... උභොහි හත්ථෙහි ආලොපෙ කත්වා ගුළං බාදි, (ධ. අ. ජම්බුකාජීවක)

B 'අහං අම්හාකං අය්‍යපුත්තෙන සද්ධිං මහාභිනික්ඛමනං නික්ඛන්තො.' (ධ. උ. ඡන්නත්ථෙර)

C. කොසලරාජා මහන්තෙන බලෙන ආගන්ත්වා බාරාණසිං ගහෙත්වා තං රාජානං මාරෙත්වා තස්සෙව අග්ගමහෙසිං අත්තනො අග්ගමහෙසිං අකාසි.' (අසාතරූප ජාතක)

D. (1) 'මයා හතිං කත්වා සාලි ලද්ධා.' 2. 'අහො ඉමිනා දුක්කරං කතං' (ධ. අ. පණ්ඩිතසාමණෙර)

(3) 'වුත්තං හෙතං භගවතා ජානතා පස්සතා අරහතා සම්මාසම්බුද්ධෙන'

(අ) පදපූරණයෙහි වූ 'හන්ද - බලු-හි' ආදී නිපාතද අවධාරණාර්ථයෙහි 'එව' ආදිය ද නිශ්චයාර්ථයෙහි 'වත, නූනං කාමං' ආදියද විස්මයෙහි හා බෙදයෙහි 'අහො, හා' ආදියද වාක්‍යච්ඡේදයේදී හැරදැමීම් හෝ මේ ආකාර ප්‍රතිබද්ධවිස්තාරයෙහි ඇතුළත්කිරීම හෝ වටනේයි.

137. හෙතුප්‍රතිබද්ධ ආඛ්‍යාතවිස්තාරයට උදාහරණ:-

A. 'අථ තෙ දෙවි පුච්ඡිං: තාත; කිං කාරණා ආගතත්ථාති'

(ධ. අ. මහාකප්පින)

B. 'එව සන්තෙපි 'අහං පුබ්බෙ කිඤ්චි අකතත්තා කිඤ්චි න ලභාමී'ති න ජානාසි? (ධ. අ. පණ්ඩිතසාමණෙර)

C. අත්තනො සාමිකෙ..... දිස්වා චිත්තං එකග්ගං න භවෙය්‍ය, තෙන මග්ගඵලානි පත්තුං න සක්කුණෙය්‍යුං, තස්මා අචලසද්ධාය පතිට්ඨිතකාලෙ තාසං තෙ භික්ඛු........... දස්සෙසි. (ධ. අ. මහාකප්පින)

යම් අභිමතාර්ථයක් සඳහා යමක් කරනු ලැබේ නම් ('පිණිස' 'සඳහා' ආදියෙන් කියවෙන) ඒ අභිමතාර්ථයත් මේ ආඛ්‍යාත විස්තාර යෙහි ඇතුළත් වේ.

A. 'න අත්තහෙතු න පරස්ස හෙතු
න පුත්තමිච්ඡෙ න ධනං න රට්ඨං' (ධම්මපද)

B. න අරහති භවං කූටදන්තො සමණං ගොතමං දස්සනාය උපසඞ්කමිතුං, සමණොත්වෙව ගොතමො අරහති භවන්තං කූටදන්තං දස්සනාය උපසංකමිතුං.' (කූටදන්තසුත්ත දීඝ)

C. 'චරථ භික්ඛවෙ චාරිකං බහුජනහිතාය බහුජනසුඛාය ලොකානුකම්පාය අත්ථාය හිතාය දෙවමනුස්සානං' (මහාවග්ගපාළි)

D. කිමත්ථාය භොන්තො ආගතා? කිං භික්ඛු නිමන්තෙතුං'
(විසුද්ධිමග්ග 20)

E. 'යෙසං අත්ථාය අහං සරාවාසො, වසෙය්‍යං තෙ උභොපි පබ්බජිතා' (ධ. අ. මමාකථෙර)

F. 'අරහං සුගතො ලොකෙ වාතෙනාබාධිකො මුනි
සචේ උණ්හොදකං අත්ථි ...................
.......................... තස්ස ඉච්ඡාමි හාතවෙ' (බ්‍රාහ්මණසංයුත්ත)

(4) 'තුං-තවෙ' ප්‍රත්‍යයාන්තයන්ද ආයප්‍රත්‍යයාන්තයන් ද මෙහි ඇතුළත් වන බව සිත තබා ගත යුතු.

## ආඛ්‍යාතපූරණය

138. භූ-භු-අස ආදී ඇතැම් ධාතූන්ගෙන් නිපන් ක්‍රියාපදයන් සම්පූර්ණාර්ථයක් ප්‍රකාශ නොකරන බැවින් ඔවුන්ගේ අර්ථය පිරවීම සඳහා යෙදෙන පදය හෝ පද ආඛ්‍යාත පූරණයයි කියනු ලැබේ.

'ඉමෙහි ලක්ඛණෙහි සමන්නාගතො නාම අගාරමජ්ඣෙ වසන්තො රාජා හොති චක්කවත්ති, පබ්බජන්තො ලොකෙ විවටච්ඡදෙ සබ්බඤ්ඤු බුද්ධොහොති' යන්න සංහතවාක්‍යයකි, මෙහි 'ඉමෙහි ලක්ඛණෙහි සමන්නාගතො' යන පද සමුදය වාක්‍යද්වයටම කර්තෘ වේ. 'අගාරමජ්ඣෙ වසන්තො' යන්න ප්‍රථම වාක්‍යයෙහි රාජා චක්කවත්ති හොති' යි කී විට ද ද්විතීය වාක්‍යයෙහි 'ලොකෙ විවටච්ඡදො සබ්බඤ්ඤු බුද්ධො' යී කී විට ද ක්‍රියාවගේ අර්ථය සම්පූර්ණ වේ. එබැවින් මෙහි රාජා චක්කවත්ති' 'ලොකෙ විවටච්ඡදෙ සබ්බඤ්ඤු බුද්ධා' යන පද ආඛ්‍යාත පූරණයයි දත යුතු. අන් කිසි කර්තෘ විශෙෂණාදියකට ඒ වචන ඇතුළත් නොකළ හැකි බව පරීක්ෂණයෙන් ප්‍රත්‍යක්ෂ වෙනවා ඇත.

'ගිහිගෙයි වසන්නේ සක්විති රජ වේ' කී තැන් කර්තෘ ගිහිගෙයි වසන්නායි. සක්විති රජ යන්න ඒ කර්තෘට විශෙෂණයක් වීමට හැකි ක්‍රමයක් නැත. එය ක්‍රියා විශෙෂණයක් ද නොවේ. ආඛ්‍යාත විස්තාරයක් ද නොවේ. හුදෙක් අසම්පූර්ණාර්ථවත් ආඛ්‍යාත පාදයාගේ පූරණයකි. හොති, භවති ආදී වූ භූ-භු-ධාතූන්ගෙන් නිපන් ක්‍රියා සැම විටම ආඛ්‍යාතපූරණයක් ගනිතියි සැලකිය යුතු.

139. සංහත වාක්‍යයක් මෙසේ විච්ඡේද කටයුතු:-

'භවං හි ආනන්දො තස්ස භොතො ගොතමස්ස දීඝරත්තං උපට්ඨාකො සන්තිකාවචරො සමීපචාරී, භවමෙතං ආනන්දෙ ජානෙය්‍ය යෙසං සො භවං ගොතමො ධම්මානං වණ්ණවාදී අහොසි, යත්ථ ච ඉමං ජනතං සමාදපෙසි නිවෙසෙසි පතිට්ඨාපෙසි' (සුභසුත්ත)

| සම්බන්ධක පදය (තස්මා) | උක්තාධීනය | | ආඛ්‍යාතාධීනය | | | | |
|---|---|---|---|---|---|---|---|
| අනතර්වාක්‍ය | උක්තය | උක්ත විශෙෂණ | කර්මය | කර්ම විශෙෂණ | ආඛ්‍යාතය | ආඛ්‍යාත විස්තාර | ආඛ්‍යාත පූරණ |
| 1. වාක්‍යය: භවං හී ආනන්දෙ තස්ස භොතො ගොතමස්ස දීඝ රත්තං උපට්ඨාකො සන්තිකාවචරො සමීපචාරී (අහොසි) | භවං ආනන්දෙ | | | | (අහොසි) | දීඝරත්තං | තස්ස භොතොගොතමස්ස උපට්ඨා කො සන්තිකාවච රො සමීපචාරී |
| 2. වාක්‍යය: භවමෙතං ආනන්දෙ ජානෙය්‍ය යෙසං සො භවං ගොතමො ධම්මානං වණ්ණවාදී අහොසි -පෙ-පතිට්ඨාපෙසි. | භවං ආනන්දෙ | | එතං | යෙසං සො-පෙ-පතිට්ඨාපෙසි' | ජානෙය්‍ය | | |
| 1. උපාන්තර්වාක්‍යය: යෙසං සො භවං ගොතමො ධම්මානං වණ්ණවාදී අහොසි | (භවං ගොතමො) | සො | | | (අහොසි) | | යෙසං ධම්මානං වණ්ණවාදී |
| 2. උපාන්තර්වාක්‍ය: යත්ථ ච ඉමං ජනතං සමාදපෙසි | (භවං ගොතමො) | | ජනතං | ඉමං | සමාදපෙසි | යත්ථ | |
| 3. උපාන්තර්වාක්‍ය: යත්ථ ඉමං ජනතං නිවෙසෙසි | (භවං ගොතමො) | | (ජනතං) | (ඉමං) | නිවෙසෙසි | (යත්ථ) | |
| 4. උපාන්තර්වාක්‍ය: යත්ථ ඉමං ජනතං පතිට්ඨාපෙසි | (භවං ගොතමො) | | (ජනතං) | (ඉමං) | පතිට්ඨාපෙසි | (යත්ථ) | |

දීර්ඝ මිශ්‍ර වාක්‍යයක්:-

'අථස්ස භරියා අන්ධබාලා එවරූපෙ පාටිහාරියෙ පසාදං අජනෙත්වා තං අක්කොසිත්වා පරිභාසිත්වා 'රාජානො නාම චණ්ඩා, සකිං කුද්ධා හත්ථපාදදිච්ඡේදනෙන බහුම්පි අනත්ථං කරොන්තී'ති පුත්තෙ ආදය රාජකුලං ගන්ත්වා රඤ්ඤපක්කොසිත්වා කිං එතන්ති පුච්ඡිතා ආහ: අයං මම සාමිකො තුම්හාකං උපට්ඨානපුප්ඵෙහි සත්ථාරං පූජෙත්වා තුච්ඡහත්ථො ඝරං ආගන්ත්වා කහං පුප්ඵානීති පුට්ඨො ඉදං නාම වදෙසි, මයා තස්ස ඡඩ්ඩිතභාවං ජානාහි' (සුමනමාලාකාරවත්ථු)

| උක්තාධීනය | | | | ආඛ්‍යාතාධීනය | | | | |
|---|---|---|---|---|---|---|---|---|
| | | උක්තය | උක්ත විශෙෂණ | කර්මය | කර්ම විශේ: | ආඛ්‍යාතය | ආඛ්‍යාත විස්තාර | ආඛ්‍යාත පූරණ |
| | ප්‍රධාන වාක්‍යය: අථස්ස-පෙ-ඡඩ්ඩිත භාවං ජානාහි | භරියා | (1) අස්ස (2)අන්ධබාලා (3)රඤ්ඤ ප-ක්කොසිත්වා කිං එතන්ති පුච්ඡිතා | අයං මම සාමිකො - පෙ-මයා තස්ස ඡඩ්ඩිත භාවං ජානාහි | | ආහ | (1) අථ (2)එවරූපෙ පාටිහාරියෙ පසාදං අජනෙත්වා (3) තං අක්කොසිත්වා (4) පරිභාසිත්වා (5) රාජානො නාම-පෙ-කරොන්තීති (වත්වා) (6) පුත්තෙ ආදය රාජකුලං ගන්ත්වා | |
| අනුවාක්‍ය | 1. රාජානො නාම චණ්ඩා සකිං කුද්ධා හත්ථපාදදිච්ඡේද නෙන බහුම්පි අනත්ථං කරොන්ති | රාජානො | (1) චණ්ඩා (2) සකිං කුද්ධා | අනත්ථං | බහුං | කරොන්ති | හත්ථපාදදිච්ඡේදනෙන | |
| | 2. අයං මම සාමිකො තුම්හාකං උපට්ඨානපුප්ඵෙහි සත්ථාරං පූජෙත්වා පෙ-ඉදං නාම වදෙසි | සාමිකො | (1) අයං (2) මම (3)කහං පුප්ඵානීති පුට්ඨො | ඉදං | | වදෙසි | (1)තුම්හාකං උපට්ඨාන පුප්ඵෙහි සත්ථාරං පූජෙත්වා තුච්ඡ හත්ථො ඝරං ආගන්ත්වා | |
| | 3. මයං තස්ස ඡඩ්ඩිතභාවං ජානාහි | (ත්වං) | | මයා තස්ස ඡඩ්ඩිතභාවං | | ජානාහි | | |

## උදහරණ xxiii

මෙහි පෙනෙන වාක්‍යයන් යට දැක්වූ පිළිවෙළින් විච්ඡේද කටයුතු.

1. 'පුණ්ණො ථෙරං දිස්වා කසිං ඨපෙත්වා පඤ්චපතිට්ඨිතෙන ථෙරං වන්දිත්වා දන්තකට්ඨං කප්පියං කත්වා අදසි.' (ධ. අ. උත්තරාවත්ථු)

2. 'අප්පකා තෙ මනුස්සෙසු යෙ ජනා පාරගාමිනො
අථායං ඉතරා පජා තීරමෙවානුධාවති.' (ධම්මපද)

3. අනුද්ධතො අචපලො නිපකො සංවුතින්ද්‍රියො
සොභති පංසුකූලෙන සීහොව ගිරිගබ්භරෙ' (මහාකස්සපථෙරගාථා)

4. 'යො ච කොචි මනුස්සෙසු පරපාණානි හිංසති
අස්මා ලොකා පරම්හා ච උභයා ධංසතෙ නරො'
(වාරණත්ථෙරගාථා)

5. සා වෙජ්ජේනාගන්ත්වා කීදිසං භද්දෙ'ති පුට්ඨා 'පුබ්බෙ මෙ අක්ඛීනි ථොකං රුජිංසු, ඉදානි අතිරෙකතරං රුජන්ති' තී ආහ.'
(ධ. අ. චක්ඛුපාල)

6. 'යාවජීවම්පි චෙ බාලො පණ්ඩිතං පයිරුපාසති
න සො ධම්මං විජානාති දබ්බී සූපරසං යථා.' (ධම්මපද)

7. 'අථ නං පිණ්ඩාය චරිත්වා ජීවතුං සමත්ථකාලෙ කපාලං හත්ථෙ ඨපෙත්වා 'තාත, මයං තං නිස්සාය මහාදුක්ඛං පත්තා, ඉදානි න සක්කොම තං පොසෙතුං, ඉමස්මිං නගරෙ කපණද්ධිකාදීනං පටියත්තාභත්තානි අත්ථි; භික්ඛාය චරිත්වා ජීවාහී'ති තං විස්සජ්ජෙසි' (ධ. අ. ආනන්දසෙට්ඨි)

8. සත්ථා මූලසිරිං ආමන්තෙත්වා 'ජානාසි එත'න්ති පුච්ඡිත්වා න ජානිමී'ති වුත්තෙ 'පිතා, තෙ ආනන්දසෙට්ඨී'ති වත්වා අසද්දහන්තං 'ආනන්දසෙට්ඨි, පුත්තස්ස තෙ පඤ්චමහානිධිං ආචික්ඛාහි' ති ආචික්ඛා පෙත්වා සද්දහාපෙසි. සො සත්ථාරං සරණං අගමාසි.' (ධ. අ. ආනන්දසෙට්ඨි)

9. 'සෙලො යථා එකඝනො වාතෙන න සමීරති
එවං නින්දපසංසාසු න සමිඤ්ජන්ති පණ්ඩිතා' (ධම්මපද)

10. 'තස්මිං සමයෙ බාරාණසීවාසිනො දෙවතා මඞ්ගලිකා හොන්ති, දෙවතා නමස්සන්ති; බහූ අජෙළකකුක්කුටසූකරාදයො වධිත්වා නානප්පකාරෙහි පුප්ඵගන්ධෙහි චෙව මංසලොහිතෙහිච බලි කම්මං කරොන්ති.' (දුම්මෙධ ජාතක 50)

## සත්වෙනි පරිච්ඡේදය

# නිපාතාර්ථ විභාගය

නිපාතයෝ නම් කවරහුදැයි පළමු පොතේ 29 වෙනි අංකයෙහි දක්වන ලදී. මොවුහු අව්‍යය නාමයෙන් ද හැඳින්වෙත්. (නිපාත-උපසර්ග දෙකොටසටම අව්‍යය නාමය ලැබේ. උපසර්ගයන් ගැන දත යුතු දේ දෙවැනි පොතේ 104 පිටේ 105 වෙනි අංකයෙහි කියන ලදී.)

නිපාතයෝ සිද්ධ-අසිද්ධ වශයෙන් ද්විවිධ වෙති. A. සිද්ධ නිපාතයෝ නම් නාම නාම - සර්වනාම-ගුණනාම-සංඛ්‍යානාමයන් කෙරෙන් වරනැගිය නොහැකි ප්‍රත්‍යයන් යෙදීමෙන් සිද්ධ වූ පද ද ධාතුන් කෙරෙන් තුං-තවෙ-ත්වා ත්වාන- තුන ය යන අව්‍යය ප්‍රත්‍යයන් යෙදීමෙන් සෑදෙන පද ද වෙති:-

(1) නාමයන්ගෙන් සිද්ධ නිපාතඃ-
අත්ථසො, ගෙහතො, හෙතුසො, මුඛතො

(2) සර්වනාමයන්ගෙන් :-
යද, තද, යෙන, කත්ථ, කද, කුතො, සබ්බද

(3) ගුණ නාමයන්ගෙන් :-
ලහුසො, දීඝතො, පුථුලතො

(4) සංඛ්‍යානාමයන්ගෙන්:-
ද්විධා, තිධා, චතුක්ඛත්තුං, පඤ්ච-පඤ්චසො

(5) ධාතුන්ගෙන්:-
කාතුං, දතවෙ, ගන්ත්වා, පත්වාන, කාතුන, ආදය

B. අසිද්ධ හෙවත් ශුද්ධ නිපාතයෝ නම්: කිර, බලු, ඛො, තු, හි, මා, ච, වා, තනු ආදීහු යි.

A. සිද්ධනිපාතයන් ගැන විස්තර දෙවෙනි පොතේ අව්‍යය තද්ධිත කොටසෙන් දත හැක.

නිපාතයන්ට විභක්ති අනුව වරනැගීමක් නැතත් ඇතැම් නිපාතයෝ ඇතැම් විභක්තීන්ගේ අර්ථයන්හි පමණක් වෙති:-

(1) සක්කා, ලබ්භා, සයං, සාම, නාමො යන මොහු ප්‍රථමාර්ථයෙහි වෙති.

(2) අභිණ්හං, මුහුං, සකිං, චිරං, ඔරං, ආදීහු ද්විතියාර්ථයෙහි වෙති.

(3) සයං, සාමං, සම්මා, මිච්ඡා, සාහසා ආදීහු තෘතීයාර්ථයෙහි වෙති.

(4) උද්ධං, අධො, තිරියං, හෙට්ඨා, උපරි ආදීහු සප්තම්‍යර්ථයෙහි වෙති.

(5) ආරා, ආරකා, යාව, තාව, ආදීහු පඤ්චම්‍යර්ථයෙහි වෙති.

(6) හො, හෙ, අරෙ, හණෙ, ජෙ, ආවුසෝ ආදීහු ආලපනයෙහි වෙති.

(මත්තෙහි අකාරාදී පිළිවෙලින් නිපාතාර්ථයන් දක්වන විට මෙකී නිපාතයන්ගේ අර්ථ ද ප්‍රකට වෙනවා ඇත.)

1. අ, ප්‍රතිසෙධාර්ථයෙහි වේ. අකුසල, අමනුස්ස, අභාව ආදී නොයෙක් පදයන්හි පෙනෙන අ-කාරය වනාහි න-නිපාතයට සිදුවූ ආදේශයකි. ව්‍යඤ්ජනයකින් ආරම්භවන ශබ්දයකට මුලින් සිටි විට න-යන්නට අ-ආදේශ ද ස්වරයකින් ආරම්භවන ශබ්දයකට මුලින් සිටි විට අන්-ආදේශ ද වේ. (අනාමය, අනස්‍ස, ආදිය දෙවැන්නට උදහරණයි)

2. අචිරං වැඩි කලක් යන්ට පෙර.

'අචිරං වත'යං කායො පඨවිං අධිසෙස්‍සති.' = වැඩි කලක් යන්නට පෙර මේ සිරුර පොළොවෙහි හෝනේය. (ධම්මපද 41)

3. අජ්ජ, අද: දැන් මෙකල

'අත්ථි මෙ අජ්ජ භෙසජ්ජමත්තා පීතා' = මා විසින් අද බෙහෙත් ප්‍රමාණයක් බොන ලදී. (දීඝ සුභසුත්ත)

4. අජ්ජතග්ගෙ, අද පටන්. (මෙය අජ්ජතො+අග්ගෙ යන දෙපදයෙන් සිද්ධ වූවා විය හැක)

'උපාසකං මං භගවා ධාරෙතු අජ්ජතග්ගෙ පාණුපෙතං සරණංගතං' =මා අද පටන් ජීවිතාන්තය දක්වා සරණ ගියකු සේ භාග්‍යවතුන් වහන්සේ පිළිගන්නා සේක්වා. (දීඝ.ස85)

5. අජ්ජුණ්හො, අද දවස, අද රැය

'සචෙ තෙ කස්‍සප අගරු

විහරෙමු අජ්ජුණ්හො අග්ගිසාලම්හි' - කාශ්‍යපයෙනි, ඉදින් ඔබට බරක් නොවේ නම් අද රැය මේ ගිනිහලෙහි වසන්නෙමු. (විනයමහාවග්ග)

6. අඤ්ඤදත්ථු, ඒකාන්තයෙන්: අනික් අතට.

A. අඤ්ඤදත්ථු සිස්‍සං මූසිලං, ආචරිය, ත්වමෙව ජෙස්‍සසි.' - ආචාර්යයෙනි ඔබ ඒකාන්තයෙන් ශිෂ්‍ය වූ මූසිලයා පරදවන්නාහ. (ගුත්තිලවිමානවත්ථු)

B. 'ආයස්මා රට්ඨපාලො සකපිතු නිවෙසනෙ නෙව දනං අලත්ථ, න පච්චක්ඛානං අඤ්ඤදත්ථු අක්කොසනමෙව අලත්ථ.' = ආයුෂ්මත් රට්ඨපාලතෙමේ සිය පියාණන්ගේ ගෙහිදි දනක් හෝ ප්‍රතික්ෂේපයක් නොලද්දේය; (අනික් අතට) ආක්‍රෝෂයක්ම ලැබුවේය. (ආක්‍රෝෂයක් මිස දනක් නොලැබුවේය යන අදහසයි) (මජ්ඣිම රට්ඨපාල සු.)

'තෙ............. කු'තස්ස වාදං ආරොපෙස්සන්ති? අඤ්ඤදත්ථු සමණස්සෙ'ව ගොතමස්ස සාවකා සම්පජ්ජන්ති.' = ඔවුහු කොයින් ශ්‍රමණ ගෞතමයන්ට වාදයක් නගත් ද? අනික් අතට ඔවුහු උන්වහන්සේගේම ශ්‍රාවක බවට පැමිණෙති. (චූල්ලහත්ථිපදොපම ම.)

7. අතිප්පගෙව, ඉතා උදෑසනම

'කින්නු බො මහාරාජ අතිප්පගෙව ආගතොසි.' (මහාසුපිනජාතක)

8. අතිප්පගො, ඉතා උදෑසන

'අථ බො භගවතො එතදහොසි; අතිප්පගො බො තාව අනුපියාය පිණ්ඩාය චරිතුං' =ඉක්බිති භාග්‍යවතුන් වහන්සේට මේ සිත පහළ විය. අනුපිය නුවර පිඩු පිණිස හැසිරීමටතවම කල් වැඩිය. (දීඝ iii. 1.)

9. අතිවිය, අතිශයෙන්; ඉතාමත්

'පඤ්චන්නං මාණවකසතානං අනන්තරෙ අතිවිය ආචරියස්ස උපකාරකො අහොසි.' (ධ. අ. ෂ. 250)

10. අතීව, අතිශයෙන්;

'අතීව පරිහීනගත්තො'ස්මිං; රත්තන්ධකාරෙ, ගමිස්සාමිති.' = ඉතා පිරිහුණු (=කෙට්ටු වූ) සිරුරු ඇත්තේ වෙමි. එබැවින් රෑ අඳුරෙහි යන්නෙමි යි. (රසවාහිනි)

11. අත්ථි යන්න අස-ධාතුවගේ ප්‍රථම පුරුෂ-එකවචන යි. එහි බහුවචනය සන්ති යන්නයි. නමුත් අත්ථි-යන්න ඇතැම් තැනක බහුවචනයෙහිත් යෙදී තිබේ. එවැනි තැන්හි එය නිපාතයක් සේ ගණන්ගත යුතු යයි ඇතැම් ආචාර්යවරයෝ කියත්.

A. 'කිම්පන වො මනුස්සා සබ්බෙ'ව කුක්කුරෙ මාරෙන්ති, උදහු මරණං අලභන්තා පි අත්ථීති?' (කුක්කුර ජාතක)

B. 'ඉතිපි නත්ථි පරො ලොකො නත්ථි සත්තා ඔපපාතිකා.' (දීඝ, පායාසිසුත්ත)

12. අථ, ඉක්බිති: එවිට: පසුව: නොහොත්,
A "අථ පාපානි කම්මානි කරං බාලො න බුජ්ඣති."
(ධම්මපද ගා. 136)

පව්වුකම් කරන අඥාන තෙමේ එය කරන කල්හි (ඒවායේ විපාක ගැන) අවබෝධ නොකෙරේ.

B. අථ බො දෙවදත්තො උපොසථදිවසෙ අත්තනො පරිසාය සද්ධිං එකමන්තං නිසීදිත්වා" (ධ. අ. j 142)

13. අථො, තවද: නැවත: එවිට
"හත්ථෙ පි ඡින්දන්ති අථො පි පාදෙ"

කණ්ණෙපි ඡින්දන්ති අථොපිනාසං (රෙවතිවිමානවත්ථු)

14. අථවා, හෝ: නොහොත්
"යො බුද්ධං පරිභාසති, අථ වා, තස්ස සාවකං"
(සුත්තනිපාතගා 134)

15. අද්ධා, ඒකාන්තයෙන්.
අද්ධා තථං බුද්ධො ච තිරියං දිසාස්වනුදියාස්වහං
අන්වෙසං නාධිගච්ඡාමි: ගොධිකො සො කුහිං ගතො."
(සංයුත්ත: i 122)

16. අධො, යට: පහත
"උද්ධං අධො ච තිරියං දිසාස්වනුදියාස්වහං
අන්වෙසං නාධිගච්ඡාමි: ගොධිකො සො කුහිං ගතො."
(සංයුක්ත i 122)

17. අන්තරා, අතරෙහි: මධ්‍යයෙහි: අතරතුරේදි.
"අථ පල්ලංකස්ස ච ඨිතට්ඨානස්ස ච අන්තරා.... චංකමන්තො සත්තාහං වීතිනාමෙසි" (ජාතක නිදාන)
සමාසයේදී මෙය විශෙෂණයක් සේ සිටියි.-
A. අන්තරා කතා, අතරතුරේ කථාව
B. අන්තරාමග්ගෙ, අතරමගදී.
C. අන්තරාමරණං, අකාලමරණය

18. අන්තරෙන අතරෙන්: අතරෙහි: මධ්‍යයෙහි

A. අන්තරෙන යමකසාලානං උත්තරසීසකං මඤ්චං පඤ්ඤාපෙහි'.
(දී. මහාපරිනිබ්බාණ)

B. 'තතො ත්වං මාලුඞ්ක්‍යපුත්ත, නෙවි'ධ, න හුරං,න උභය මන්තරෙන' - 'මාලුංක පුත්‍රය, එවිට ඔබ මෙහිත් නැත මින් පිට තැනකත් නැත, ඒ දෙක අතරෙහිත් නැත.' (සං.ග iv 73)

19. අන්තො, ඇතුළෙහි (සමාසයේදී 'ඇතුල්' යන අර්ථය දේ.)

A. 'එවං පාසාදස්ස අන්තො ච බහි ච ගාළ්හාරක්ඛා අහොසි'
(ධ.අ.iv 209 ජොතිය)

20. අපරජ්ජු, පසුදා

'තෙන ඛො පන සමයෙන ආයස්මා නිග්‍රොධකප්පො පච්ඡා භත්තං පිණ්ඩපාතපටික්කන්තො විහාරං පවිසති, සායං වා නික්ඛමති, අපරජ්ජු වා කාලෙ.' -එකල්හි ආයුෂ්මත් නිග්‍රොධ කල්ප තෙමේ පිණ්ඩපාතයෙන් ඉවත්වූයේ පසුබත් කාලයෙහි (තමා වසන) ආවාසයට ඇතුල් වී හවස හෝ පසුදා උදෑසනකාලයෙහි හෝ පිටතට එයි. (සං. i. 186)

21. අපි, දෑ තවද: පවා: නම් : නමුත්:

A. 'සා' පි තක්කසිලාමග්ගං පටිපජ්ජි: සහායකො' පි'ස්සා ඉතො චි' තො ච විචරිත්වා' පි නාද්දස' (ධ.අ. සොරෙය්‍යවත්ථු)

B. පවා: අපි දිබ්බෙසු කාමෙසු
රතිං සො නාධිගච්ඡති' (ධම්මපද ගා. 187)

C. 'අපාහං මරිස්සාමි, නාහං සක්කොමි එකෙන පස්සෙන සත්තමාසෙ සයිතුං.' - මම මැරෙන්නෙමි නමුත් (= මා මැරුණත්) එක් ඇලයකින් සත් මසක් නිදන්ට නොහැක්කෙමි. (විනය මහා වග්ග)

ප්‍රශ්න කිරීමෙහි:-

D. 'අපි සමණ, බලිවද්දෙ අද්දස?' - ශ්‍රමණය, ගොනුන් දුටුවෙහි ද?' (මාරසංයුත්ත)

E. 'අපි සමණ, පිණ්ඩමලත්ථ? - 'ශ්‍රමණය, ආහාර ලැබුවෙහි ද?
(මාරසං)

F. නමුත්: අපි, උදයි, ආනන්දො දිට්ඨෙව ධම්මෙ පරිනිබ්බායිස්සති.' - නමුත් උදයි, ආනන්දතෙමේ මේ ආත්මයේදීම පිරිනිවෙන්නේය.' (අං i. 228)

22. අපිස්සු, තවද

'අපිස්සු භික්ඛවෙ විපස්සි භගවන්තං ඉමා අනච්ඡරියා ගාථා පටිභංසු' = මහණෙනි, තවද විදර්ශිභාග්‍යවතුන්ට මේ ආශ්චර්යවත්නොවූ ගාථාවෝ සිතට නැගුණාහ. (දී. මහාපදාන)

23. අපිස්සුදං, මෙන්: වාගේ: තවද

'ආයසමතො සම්දධිස්ස අවිදූරෙ මහන්තං භය-භෙරව සද්ද මකාසි, අපිස්සුදං පඨවි මඤ්ඤෙ උද්‍රියතීති' = (හෙතෙම) පොළොව කම්පාවන්නාසේ හැගෙන තරමේ මහත් භයජනක ශබ්දයක් ආයුෂ්මත් සම්ඪිතෙරුන්ට නුදුරු තැන්හිදි කෙළේය. (සං. 119)

24. අපි ච, තවද එහෙම වුවත්, නමුත්

අපි ච, මෙ'ත්ථ පුග්ගලවෙමත්තතා විදිතා' = එසේ වුවත් මෙහිදි මා විසින් පුද්ගල විශේෂය සලකනු ලැබේ. (දී. මහාපරිනි)

25. අපි නු, ප්‍රශ්න විචාරීමේදී යොදනු ලැබේ.

'ආහනියෙ'දිසං ජනං, අග්ගි පජ්ජලිතං ච ලිඞ්ගිය,
ගණ්හිය-මාසිවිසං විය; අපි නු සොත්ථි සියා? ඛමෙහි නො'
(සුභාථෙරීගාථා)

26. අප්පෙව සමහරවිට: යෙහෙකි.

'අප්පෙව මං සො භගවා සබ්බදුක්ඛා පමොචයෙ' = ඇතැම් විට ඒ භාග්‍යවත් තෙමේ මා සියලු දුකින් මුදනවා ඇත. නොහොත් මා සියලු දුකින් මිදුව හොත් යෙහෙකි. (ථෙරීගා. 319)

27. අප්පවෙ නාම, එසේ වුවොත් යෙහෙකි.

A. අප්පෙව නාම භගවා අවන්තිදක්ඛිනාපථෙ චම්මානි අත්ථරණානි අනුජානෙය්‍ය' = භාග්‍යවතුන් වහන්සේ අවන්ති-දක්ෂිණා පථයෙහි සම්ඇතිරි අනුදක්නාසේක් නම් යෙහෙකි. (විනය මහා වග්ග)

28. අබ්භුම්මෙ, අහෝ: භයානක දෙයකි. මහත් භයක් ඇතිවූ විට සිංහලයෝ 'අපොයි අම්මේ' යි කෑගසත්. මෙය අබ්භුම්මෙ යන්නෙන් ආවක් විය හැක. අබ්භුම්මෙ = අප්පොම්මෙ අප්පොයිමෙ=අපොයි අම්මෙ වශයෙනි.)

අබ්භුම්මෙ කථන්නු භණසි?

සල්ලං මෙ දෙව උරසි කම්පෙසි.' (ජා.අ. 179)

'අනේ , මේ කුමක් කියන්නෙහිද? දේවයන්වහන්ස, මාගේ ළයෙහි හුලක් ඇන සොලවන්නෙහිද?'

29. අභික්ඛණං, නිතර: නැවත නැවත

'සච්චං කිර ත්වං භද්දිය, අභික්ඛණං 'අහො සුඛං, අහො සුඛ'න්ති වදෙසීති?' =භද්දිය, තෝ, නිතර 'අහෝ සැපයෙක, සැපයෙකැ' යි කියන්නෙහිය යන්න සැබෑවක්ද? (ථෙරගාථට්ඨකථා)

30. අභිණ්හං, නිතර

'ඉත්ථං සුදං භගවා ආයස්මන්තං රාහුලං ඉමාහි ගාථාහි අභිණ්හං ඔවදති.' (සුත්තනිපාත 60)

31. අභිදො, අභිමුඛයෙහි 'අභිදෙ අඩ්ඪරත්තන්ති අඩ්ඪරත්තෙන අභිමුඛෙ භූතෙ' (අං. අ. 701)

'අභිදෙ අඩ්ඪරත්තං' යන්නේ තේරුම මධ්‍යම රාත්‍රිය අභිමුඛ වූ කල්හිය.

32. අම්භො, එම්බා, පින්වත්නි.

'අම්භො දුට්ඨබ්‍රාහ්මණ, අඤ්ඤෙසං ඉදනෙ'ව ධනං වස්සා පෙත්වා අම්හෙ අඤ්ඤං සංවච්ඡරං අධිවාසාපෙසි.' = එම්බා දුෂ්ට බමුණු, තෝ අන්‍යයන්ට දැන් ධනය වසින්ට සලස්වා අපට තව අවුරුද්දක් ඉවසන්ට කීයෙහි. (වෙදබ්භජාතක)

33. අරෙ, බොල: ඒයි.

'අරෙ දුට්ඨ චෙටක, ඉලලිසමහාසෙට්ඨි සකල නගරස්ස දනං දෙති, ත්වං කිං අහොසීති?' (ඉල්ලීසජාතක)

ත්වං කිං අහොසි, තෝ කවෙරක් වෙහිද?

34. අලං, පමණි: ඔය ඇති: සමර්ථ වේ: යොග්‍යයි: සෑහේ

A. 'අලං ආවුසො මා සොචිත්ථ, මා පරිදෙවිත්ථ.' - ඇවැත්නි, පමණය. (-ඔය ඇත), ශොක නොකරව, නොවැලැක්පෙව්. (මහාපරිනිබ්බාණ)

B. 'එවමෙතං සුමනෙ, අලමෙව දනානි දතුං, අලංපුඤ්ඤානි කාතුං' - සුමනාවෙනි, එය එසේම ය: දන්දීම සුදුසුමය, පින්කිරීම සුදුසුමය. (අං· iii. 34 සුමනා)

C. 'සතථා අලං එත්තකං ඉමස්සාති පක්කාමි' - බුදුරජ මෙපමණක් මොහුට ප්‍රමාණයයි සිතා වැඩි සේක. (ධ. අ. මට්ටකුණ්ඩලී)

සමස්ත වචනඃ-

අලංකම්මනිය - ක්‍රියාවට යොග්‍යවූ හෙවත් සෑහෙන තරමට මේරූ
අලංපතෙය්‍ය - ස්වාමියකුට පාවාදීමට තරම් යොග්‍ය වයසට පත්
අලංවචනිය - අනුන් කියන වචන තේරුම් ගැනීමට තරම් වයසැති.

අලමරියඤාණදස්සන = ප්‍රබල වූ ආයඍඥාන දර්ශනය
අලංවචනියං කත්වා = බිරිඳක් දික්කසාදයට පමුණුවා (තමා ඇය ගැන වග නොකියන්නකු කොට)

35. අවස්සං, ඒකාන්තයෙන්.

'අද්ධුවං ජීවිතං, ධුවං මරණං, අවස්සං මයා මරිතබ්බං' = මා ඒකාන්තයෙන් මරණයට පැමිණිය යුතුය. (ධ. අ. පෙසකාරධීතු)

36. සු, පදපූරණයෙහි

A. 'ආදිත්ත'ස්සු නාම'ජ්ජ වෙදියකො පබ්බතොඃ ජලිත'ස්සු නාම'ජ්ජ වෙදියකො පබ්බතො.' - අද වනාහි වේදියක පර්වතය ගිනිගෙන තිබේ. අද එය දැල්වේ. (දී. සක්කපඤ්හ)

B. 'කෙන'ස්සු නීයතී ලොකො?' - මේ ලෝ වැසි තෙමේ කවරෙකු විසින් මග පෙන්වනු ලැබේද? (ස. i 39)

37. අහෙ: සමානයන්ට ආමන්ත්‍රණයේදී යොදනු ලැබේ. 'සක්කො ච මෙ වරං දජ්ජාඃ තාවතිංසානමිස්සරොඃ තා'හං භද්දෙඃ වරෙය්‍යා'හෙ' (දී. සක්කපඤ්හ)

=තව්තිසා වැසියන්ට අධිපති වූ ශක්‍රතෙමේ ඉදින් මට වරයක් දෙන්නේ නම් සොඳුර, මම තා ඉල්ලා ගන්නෙමි. ' අහෙ ති ආමන්තණං' යි අටුවාහි කියන ලදී. අන්තැනක මෙ වැනි නිපාතයක් නොදක්නා ලැබේ.

38. අහො, අනේ: අපොයිඃ ආශ්චය‍ර්‍යයකි.

A. 'අහො! මයා උදරහෙතු අයුත්තං කතං.' (ලොසකජාතක)
B. 'අහො! ඉමස්මිං ලොකෙ අයුත්තං වත්තති.' (කුක්කුර ජා.)
C. 'අහො! බුද්ධානං බුද්ධානුභාවො නාම.' (වට්ටකජාතක)

39. අහොවත, තිඳුවක් හෝ බලාපොරොත්තුවක් ප්‍රකාශ කෙරේ.

A. 'අහොවතා'යං බ්‍රාහ්මණො මණිං උපසඩ්කමිත්වා න ගණ්හෙය්‍ය.' - මේ බමුණා මැණිකට ළං වී එය නොගන්නේ නම් යෙහෙකි.

(ධ. අ. සඩ 206)

B. 'අහො වත රෙ අම්හාකං පණ්ඩිතකා' - අනේ අපේ පණ්ඩිතමානීන්ගේ සැටි!! (දි. අම්බට්ඨ)

40. 'ආදු, නොහොත්.

'දෙවතා නු' සි? ගන්ධබ්බො? ආදු සක්කො පුරින්දදෙ?'

(ධ. අ. මට්ටකුණ්ඩලී)

දේවතාවෙක් වෙහි ද? ගන්ධර්වයෙක් වෙහිද? නැතහොත් පුරින්ද ද නැමැති ශක්‍රයා වෙහිද?

41. ආම, එසේය: ඔව්

'ආම භන්තෙ න සක්කා තත්ථ වසිතුං' (ධ. අ.)

42. ආයති, ආයතිං, ආනගතයෙහි, අනාගතය

'තථාගතස්ස බො සීහ: ආයතං ගබ්භසෙය්‍යා පහීනා' - සිංහ සෙනෙවිය, බුදුරදුන්ගේ ආනගතයෙහි ඉපදීම ප්‍රහීන විය. (විනය මහා වග්ග)

43. ආරකා, දුරින්, දුරදී

A. ආරකා තෙ අනුත්තරාය, විජ්ජාචරණසම්පදය.' - ඔවුහු නිරුත්තර විද්‍යාචරණසම්පත්තියෙන් දුර වෙති. (දී. i 99)

A. 'එවං චේතං ජනො ජඤ්ඤා යතා ජානාමි තං අහං
ආරකා පරිවජ්ජෙය්‍ය ගූථට්ඨානං'ව පාවුසෙ' (ථෙරගාථා ii 53)

- මා තා ගැන දන්නා සේ මහාජනයාත් තා ගැන දනීනම් මහා ජන තෙමේ වැසිකලක මලපහරන තැනක් මෙන් (පිළිකුල් කොට) තා දුරින් දුරු කරන්නේය.

44. ආරා, දුරින්: දුරදී.

A. 'න හරාමි. න භඤ්ජාමි ආරා සිංසාමි වාරිජං' - මම පියුම නොගෙනයමි, එය නොකඩමි: දුරින් (හෙවත් දුර සිට) සිඹිමි. (වනසංයුත්ත)

B. 'ආරා සො ආසවක්ඛයා' - හෙතෙම ආශ්‍රවයන් ක්ෂය කිරීමෙන් ඈතය. (දුරය) - (ධම්ම ගා. 253)

45. ආවි, ඉදිරියෙහි, ප්‍රකට ලෙස

'මා' කාසි පාපකං කම්මං ආවී වා යදි වා රහො.' =ප්‍රකට ලෙස හෝ රහසෙහි පව් නොකරව.= (ථෙරී ගා. 247)

ආවිභාව=ප්‍රකට බව

46. ආවුසො, ඇවැත්නි, සොහොයුර.

'ආවුසො. ඉමං තෙමාසං කතිහි ඉරියාපථෙහි වීතිනාමෙස්සථ?'

(ධ. ද. චක්ඛුපාල)

47. ඉංඝ, මෙහෙ බලව: එහෙනම්

'ඉංඝ ත්වං සොණ, තත්‍ථෙ'ව අගාරියභූතො බුද්ධානං සාසනං අනුයුඤ්ජ.' = එහෙනම්, සෝණ, තෝ එහිම ගිහිවූයේ බුද්ධධර්මය පිළිපදුව

(විනයමහාවග්ග)

48. ඉති, මෙසේ. වාක්‍යාවසානය දැක්වීමටත් යෙදේ.

'ඉති ඛො, මාණව අප්පායුකසංවත්තනිකා පටිපද අප්පායු කත්තං උපෙන්ති' = 'මානවකය, මෙසේ අඩු ආයුෂය පිණිස පවත්නා පිළිවෙත අල්පායුෂ්ක බව එළවයි. (ම iii 206)

49. ඉත්ථං, මෙසේ. 30 වෙනි අඩකයට දුන් උදහරණය බැලිය යුතු.

50. ඉව, මෙන්: වාගේ

'අඤ්ජනී'ව නවා චිත්තා, පූතිකායො අලඞ්කතො' =අලුත් වූ විසිතුරු වූ අඳුන්කුරක් මෙන් මේ කුණු ශරීරය සරසන ලද්දේය.

(ථෙ. ගා. 773)

51. උත්තරසො, අනිද්දා

'නත්‍ථි සා ඉද්ධි වා ආනුභාවො වා අජ්ජේ' ව මෙ ධඤ්ඤානි ජායන්තු, සෙව ගබ්භිනි හොන්තු, උත්තරසො පච්චන්තුති' = 'අද ම මාගේ ධාන්‍ය පැලවෙත්වා, හෙට ගැබ් ගනිත්වා: අනිද්ද පැසෙත්වා' යි (සිතා එසේ සිද්ධ කිරීමට හැකි) සෘද්ධියක් හෝ ආනුභාවයක් හෝ නැත.

(අං. ස. 240)

52. උත්තරි, උත්තරි, මත්තෙහි

A. 'අථව පන භවං ආනන්දෙ එවමාහ. අත්‍ථි වෙ'ත්‍ථ උත්තරි කරණීයං'ති' = තවද භවත් ආනන්ද ස්ථවිර තෙමේ 'මෙහිදී මත්තෙහි කළයුතු දෙයක් ඇතැයි කීය. (දී. ෂ. 26)

B. 'උත්තරිං අප්පටිවිජ්ඣන්තො බ්‍රහ්මලොකූපගො හොති' = මත්තෙහි (උසස් ධර්මයන්) අවබොධ නොකරන්නේ හෙතෙම බඹලොව උපදනේ වෙයි. (අං. ස. 342)

C. උත්තරිසාටක, උතුරු සළුව; උඩ කොටස වසන වස්ත්‍රය.

D. උත්තරිභඞ්ග: (කැඳබීම-රාබීම ආදියේදී පාවිච්චියට ගන්නා) කටගැස්ම; අතිරේක ව්‍යඤ්ජනය

E. උත්තරිමනුස්ස ධම්ම, මනුෂ්‍යත්වය ඉක්මවූ දෙය.

53. උද, හෝ නොහොත්

'චරං වා යදි වා තිට්ඨං නිසින්නො උද වා සයං' (සුත්තනිපාත ගා. 34)

54. උදාහු, නොහොත්

'කින්නාමෙ'තං සත්ථාරා කතං? ඤත්වා නු බො කතං උදාහු අජානිත්වාති' (ධ. අග චූලකාළ-මහාකළ)

55. උඩං, උඩ මත්තෙහි; පසුව

A. 'සො තත්ථ වේණුදෙදහකං පචමානො සකිම්පි උඩං ගච්ඡති' = හෙතෙම එහි පෙණ දමමින් පැසෙන්නේ වරක් උඩට යයි.

(අං,ස. 141 ම iii 183)

B. 'උඩං අධො ච තිරියං දිසාසු' නු දිසාසු' හං
අන්වෙසං නාධිගච්ඡාමි ගොධිකො සො කුහිං ගතො.'

(සං. ස. 22)

උඩ ද යට සරස ද දිශානුදිශාවන්හි ද සොයන්නා වූ මම ඒ ගොධිකස්ථවිර කොහි ගියේ දැයි අවබොධ නොකරමි.

C. 'උඩං චතූහි මාසෙහි කාලකිරියා භවිස්සති.' =මින් සාර මසකින් මත්තෙහි මාගේ මරණය සිදු වන්නේය. (ධනපාලපෙතවත්තු)

D. උඩංමුඛ, උඩබලාසිටින, උඩිකුරු මූණ ඇති.

E. උඩපාද, පා උඩිකුරු කොට ඇති.

F. උඩංවිරෙචන, වමනය කරවීම.

56. උපරි, මත්තෙහි; උඩ මුදුනෙහි.

A. 'යස්ස දෙසො අත්ථි තස්සෙ'ව උපරි සාපො පතතු' = දෝෂය යමකුගේ වේ නම් ඔහු මත්තෙහි සාපය වැටේවා. (ධ. අ. චූල්ලතිස්ස)

B. හෙට්ඨා අවීචි උට්ඨහිත්වා උපරි පටිහඤ්ඤති.' - යටින් ගිනිදැල්ල නැග මත්තෙහි (=උඩතට්ටුවෙහි) හැපේ. (ම. iii. 184)

C. 'ඉතො වස්සසතස්ස උපරි අට්ඨාරසමෙ වස්සෙ...... සාසනෙ මහන්තං අබ්බුදං උප්පජ්ජිස්සති' - මෙයින් අවුරුදු සීයයකින් මත්තෙහි අටළොස්වෙනි වර්ෂයේදී සස්නෙහි මහත් අර්බුදයක් උපදින්නේය. (විනයඅටුවා. නිදාන)

57. එකජ්ඣං, එක් තැනෙක: එකතුව

'තානි සබ්බානි එකජ්ඣං ආරොපෙන්තෙහි සංගහං

ජාතකං නාම සංගීතකං....' (ජාතකනිදාන)

ඒ සියල්ල එක් තැන්කොට සංග්‍රහවට නගන්නාවූ ඒ තෙරුන් විසින් ජාතක නම් කොටසක් සඩගායනා කරන ලදී.

58. එකතො, එකතුව: එකට

'අඤ්ඤතිත්ථියා..... නිප්පභා හුත්වා එකතො සන්නිපතිත්වා මන්තයිංසු' (ජා ii 145)

59. එකමන්තං, එක් පසෙක පැත්තක

'එකමන්තං ඨිතා ඛො සා දෙවතා භගවන්තං ගාථාය අජ්ඣභාසි.'

60. එකිදං, ඇතැම්

'එකිදං සත්තා වණ්ණවන්තා හොන්ති, එකිදං සත්තා දුබ්බණ්ණා' - ඇතැම් සත්වයෝ වර්ණවත් වෙති, ඇතැම්හු දුර්වර්ණ වෙති. (අග්ගඤ්ඤසුත්ත. දීඝ)

61. එත්තො, අරෙහෙන්.

'මාතුල: අයං සරො එත්තො, ත්වං පන ඉතො නෙසීති.' - මාමෙ, මේ විල අරෙහෙනි, ඔබ මෙහෙන් ගෙනයෙහි.' (බක ජාතක)

62. එත්තාවතා, මෙපමණකින්

'එත්තාවතා ඛො මහානාම උපාසකො හොති.' -(සංග v. 395)

63. එව අවධාරණාර්ථයෙහි හෙවත් නියම කොටම කීමෙහි වේ.

'යං සො වදති තං තථේ'ව හොති.' - හෙතෙම යමක් කියා නම් එය එසේම වේ. (ධ. අ. iii, 45)

64. එවං, මෙසේ, එසේය, ඔව්, මෙවැනි

A. 'එවං, ඛො ආනන්ද දක්ඛිණා, දායකතො විසුජ්ඣති. - ආනන්දය, මෙසේ දානය දායකපක්‍ෂයෙන් පිරිසිදු වේ. (ම. දක්ඛිණාවිභඞ්ග)

B. 'එවං හොති ඛො සො මාණවො සුභස්ස මාණවස්ස. පටිස්සුත්වා යෙනා'යස්මා ආනන්දො තෙනු'පසංකමි.' - එවං හොති- එසේය, පින්වතැයි. (දී. සුභසුත්ත)

C. එවං දිට්ඨි මෙවැනි දෘෂ්ටි ඇත්තේ

D. එවංවාදී, මෙවැන්නක් ප්‍රකාශකරන්නේ

65. එවමෙව, එසේම, එපරිද්දෙන්ම

'එවමෙව තුවං මාර, ආසජ්ජ නං තථාගතං

සයං දහිස්ස' ත්තානං, බාලො අග්ගිංව සම්ඵුසං.' (ථෙරගාථා 1205)

-'එසේම, මාරය තෝ ඒ තථාගතයන්ට හිරිහැර කොට ගින්නක් ස්පර්ශ කරන බාලයකු මෙන් තමා දවාගන්නෙහි.'

66. එවමෙවං 64 හා සමානාර්ථ ඇත්තේයි.

'සක්කා නු ඛො භන්තෙ එවමෙවං දිට්ඨෙව ධම්මෙ සන්දිට්ඨිකං සාමඤ්ඤඵලං පඤ්ඤාපෙතුං'ති?' - ස්වාමීනි, එපරිද්දෙන්ම මේ ආත්මයේදීම ප්‍රත්‍යක්‍ෂ වූ මහණකමේ ඵලයක් පෙන්විය හැකිද?' (දී. සාමඤ්ඤඵල)

67. ඔරං, යට, ඇතුළත, මෙහා මෙගොඩ
ඔරෙන, අඩුව.

A. 'ඔරං සමුද්දස්ස අතිත්තරූපො, පාරං සමුද්දස්සපි පත්ථයෙථ.' - මුහුදෙන් මෙතෙරට තෘප්ත නොවූයේ මුහුදෙන් එතරත් ප්‍රාර්ථනාකරයි. (ථෙරගාථා 777)

B. 'ඔරං වස්සසතාපි මීයති' - අවුරුදු සියයෙන් අඩුවත් (සියය පිරෙන්ට මත්තෙනුත්) මැරේ. (සුත්තනි ගා 804)

C. ' යො පන භික්ඛු ඔරෙනඩමාසං නහායෙය්‍ය පාචිත්තියං' - යම් භික්‍ෂුවක් අඩමසකින් මෙහා (-අඩ මසකට අඩු දින ගණනකදී) නාන්නේ නම් පාචිත්තියාපත්තියක් වේ.[1] (පාචිත්තියපාළි)

68. කච්චි, කිමෙක්ද? (මෙය සැකයක් විචාරීමෙහි යි)

A. 'කච්චි මං සම්ම ජීවක, න වඤ්චෙසි?' - ' කිමෙක්ද මිත්‍ර ජීවකය, මා මුළා නොකෙරෙහිද?' (දී. සාමඤ්ඤඵල)

B. කච්චි තෙ වක්කලි, ඛමනීයං? කච්චි යාපනීයං? කච්චි දුක්ඛා

1. මෙය මධ්‍යදේශයෙහි පමණක් බලපවත්වන්නේයි: එහිදීත් විශේෂ කරුණු ඇති විට නෑ හැක.

වෙදනා පටික්කමන්ති, නො අභික්කමන්ති - 'කිමෙක්ද වක්කලී, ඔබට ඉවසිය හැකිද? දුක් වේදනාවෝ ඉවත් වෙත්ද? ඉදිරියට නො එත්ද?
(සං iii 120)

69. කථං, කෙසේ.

A' 'කථං අවන්දියා බුඩා'? = බුදුවරු කෙසේ නො වැඳිය යුත්තාහුද? (අපදාන)

සමස්තපදඃ

B. කථංකර, කෙසේ ක්‍රියාකරන,
C. කථංජීවි, කෙසේ ජීවත්වන
D. කථම්භූත, කෙසේ වූ
E. කථංවිධ, කෙබඳු ආකාර ඇත.

70. කද, කවර කලක
71. කදචි, කිසිකලක, ඇතැම්විට.
72. 'කරහචි, යම්කිසි කලක. කදචි, කරහචි, බොහෝ කලාතුරකින්.

A. 'හොති සො භික්ඛවෙ සමයො යං කදචි, කරහචි, දීඝස්ස අඩුනො අච්චයෙන දුතියො සුරියො පාතුභවති.' (අං. සත්තසුරිය) මහණෙනි, බෙහෝ කාලයක්හුගේ ඇවෑමෙන් කිසියම්කලක දෙවෙනි සූර්යයකු පහළවන කාලයක් ඇති වේ.

B. 'න කොත්ථුකො සීහසමො කදචි' (ස. i. 66)
= හිවලා කිසිවිටකත් සිංහයාට සමාන නොවේ.

73. කාමං, ඒකාන්තයෙන්
කාමං, චජාම අසුරෙසු පාණං,
මා'මෙ දිජා විකුලාවා අහෙසුං.' (කුලාවක ජාතක)
= ඒකාන්තයෙන් අසුරයන් මැදදී අපගේ ප්‍රාණය අත්හරිමු. මේ පක්ෂීහු කූඩු නැත්තෝ නොවෙත්වා.

74. කිඤ්ච, කියනුම කිම, කුමක් හෙයින්.
'අඤ්ඤෙදාපි දෙවො පොසෙති කිඤ්ච දෙවො සකං පජං.'

= දේවයන්වහන්සේ අන්‍යයනුත් පෝෂණය කෙරෙත්, තමාගේම ප්‍රජාව (සන්තතිය හෙවත් පරම්පරාව) පෝෂණය කිරීම ගැන කියනුම කිම? (කච්ඨහාරිජා.)

75. කිඤ්චාපි. කිසිසේත්, එසේ වුවත්

'කිඤ්චාපි, බො'මිහි දුක්ඛිතා දුබ්බලා ගතයොබ්බනා,

දණ්ඩමොලුබ්භ ගච්ඡාමි පබ්බතං අභිරූහිය.' (ථෙරීගා. 29)

= මා දුක්ඛිත වුවත්, දුර්වල වුවත් පහ වූ තරුණ බව ඇතත් සැර යටියෙහි එල්ලී පර්වතයට නැග යමි.

76. කිඤ්චි, කිසිවක්. iv උදාහරණ කොටසේ 12 වෙනි අධිකය බලනු.

77. කින්ති, කෙසේ කිමෙක් ද

'සො තෙසං භොගානං ආරක්ඛාධිකරණං දුක්ඛං දෙමනස්සං පටිසංවෙදෙති: කින්ති මෙ භොගෙ නෙව රාජානො හරෙය්‍යුං, න චොරා හරෙය්‍යුං..... ති.' = ඒ භෝගයන් රැකීම නිමිතිකොට ගෙන හෙතෙම දුක් දොම්නස් විඳියි: කෙසේ මාගේ ධනය රජවරු පැහැර නොගනිත් ද, කෙසේ සොරු නොගනිත් දැ' යි. (ම.i, 86)

78. කිමංග, කියනු කිම?

'මහලකස්ස හි අත්තනො හත්ථපාදපි අනස්සවා හොන්ති ............ කිමංග පන ඤාතකා? = මහල්ලාට, තමාගේ අත් පා ද නොකීකරු වෙති, නෑයන් ගැන කියනුම කිම? (ධ. අ. චක්ඛුපාල)

79. කිත්තාවතා, කොපමණකින්?

'කිත්තාවතා නු බො භන්තෙ උපාසකො හොතීති?'

=ස්වාමීනි, කොපමණකින් උපාසකයෙක් වේද? (සං. v 395)

80. කිර, ලු: චනාහි, මෙසේ අසන්ට ලැබේ.

'ජටිලස්ස කිර ගෙහෙ භූමිං භින්දිත්වා සුවණ්ණපබ්බතො උට්ඨිතොති සුත්වා' = ජටිල ගෘහපතියාගේ ගෙයි පොළොව බිඳගෙන රන්පර්වතයක් නැංගේලුයි අස්නට ලැබී. (ධ. අ. iv 216)

81. කිං කිමෙක්ද?

'අථ නං සත්ථා කිං භික්ඛු, නාලන්ථ ත්වං තත්ථ වාසං' ති? පුච්ඡි.'
(ධ. අ. i 294)

82. කිංසු, කුමක්.

' කිංසු නරානං රතනං? - මිනිසුන්ට කුමක් රත්නය වේද? (දෙවතා සං)

83. කීව, කොපමණ

'කීව චිරං විමානස්මිං ඉධ වස්සසු'පොසථෙ' - උපොසථාවෙනි, කෙතරම් දීර්ඝ කාලයක් තෝ මේ විමානයෙහි වාසය කරන්නෙහිද? (උපොසථාවිමානවත්ථු)

84. කුදචනං, කිසිකලක

'ගමනෙන න පත්තබ්බො, ලොකස්ස'න්තොකුදචනං' - ගමන් කිරීමෙන් ලෝකයේ කෙළවරට කිසි කලෙකත් පැමිණිය නොහැක්කේය. (සං,ෂ 62)

85. ක්ව, කුවං, කොහි, කොහේ?

A. 'ක්ව නච්චං? ක්ව ගීතං? ක්ව වාදිතං?' (සිඟාලෝවාද)

B. 'කිං සු අසිස්සාමි? කුවං වා අසිස්සං?

'දුක්ඛං වත සෙත්ථ, කුවජ්ජ සෙය්‍යං? (සුත්තනි. ගා. 970)

'කුමක් කන්නෙම්ද? කෙහිදී කන්නෙම්ද? (ඊයේ) දුකසේ නිදගත්තෙමි, අද කොහි සැතපෙන්නෙම්දැ' යි (මෙසේ හෙතෙම සිතිවිල්ලෙන් යුක්ත වෙයි)

86. ක්වචි, කිසි තැනක.

A. 'තතො අදින්නං පරිවජ්ජයෙය්‍ය

කිඤ්චි ක්වචි සාවකො බුජ්ඣමානො.' - වැටහෙන නුවණැති ශ්‍රාවකතෙමේ යම්කිසි තැනක යම්කිසි නුදුන් දෙයක් දුරු කරන්නේය.
(සුත්තනි. ගා. 395)

B. 'යස්ස නත්ථි උපමා ක්වචි.' - යමකුට අපමාවක් කිසි තැනකත් නැද්ද. (සු. නි. 1137)

87. මලු, ඒකාන්තයෙන්: එනාහි.

'සමණො බලු භො ගොතමො සක්‍යපුත්තො, සක්‍යකුලා පබ්බජිතො' - භවත් ශ්‍රමණ ගෞතම තෙමේ එකාන්තයෙන් ශාක්‍යපුත්‍රයෙකි, ශාක්‍යකුලයෙන් පැවිදි වූවෙකි. (දී. සොණදණ්ඩ.)

88. ඛිප්පං, වහා
'සො ඉමං ධම්මං ඛිප්පං, අජානිස්සති (ජාතකනිදාන)

89. බු. ඒකාන්තයෙන්: එකාන්තයෙන්
කාහින්ති බු තංකාමා, ජාතා සුනඛං' ච චණ්ඩාලා' මෙය කාහින්ති යන පදයට උදාහරණ වශයෙන් මින් පෙර දක්වන ලදී. (ථෙර ගා. 509)

90. ඛො, එකාන්තයෙන්: ඒකාන්තයෙන්
'අරොචෙමි ඛො තෙ මහාරාජ ........... අධිවත්තන්ති ඛො තං මහාරාජා, ජරාමරණං' - මහරජ, ඔබට දැනුම්දෙමි:- මහරජ, ජරා මරණ දෙක ඔබ මැඩගෙන පවතී. (කොසලසං)

91. වරහි, දැන්: එබැවින්
A. 'අථ කෙ චරහි දෙවතෙ ලොකෙ අරහන්තො?' - දෙවතාව, එහෙනම් දැන් මෙලෙව්හි රහත්හු කවරහුද? (උදාන, දරුචීරිය)

B. 'නනු ත්වං ආවුසො භගවතා අනාගාමී ව්‍යාකතො: අථ කිං චරහි ඉධා'ගතො?' - ඇවැත්නි, භාග්‍යවතුන්වහන්සේ විසින් තෝ අනාගාමියෙකැයි ප්‍රකාශකරන ලද්දේ නොවෙහිද? එබැවින් දැන් මෙහි ආවේ කුමක් හෙයින්ද? (සං. ස. 149)

92. චිරං, බොහෝ කලක්
'දුක්ඛම්හි ච තිරච්ඡානයොනියං
නෙකධා වුසිතං චිර මයා' - ඉවසිය නොහැකි දුක් ඇති තිරිසන් භවයෙහි මා විසින් දීර්ඝ කාලයක් වසන ලදී. (ථෙර ගා. 258)

B. චිරට්ඨිතික, බෙහෝකල් පවත්නා
C. චිරනිවාසී, බොහෝකල් වසන.
D. චිරපබ්බජිත, පැවිදි වී බොහෝකල් ගත වූ
E. චිරපටිකා, බොහෝ කලක පටන්.

A. 'චිරපටිකා' හං භන්තෙ භගවන්තං දස්සනාය උපසංකමි තුකාමො.' (සක්ක පඤ්හ. සං. iii 120)

B. 'චිරපටිකා මයං භො මහාසමණෙ අභිප්පසන්නා.' = බොහෝ කලක පටන් අපි මහා ශ්‍රමණයා කෙරෙහි පැහැදී සිටිමු. (විනය මහා වග්ග)

94. චිරරත්තං, බොහෝ කලක් මුළුල්ලේ
චිරරත්තං වතා'තාපි ධම්මං අනුවිචිනන්තයං
සමං චිත්තස්ස නාලත්ථං පුච්ඡං සමණ-බ්‍රාහ්මණෙ.'

(ථෙර ගා. 747. තෙලකානි)

බොහෝ කලක් මුළුල්ලේ උත්සාහවත්ව ධර්මය විමසන්නාවූ මම මහණ බමුණන් විචාරමින් චිත්තසමථයක් (-සිතේ සැනසීමක්) නො ලදිමි.

95. චිරස්සං, බොහෝ කලකට පසු
'අහො දුක්ඛං! අයෙයා නො මහාකස්සපත්ථෙරො චිරස්සං මෙ කුටිද්වාරං ආගතො.' = අනේ දුකකි! අපගේ ආර්ය වූ මහාකාශ්‍යප ස්ථවිරතුමා බොහෝ කලකට පසු මාගේ පැල ඉදිරියට පැමිණියේය.

(ධ. අ. i 425)

96. චිරාය, චිරරත්තාය, බොහෝ කලකට
'සංයොජන-සඞ්ග-සත්තා දුක්ඛමුපෙන්ති පුනප්පුනං චිරාය' = සංයොජනවලින් බැඳුණු සත්වයෝ බොහෝ කලක් මුළුල්ලේ නැවත දුකට පැමිණෙත්. (ධම්ම 342)

97. චිරෙන, බොහෝ කලකින්
'අථා'පරභාගෙ 'කිං ඉමිනා වුත්ත'න්ති කංඛන්තො චිරෙන ජානාති.' = ඉක්බිති පසු කලක 'මොහු විසින් කුමක් කියන ලදදැයි' සැක කරන්නේ බොහෝ කලකට පසු දැනගනී. (විනය අ.)

98. වෙ, ඉදින්. (මෙය වාක්‍යයක මුල නො යොදනු ලැබේ.)
'පාපං වෙ පුරිසො කයිරා, න තං කයිරා පුනප්පුනං'

(ධම්මපද ගා. 118)

99. ජාතු, ඒකාන්තයෙන්
'ඉදං හි ජාතු මෙ දිට්ඨං: නයි' දං ඉතිහීතිහං' = මෙය මා විසින් ඒකාන්තයෙන් දක්නාලදී: මෙය අනුන්ගෙන් අසා දැනගත්තක් නොවේ.

(සං, i, 154)

100. ජෙ, පහත් ස්ත්‍රීන්ට ආමන්ත්‍රණයෙහි පෙනේ.

A. 'හෙ ජෙ කාළි ............ කිං ජෙ දිවා උට්ඨාසි' - එම්බල කාළි, දහවල් වී කුමක් හෙයින් නැගිටින්නෙහිද?' (ම. i, 126)

B. 'ගච්ඡ. ජෙ, වජතො ගුත්තං නික්ඛමනවෙලාය වජද්වාර මජ්ඣෙ ඉමං තිරියං නිපජ්ජාපෙහි' (ධ. අ. සොසක)

101. තග්ඝ, එසේනම්: ඒකාන්තයෙන්

A. 'තග්ඝ ත්වං බ්‍රාහ්මණ එවංකාරි කිච්චකාරී හොසි.' = බ්‍රාහ්මණය: මෙසේ කරන්නාවූ තෝ ඒකාන්තයෙන් කටයුත්ත කරන්නෙක් වෙහි. (බ්‍රාහ්මණසං)

B. 'තග්ඝ, තං අමොහා පුරිස තථා කරිස්සන්ති යථා තං පමත්තං' - එසේ නම් එම්බා පුරුෂය, තා ප්‍රමාද වූවකුසේ සලකා ඔවුහු එසේ කරන්නාහ.

102. තාව, ඒතාක්: එපමණ: පළමුකොට, වනාහි.

A. 'යාව'ස්ස අඤ්ඤො කොචි පත්තං න ගණ්හාති තාව'ස්ස ගන්ත්වා පත්තං ගණ්හ. = යම්තාක් අන් කිසිවෙක් උන්වහන්සේගේ පාත්‍රය නො ගනීද ඒතාක් ගොස් උන්වහන්සේගේ පාත්‍රය ගනුව: (අනිකකු පාත්‍රය ගන්ට පෙර ගනුව යන අදහසයි) (ධ. අ. පණ්ඩිතසා.)

B. 'න තාව කාලඞ්කරොති යාව තං පාපකම්මං ව්‍යන්ති හොති. - ඒ පාපකර්මය ගෙවෙනතුරු හෙතෙම කලුරිය නොකරයි. (මෙහි යාව-තාව දෙකම 'තුරු' යන්නෙන් අනූදිතයි) (අ. දෙවදූත)

C. තාව බහුං සුවණ්ණනං - එපමණ බොහෝ වූ රන් (විනයමහා වග්ග)

103. තාවතා. එපමණ කල්: එපමණකින්.

'තාවතා තිට්ඨමානො සො තාරෙසි ජනතං බහුං' - එපමණ කල් සිටින්නා වූ එතුමා මහත් ජනතාවක් එතෙර කළේය. (බුඩවංස)

104. තාවදෙ, එකෙණෙහි: එකල්හි.

'සට්ඨිවස්ස සහස්සානි ආයු විජ්ජති තාවදෙ' - එකල්හි සැට දහසක් හවුරුදු ආයුෂ විද්‍යමානවේ. (බුඩවංස)

105. තාවදෙව, එකෙණෙහිම.

'තාවදෙව අසීතිහත්ථගම්භීරාය අඩගාරකාසුයා තලතො.....
....... එකං මහාපදුමං උග්ගන්ත්වා' (ඛදිරඞ්ගාර ජා.)

106. තිරියං, සරසː හරස්ව

' සො පන දෙවලො නිපජ්ජමානො අත්තනො තිසිත්තාටඨාමෙහ අනිපජ්ජිත්වා වාරමජ්ඣෙඩ තිරියං නිපජ්ජි' (ධ. අ. චූල්ලතිස්ස)

107. තිරො, සරසː එහාː ඉත්පිට (සමාසයෙහිම පෙනේ.)

'තිරොකුඩ්ඩං තිරොපාකාරං තිරොපබ්බතං අසජ්ජමානො ගච්ඡති සෙය්‍යථාපි ආකාසෙ' - හෙතෙම අහසෙහි යන්නාසේ නොහැපී බිත්තියක් හෝ ප්‍රාකාරයක් හෝ පර්වතයක් හෝ සරස (-විනිවිද) ගමන් කරයි.
(දී. සාමඤ්ඤඵලාදි.)

108. තු, නමුත්ː තවදː වනාහිː නම්.

'තථා තු කස්සාමි යථාපි ඉස්සරො' - අධිපතියෙක් යම්සේ කරන්නේ නම් එසේ මමත් කරන්නෙමි. (ථෙරගා. 1138)

109. තුණ්හි, නිශ්ශබ්දලෙස.

A. 'තතියම්පි තෙ භික්ඛූ තුණ්හී අහෙසුං' (දී. ii 155)

B. ' නින්දන්ති තුණ්හි මාසීනං නින්දන්ති බහුභාණිනං' - නිශ්ශබ්දව උන්නහුටත් නිඳා කෙරෙත්, බොහෝ කථා කරන්නහුටත් නිඳා කෙරෙත්.
(ධම්ම 227)

110. තුවටං, වහා

'තුවටං, බො අය්‍යපුත්ත ආගච්ඡෙය්‍යාසි' (ධ. අ. නන්ද.,

111. දිවා, දවල්, දවල්හි

A. 'එකෙ සමණ-බ්‍රාහ්මණ රත්තිං යෙව සමානං දිවාති සඤ්ජානන්ති' - ඇතැම් මහණ - බමුණෝ ඇත්ත වශයෙන් පවත්නා රාත්‍රිය දවල යයි හැඳිනගතිත්. (ම. i, 183)

112. දිඝරත්තං, දිගුකලක්

'තද'ස්ස උත්තියස්ස පරිබ්බාජකස්ස දීඝරත්තං, අහිතාය දුක්ඛාය.' - එය උත්තියපරිබ්‍රාජකයාට දිගුකලක් අහිතපිණිස දුක් පිණිස පවත්නේය. (අං. v, 194)

113. දුච්ඡු, නපුරුසේ: වැරදිසේ

'දුබ්බණිතන්ති භණන්තෙතපි දුච්ඡු භණිතං' -දුබ්භණිත නම් කියන්නහු විසින් නපුරුසේ කියන ලද්දකි. (සුත්තනිපාතට්ඨකථා)

114. ධි නිඳුවේවා: චි:,

'සො.............. සතපු පුරතො නග්ගො අට්ඨාසි මනුස්සා ධී ති ආහංසු' - හෙතෙම බුදුරදුන් ඉදිරියෙහි නිර්වස්ත්‍රව සිටියේය. මිනිස්සු චි: චි: යයි කීහ. (නච්චජාතක)

115. ධිර ත්‍ථු (ධි+අත්‍ථු-) නින්ද වේවා.

A. ධිර ත්‍ථු කිර භො ජාති නාම. - ඉපදීම නම් දෙයට නින්ද වේවා. (දීඝ මහපදනං)

B. 'ධීරත්‍ථු තං ජනපදං යත්ථි'ත්ථී පරිණායිකා' - යම් තැනක ස්ත්‍රියක් නායිකාව වේ නම් ඒ රටට නින්ද වේවා (කණ්ඩිනජා.)

116. ධුවං, ඒකාන්තයෙන්.

'තෙ ප'ජ්ජ සබ්බෙ සන්තුට්ඨා, ධුවං බුඩො භවිස්සයි' (බුඩවංස) ඒ සියලු දෙන අද සතුටු වූවෝය: ඒකාන්තයෙන් බුදුවන්නෙහි.

117. න, (ප්‍රතිෂෙධාර්ථයෙහි නිපාතයකි) නැහැ: නැත.'න තස්සං පරිසායං කොචි දෙවො අභිවාදෙතිවා පච්චුට්ඨෙති වා' - ඒ පිරිසෙහි වඳින්නාවූ හෝ අස්නෙන් නැගිටින්නාවූ කිසි දෙවියෙක් නැත. ඒ පිරිසෙහි කිසි දෙවියෙක් වඳින්නේ හෝ අස්නෙන් නැගිටින්නේ නොවේ. (දීඝ ජනවසභං)

නෙව (න+එව) ඒකාන්තයෙන් නැත

'තං ඛො පනෙතං පාපකම්මං නෙව මාතරා කතා න පිතරා කතං' (අං දෙවදූත)

118. නනු, නොවේද?

'නනු තෙ පුත්තෙන මට්ටකුණ්ඩලිනා මයි මනං පසාදෙත්වා අත්තනො සග්ගෙ නිබ්බත්තභාවො කථිතො?' - තාගේ පුත්‍රවූ මට්ටකුණ්ඩලී විසින් මා කෙරෙහි සිත පහදවා තමා දෙව්ලොව උපන් බව කියන ලද්දේ නොවේද? (ධ. අ. මට්ටකුණ්ඩලී)

119. නු, නොවේද? හෝ කවිද?

'ගතො නු චිත්තකූටං වා කෙලාසං වා යුගන්ධරං? - චිත්‍ර කූටයට හෝ ගියේ වේද? කෛලාශයට හෝ යුගන්ධරයට ගියේ වේද?

(ධ. අ. යමකපාටිහාරිය)

120. නමො, නමස්කාර වේවා.

'නමො තෙ පුරිසාජඤ්ඤ, නමො තෙ පුරිසුත්තම' (ථෙරගා. 629)

121. නහ, නොවේ.

'නහ නූන සො ඔරකො ධම්මවිනයො, න සා ඔරකා පබ්බජ්ජා යත්ථ ............... විපස්සී කුමාරො ........... පබ්බජිතො' - යම් සස්නක විදර්ශි කුමාරයා පැවිදි වී නම් එය ලාමක ධර්මයක් විය නොහැක: එය ලාමක පැවිද්දක් විය නොහැක. (දීඝ මහාපදන)

122. නාම, නම්: වනාහි: ඒකාන්තයෙන්

'පමත්තස්ස ච නාම චත්තාරො අපායා සකගෙහසදිසා'

(ධ. අ. චක්ඛුපාල)

123. නූන, ඒකාන්තයෙන්.

'එතාසං නූන භන්තෙ සමාධිභාවනානං සච්ඡිකිරියාහෙතු භික්ඛු භගවති බ්‍රහ්මචරියං චරන්ති?' - සවාමීනි: මේ සමාධිභාවනාවන් ඒකාන්තයෙන් ප්‍රත්‍යක්‍ෂකිරීම පිණිස භික්‍ෂූහු භාග්‍යවතුන් වෙත බඹසරෙහි හැසිරෙත්ද? (දී. අ. 155)

124. නිච්චං, නිතර.

'නිච්චං ආරද්ධවිරියෙහි පණ්ඩිතෙහි සහා වසෙ.' - නිතර ආරම්භකළ වීර්‍ය ඇති පණ්ඩිතයන් හා වසන්නේය. (ථෙරගා. 148)

125. නො, න-නිපාතය හා සමානයි. (නු-නිපාතය ද ඇතැම් විට නො යි යොදා තිබෙනු පෙනේ)

'වුද්ධි යෙව ආනන්ද වජ්ජීනං පාටිකංඛා නො පරිහානි' - ආනන්දය, (ඒතාක්) වජ්ජීන්ට අභිවෘද්ධියක්ම බලාපොරොත්තු විය යුතුය. පිරිහීමක් බලාපොරොත්තු නොවිය යුතුය. (දී. මහා පරිනිබ්බාණ)

126. පගෙව, කලින්ම: පළමුවෙන්: කියනු කිම?

A. 'සෙට්ඨිධීතා පි'ස්ස පගෙව සඤ්ඤං අදසි' = සිටුදුවණිය කල් ඇතිවම ඔහුට දැනුම්දුණි. (අං. අටුවා)

B. 'මනසිකාතුම්පි මෙ එසා භික්ඛවෙ දිසා න ඵාසු හොති, පගෙව ගන්තුං' = මහණෙනි, එවැනි (කලහකාරයන් වසන) දිසාවක් මෙනෙහිකිරීමත් මට පහසුවක් නොවේ; එවැනි දිශාවකට යාම ගැන කියනුම කිම? (අං.i, 327)

127. පගෙවතරං, ඉතාම කලින්.

'ආයස්මා අනුරුද්ධො පගෙවතරං ආගච්ඡෙය්‍ය.' (ම. iii. 145)

128. පච්ඡතො, පස්සෙන්

A' 'සුජාතාපි යානකං පහාය........... පරිදෙවමානා පච්ඡතො පච්ඡතො ආගමාසි.' (ජා. ii. 123)

B. ' න පච්ඡතො ගච්ඡන්තො පුරතො ගච්ඡන්තස්ස අගිලා නස්ස ධම්මං දෙසෙස්සාමීති සික්ඛා කරණීයා.' = පස්සෙන් යන්නේ ඉදිරියෙහි ගමන් කරන නොගිලනාට දහම් නොදෙසන්නෙමි යන ශික්ෂාව පිළිපැදිය යුතුයි. (පාතිමොක්ඛ)

129. පච්ඡා, පසුව

A. ' සො පච්ඡා පබ්බජිත්වාන දුතියො හෙස්සති සාවකො'

(මහාමොග්ගල්ලාන අපදාන)

B. පච්ඡානිපාතී, පසුව නින්දට යන්නා.

C. පච්ඡාබාහං, අත් පිටිපසට තබා (බැඳ)

C. පච්ඡාභත්තං, පසුබත් කාලයෙහි; භවස්වරුවේ

E. පච්ඡාසමණ, පස්සෙන් යන ශ්‍රමණයා; අතවැසි පැවිද්ද

130. පටිගච්චෙ'ව කලින්ම; කල් ඇතුවම.

'අථ ඛො යසො කුලපුත්තො පටිගච්චෙ'ව පබුජ්ඣිත්වා අද්දස සකං පරිජනං සුපන්තං.' = ඉක්බිති යශකුලපුත්‍රයා කල් ඇතිව නැගිට නිදන්නාවූ සිය පිරිස දැක්කේය. (විනය මහාවග්ග)

131. පන, වනාහි, (පදපූරණයෙහි)

අථ ච පන, තවද වනාහි; එසේ වුවත්

වා පන, හෝ නොහොත්

A. 'තස්මිං ඛො පන සමයෙන......... කොසම්බියං තයො සෙට්ඨිනො හොන්ති' (ධ. අ. i. 203)

B. අඵ ච පන පෙතානං කාලකතානං දක්ඛිණං අනුප්පදස්සාමීති.'
= 'තවද මෙලොවින් චුතව පරලොව ගියවුන්ට පින් දෙන්නෙමියි.'
(දී.iii.189)

132. පභුති, පටන්. තතො පභුති, එතැන් පටන්

'සො පුනදිවසතො පභුති උපසඞ්කමන්තස්ස ථෙරස්ස උපසමං දිස්වා භීයොසොමත්තාය පසීදිත්වා ථෙරං නිච්චකාලං අත්තනො ඝරෙ හත්තවිස්සග්ග කරණත්ථාය යාචි' = හෙතෙම පසුදු පටන් එළඹෙන තෙරුන්ගේ සංයමය දැක වැඩි දුරටත් පැහැදී සැමද තමාගේ ගෙයි දන් වැලදීමට තෙරුන්ට ආරාධනා කෙළේය. (විනය අටුවා)

133. පාතු, ඉදිරියෙහි: ප්‍රකට. (සමාසයෙහි ම දක්නා ලැබේ)

'බ්‍රහ්මුනො හෙ' තං පුබ්බනිමිත්තං පාතුභාවාය යදිදං ආලොකො සඤ්ජායති, ඔභාසො පාතුභවති.' - යම් මේ ආලෝකයක් හටගනී, එළියක් පහල වේ ද, එය බ්‍රහමයාගේ පහළවීමට පෙරනිමිත්තකි. (දී. ජනවසභ)

134. පාතො, උදැසන: උදැසන්හි

'සායං සායමාසාය, පාතො පාතරාසාය ගාම-නිගම-රාජධානියො ඔසරන්ති.' - හවස හවස්බත පිණිසද උදැසන්හි පෙරවරු බත පිණිසද ගම්-නියම්ගම්-රාජධානිවලට ඇතුල් වෙත්. (දී. අග්ගඤ්ඤ)

135. පුථු, වෙන්ව: වෙන්වූ: පතළ වූ: බොහෝ වූ

A. 'එවං පියො පුථු අත්ත පරෙසං' (දෙවතා සං)

මෙසේ එක් එක් අයට අයිති ආත්මය අන්‍යයන්ට ප්‍රියවේ.

B. පුථුභූත, පතළාවූ: පැතිරගිය

C. පුථුදිසා, වෙනස් දිශාවෝ

D. 'තෙන ඛො පන සමයෙන සිගාලකො ගහපතිපුත්තො කාලස්සෙ'ව වුට්ඨාය..... පුථුදිසා නමස්සති.'
- එකල වනාහි සිගාලක ගෘහපති පුත්‍ර තෙමේ කලින්ම නැගිට.......... නානාදිශාවන්ට වඳියි. (දී. සිගාලෝවාද)

136. පුන, පුනො, නැවත

'සබ්බෙ මච්ඡෙ ඛාදිත්වා පුනා'ගන්ත්වා එකමච්ඡම්පි නාද්දස.'
(බක ජාතක)

137. පුනප්පුනං දනපති දදිත්වා පුනප්පුනං සග්ගමුපෙන්ති ඨානං'
(සං. ස, 175)

(පුනප්පුන යන්න සඳහා මීට පහළින් උදහරණය බැලිය යුතු)

138. පුරතො, ඉදිරියෙන්: ඉදිරියෙහි

'ඉමානි ඵලානි අගාන්ත්වා මය්හං පුරතො පතන්ති: 'අත්ථි පන උපරි ලුද්දකො' ති පුනප්පුනං උල්ලොකෙන්තො ලුද්දකං දිස්වා අපසක්කන්තො විය හුත්වා................ ඉමං ගාථමාහ.' (කුරුඞ්ගමිගජා)

139. පුරත්ථ තො, ඉදිරියෙහි: නැගෙනහිරින්

'එස භික්ඛු මහාරාජ, පණ්ඩවස්ස පුරත්ථතො
නිසින්නො ව්‍යග්ඝුසභො'ව සීහො'ව ගිරිගබ්භරෙ.' (සුත්තනි ගා. 416)

'මහරජ, ඒ භික්ෂුනම පාණ්ඩවපර්වතය ඉදිරියෙහි උතුම් ව්‍යාඝ්‍රයකු මෙන් හෝ ගිරිගුහාවක සිංහයකු මෙන් වැඩහුන්න්ය.'

140. පුරත්ථං, ඉදිරියෙහි: ඉදිරිය: අභිමුඛය

'න තස්ස පච්ඡා, න පුරත්ථ මත්ථි,
සන්තො විධූමො අනිඝො නිරාසො' (සං. ස, 14)

ඔහුට පස්සක් නැත, ඉදිරියක් නැත: හෙතෙම ශාන්තය, වෙෂ ධූමය නැත්තෙකි, විපත් නැත්තෙකි, ආශා නැත්තෙකි.

141. පුරත්ථා, නැගෙනහිර: ඉදිරියෙහි: පෙරදී.

A. 'පුරෙ පුරත්ථා පුරිමාසු ජාතිසු
මනුස්සභූතො බහුනං සුඛාවහො.' (දී. ලක්ඛණ සුත්ත)

පෙර පූර්ව ජාතිවලදී මිනිසෙක් වූයේ බොහෝ දෙනට සැප ගෙන දෙන්නෙක් විය.

B. 'එසො මහාරාජ, භගවා මජ්ඣිමං ථම්භං නිස්සාය පුරත්ථාභිමුඛො නිසින්නො, පුරක්ඛතො භික්ඛුසංඝස්ස.' -'මහරජ, මේ මැද ටැඹ ආශ්‍රයකොට නැගෙනහිරට මූණලා භික්ෂු සමූහයා විසින් පෙරටු කරන ලදුව වැඩහිඳින්නේ භාග්‍යවතුන් වහන්සේය.' (දී. සාමඤ්ඤඵල.)

142. පුරා, පූර්වයේදී: (ඊට) පෙර

A. පුරා ආගච්ඡතෙ එතං අනාගතං මහබ්භයං
සුබ්බචා හොථ සඛිලා අඤ්ඤමඤ්ඤං සගාරවා' (ථෙරගාථා 978)

මේ මහත් භය පැමිණෙන්ට පෙර සුවචයෝ, මෘදු වචනැත්තෝ, ඔවුනොවුන්ට ගෞරව කරන්නෝ වෙත්වා.

B. 'තං තං කාරණමාගම්ම දෙසිතානි ජුතීමතා
අපණ්ණකාදිනී පුරා ජාතකානි මහෙසිනා.' - ද්‍යුතිමත් මහාර්ෂීන් වහන්සේ විසින් ඒ ඒ කාරණය නිමිතිකොට පූර්වයේදී අපණ්ණකාදී ජාතකයෝ දෙසන ලදහ. (ජාතක නිදන)

143. a. පුරෙ, පෙර, පූර්වයේදී

''සුඛජීවිනෝ පුරෙ ආසුං භික්ඛු ගොතමසාවකා' (සං. සල 61)

B. පුරෙතරං, කලින්ම: ඊට පළමුවෙන්ම

'ථෙරෙහි පුරෙතරමෙව එකපසෙසන ගන්ත්වා සිරිවඩ්ඪකසස නිවෙසනවාරෙ අට්ඨාසි.' (ධ. අ. අග්ගසාවක)

144. බහි, පිටත

'තසස බහි නිකඛමණං වාරෙතුං සබ්බොගෙහපරිජනො............ වාරානි ඵකෙත්වා බහි ගෙහං පරිවාරෙත්වා රකඛනෙතා අච්ඡති.' = ඔහුගේ පිටත නික්මීම වැළැක්වීම පිණිස ගෙයි වැසි සියලු දෙන දොරවල් වසා පිටතින් ගෙය පිරිවරාගෙන රකිමින් සිටියි. (ධ. අ. චූළසුරික)

145. බහිධා, පිටත

'ඉතො බහිධා සමණොපි නත්ථි.' (දී. මහාපරිනි)

146. භණෙ. තමාට වඩා පහත් අයට ආමන්ත්‍රණයේදී යොදන නිපාතයකි.

'භද්‍ර භණෙ උපාලි, නිවත්තස්සු: අලං තෙ එත්තකං ජීවිකාය' = එම්බා උපාලි, දැන් තෝ නවතුව: මෙතෙක් දෙය තාගේ ජීවිකාවට ප්‍රමාණවත් වේ. (ධ. අ. දෙවදත්ත)

147. භනෙත, ස්වාමීනි

'භනෙත තුම්හාකං යං යං ඉච්ඡති තං තං ගහෙත්වා පරිභුඤ්ජථ,' (ධ. අ. ස, 292)

148. භීයොසො , භීයො, බොහෝසේ: වඩ වඩා

'තානි මෙ ගණ්හනෙතිසු තෙසු ආඝතො නාම නාහොසි: චිත්තං භීයො භීයො පසිදී යෙව.' = ඒවා ඔවුන් ගන්නාකල්හි මට කෝපයක් නූපන්නේය: සිත වඩවඩා පැහැදුණේය (ධ. අ. සඩ, 206)

149. භීයොසොමත්තාය, අතිශයින්: වඩවඩා

උදහරණයක් සඳහා අඩික 132 බැලිය යුතු.

150. භූතපුබ්බං, පෙර: අතීතයේදී

'භූතපුබ්බං භිකඛවෙ දෙවාසුරසංගාමො සමුපබ්බූළ්හො අහොසි.' - මහණෙනි පූර්වයේදී දෙවියන් හා අසුරයන් අතර යුද්ධයක් පටන්ගන්නා ලද්දේ විය. (ස ස, 221)

151. හො, එම්බා: පින්වත්නි. (සමානයන්ට ආමන්ත්‍රණ යෙහි වේ: ඇතැම්විට උසස් අයට ආමන්ත්‍රණයෙහිත් පෙනේ. මෙය බහුලව යෙදී තිබෙන්නකි)

A. 'හො චොරා තුම්හෙ මං කිමත්‍ථාය ගණ්හථ? (වේදබ්භ ජා.)

B. 'හො, අහං දෙවතාය ආයාචමානො: යෙ මය්හං රජ්ජෙ පාණාතිපාතිදීනි........ සමාදියා වත්තිස්සන්ති, තෙ ගහෙත්වා......... බලිකම්මං කරිස්සාමීති ආයාචිං.' (මෙහි රජකු විසින් තමාගේ රටවැසියන්ට ආමන්ත්‍රණය සඳහා මෙය යොද තිබේ.) (දුම්මෙධ ජා.)

152. මඞ්කු, මකු, කථානැති: හැකුළුණු.

A. 'මා ඛො මඞ්කු අහොසි.' = කතා නැත්තෙක් නොවෙව.

(විනය මහා වග්ග)

B. ' න තෙන මඞ්කු හොතබ්බං' = ඒ කරණ කොට හැකුළුණකු නොවිය යුතුය. (සංගස, 201)

153. මනං, ටිකක්: යන්තම්

A. 'මනං වත දෙවදත්තෙන එවං උපනිස්සයසම්පන්නො කුමාරකස්සපො ථෙරී ච නාසිතා' =තව ටිකකට දෙවදත්තයන් විසින් මෙසේ හේතු සම්පත් ඇති කුමාර කාශ්‍යප 'තෙමේත් (මව වූ) සථවිරියත් නසනලද්දහ. (ධ. අ. දදද. 147)

B. අතිපණ්ඩිතෙන පුත්තෙන මන'ම්හි උපකූලිතො' (කුටවාණිජ ජා.) අතිපණ්ඩිත පුත්‍රයා නිසා මම තරමක් දැවී හැකුළුනේ වෙමි.

154. මා, ප්‍රතිෂෙධයෙහි: වැළැක්වීවෙහි.

'මා හෙව ඛො විපස්සී කුමාරො ආගාරස්මා අනගාරියං පබ්බජී.' = විදර්ශී කුමාරයා ගිහිගෙන් නික්ම අනගාරිකව පැවිදි නොවේවා.

(දීඝ. මහාපදාන)

මා යෝගයේදී අතීත ක්‍රියාව යෙදෙන සැටි මින් පෙර දක්වන ලදී. (අංක 109 බලනු)

155. මිච්ඡා, වැරදිසේ: මිථ්‍යාව: අසත්‍යය.

A. මිච්ඡා පණිහිතං චිත්තං පාපියො නං තතො කරෙ'

(ධම්මපද ගා. 43)

වැරදිසේ පිහිටෙව් සිත ඔහු වඩා පාපියකු කරයි.

B. 'යථා නෙමිත්තිකානං බ්‍රාහ්මණානං මිච්ඡා අස්ස වචනං' = නිමිති කියන බමුණන්ගේ වචනය යම්සේ බොරු වන්නේද, එසේ.

(දී. සසග 28)

156. මිථු, එකිනෙකා: අන්‍යොන්‍යවශයෙන්.

'තෙ වාදකාමා පරිසං විගය්හ
බාලං දහන්ති මිථු අඤ්ඤමඤ්ඤං.' (සුත්තනි 825)

වාද කැමති වූ ඔවුහු පිරිසට බැසගෙන (හෙවත් පිරිස මැදට අවුත්) එකිනෙකාට අඥනයා' යි කියත්.

157. මුධා, නිකමට: නොමිලයේ

'රාජා: පඤ්චසතානි දත්වා ගණ්හන්තු'ති භේරිං චාරපෙත්වා කිඤ්ච ගණ්හකං අදිස්වා..... මුධාපි ගණ්හන්තු'ති භෙරිං චරාපෙසි.' (ධ. අ. iii" 108)

158. මුසා, බොරුව: අසත්‍යය: බොරුවූ

A. 'මුසා තං සාමි, තුච්ඡාව වාචියො' (ධ. අ. ගරහදින්න)

B. 'මුසා න භාසෙ, නච මජ්ජපො සියා.' (අං.iii, 214)

159. මුහුං, වහවහා

'නහ නූන දුබ්භිස්සසි මං පුනප්පුනං,
මුහුං මුහුං වාරණිකං ච දස්සයං' (ථෙරගා. 1129)

'වහවහා ගමන් කරවන චිත්‍රයක් දක්වන්නෙක්මෙන් නැවත නැවත මට ද්‍රෝහ නොකරව.'

160. යග්ඝෙ, කාරණයක් දැන්වීම සඳහා තමාට වඩා උසස් අයට ආමන්ත්‍රණයෙහි පෙනේ.

'යග්ඝෙ'යෘ ජානෙය්‍යාසි: අය්‍යපුත්තො රට්ඨපුත්තො රට්ඨපාලො අනුප්පත්තොති.' - ආයසීාවනි, දන්නෙහිද? ස්වාමිපුත්‍ර වූ රට්ඨපාල තෙමේ මෙහි පැමිණියේය. (ම. රට්ඨපාල)

161. යතො, යම්හෙයකින්: යමකින්: යම් ආකාරයකින්: යම් කලක පටන්.

A. 'යතො යතො සම්මසති ඛන්ධානං උදයබ්බයං' -ස්කන්ධයන්ගේ හටගැන්ම හා විනාශය යම් යම් ආකාරයකින් විමසා බලන්නේද (ඒ ඒ ආකාරයෙන්.........) (ධම්ම 347)

162. යථා, යම්සේ

A. 'යථා අගාරං දුච්ඡන්නං වුට්ඨී සමතිවිජ්ඣති.' (ධම්ම 13)

යම්සේ නොමනාකොට සෙවිලි කළ ගෙය වැස්ස තෙමාද එසේ රාගතෙමේ නොවැඩූ සිත විනිවිද යයි හෙවත් මැඩ පවත්වයි.

සමාසයේදී:-

B. යථාකාමං, යථාරුචිං, කැමති සේ.

C. යථාතථං යථාභූතං, ඇතිසැටියේ: තත්වූ පරිදි

D. යථාධම්මං, ධර්මයට එකඟසේ.

E. යථාබලං, ශක්තිය ඇතිසේ.

F. යථාසකං, තමතමා අයත්.

G. යථාසුඛං, සැපසේ.

163. යදි, ඉදින්: නම්

'යදි පන මෙ පරාජයො භවෙය්‍ය, මතං මෙ ජීවිතා සෙය්‍යො.'

(ගුත්තිල විමාන ව.)

164. යදිදං, පහත දැක්වෙනසේ, යම් මේ: නම් වශයෙන්,

'එකායනො අයං භික්ඛවෙ මග්ගො සත්තානං විසුද්ධියා...... යදිදං චත්තාරො සතිපට්ඨානා' - මහණෙනි, මේ සතරසතිපට්ඨාන යෝය යන යමක් වේද එය සත්වයන්ගේ ශුද්ධිය පිණිස පවත්නා එකම මාර්ගයයි.

(දී. සස, 290)

165. යං නූන, එසේ වූවොත් යෙහෙකි.

යං නූනා'හං සයමෙව එකං කුමාරිකං ආනෙය්‍යං' - මම තෙමේම ගොස් එක් කුමරියක් ගෙනෙන්නෙම් නම් යෙහෙකි. (ධ. අ. කාළියක්ඛිනී)

166. යාව, යම්තාක්: යම්පමණ

'අත්ථි කොචි තෙවිජ්ජකානං බ්‍රාහ්මණානං යාව සත්තමා ආචරිය මහයුගා යෙන බ්‍රහ්මා සක්ඛි දිට්ඨො' - ත්‍රිවිද්‍යා ඇති බ්‍රාහ්මණයන්ගේ සත්වෙනි ආචාර්යපරම්පරාව දක්වාත් බ්‍රහ්මයා ප්‍රත්‍යක්ෂයෙන් දුටු කිසිවෙක් ඇත්තේද? (දී. ස, 238)

167. යාව කීවඤ්ච, යම්තාක් කල්

'යාවකීවඤ්ච භික්ඛවෙ භික්ඛූ අභිණ්හසන්නිපාතා සන්නිපාත බහුලා භවිස්සන්ති, වුඩ්ඪි යෙව භික්ඛූනං පාටිකංඛා, නො පරිහානි.' - මහණෙනි යම්තාක් කල් භික්ෂූහු නිතර රැස්වීම් ඇත්තෝ බහුල රැස්වීම් ඇත්තෝ වෙත් ද එතාක් කල් භික්ෂූන්ගේ අභිවෘධියක්ම බලාපොරොත්තු විය යුතුය, පිරිහීමක් නොවිය යුතුය. (දී. මහාපරිනි)

168. යාවදෙව, සඳහා පමණක්.

'පටිසංඛා යොනිසො චීවරං පටිසෙවාමි: යාවදෙව සීතස්ස පටිඝාතාය, උණ්හස්ස පටිඝාතාය.' (=සිත නැසීම සඳහා උෂ්ණය නැසීම සඳහා පමණක් යයි නුවණින් සලකා බලා සිවුර අඳිමි).

169. යාවතා, යම් පමණ; යම්තාක්; ඒතිසා

A. 'න තෙන පණ්ඩිතො හොති යාවතා බහු භාසති' = බොහෝ දේ කී පමණින් පණ්ඩිතයෙක් නොවේ. (ධම්මපද 258)

B. 'යාවතා, චුන්දි සත්තා අපද වා දිපද වා චතුප්පද වා බහුප්පද වා.........තථාගතො තෙසං අග්ගමක්ඛායති' = චුන්දි කුමරිය, පානැත්තාවූ හෝ දෙපාඇත්තාවූ හෝ සිවුපා ඇත්තාවූ හෝ බොහෝ පා ඇත්තාවූ හෝ යම් පමණ සත්වයෝ වෙත්ද ඒ සියල්ලන්ට තථාගත තෙමේ ශ්‍රෙෂ්ඨයයි කියනු ලැබේ. (අං iii, 35)

C. යාවතායුකං, ආයුෂ ඇතියාක්

D. යාවදිච්ඡකං, කැමතිතාක්

170. යෙභුය්‍යෙන, බොහෝ සේ

'අථ කො තෙ භික්ඛවේ භික්ඛූ යෙභුය්‍යෙන එකාහෙනෙ'ව ජනපදචාරිකං පක්කමිංසු' (දී. මහාපදාන)

171. රහො, රහසෙහි; රහසින්; රහස

A. නත්ථි ලොකෙ රහො නාම පාපකම්මං පකුබ්බතො

= ලෝකයෙහි පව්කම් කරන්නහුට රහසක් නැත. (අ. ස, 149)

B. 'මා කාසි පාපකං කම්මං ආවී වා යදිවාරහො.' (ථෙරී ගා. 247)

ප්‍රකට ලෙස හෝ රහසිගතව පව් නොකරව.

172. රෙ, පහත් අයට නිතද සහගතආමන්ත්‍රණයෙහි වේ.

'එහි රෙ දස කිං අකෙකාසසීති අකඩ්ඪිත්වා...... තං ඨානං භින්දපෙත්වා .......... ධනං ආහර' = 'බොල නීචදසය කුමක්හෙයින් ආක්‍රොශ කෙරෙහිදැ' යි කියමින් ඔහු ඇද දමා එතැන සාරවා ධනය ගෙනෙව. (නන්දජාතක)

173. ලබ්භා, ලැබේ ද? ලැබිය හැකිද?

උදහරණ මින් පෙර දක්වන ලදී.

174. ලාභා, එය ලාබයකි

'ලාභා තෙ මහාරාජ, සුලද්ධං තෙ මහාරාජ යස්ස තෙ කුලෙ එවරූපො පුත්තො උප්පන්නො' - මහරජ යම් බඳුවූ ඔබගේ කුලයෙහි මෙබඳු පුත්‍රයෙක් උපන්නේ ද ඒ ඔබට ලාභයකි: ඔබට මනා ලැබීමකි. (දී. සස, 10)

175. වත, ඒකාන්තයෙන්

'ලාභා, වත නො අනප්පකා,

'යෙ මයං භගවන්තං අද්දසාම' = යම්බඳුවූ අපි භාග්‍යවතුන් වහන්සේ දකිමුද ඒ අපට ඒකාන්තයෙන් ලාභයකි. (සුත්තනි භා 31)

176. වා, හෝ: නොහොත්

'ඉධ පන මාණව, එකච්චො ඉත්ථී වා පුරිසො වා සත්තානං විහෙඨනජාතිකො හොති පාණිනා වා ලෙඩ්ඩුනා වා දණ්ඩෙන වා' = මානවකය මෙලොව යම්කිසි ස්ත්‍රියක් හෝ පුරුෂයෙක් හෝ අතින් හෝ මැටිකැට ආදියෙන් හෝ දණ්ඩකින් හෝ සත්වයන්ට හිංසා කරන ස්වභාව ඇත්තේ වේ. ( ම iii, 204 කම්මවිභඩ්ග)

177. විනා, වෙන්ව, නැතිව: හැර

A. 'කොකාලිකො සාරිපුත්ත-මොග්ගල්ලානෙහි සහාපි විනාපි වත්තිතුං න සක්කොති.' =කොකාලික තෙමේ සැරියුත් මුගලන් දෙනම ඇතිවත් නැතිවත් පවතින්ට අසමර්ථවේ. (ව්‍යග්ඝ ජාතක)

B. 'ථෙරො....... සකලරාජකුලං සත්ථු දස්සනං විනා යෙව සත්ථරි සඤ්ජාතප්පසාදං අකාසි. (ජාතක නිදන)

178. විය, මෙන්: සේ

'එකමෙකොව මච්චානං ගො වජ්ඣො විය නීයති' - මාරයා විසින් මිනිසුන් අතරෙන් එක එකා මැරියයුතු ගවයකු (ගෝඝාතකයා ගෙනයන්නා) සේ ගෙනයනු ලැබේ. (සුත්ත නි. ගා. 580)

179. වෙ, ඒකාන්තයෙන්

'තං වෙ පසහති මාරො වාතො රුක්ඛං'ව දුබ්බලං' (ධම්ම ගා. 7)

180. සකිං එක්වරක්, සකිදෙව, එක්වරක් පමණක්

'යං නූන............. ද්වෙචත්තාරීසං ඡච්චත්තාරීසං නාග සහස්සානි සකිං, සකිං උපට්ඨානං ආගච්ඡෙය්‍යුං' - සතළිස් දෙදහසක් (බැගින්)

ඇත්තු වරක් වරක් (වෙන් වශයෙන්) උපසථානයට එන්නාහු නම් යෙහෙකි) (දී. මහාසුද)

181. සක්කා, හැකිය.

'සක්කා නු බො භන්තෙ, එවමෙව දිටෙඨව ධම්මෙ සන්දිට්ඨිකං සාමඤ්ඤඵලං පඤ්ඤාපෙතුංති?' =ස්වාමීනි, එපරිද්දෙන්ම මෙලොවදි තමා විසින්ම දැක්ක හැකිසේ ශ්‍රමණභාවයාගේ ඵලය පෙන්විය හැකි ද? (අ. සාමඤ්ඤඵල)

182. සක්ඛි, ප්‍රත්‍යක්‍ෂලෙස: තමා විසින්ම

'තං මෙ ඉදං භන්තෙ සක්ඛි දිටඨං.' =ස්වාමීනි, 'මෙය මා විසින් ප්‍රත්‍යක්‍ෂ ලෙස දක්නා ලදී. (දී. ii, 271)

183. සචේ, ඉදින්

'සචෙ, අයයා ඉමං තෙමාසං ඉධ වසිස්සන්ති, අහං............ උපොසථකම්මං කරිස්සාමි.' (ධ.අ. i 290)

184. සජ්ජු, එකෙණෙහි: වහා

'න හි පාපං කතං කම්මං සජ්ජු ඛීරං ව මුච්චති' =කළාවූ පාපකර්මය වහා විපාක නොදේ: (කුමක් මෙන්ද යත්) දෙවගත් කෙණෙහි කිරි නොමිදෙන්නාක් මෙනි.) (ධම්ම ගාග 71)

185. සතතං, නිරන්තරයෙන්: නිතර

'රත්තින්දිවං සතතං අප්පමත්තො' (සුත්තනි. ගා. 507)

186. සනිකං, හෙමින්

'අථ නං කම්භිං ඔරොපෙත්වා උබ්භින්දිත්වා මුඛං විවරිත්වා සනිකං නිල්ලොකෙම' = ඉක්බිති ඒ සැලිය බිමට බා උඩ කොටස බිඳ මුඛය විවෘත කොට හෙමින් බලමු. (දී. ii, පයාසිරා)

187. සමන්තා, හාත්පස: හාත්පසින්: නිතර

'දුවග්ගි.................. තස්ස පදෙසස්ස සමන්තා සොළසකරීමත්ත ට්ඨානං පාපුණි.' = ලැව්ගින්න ඒ පෙදෙස හාත්පසින් 16 කිරියක් පමණ තැනට පැමිණියේය. (වට්ටක ජා.)

188. සමිතං, නිරන්තරයෙන්: නිතර

'චරෙතො ච මෙ තිට්ඨතො ච සුත්තස්ස ච ජාගරස්ස ච සතතං

සම්මතං සුඤ්ඤදස්සනං පච්චුපට්ඨිතං.' - ඇවිදින්නාවූ ද සිටින්නාවූ ද නිදන්නාවූ ද පිබිදෙන්නාවූ ද මට නිරතුරුවම ඥාන දර්ශනය එළඹ සිටියේය. (ම. i, 93)

189. සම්පති, දැන්
'සම්පති, ජාතො බොධිසත්තො සමෙහි පාදෙහි පතිට්ඨහිත්වා උත්තරාභිමුඛො සත්තපදවීතිහාරෙන ගච්ඡති. = දැන් උපන් (-උපන් සැටියේ) බෝසත් තෙමේ සමපාවලින් බිම පිහිටා උතුරට අභිමුඛව සත්පියවරක් නැගිමෙන් යයි. (දී. මහාපදාන)

190. සම්ම, මිත්‍රය

'ආම සම්මා, ඉදනා'හං විහාරං ගන්ත්වා ථෙරං තයා කතපණ්ණ සාලාය නිසින්නං දිස්වා ආගතොම්හි.' (ධ. අ. චක්ඛුපාල)

191. සම්මා, මනාසේ: යහපත්: නිවැරදි.
A' බ්‍රාහ්මණොස්මීති ච වදමානො සම්මා වදෙය්‍ය: න ච පන මුසාවාදං ආපජ්ජෙය්‍ය.' - 'මම බමුණෙක් වමි' යි කියන්නාවූ හෙතෙම මනාසේ (හෙවත් නිවැරදිසේ) කියන්නේය. (දී. සග 123)
B. සම්මාදිට්ඨි. නිවැරදි දෘෂ්ටිය
C. සම්මාවාචා, සතය වචනය

192. සයං, තෙමේ: තමා විසින්:
'සයමෙව ඔදනං සාධයාමි = මම ම ආහාර සම්පාදනය කරමි:
'සයමෙව භාජනං ධොවං' = මම ම භාජන සේදුවෙමි.
(ථෙරී ගා. 412)

193. සසක්කං, ඒකාන්තයෙන්.
'එවරූපං තෙ රාහුල, කායෙන කම්මං සසක්කං න කරණීයං' - රාහුල, තා විසින් ශරීරය මුල්කොට ගෙන මෙවැනි ක්‍රියාවක් ඒකාන්තයෙන් නොකට යුතුයි. (ම.ස, 415)

194. සහ, සමග (මෙය සම්බන්ධ කරන වචනයට මුලින් යොදනු ලැබේ)
A. 'සහ පටිසම්භිදාහි අරහත්තං පාපුණි.'
B. සහ භණ්ඩකෙන චොරං චූළාය ගණ්හන්ති විය (ධ. අ.)

ඇතැම් තැනක එකෙණෙහි යන අර්ථය ගෙනදේ-

'සහ සච්චෙ කතෙ මය්හං මහා පජ්ජලිතො සිඛී

වජ්ජෙසි සොළස කරීසානි උදකං පත්වා යථා සිඛී.' - මා සත්‍යක්‍රියා කළ කෙණෙහි මහත් ව දැල්වෙන ගින්න ජලයක් සමීපයට පැමිණි ගින්නක් සේ සොළොස් කිරියක් පමණ තැන අත්හැරියේය. (වට්ටක ජා)

සහගත සහජාත ආදියෙහි උපසර්ගයක් වශයෙන්ද යෙදී තිබෙන බව පෙනේ.

195. සහසා, හදිස්සියෙන්: බලාපොරොත්තු නැතිව: බලාත්කාරයෙන්

A. 'භූතපුබ්බං භික්ඛවෙ සකුණග්ඝි ලාපං සකුණං සහසා අජ්ඣප්පත්තා අග්ගහෙසි.' -මහණෙනි, පූර්වයෙහි එක් උකුස්සෙක් වහා මැඩගෙන අවුත් කැටකුරුල්ලකු අල්වා ගත්තේය. (i. v. 146)

B. සහසා කරොන්තානං අසඤ්ඤතානං

න හ නූන අත්ථි පටිසෙධිතාරො' (ජා. මණිචොර)

බලාත්කරයෙන් ක්‍රියා කරන්නා වූ නොහික්මුණවුන් වළක් වන්නෝ ඒකාන්තයෙන් නැත්තාහ.

196. සාධු, මනාසේ: යෙහෙකි: හොඳයි: යහපති.

A. සාධු ඛො සම්ම සාරථි, පබ්බජිතො නාම, සාධු සමචරියා: සාධු පුඤ්ඤකිරියා' - මිත්‍ර රථාචාරිය, පැවිද්ද නම් යහපති: සමහැරීම යහපති: පින් කිරීම යෙහෙකි (දී. මහාපදන)

B. ' සා සාධු දෙවාති වුත්තනයෙනෙව තං සබ්බං කත්වා'

(ධ. අ. iii. 13)

197. සාමං, තෙමේ: තමා විසින්

'ඉදං මෙ භන්තෙ නවං දුස්සයුගං භගවන්තං උද්දිස්ස සාමං කන්තං සාමං වායිතං' - සවාමීනි, මේ අලුත් වස්ත්‍ර ජෝඩුව මා විසින් භාග්‍යවතුන් වහන්සේ උදෙසා තමා විසින් ම කටින ලදී, තමා විසින්ම වියන ලදී. (ම. iii, 253)

198. සායං, හවස: සවස්හි

'අථ'ස්ස සායම්පි පුනදිවසෙපි මධුරභත්තං පචිත්වා අදසි'

(කුම්භඝෝසක ධ. අ.)

199. සාහු, සාධු හා සමානයි

අප්පස්මිං පි සාහු දනං: අපි ච සද්ධාය පි සාහු දනං' - ස්වල්ප

දෙයක් ඇති කල්හි දිමත් යෙහෙකි: තවද ශ්‍රද්ධාවෙන් දීමත් යෙහෙකි. (දෙවතාසං)

200. සු, ප්‍රශ්න කිරීමෙහි යොදනු ලැබේ. නොයෙක්විට ප්‍රශ්නාර්ථවත් සර්වනාමයන් හා සම්බන්ධව පෙනේ.

'එවං සු තෙ, ප්‍රශ්න කිරීමෙහි යොදනු ලැබේ. නොයෙක්විට ප්‍රශ්නාර්ථවත් සර්වනාමයන් සම්බන්ධව පෙනේ.

'එවං සු තෙ, භගවන්තො සඩ්ගම්ම සමාගම්ම උන්නාදිනො ......... ............... විහරිංසු? = මෙසේ ඒ භාග්‍යවත්හු එක් තැන රැස්ව මහත් නාද ඇත්තෝව විසූහුද? (දි.iii, 54)

201. සුවිදූ, මනාසෙ: යෙහෙකි

A. 'සුවිදූ, වො කතං: තාතා, පානීයං අපිවන්තෙහි'

(නලපාන ජාතක)

B. 'සො තම්පි සුවිදූ උපධාරෙත්වා පසන්නමානසො............ මග්ගං පටිපජ්ජි.' = හෙතෙම එයත් මනාසේ සලකා බලා සතුටු සිතැත්තේ මගට බැස්සේය. (ඡත්ථි විමානවත්ථු.)

202. සුදං, පදපූරණයෙහි

'තත්‍ර සුදං ආයස්මා කුමාරකස්සපො සෙතව්‍යායං විහරති උත්තරෙන සෙතව්‍ය සිංසපාවනෙ.' = එහි වනාහි ආයුෂ්මත් කුමාර කාශ්‍යපස්ථවිරතුමා සෙතව්‍යානුවරට උතුරෙන් පිහිටි ඇට්ටේරිය වෙනෙහි වාසය කරයි. (දී. පායාසිරා.)

203. සුවෙ, සෙව, හෙට

A. 'සෙව දනි භවං පොක්ඛරසාති සමණං ගොතමං දස්සනාය උපසඩ්කමිස්සති.) (දී: i 108)

B. 'යං ච විඤ්ඤු පසංසන්ති අනුවිච්ච සුවෙ සුවෙ,
නෙක්ඛං ජම්බොනදස්සෙ'ව කො තං නින්දිතු මරහති?

= නුවණැත්තෝ දවසක් දවසක් පාසා විමසා බලා යමකුට ප්‍රශංසා කෙරෙත් නම් කවරෙක් ඔහුට නින්ද කරන්ට සුදුසු වේ ද? මෙහි (දිනක් පාසායන අර්ථය ලැබෙන බව පෙනේ.) (ධම්ම ගා. 299)

204. සෙය්‍යථාපි, යම්සේ

'වඩකමො ලොහිතෙන ඵුටො අහොසි, සෙය්‍යථාපි ගව ඝාතනා' = සොණතෙරුන්ගේ සක්මන ගවයන් මරණ තැනක් මෙන් ලෙයින් පැතුරුණේ විය. (විනය මහා වග්ග)

205. සෙය්‍යථීදං, හේ මෙසේයි:-

'සත්ථා තස්ස............. ධම්මං දෙසෙන්තො ආනුපුබ්බිකථං කථෙයි, සෙය්‍යථීදං:- දානකථං' (ධ. අ. චක්ඛුපාල)

206. හඤ්චි, ඉදින්. සචෙ නිපාතයට සමානයි. මෙය තෙ වෙනි සංගීතිකාලයේදී ඇතිවූවකි. 'හඤ්චි පුග්ගලො උපලබ්භති සච්චිකට්ඨ-පරමත්ථෙන,' = ඉදින් සත්‍යාර්ථපරමාර්ථයෙන් පුද්ගලයෙකු ලැබේනම්.
(කථාවත්ථු)

207. හම්භො, නින්දවක් හෝ විස්මයක් ප්‍රකාශ කිරීමේදී යොදන ආලපනයකි.

'හම්භො පුරිස, ඉදානි'සි කිඤ්චාපි මං විරද්ධො: අට්ඨ පන මහා නිරයෙ අවිරද්ධො යෙවා'සීති' = එම්බා පුරුෂය, දැන් මට විදිය නොහැකිව වරද්දගත්තේ වුවත් අටමහනරකයන් නො වරද්ද ගත්තේ වෙහි.
(කුරුංග මිගජා.)

208. හන්ද, වාක්‍යාරම්භයෙහි ද උත්සාහවත් කරවීමෙහි ද අනුකම්පාවෙහි ද පෙනේ. සිංහලෙහි සමානවචනයක් නොපෙනේ.

A. හන්ද කුතො නු තුම්හෙ මාරිසා ආගච්ඡථ?' = පින්වත්නි තෙපි කොයි සිට එව්ද? (බ්‍රහ්මසං)

B. හන්ද, හං හන්තෙ භගවා ගමිස්සාමි.' = ස්වාමීනි භාග්‍යවතුන් වහන්ස, දැන් මම යන්නෙමි. (ඡත්තමාණවක)

C. 'හන්ද, කුතො නු ත්වං විසාඛෙ ආගච්ඡසි දිවා දිවස්ස?' = විශාඛාවෙනි මේ මධ්‍යම දවල්හි ඔබ කොයිසිට එන්නහුද (ධ. අ.)

209. හලං, ඕනෑ නැත: ඔය පමණි

'කිච්ඡෙන මෙ අධිගතං හලං දානි පකාසිතුං' = මා විසින් මෙය දුකසේ අවබෝධ කරන ලදී. දැන් එය ප්‍රකාශ කිරීම ඕනෑ නැත.
(දී. මහාපදාන)

210. හවෙ, ඒකාන්තයෙන්.

'බාලා, හවෙ නප්පසංසන්ති දානං (ධ. අ. අසදිසදාන)

211. හා, ඛේදයකි.

' හා යෝගා විප්පයොගන්තා! හා'නිච්චං සබ්බසංඛතං!

හා ජීවිතං විනාසන්තං? ඉච්චා'සි පරිදෙවනා.' - බෙදයකි, එක් වීම් වෙන්වීම කෙළවර කොට ඇත්තාහ; සියලු ප්‍රත්‍යයනිෂ්පන්නාදෙය අනිත්‍යය, අහෝ ජීවිතය විනාශ කෙළවර කොට ඇත්තේ යයි මෙසේ වැලපීම විය. (අපදාන මහාපජාපතී)

212. හි, වනාහි එහෙයින් ඒකාන්තයෙන්

'තස්ස හි, ද්වෙ පජාපතියො, ඉමස්ස අට්ඨ; අට්ඨහි පරික්ඛිපිත්වා ගහිතො කිං කරිස්සති භන්තෙ? ති.' (ධ. චූල්ලකාළ)

213. හියෝ‍යා, හීයො, ඊයේ

'තුම්හෙ හියෝ‍යා අම්හාකං ගෙහෙ කිඤ්චි අලද්ධා යෙව ලභිම් හාති අවචුත්ථ (විනය අටුවා)

214. හුරං, පරලොව; පෙර

A. 'යෙ මෙ පුබ්බෙ වියාකංසු හුරං ගොතමසාසනා.'

=ගෞතමශාසනය පහළවන්ට පෙර මට යම්කෙනෙක් විස්තර කීවාහුද. (සුත්තනි ගා. 1084)

B. 'දෙවා මනුස්සා ඉධ වා හුරං වා
සග්ගෙසු වා සබ්බනිවෙසනෙසු.' (සං. ස, 12)

මෙලොව හෝ අන් ලොවක හෝ ස්වර්ගයන්හි හෝ අන්‍ය සත්වා වාසයන්හි හෝ දෙවියෝ ද මිනිස්සු ද

215. හුරාහුරං, එක් තැනකින් තව තැනකට; එහා මෙහා.

'සො ප්ලවති හුරාහුරං ඵලමිච්ඡං ච වනස්මි වානරො,
(ධම්ම ගා. 334)

වනයෙහි ගෙඩි කැමති වඳුරකු එහා මෙහා පනින්නාසේ හෙතෙම එහාමෙහා පනියි හෙවත් භවයෙන් භවයට යේ.

216. හෙට්ඨා, යට; යටපිහිටි

A. උපරිතො අච්චි උට්ඨහිත්වා හෙට්ඨා පටිහඤ්ඤති' - උඩින් ගිනිදැල් නැගී යට හැපේ. (දෙවදූත ම.)

B. ' සෙය්‍යථාපි පොට්ඨපාද, පුරිසො නිස්සෙණිං කරෙය්‍ය පාසා දස්ස ආරොහණාය, තස්සෙ'ව පාසාදස්ස හෙට්ඨා.' - පොට්ඨපාද, යම්සේ පුරුෂයෙක් ප්‍රාසාදයකට නැගිම සඳහා ඒ ප්‍රාසාදය යටම හිණිමගක් සාදන්නේද (දී. පොට්ඨපාදසු)

C. හෙට්ඨාභාග, යටකොටස

D. හෙට්ඨාපාදතලෙසු, යටිපතුල්වල

# උපග්‍රන්ථය

## අප්‍රකටවචන හා ගැටලුපදවලින් සමහරක් මෙහි දක්වනු ලැබේ.

1. අග්ඝිය - ආගන්තුක සත්කාරය.

(1) 'පටිග්ගහිතං යං දින්නං:
සබ්බස්ස අග්ඝියං කතං'

(සියලු දෙනාට ආගන්තුක සත්කාර කරන ලදී.)
(සොණනන්ද ජාතක)

(2) මෙයින් මල් ඇගැව හෙවත් මලින් සැරසූ කළුවක් ද කියවේ: සිඬත්ථස්ස භගවතො ලොකජෙට්ඨස්ස තාදිනො. අග්ඝියං කාරයිත්වාන ජාතිපුප්ඵෙහි ඡාදයිං' (චූළථෙරාපදාන 50)

2. අවවසරා - ඉක්මගියේය

'ඉධ භන්තෙ ද්වෙ භික්ඛූ සම්පයොජෙසුං. තත්‍රෙකො භික්ඛු අවවසරා (-ස්වාමීනි, මෙහි භික්ෂූ දෙනමක් කලහ කළහ. එයින් එක්නමක් ඉක්මවා ගියේය. හෙවත් සීමාව ඉක්ම යන වචන කීයේය.)

(සක්කසංයුත්ත)

මෙහි සම්පයොජෙසුං යන්නද අප්‍රකට එකකි.

3. අවජන්ති - හිඳිත්: වාසය කරත්.

(1) ඡබ්බග්ගියා භික්ඛූ.................. ආසනෙසු අවජන්ති.'

(විනය මහාවග්ග)

'අවජන්තීති වසන්ති.' (දික්සඟි අටුවා 631)

(2) 'යතං චරෙ යතං තිට්ඨෙ යතං අච්ඡෙ යතං සයෙ' යන අඞ්ගුත්තර ගාථාවේ අටුවාවෙහි 'අච්ඡෙති නිසීදෙයා' යි දැක්වේ. මෙහි 'යතං' යන්න යතන්ත ශබ්දයේ ප්‍රථමා එක වචන යයි. 'සංයත වූයේ' යන අර්ථ ඇත්තේයි.

අවිඡාදෙති - රුචි උපදවයි: අන්දවයි.

(1) 'තෙසං රසං පඨවිං අංගුලියා සායතං අවිඡාදෙසි (-ඇඟිල්ලෙන් රසපොළොව ආස්වාදනය කරන ඔවුන්ට රුචි ජනක විය.) (අග්ගඤ්ඤසුත්ත)

(2) 'එකමෙකං භික්ඛු පවෙචකදුස්සයුගෙන අච්ඡාදෙසි' යන තැන 'ඇන්දෙව්වේය' යන අර්ථ ඇත්තේයි.

5. **අජ්ඣප්පත්ත** - මැඩගෙන පැමිණි
'සකුණග්ඝි ලාපං සකුණං සහසා අජ්ඣප්පත්තා අග්ගහෙසි' (=උකුස්සා හදිසියෙන් මැඩගෙන පැමිණියේ කැටකුරුල්ලා අල්ලා ගත්තේය.) (සතිපට්ඨානසංයුත්ත)

6. අජද්ධුක = නිරාහාර බව.
(1) 'අහඤ්චෙ බො පන සබ්බසො අජද්ධුකං පටිජානෙය්‍යං' (=ඉදින් මම සියලු ආකාරයෙන් නිරාහාර බව ප්‍රතිඥා කෙරෙම් නම්) (මහාසච්චක සු. ම.)
(2) අජද්ධුකංති අභොජනං' (ම. අ. 466)

7. **අජ්ඣාචර** = ඉල්ලුම්කාරයා
'අජ්ඣාචරා'මිහ නන්දස්ස හොතො සන්තිකමාගතා.' (=පින්වතාගේ සමීපයට පැමිණි අපි නන්දයාගේ ඉල්ලුම් කාරයෝ හෙවත් නන්දයා වෙනුවෙන් ඉල්ලීමක් කිරීමට ආවෝ වෙමු.)

8. **අඤ්ජති** = අදී, (සමක් පළල් කිරීමට ඇදීම මෙනි.)
'කිස්ස ත්වං උදයි නිසීදනං පඤ්ඤපෙත්වා සමන්තතො සමඤ්ජසි සෙය්‍යථාපි පුරාණාසිකොට්ඨො' (=උදයි, තෝ නිසිදනය අතුරා පරණසම්කරුවෙකු මෙන් කුමකට හාත්පසින් අදින්නෙහිද?) (පාචිත්තියපාළි)

9. **අතියාතුං** = ඇතුළට යන්ට
'අතියාතුං ති බහිද්ධා ජනපදෙ චාරිකං චරිත්වා ඉච්ඡිතච්ඡි තක්ඛෙණෙ අන්තොනගරං පවිසිතුං.' (අඞ්ගුත්තර අටුවා 324)

10. **අනුධංසේති** = දුර්වලකරයි. අනුධංසෙ තීති කිලමෙති මිලාපෙති. (ම. අටුවා)

11. **අනුපඛජ්ජ** = (අන්‍යයකුට අවකාශ මද වනසේ) ඉතා ළගට පැමිණ.
'ඡබ්බග්ගියා ථෙරෙ භික්ඛූ අනුපඛජ්ජ සෙය්‍යං කප්පෙන්ති'
(=ෂඩ්වර්ගීය භික්ෂූහු සථවිර භික්ෂූන්ට ඉතා ළංව සයනය කරත්) (පාචිත්තියපාළි)

12. **අනුපහච්ච** = නො නසා; තුවාළ නො කොට.
'ඉමස්ස නාගස්ස අනුපහච්ච ඡවිං ච චම්මං ච.........
තෙජසා තෙජං පරියාදියෙය්‍යං' (= මේ නාගයා ගේ සිවිය ද සම ද තුවාල නොකොට තෙදින් තෙද ක්‍ෂය කරන්නෙමි. (මහාවග්ගපාළි)

13. **අන්නභාර**= (යවස නම්) තෘණ ගෙනයන්නා.
'අන්නං වුච්චති යවසං, තං භාරො එතෙසංති අන්නභාරා යාවසිකානං එතං නාමං.' (අංගුත්තර අටුවා 616)

'අඞ්ගුත්තර අටුවාහි 'යවසං' යන්නට 'යවභත්තං' යි පාඨ භෙදයක් පෙනේ; අන්න - ශබ්දය බතට නමක් බැවින් 'යවස' යනු 'යවබත්' යයි මුළාවේ වැටීම ඉතා පහසුය. අභිධානප්පදීපිකාවෙහි 'ඝාසො තු යවසො වාථ' යන්නෙන් 'යවස' නම් තෘණවර්‍ගයක් බව පැහැදිලි වේ.

14. **අපකස්ස** = ඉවතට ඇද
'සෙය්‍යථාපි භික්ඛවෙ පුරිසො ජරුදපානං වා ඔලොකෙය්‍ය පබ්බතවිසමං වා.......... අපකස්සෙව කායං අපකස්සෙව චිත්තං'
(කස්සපසංයුත්ත)

පාලුළිඳක් හෝ ප්‍රපාතයක් බලන මිනිසා ළිඳේ හෝ ප්‍රපාතයෙහි වැටෙත යන බියෙන් තමාගේ සිරුරත් සිතත් අනික් අතට ඇදගෙන හෙවත් බර කොටගෙන බලයි.

15. **අපවදති** = ප්‍රතික්‍ෂෙප කරයි; අවමන් කරයි
'අපවදතෙව භවං සොණදණ්ඩො වණ්ණං, අපවදති, මනෙත
(=භවත් සොණදණ්ඩතෙමේ කුලය ද මන්ත්‍රයන් ද ප්‍රතික්‍ෂෙප කරයි. නොහොත් ඒවා ඉවත්කොට කියයි.) (සොණදණ්ඩ දීඝ)

16. **අපලොකෙති** = විචාරයි.
'සත්ථා තෙමාසං වසිත්වා වෙරඤ්ජං බ්‍රාහ්මණං අපලොකෙත්වා තතො නික්ඛන්තො.' (ධ. අ. 294)

17. **අපහත්තු** = දුරුකරන්නා
බහුන්නං වත නො භගවා දුක්ඛධම්මානං අපහත්තා'
(=භාග්‍යවත්තෙමේ අපගේ බොහෝ දුක් දුරුකරන්නා්ය.)
(ලටුකිකොපම ම.)

18. අප්පටිවාන = තෘප්තියට නොපැමිණි; පසු නොබසින; නො නවතින.
'ච්ධනං භික්ඛවෙ ධම්මානං අතිනෙතා අප්පටිවානො මාතු ගාමො කාලංකරොති' = (ස්ත්‍රිය කරුණු දෙකක් ගැන තෘප්ත නොවූවා පසුනොබස්නී හෙවත් සෑහීමට නොපැමිණියාම කලුරිය කරයි.) (දුකංගුත්තර.)
'අප්පටිවානො ති අනුක්කණ්ඨිතො, අපවෙචා සක්කිතො' (එම අටුවා)
'පටිවානරූපාති නි වත්තනසභාවා.' (මජ්ඣිම අටුවා 830)

19. අප්පටිවානිතා = පසුනොබස්නා බව
'ච්න්නාහං භික්ඛවෙ ධම්මානං උපඤ්ඤාසිං, යා ච අසනතුට්ඨිතා කුසලෙසු ධම්මෙසු; යා ච අප්පටිවානිතා පධානස්මිං; අප්පටිවානී සුදහං භික්ඛවෙ පදහාමි' =මහණෙනි, කුශල ධර්මයන්හි අසන්තුෂ්ඨ බවද ප්‍රදහනයෙහි නෙනවත්නා බවද යන මේ ධර්ම දෙකට එළඹ මම (ඒ දෙකේ ගුණ) දැන ගතිමි.; මහණෙනි, මම නොපසුබට වීර්‍ය්‍ය ඇතිව ප්‍රදහනය කරමි. (දුකඞ්ගුත්තර)

20. අභිහාරෙති - ගමන් කරයි; ඉදිරියට යයි. 'පිණ්ඩාය අභිහාරෙසි ආකිණ්ණවරලක්ඛෙණො' (පබ්බජ්ජාසුත්ත සුත්තනිපාත)

21. අයිර: අයිරක, අය්‍ය ශබ්දයට සමානාර්ථ ඇත්තාහ.
(1) 'පඤ්චහි ඨානෙහි අයිරකෙන හෙට්ඨිමා දිසා දසකම්ම කරා පච්චුපට්ඨිතා..... අයිරකං අනුකම්පන්ති' (සිඟාලොවාද)
(2) 'අහං මනුස්සෙසු මනුස්සභූතා දසි අයිරකුලෙ අහුං' (මඤ්ජෙට්ඨක විමාන ව.)

22. අවත්‍ථාති = මත්තෙහි වැටේ. අව+ඨා+ති
'දුතියො මුසලො පරිපතිත්‍වා අඤ්ඤතරස්ස දරකස්ස මත්‍ථකෙ අවත්‍ථාසි' (=දෙවෙනි මොහොලත් පෙරළි එක්තරා ළමයකු මත්තෙහි වැටුණේය.) (පාරාජිකපාළි)

23. අසංකිණ්ණ පදය නොහරන ලද යන අර්ථයෙහි ද වැටෙන බව 'අසංකිණ්ණාති අවිජහිතා අජ්ඣිතා' (සංයුත් අටුවා ii 203) පාඨයෙන් පෙනේ.

24. අස්මා-ගල (ආකාරාන්ත පුල්ලිංගිකයි)

'මා ත්වං අධම්මො ආචරිතො අස්මා කුම්භමිව'බ්භිද' (පාචිත්තියපාළි)
(= තා විසින් හැසිරෙන ලද අධර්මය ගලක් කළයක් බිඳින්නා සේ තා නො නසාවා)

25. ආතුම = ආත්මය: තමා. (අත්ත - ශබ්දය මෙන් වරනැගේ)
යෙනෙව බාලොති පරං දහන්ති,
තෙනා' තුමානං කුසලොති චාහ.'
(=යම් කාරණයකින් අන්‍යයාට 'අඥානයා' යයි කියයිද ඒ කාරණයෙන්ම තමා දක්ෂයෙකැයි කීය.) (චූලවියූහ සුත්තනිපාත)

26. ආදිස්ස =ගර්හා ලැබිය යුතු
(1) 'තුම්හෙපි තෙන ආදිස්සා භවෙය්‍යාථ' (ධම්ම දායාද ම.)
(= ඒ කරණකොට තෙපිත් ආදර්ශකොට පෙන්විය යුත්තෝ හෙවත් ගර්හා ලැබිය යුත්තෝ වන්නෙව්)

(2) 'ආදිස්සා භවෙය්‍යාථ අවදිසිතබ්බා, විසං කාතබ්බා. වචනථ පෙතබ්බා විඤ්ඤූහි ගාරය්හා භවෙය්‍යාථ' (මජ්ඣි අටුවා 76)

27. ආදිස්ස = ආදර්ශකොට (පූර්වක්‍රියා)
'භගවා............ ආදිස්ස ආදිස්ස ආයස්මතො උපාලිස්ස වණ්ණං භාසති.' (පාචිත්තියපාළි)

28. ආමත්තිකාපණ = මැටි භාජන විකුණන තැන.
'පත්තවණිජ්ජං වා භික්ඛුනීයො කරිස්සන්ති, ආමත්තිකා පණං වා පසාරෙස්සන්ති.' (පාචිත්තියපාළි)

ආමත්ත නම් භාජනයයි, භාජන විකුණන්නෝ ආමත්තික නම් වෙති. ඔවුන්ගේ වෙළඳසැල ආමත්තිකාපණ නම්.

29. ආයූහති, =පීණයි, පිහිනා යයි. 'යද ස්වාහං, ආවුසො ආයූ හාමි, තදස්සු නිබ්බුය්හාමි. = යම්කලක මම පීණන්නෙම් නම් එකල දියේ පාවෙමි. (දෙවතා සංයුත්ත)

30. ආයසක්‍ය = අපකීර්තිය. 'ආයසක්‍යං ති අයසභාවං (අං අටුවා 725)

31. ආරභති - නසයි: පටන් ගනී
'සමණං ගොතමං ආරබ්භ පාණං ආරභන්ති.' (ජීවකසුත්ත ම. )

32. ආලිම්පෙති = ගිනිතබයි: ආලේපකරයි
'ඡබ්බග්ගියා භික්ඛු දයං ආලම්පෙසුං මනුස්සා දඩ්ඪා කාලමකංසු'
(=සවග භික්ෂූහු වනයට ගිනි තැබූහ. මිනිස්සු ද මළහ.)
(පරාජිකපාළි)

33. අවිඤ්ඡති = අදියි: කරකවයි: කලතයි
(1) 'සෙය්‍යථාපි භූමිජ, පුරිසො ඛීරත්ථිකො........... ගාවිං තරුණවච්ඡං විසාණතො ආවිඤ්ඡෙය්‍ය........... උදකං කලසෙ ආසිඤ්චිත්වා මන්ථෙන ආවිඤ්ඡෙය්‍ය' (භූමිජසුත්තම)

කිරිගනු කැමති මිනිසා දෙනගේ (අහෙන් අල්වා) අදින්නේ නම් යන තැන කිරිදෙව්මට තනය ඇදීම වැනි ඇදීමක් කියවේ.
මන්ථෙන ආවිඤ්ඡෙය්‍ය' යන තැන වෙඬරු සෑදීමට කිරි භාජනයක වත්කොට ලීයකින් කරකැවීම කියවේ.

(2) ඡප්පාණකා නානාවිසයා නානගොචරා සකං සකං ගොචර විසයං ආවිඤ්ඡෙය්‍යුං' යන සළායතනසංයුත්ත පාඨයෙහි කඹයකින් බැඳි සතකු තමා කැමති තැනට යාමට ඇදීම කියවේ.

'ආවිඤ්ඡෙය්‍යුං' ති ආකඩ්ඪෙය්‍යුං.' (සංයුත් අටුවා iii 81)

34. ආසජ්ජ =හැපී:ගටා (ආ+සද+ත්වා]
(1) 'තාදිං භික්ඛු මාසජ්ජ කණ්හ, දුක්ඛං නිගච්ඡසි.'
(=මාරය, එවැනි භික්ෂුවක් ගටා හෙවත් හිරිහැර කොට තෝ දුකට පැමිණෙන්නෙහි). (මොග්ගල්ලාන ථෙරගාථා)
'ආසජ්ජාති සමාගන්ත්වා ආසජ්ජ නං තථාගතංති ආදිසු ඝට්ටනෙ'
(විනය අටුවා)

(2) 'අද්ධා බො තෙ අග්ගිවෙස්සන, ආසජ්ජ උපනීය වාචා භාසිතා' (=අග්ගිවෙස්සන, තා විසින් මා ගටා මා කරා එළවා මේ වචන කියන ලදී.) (මහා සච්චක, ම.)

35. ආසාදිත = ගටනලද: හිරිහැර කරනලද
'ආසාදිතො මයා බුද්ධො ඝොරො උග්ගතපො ජිනො'
(= විසින් උග්‍රතපස් අති භයජනක තථාගතෙමේ ගටන ලද්දේය.)
(උපාලිථෙරාපදාන)

36. ආසාදිය - ගටා ආසජ්ජ යන්නට සමානයි.
'ආසාදිය එදිසං ජනං අග්ගිං පජ්ජලිතංව ලිංගිය.'
(=දැල්වෙන ගින්නක් වැළඳගන්නා සේ මෙවැන්නකුට හිරිහැර කොට) (සුභාථෙරී ගාථා)

37. ආසාදෙති - හිරිහැර කරයි.
'පෙසෙත්වා සිරිකං නාගං බුඩං ආසාදයිං තදා' (උපාලිථෙරාපදාන)

38. ආසුම්භති - වත්කරයි; දියාරු දෙයක් විසුරුවයි.
(1) 'පානීයථාලකං මත්ථකෙ ආසුම්භිත්වා විධූපනෙන පහාරං අදාසි' (-පැන්තලිය හිස මත වත්කොට තල්වටින් පහර දුන්නේය) (පාචිත්තිය පාළි)

(2) 'කටාහෙ වච්චං කත්වා..... තස්ස බ්‍රාහ්මණස්ස මත්ථකෙ ආසුම්භි' = කබලක වර්චස් කොට ........ ඒ බමුණාගේ මත්තෙහි විසුරු විය.) (එම.)

(3) 'දළ්හං පාසං කරිත්වාන ආසුම්භිත්වාන පාදපෙ' යන විමානවත්ථුපාඨයෙහි 'වීසිකොට' යන අර්ථ ගතයුතු.

39. ආහුන්දරික - අවකාශ රහිත
ආහුන්දරිකා සමණානං සක්‍යපුත්තියානං දිසා අන්ධ කාරා.'
(-ශ්‍රමණ ශාක්‍යපුත්‍රයන්ට දිශාවෝ සම්බාධවෙති.) (මහාවග්ගපාළි)

'ආහුන්දරිකාති සම්බාධා.' (එම අටුවා)

40. ඉරිණ - මහවනය
'අරඤ්ඤෙ ඉරීණෙ වනෙ
අන්වාහිණ්ඩාමහං තදා' (-මම එල්හි අරණ්‍ය සංඛ්‍යාත මහවනයෙහි ඇවිදීමි) (ආසනත්ථවික ථෙරාපදාන)

41. උක්කොටන - අල්ලස් ගැනීම
උක්කොටනන්ති සාමිකෙ අස්සාමිකෙ කාතුං ලඤ්ජගහනං' (ම. අ. 405)

42. 'උග්ගිරති - පහරදීමට උරුක්කරයි.
'ඡබ්බග්ගියා භික්ඛු........ සත්තරසවග්ගියානං භික්ඛූනං තලසත්තිකං උග්ගිරන්ති.' (-සවග භික්‍ෂූහු සතළොස්වග භික්‍ෂූන්ට පහරදීම සඳහා අත්ල ඔසවත්) (පාචිත්තිය පාළි)

43. උච්චාරෙති = උඩට ඔසවයි
'අඤ්ඤතරො භික්ඛු ......... හෙට්ඨා හුත්වා සිලං අච්චාරෙසි. උපරිමෙන භික්ඛුනා දුග්ගහිතා සීලා හෙට්ඨිමස්ස භික්ඛුනො මත්ථකෙ අවත්ථා' (=එක්තරා භික්‍ෂුවක් විසින් මනාසේ අල්වා නොගත් ගලයට සිටි භික්‍ෂුව මත්තෙහි වැටුණේය.' (පාරාජික පාළි)

44. උජ්ජවති = උඩුගං බලා යාත්‍රා කෙරේ.
'ආයස්මා ආනන්දෙ .......පඤ්චමත්තෙහි භික්ඛු සතෙහි නාවාය කොසම්බිං උජ්ජවි.' (චුල්ලවග්ග පාළි)

45. උජ්ජවනි නාවා = උඩුගං බලා යන නැව.
යටි අතට යන නැව ඔජවනී නම්.

46. උජ්ඣිත්වා = හැරදමා; උදුරා.
'තෙ භික්ඛු සත්ථකානි උජ්ඣිත්වා ආරඤ්ඤකඞ්ගං......... සමාදියිංසු. (= ඒ භික්‍ෂූහු ඇතිරිම හැරදමා ආරණ්‍ය කාඩගය සමාදන් වූහ.) (පාරාජිකපාළි)

47. උත්තිණං කරොති = තෘණ රහිත කරයි.
'භික්ඛූ සටීකාරස්ස කුම්භකාරස්ස නිවෙසනං උත්තිණං මකංසු (=භික්‍ෂූහු සටීකාර කුම්භකාරයාගේ ගෙය තෘණ රහිත කළහ: වහලේ සෙවිලිකො තිබුණු තණකොළ ගලවාගෙන ගියහ යන අදහසයි.) (සටීකාරසුත්ත. ම.)

48. උද්දන = (මාලුවැල වැනි) එකට ඇවුණු වැල.
'ඉමෙ මච්ඡෙ ගහෙත්වා පාදග්සනකානි ............. උද්දනානි කරොහි (=මේ මසුන් ගෙන කහවණු සතරෙන් කොටසක් අගනාවැල් සාදව) (ධ. අ. පණ්ඩිතසාමණෙර)

(2) උද්දන ගාථා යන තැන ද එක්කොට අවුණනුලබන බැවින්
උද්දන නමැයි දතයුතු.

49. උද්දීයති = බිඳවැටේ
(1) 'තෙන ඛො පන සමයෙන ථුල්ලනන්දය භික්ඛුනියා පරිවෙණං උද්දීයති.' (පාචිත්තිය පාළි)
(2) 'උද්දීයති ති විනස්සති පරිපටති.' (එම අටුවා.)

පාලිභාෂාවතරණය iii

(3) මාරසංයුත්තයෙහි මෙය උද්‍රියති යයි පෙනේ.

50. උද්දෙකනික = (වතුරගන්නා) දඬුකැටය
'සෙය්‍යථාපි නාම මණිකො හුත්වා උද්දෙකනිකො අස්ස'
(=යම්සේ මහසැළියක් වී සිට කුඩා භාජනයක් බවට පැමිණේද)
(චූල්ලසකුලුදායි සුත්ත ම.)

'උද්දෙකනිකොති උදකවාරකො' යනු එම සූත්‍ර අටුවායි. දම්පියා අටුවාවෙහි අග්ගසාවකවත්ථුවෙහි 'අහං මහාජනස්ස ආචරියො හුත්වා වීචරිං; තස්ස මෙ අන්තෙවාසිකභාවො චාටියා උදඤ්චන භාවපපත්ති විය හොති' යන්නෙන් කියවෙන්නේත් මේ කාරණයම විය යුතුයි. එහි උදඤ්චන යන්න උද්දෙකනික යන්න සඳහා යෙදී තිබේදැයි විමසිය යුතු.

51. උපනිධානය = උපමාකොට, ළඟතබා
'යථා සිනෙරුං උපනිධාය සාසපො............ එවමෙවං සමණස්ස ගොතමස්ස ජාතිසම්පත්ති ආදයො ගුණෙ උපනිධාය අම්භාකං ගුණා පරිත්තා ලාමකා (=මහමෙර සමීපයෙහි තැබූ අබ ඇටය යම්සේ කුඩාවේද එමෙන් ශ්‍රමණගෞතමයාගේ ජාතිසම්පත් ආදි ගුණයන්ට උපමා කළවිට අපගේ ගුණයෝ ස්වල්පවෙති, ලාමකවෙති)
(ම. අට්ඨකථා 790)

ම. බාලපණ්ඩිත සූත්‍රයෙහි ද අංගුත්තරට්ඨකථාවෙහිද මේ වචනය පෙනේ.

52. උපහත්තු = එළවන්නා; ගෙන දෙන්නා
'බහුන්නං වත නො භගවා සුඛධම්මානං උපහත්තා
(=භාග්‍යවත් තෙමේ අපට බොහෝ සැප ගෙන දෙන්නෙක්ය.)
(ලටුකිකොපම ම.)

53. උප්පච්ච = උඩනැගී
(1) 'න තෙ දුක්ඛා පමුත්ත්‍යත්ථි
උප්පච්චා පි පලායතො' = අහසට නැග පලායන්නා වූ ද තට දුකෙන් මිදීමක් නැත. (පුණ්ණාථෙරීගාථා)
මෙය උප-පූර්ව-පත-ධාතුවෙන් සිඩවූ පූර්වක්‍රියාවකි.
උප්පතිය-යන්නට සමානාර්ථ ඇත්තේයි.

(2) දම්පියා අටුවාවේ සාණුසාමණේර වස්තුවෙහි මේ ගාථා දෙපයද වරදවා යෙදු තිබේ.

(3) උප්පච්චාපීති උප්පතිත්වාපි.' (යක්ඛසංයුත්තට්ඨකථා 237)

54. උප්පාතක = වැලිමැක්කා (පොත්වල උප්පාදක යයිද පෙනේ)

(1) 'නහනූනිමස්ස සමණස්ස
සන්ථරො සතතමාසිකො
උප්පාතකෙහි සඤ්ජනෙනා
තෙනායං සමණො සුඛී' (බ්‍රාහ්මණසංයුත්ත)

(2) 'උප්පාතකෙහි සඤ්ජනෙනාති උප්පාතකපාණෙහි සඤ්ජනෙනා'
(එම අටුවා)

55. උබ්බන්ධිත්වා = උඩ එල්ලී; බෙල්ලේ වැල ලාගෙන.
'අරඤ්ඤං ගන්ත්වා උබ්බන්ධිත්වා මරිස්සාමීති' (=වනයට ගොස් බෙල්ලේ වැල ලාගෙන මැරෙන්නෙමියි) (ගුත්තිලවිමාන ව.)

56. උබ්බිල්ල = අධික ප්‍රීතිය 'සෙය්‍යථාපි අනුරුද්ධ පුරිසො එකං නිධිමුඛං ගවෙසන්තො සකිදෙව පඤ්චනිධිමුඛානි අධිගච්ඡෙය්‍ය, තස්ස තතො නිදනං උබ්බිල්ලං උප්පජ්ජෙය්‍ය' (ම. iii 159 උපක්කිලෙසයුත්ත)

57. උම්මිහිති = මූත්‍රකරයි
'යෙසු නො දරකා ඌහදන්ති පි උම්මිහන්ති පි' (=යම් ඇතිරිලිවල අපගේ දරුවෝ මළ පහරත්ද මූත්‍ර කෙරෙත් ද (පරාජිකපාළි)

58. උරුන්ද -මහත්; විශාල
(1) උරුන්දං ආවුසො කුම්භකාරනිවෙසනං, විහරතා,යස්මා යතා සුඛං.' (ධාතුවිභංග. ම.)
(2) උරුන්දංති විවිත්තං අසම්බාධං. (එම අටුවා 986)

59. උස්සාරෙති = (මිනිසුන්) ඉවත් කරයි.
'ජීවකො ජනං උස්සාරෙත්වා............ අන්තගණ්ඨිං නීහරිත්වා දස්සෙසි' (=ජීවකයා මිනිසුන් ඉවත් කරවා................ බඩවැල්ගැටය පිටතට ගෙන පෙන්විය. (මහාවග්ගපාළි)

60. උස්සීසකරණ = හිස උස්කොට තැබීම.
'ඛුද්දකං මඤ්චකං පඤ්ඤාපෙත්වා උස්සීසකරණත්ථාය චීවරං දෙන්ති.' (තිපල්ලත්ථමිග ජා.)

61. උංහදති (උහදති) = මලපහ කරයි.
'යථා නගරද්වාරෙ නිඛාත ඉන්දඛීලං දරකාදයො ඔමුත්තෙන්ති පි උංහදන්තිපි' (=යම් සේ නුවරදෙරටුවෙහි සිටවූ එසිකා ස්ථම්භයට ළමයි ආදීහු මුත්‍රාකරත් ද මල පහරත්ද) (ධ. අ. 306 සාරිපුත්ත)

62. ඔකප්පනිය, ඇදහිය යුතු. 'ඔකප්පනියමෙතං හොතො ගොතමස්ස' = (මහාසච්චක සු. ) 'ඔකප්පනියමෙතංති සද්දහනියමෙතං'
(එම අටුවා 468)

63. ඔපසායික, සමීපයෙහි නිදන. ඔපසායිකො මෙ භවිස්සසි'
(බ්‍රහ්මනිමන්තණසුත්ත ම.)

64. ඔකාසෙති = විසුරුවයි; ලිහාදමයි.
(1) තෙන හි ත්වං ගහපති ආලින්දෙ උත්තරාසංගං පඤ්ඤපෙත්වා තිණකලාපං ඔකාසෙහි' ති.' (චිත්ත සංයුත්ත)
(2) 'ඔකාසෙසී' ති විප්පකිරි' (එම අටුවා)

65. ඔක්ඛායති, වැටහේ 'සමාහිතස්ස භික්ඛවෙ භික්ඛුනො ඔක්ඛායති' (සළායතන සංයුත්ත s. iv. 144) ඔක්ඛායතීති පඤ්ඤායති පාකටං හොති' (එම අටුවා iii 34)

66. ඔණොජෙති = දෙයි; බෙදදෙයි.
(1) 'ඔණොජෙථා'වුසො සංඝස්ස චීවරං' (චුල්ලවග්ගපාළි)
(2) ඔණොජනංති විස්සජ්ජනං' (එම අටුවා)
(3) 'පජාපතිං ......... තස්ස පුරිසස්ස ඔණොජෙසිං' (=දුන්නෙමි)
(අට්ඨකංගුත්තර)

67. ඔපෙති = දමයි.
(1) ' න තෙසං කොට්ඨෙ ඔපෙන්ති (සක්කසංයුත්ත)
(2) 'න තෙසං සන්තකං ධනං කොට්ඨෙ පක්ඛිපන්ති.' (එම අටුවා)

68. ඔමුත්තෙන්ති - මුත්‍ර කරයි. (අංක 61 බලනු)

69. ඔලුබ්භ - පහතට බරකොට එල්ලී (අව+ලුභ)
'දණ්ඩ මොලුබ්භ තිට්ඨන්තො මණ්ඩුකං අනොලොකෙත්වා තස්ස සීසෙ සන්නිරුම්භිත්වා අට්ඨාසි' (- සැරයටිය ඔබා ගෙන සිටින්නේ මැඩියා නො දැක උගේ හිස මැඩගෙන සිටියේය.)
(විමානවත්ථු අටුවා)

70\. ඔවච්චිත, මත්තෙහි වර්චස් කරන ලද. 'තෙහි ඔවච්චිතාපි ඔමුත්තිතාපි ඔහතිතාපි ගන්ධවිලෙපනං පතිතං විය පටිච්ඡන්නා සොමනස්සං ආපජ්ජන්ති. (සං. අ. i. 26)

71\. ඔසාදෙති - පහළ බස්සවයි

(1) 'සකටෙහි නිබ්බාහාපෙත්වා මජ්ඣෙ ගඞ්ගාය සොතෙ ඔසාදෙහි'
- ඒ ධනය ගැල්වලින් යවා ගඟ මැද ජල ප්‍රවාහයෙහි බස්සව. (පාරාජිකපාලි)

(2) 'තෙන හි මහාරාජ අග්ඝං ඔසාදෙහී ති - එසේ නම් මහරජ වටිනාකම පහළ බස්සව) (මුද්‍රිත පොතේ ඔසාපෙහි යි පෙනේ) (සිරිමා වත්ථු ධ. අ.)

72\. කටග්ගාහ - ජයග්‍රහණය
'උභයත්ථ කටග්ගාහො
සද්ධස්ස ඝරමෙසිනො' (චතුක්කංගුත්තර)

73\. කටසි - සොහොන: තෘෂ්ණාවිද්‍යාවෝ ද.

(1) 'එවං දීඝරත්තං වො භික්ඛවෙ දුක්ඛං පච්චනුභූතං, කටසි වඩ්ඩිතා' - සොහොන හෝ පොළොව වඩන ලදී. (අනමතග්ග සංයුත්ත)

(2) කටසිං' ති අත්තභාවං' (අං. අ. 512)

(3) 'කටසිවඩ්ඪනාති කටසිසංඛාතානං තණ්හාවිජ්ජානං අභිවඩ්ඪකා.' (උදාන අටුවා)

74\. කටුවියකත - ඉඳුල් කළ. කටුවියකතොති උච්ච්ට්ඨකතො, (අං. අටුවා. ජේ. 460)

75\. කප්පෙති - සරසයි: සුදනම් කරයි: කපයි

(1) 'තෙන හි සම්ම ජීවක හත්ථියානානි කප්පාපෙහි' - සූදනම් කරවව. (සාමඤ්ඤඵලසුත්ත)

(2) 'කක්කටකො කුමුදනාළං කප්පෙන්තො විය තස්ස ගීවං කප්පෙත්වා උදකං පාවිසි.' - මානෙල් දණ්ඩක් කපන්නා සේ උගේ බෙල්ල කපා.' (බක ජාතක)

76. කලි = හානිය; විපත; පරාජය.
'අප්පමත්තො අයං කලි
යො අක්ඛෙසු ධනපරාජයො.'
=දූකෙළිමෙහි යම් පරාජයක් වේ නම් එය ස්වල්ප හානියකි.
(චතුක්කංගුත්තර)

77. කලිග්ගහ = පරාජය
'එවමිමස්ස හොතො පුරිස පුග්ගලස්ස උභයත්ථ කලිග්ගහො'
(දෙලොවම පරාජයග්‍රහණය වේ.) (අපණ්ණකසු. ම.)

78. කසිණ = සියලු.
'කසිණා පඨවි ධනස්ස පූරා.
එකස්සෙව සියා අනඤ්ඤාදෙය්‍යා.'
(= ධනයෙන් පිරුණු මුළු පොලොව අනෙකකුට අයත් නොවී
එකකුට ම අයත් වුවත්) (උදය ජාතක)

79. කීරති, බහනු ලැබේ. 'තෙපි තත්ථෙව කීරන්ති, නහි කම්මං පනස්සති.' (ජෙතිදූස පොරගාථා) කීරන්තිති පක්කීපීයන්තී' (අටුවා)

80. කොලාප = වියලිලු /තිරොජස්ක
'කොලාපං ති ජීන්නසිනෙහං, නිරූපං' (ම. අ. 465)

81. බටක = වොක්ක
'සා තස්මිං ගෙහෙ දසියා......... අක්කොසති පරිභාසති, බටකං චස්සා දෙති' (රජ්ජුමාලාවිමාන වත්ථු)

82.. බවොපිකා උණ පතුරු අතුරා කළ ඇඳ, 'බටෙපාකාති විළිව මඤ්චකො' (ම. අ. 658)

83. බුද්දකප්ප = කණ මී පැණිමෙන් රසවත්.
එලානි බුද්දකප්පානි භුඤ්ජ රාජ වරං විරං.' (සොණනන්ද ජා.)

84. බුරප්පං සන්නය්හි, ශරය (දුන්නෙහි) යෙදුවේ ය. 'තස්ස රාජා ඔක්කාකො කුපිතො අනත්තමනො..... බුරප්පං සන්නය්හි'
(අම්බට්ඨසුත්ත)

85. ගච්ඡිත = ගැවසුණු
'බොධිසත්තස්ස සීසං කිඤ්ජක්ඛ ගච්ඡිතං විය කුය්‍යක පුප්ඵං අහොසි' = බෝසතාණන්ගේ හිස කෙසුරෙන් ගැවසීගත් බක්මී මලක් වැනි විය. (ජාතක නිදාන)

86. ගාමණ්ඩල = ගම්දරුවා
'සුසානෙ සෙය්‍යං කප්පෙමි
ඡවට්ඨිකං උපධාය 'හං
ගාමණ්ඩලා උපාගන්ත්වා
රූපං දස්සෙන්ති 'නප්පකං'
= මිනි ඇටයක හිස තබාගෙන මම සොහොනෙහි හොවීමි. ගම්දරුවෝ අවුත් මට නොයෙක් විකාර දක්වති. (චරියාපිටක)

**සංලක්ෂ්‍යය**

මුද්‍රිත පොත්වල 'ගාමණ්ඩල' යන්න ගොමණ්ඩල යයි ද, 'උපධාය' යන්න උපනිධාය යයි ද පෙනේ. (1) 'උපධාන' යන්න හිස තබන කොට්ටයට නම්. 'උබතො ලොහිතකූපධානා' යනාදියෙහි එය පෙනේ. ඒ සම්බන්ධ පූර්වක්‍රියා 'උපාධාය' විය යුතුයි.

(2) මැදුම්සඟියේ අස්සලායන සූත්‍රයෙහි 'කො නාමායං ගාමණ්ඩල රූපො විය' යන්න එම අටුවාහි 'ගාමණ්ඩලරූපො වියාති ගාමදාරකරූපො විය' යන්නද පෙනෙන බැවින් මෙය ගාමණ්ඩලම විය යුතුයි.

87. ගිවා = වන්දිය ; දඩය
'යස්ස පස්සෙන මිගො පලායති තස්සෙව ගිවා' = යමකු සිටින තැනින් මුවා පලායේ නම් දඩය ඔහුටමය; ඔහු විසින් වන්දිය ගෙවිය යුතුය. (ජයද්දිසජාතක)

88. චඞ්ගවාර, කිරිගොට්ට වැනි පෙරහණක් 'වඞගවාරංති බාර පරිස්සාවනා' (වම්මිකසුත්ත අටුවා)

89. චෙතාපෙත්වා = මාරුකොට
'උපායකො තෙලතණ්ඩුලාදීනි කම්මකාරණං හතත චෙතනත්ථං පහිණාති, අවසෙසෙහි සුවණ්ණං චෙතාපෙත්වා පහිණති.'
(මජ්ඣිමට්ඨකථා)

මෙම වචනය විනය ශික්ෂාපදයන්හිද පෙනේ.

90. ඡන්දක - සම්මාදම: කැමැත්තෙන් දෙන දෙය.
'භික්ඛුනීසංඝස්ස චීවරත්ථාය ඡන්දකං සංහරිත්වා'
(-භික්ෂුණීසංඝයාට සිවුරු පිණිස සම්මාදම් එකතුකොට)

(පාචිත්තියපාළි)

91. ඡපක - සැඩොලා
'අභිධානප්පදීපිකා' හි චණ්ඩාලපර්‍යායය සපාක, සපච ශබ්දයන් දැක්වූ නමුත් ඡපක ශබ්දයක් නොදක්වන ලදී.

පාචිත්තියපාළියෙහි: 'බාරාණසියං අඤ්ඤතරස්ස ඡපකස්ස පජාපතී ගබ්භිනී අහොසි, අථ ඛො............ සා ඡපකී තං ඡපකං එතදවොච' යන්නද එම අටුවාහි ඡපකස්සාති චණ්ඩාලස්ස' යන්නද දක්නා ලැබේ.

92. ඡව-ලාමක

(1) 'තයා භාරද්වාජ ඡවස්ස දරුපත්තස්ස කාරණා ගිහීනං
උත්තරිමනුස්සධම්මා ඉද්ධිපාටිහාරියං දස්සිතං'

(චුල්ලවග්ගපාළි)

(2) ඡවඩාහක යනාදි තන්හි මෙය මෘතශරීර වාචාවේ.

93. තුම - තෙමේ.
'යං තුමො කරිස්සති තුමොව තෙන පඤ්ඤායිස්සති' - තෙමේ යමක් කරන්නේ නම් තෙමේ ම එයින් ප්‍රකට වන්නේය. (චුල්ලවග්ග)

සංලක්ෂ්‍යය:

(1)'තුමො' යන ප්‍රථමා එකවචනය පමණක් දක්නට ලැබේ. සිංහලෙහි 'තෙමේ' 'තමා' යන පද මේ පාලි වචනයෙන් බිනන යයි සිතිය හැක.

(2) මෙය සයං (-තෙමේ) නිපාතය හා සමානාර්ථ ඇති නිපාතයකැයි සලකමු. නැතහොත් 'ආතුම' ශබ්දය මෙන් වරනැගිය යුතුය. සූත්‍රනිපාත - අංගුත්තර - විනය අටුවාවන්හි මෙය සර්වනාමයක් මෙන් සලකා අර්ථ විවරණ තිබේ.

94. ථණ්ඩිල, න කර්කශභූමිය 'ථණ්ඩිලෙති ඛරකඨිනෙ භූමිප්පදෙසෙ' -ථණ්ඩිලසායිකා යන තැන අමුකුසතණ ඇතුරූ භූමියෙහි හොවීම යයි සළායතන සංයුත් අටුවාවේ තෝරා තිබේ. (පෙතවත්ථු අටුවා)

95. ථම්භ ශබ්දයෙන් කණුව පමණක් නොව ඉපනැල්ල ද කියවේ. 'ඉපනැල්ල' නම් ගොයම් කපාගත් පසු ඉතුරුවෙන මුල් කොටසයි. මැදුම්සඟියේ කොසම්බක සූත්‍රය බලනු.

96. දව්ඩු - දැක පූ. ක්‍රි.
'කාමෙස්වාදීනවං දිස්වා නෙක්ඛම්මං දව්ඩු ඛෙමතො.'
(පබ්බජ්ජාසුත්ත. සබ්බකාමභෝරගාථා)

(දිස - ධාතුවෙන් ත්වා ප්‍රත්‍යයට රව්ඩු -ආදෙශ වී ධාත්වන්තය සමග රකාරලෝපය වී සෑදේ)

97. දිව්ය - දෙවියන් පිළිබඳ
'දිව්‍ය' යන්න පාළියෙහි දිබ්බ -ශබ්දයෙන් කියවේ. නමුත් ඊට සමානාර්ථ ඇති 'දිව්ය' ශබ්දයක්ද පෙනේ.
'චුතාහං දිව්යා කායා ආයුං හිත්වා අමානුසං
අමූළ්හො ගබ්භමෙස්සාමි යත්ථ මෙ රමතී මනො.' (සක්කපඤ්හ දිස)

98. දෙස්ස - අප්‍රිය වූ
' න මෙ දෙස්සා උභො පුත්තා
මද්දිදෙවී න දෙස්සියා' (වෙස්සන්තර ජා.)
(පුත්‍රයෝ දෙදෙන මට අප්‍රිය නොවෙති. මද්‍රි දේවිය ද අප්‍රිය නොවූවාය.)

99. දෙසිනා -දෙෂ විරහිත වූ (ජ්‍යෝත්ස්නා ශබ්දයෙන් බිඳුනා විය හැක.)
(1) ලක්ඛණ්ඤා 'වත භො දෙසිනා රත්ති' (-දෙෂ විරීත රාත්‍රිය ඒකාන්තයෙන් සංලක්ෂණය කළ යුත්තීය.)' (සාමඤ්ඤඵල දිස)
(2) දෙසිනාති දෙසවිරහිතා.' (එම අටුවා)

100. ධාතිය - ධාන්‍ය දස්ඤ ශබ්දය හා සමානයි. 'න පසු බ්‍රාහ්මණානුං - න හි රඤ්ඤං න ධාතියං' (බ්‍රාහ්මණ ධම්මික සුත්ත)

101. නිදංසති, හිතවත් දේ දක්වයි. 'බහුජනං නිදංසතීති බහු ජනස්ස හිතං දස්සෙති.' (දිස අ. 677)

102. නිජ්ඣාතංබමති, වැටහේ. 'න නිජ්ඣානං ඛමන්තීති න උපට්ඨහන්ති.'
(ම. අ. 324 අලුවිභාර)

103. **නිද්ධමනතුම්බ** - වැවේ සොරොව් කට
නිද්ධමනතුම්බෙසු විවටෙසු කම්මන්තෙ කයිරමානෙ උදකස්ස නික්ඛමනකාලො වීය.' (අ. අ. 56 චතුක්ක)

(2) දිය බැසයන අගලක් 'නිංමන' යන්නෙන් කියවේ.

'අථේකො සිගාලො අඩ්ඪරත්තසමයෙ නිංමනෙන නගරං පවිසිත්වා' යන සිගාල ජාතකපාඨයෙහි එය පෙනේ.

(3) නිද්ධමනද්වාර යන්නෙන් ද කානුකට කියවේ. 'බාරාණසී රඤ්ඤො පුත්තො පිතුමරණකාලෙ නිද්ධමනද්වාරෙන පලායිත්වා' (උදානට්ඨකථා 81)

104. **තින්තග**, ජලය. 'කොඤ්චා තීරපකොව තින්තගං' (උදාන පාළි)
තින්තට්ඨානගමනෙන තින්තගසංඛාතං උදකං.' (එම අටුවා)

105. **නිබ්බසන**, ඇඳ ඉවත්කළ වස්ත්‍රය. 'නිබ්බසනානීති පුබ්බෙ භගවතා නිවාසෙත්වා අපනීතතාය එවං ලද්ධ නාමානි'
(කස්සප සංයුත්ත අටුවා ii, 125)

106. **නිබ්බුය්හති**, පාවී යයි. නිබ්බුය්හාමීති ඨාතුං අසක්කොන්තො අතිවත්තාමි.' (සං. අ. i, 15)

107. **නෙගම** - නියම්ගම් වැසි සමූහය; ගම්සභා නගරසභාදිය 'අථ ඛො රාජගහකො නෙගමො සාලවතිං කුමාරිං ගණිකං වුට්ඨාපෙසි' - ඉක්බිති රජගහනුවර වැසි ගෘහපති සමූහය - හෙවත් රජගහවේ නගර සභාව - සාලවතී කුමරිය ගණිකා ස්ථානයෙහි තැබීය.) (පාරාජිකාපාළි)

නෙගමොති කුටුම්බියගණො (එම අටුවා)

108. **පච්චාහාර** = මගහැරීමට කරන හෝ කියන දේ. ' සො මය්හං හදයං වා රුජති, කායො වා බාධතීති කිඤ්චි පච්චාහාරං අකත්වා......... වදති' (=මගේ පපුව රිදේ ඇඟ රිදේ යයි මගහැරීමට හෙතු නො දක්වා ........... කියයි.) (යක්ඛසංයුත්තට්ඨකථා)

ඉංග්‍රීසියෙහි Excuse යන වචනය මීට සමානාර්ථ ඇත්තේයි. නිදොස්වීමට කියන කාරණය 'ප්‍රත්‍යාහාර' යයි.

109. පටග්ගි = විරුද්ධ ගින්න
'අනුජානාමි භික්ඛවෙ දවඩාහෙ ඩය්හමානෙ, පටග්ගිං කාතුං.'
(චුල්ලවග්ගපාළි)
කැලයක් ගිනිගෙන දැවෙන කල්හි ඊට ළංව පිහිටි ගෙවල් බේරාගැනීම සඳහා ගෙවල් අවට වනය හෝ තෘණාදිය කලින් පුළුස්සා දැමීම අදහස් කරනු ලැබේ.

110. පටිග්ගහ = පඩික්කම
'සෙට්ඨිභරියා පටිග්ගහෙ නිට්ඨුභිත්වා දසිං ආනාපෙසි'
(=පඩික්කමෙහි කෙළගසා දසියට අණකළේය.) (මහාවග්ගපාළි)

111. පටිභාණචිත්ත = ස්ත්‍රී පුරුෂ සංසර්ගය දැක්වෙන චිත්‍රය,
රඤ්ඤො පසෙනදිස්ස කොසලස්ස උය්‍යානෙ චිත්තාගාරෙ පටිබාණචිත්තං කතං හොති.' (=කොසොල් රජුගේ උයෙනෙහි වූ චිත්‍රශාලාවෙහි ස්ත්‍රී පුරුෂ සංසර්ගය දක්වන චිත්‍රයක් අඳින ලද්දේ වේ. (පාචිත්තියපාළි)

112. පණාමෙති = නෙරපයි.
'අථ කො භගවා කිස්මිඤ්චිදෙව පකරණෙ භික්ඛුසංඝං පනාමෙත්වා'
(=කිසියම් කාරණයෙක්හි භික්ෂු සංඝයා නෙරපා.) (ඛන්ධසංයුත්ත)

113. පනොපණවියා = වෙළඳ බඩු ගනුදෙනුව: මිලගණන් අඩු කිරීමට හෙට්ටුකිරීම.
'තස්ස පා'යං එවරූපී පණොපණවියා න උපෙති.'
(= මෙබඳු වූ මිලගණන් අසමින් හෙට්ටුකිරීම ඔහුටත් නො හොබී.)
(කීටාගිරිසුත්ත)

114. පදසා = පද ශබ්දයේ තතියා එක වචනය. මෙය මනොගණයෙහි නොවෙතත් 'පදසා, පදසි' යන පද විද්‍යමාන වෙති. මෙය පදදි - ගණය යයි පදසාධනයෙහි කියන ලදී: බිල ශබ්දයද මීට සමානයි.

'සුජාතා ඔතරිත්වා යානකස්ස පවජතො පදසා පායාසි.
(මණිචොර ජාතක)
'අම්බට්ඨං මාණවං පදසා යෙව පවට්ටෙසි' (=අම්බට්ඨමාණවකයා පයින් ම පෙළුවේය.) (අම්බට්ඨසුත්ත)

115. පරියන්ති ශබ්දය තෘප්තියෙහි හෝ සෑහීම් අර්ථයෙහිත් වැටෙන බව දික්සඟි අටුවාහි (119) එන 'එතස්ස භගවතො වචනස පවණ පරියත්ති නාම නත්ථි' යන්නෙන්ද එහිම 422 පිටේ 'ඉදං හි මම යාව ජීවං පරියන්තං අස්ස' යන්නෙන්ද පෙනේ.

116. පරිවච්ඡ - සූදනම්: ලැස්තිය
'තෙන හි භන්තෙ ආගමෙථ, මයම්පි පරිවච්ඡං කත්වා ආගච්ඡාමාති. තුම්හෙසු පරිවච්ඡං කරොන්තෙසු අම්හාකං පපඤ්චා හොති.'
(ධ. අ. උදේනව)

(1) ආගමෙථ - නවතිනු මැනව.
(2) පරිවච්ඡං කත්වා - සූදනම් කොට.

117. පාමෙති - ප්‍රමාණකරයි: මණියි.
'මා තං රූපෙන පාමෙසි, ආරොහෙන පභාවතී'
(-එම්බා ප්‍රබාවතිය ඒ කුසනිරිඳු තාගේ රූපයෙන් හා ආරොහ පරිණාහයෙන් ප්‍රමාණ නොකරව.) (කුසජාතක)

118. පිඤ්ඤාක - තල පුන්නක්කු.
(1) 'ඡබ්බග්ගියා භික්ඛුනියො වාසිතකෙන පිඤ්ඤකෙන නහායන්ති' (-සුවඳ කැවූ තලපිටියෙන් ඇඟ උළා නාති.)
(පාචිත්තිය පාළි)

(2) පිඤ්ඤාකභක්ඛො වා හොති, තිණභක්ඛො වා' හොති.'
(කස්සපසීහනාද සුත්‍රාදිය)

119. පුටංස -උරයෙහි එල්වාගත් පොට්ටනියක් ඇත්තා 'අලං යොජනගණනානිපි දස්සනාය ගන්තුං අපි පුටංසෙනාපි' (- උරෙහි එල්වාගත් බත් මුලක් ඇත්තහු විසිනුදු දැකීම පිණිස බොහෝ යොදුන් ගණනක් වුවත් යාම සුදුසුය.) (චතුක්කඞගුත්තර)

120. පෙත්තණික, පියාගෙන් ලත් දේ අනුභව කරන 'පෙත්තණිකො ති පිතරා භුත්තානුභුත්තං භුඤ්ජති.' (අං අටුවා,, 676)

121. පෙත්ති- පිතෘවාචක පෙත්ති -ශබ්ය සමාසවිෂයෙහි පෙනේ.

(1) 'මාතාපෙත්තිභරං ජන්තුං
කුලෙ ජෙට්ඨාපචායිනං.' (සක්කසංයුත්ත)
(2) පෙත්තිවිසය යන තැන මෙ ප්‍රෙතවාචකයි.

122. පෙත්තික-පියාසතු
'ගොචරෙ භික්ඛවෙ චරථ සකෙ පෙත්තිකෙ විසයෙ' (-තමාට ගොචරවූ ස්වකීය පිය සතු පෙදෙසෙහි හැසිරෙව්.) (සතිපට්ඨාන සංයුත්ත)

123. පොත්ථක - වැහැරි (-කැන්වස්) රෙද්ද
(1) 'පොත්ථකො දුබ්බණ්ණො ච හොති දුක්ඛසම්ඵස්සො අප්පග්ඝො' (තිකඞ්ගුත්තර)
(2) පොත්ථිකොත්ති වාකමයවත්ථං (ම අටුවා 449)

124. පොන්ති, රෙදිකඩ, අමුඩය, 'නික්ඛිප පොන්තිං ච සටිකං චාති තයා පරිදහිතං පිලොතිකඛණ්ඩං ච භික්ඛා කපාලං ච ඡඩ්ඩෙහි.' (ඉසිදාසි ථෙරී. අටුවා)

125. බාහුජඤ්ඤ - බොහෝ දෙනා දත්
'බාහුජඤ්ඤංති බහූහි ඤාතං පටිවිද්ධං' (සං. අ. iii 199)

126. මහන්තශබ්දය මෙන් බ්‍රහන්ත ශබ්දය ද සමාසයෙහි ආකාරාන්තව සිටී.
'යථාපි පබ්බතො සෙලො
අරඤ්ඤස්මිං බ්‍රහාවනෙ.' (තිකඞ්ගුත්තර)
'ඉමෙච ච වත්වාන යමස්ස දූතා,
තෙ ද්වෙ යක්ඛා ලොහිතක්ඛා බ්‍රහන්තා' යන රෙවතී විමානවත්ථු පාඨයෙහි 'බ්‍රහන්තා' යි ප්‍රථමා බහුවචනය පෙනේ.

127. මණික - (1) මහසැළිය: (2) ගුළිය
(1) 'සෙය්‍යථාපි නාම මණිකො භුත්වා උද්දෙකනිකො අස්ස (-මහසැළියක් වී සිට පසුව වතුර ගන්නා කුඩා භාජනයක් වන්නා සේ.) (චූළසකුලුදායිසුත්ත)

128. මණික: ගුළිය:.
කරුවින්දකපාසාණචුණ්ණෙන සඞ්ං ලාඛං යොජෙත්වා මණිකෙ කත්වා සුත්තෙ ආවුණිත්වා තං මණික කලාප පනතිං උභතො ගහෙත්වා පිට්ඨිං සංඝනති' - නෑමේදී පිට ඇතිල්ලීමට ගන්නා

ගුලිවැලක් මෙහි කියවේ. ඒ ගුළි තිරුවාණගල් (?) කුඩු ලාකඩ හා මිශ්‍ර කොට සාදතියි සීහ. (අං. අ. 463)

සෙරිවාණිජ ජාතකයෙහි 'මණිකෙ ගණ්හථ මණිකෙ ගණ්හථාති විචරන්තො' යන තැන කියවෙන්නේ බෙල්ලේ පලඳින 'ඇට වැල්' විය යුතුයි. (යුරෝපීය භාෂාවලට නැගූ ජාතක පොත්වල එයට මැටි භාජන යයි කියා තිබේ.)

ජාතක ගැටපදයෙහි මෙය 'වලලු' යයි තෝරා තිබේ. සිංහල ජාතකපොතෙහි 'කදාවලලු' යයි පෙනේ. වලල්ලට එවැනි පර්‍යාය නාමයක් පාළිනිඝණ්ඩුවෙහි නොදක්වන ලදී. මෙය පරීක්‍ෂණය කළ යුත්තකි.

128. මඞ්කුලි, 3. විකාරරූප ඇත්තා. 'මඞ්කුලිංති විරූපං දුද්දිකං බීභච්ඡං (සං අ. 163)

129. මත්ති, මාතෘවාචක මත්ති ශබ්දයක් සමාස විෂයෙහි පෙනේ.
'න වාහං බ්‍රාහමණ බ්‍රෑමි
යොනිජං මත්තිසම්භවං' (සුත්තනිපාත)
මත්තිසම්භවං - මවගෙන් හටගත් හෙවත් මවුකුසැ උපන්.

130. මත්තික - මවගෙන් ලත්
ඉදං තෙ තාත සුදින්න මාතු මත්තිකං, ඉත්ථිකාය ඉත්ථිධනං' (=දරුව සුදින්න, මෙය තාගේ මවගේ මාතෘසන්තක ධනයයි, ස්ත්‍රියකගේ ස්ත්‍රී ධනයයි)

131. මත්තිඝ - මව නසන්නා. (මාතෘඝන ශබ්දය අනුව ගියේ යයි සිතිය හැක)
'තම්බලොහවිලිනං ච තත්තං පායෙන්ති මත්තිඝං' (සංකිච්ච ජා.)
(= මව නැසූ පාපියාට දියවී ගිය තඹලෝමෙන් රත්වූ පානයක් පොවති.)

132. මන්දමුඛී - ගිනිතපින උඳුන
'අථ ඛො භගවා පඤ්චමත්තානි මන්දමුඛිසතානි අභිනිම්මිණි.' (මහාවග්ගපාළි)

133. මොසවජ්ජ - මුසාවාදය
'සච්චෙව ධීතා මොසවජ්ජං පහාය.' (පතිබ්බතාවිමාන ව.)

134. මිගමාතුකා = මීවින්නා, (මීමින්නා) (ජාතකගාථාසන්නය 36)

135. රජකත්ථරණ = රෙදි සෝදන තැන හෝ වේලන තැන.
'රජකත්ථරණන්ති රජකතිත්ථං' (විනය අටුවා)

136. ලකබ්ඛද්‍ද වත හෝ දෙසිනා රත්ති'
මෙහි 99 වෙනි අඩකය බලනු.

137. ලොණී = කලපුව; ලේවාය (අ. අ. 261)

138. වඩ්ඩි = පොලිය; අභිවෘඩිය
'දළිද්දෙ අස්කො අනාළ්හිකො ඉණං ආදියිත්වා වඩ්ඪිං පටිසුණාති' = ධනය නැති සහල් නැලියක්වත් නැති දිළින්ද ණයගෙන පොළිය (ගෙවීමට) පොරොන්දු වෙයි. (චතුක්කඩ්ගුත්තර.)

139. වන = පස්කම් සැපය
(1) 'වනං නාම පඤ්චකාමගුණා; තණ්හා වනථො' (නෙත්තිපකරණ)
(2) යො නිබ්බනථො වනාධිමුත්තො
වනමුත්තො වනමෙව ධාවති.
තංපුග්ගලමෙව පස්සථ,
මුත්තො බන්ධනමෙව ධාවති.' (ධම්මප. 344)
යමෙක් (ගිහිගෙයි) ආශාව දුරුකළේ, තපොවනයෙහි ඇලුනේ, කාමාශාවෙන් මිදුනේ; බන්ධනයෙන් මිදී ඒ බැම්මට අසුවීමට නැවත යන ඔහු දෙස බලව්.

140. වියූළ්හ =කලබල සහිතව රැස්වූ
'උභතො වියූළ්හං සංගාමං පක්ඛන්දති' (මහාදුක්ඛන්ධසුත්ත.ම.)
'වියූළ්හං ති රාසිභූතං' (එම අටුවා)

141. විසංවාදෙති = පොරොන්දු කඩකරයි; බොරු කියයි.
'කථං හි නාම ආයස්මා උපනන්දො රඤ්ඤො පසෙනදිස්ස කොසලස්ස වස්සාවාසං පටිස්සුණිත්වා විසංවාදෙස්සති?' (=වස්විසීම පොරොන්දුවී කෙසේ නම් ප්‍රතිඥා භඩගය කරන්නේද?) (මහාවග්ගපාළි)

142. විසෙවන =දමනය
'අදන්තංති සවිසෙවනං, දන්තංති තිබ්බිසෙවනං' (අං. අං. 31)
සිංහලෙහි 'විසේ' යන වචනය මීට සමානාර්ථ ඇත්තේ යයි හඟිමු.

143. වෙය්‍යාවික - වියදම
'දදම් තෙ ගහපති වෙය්‍යාවිකං යෙන තවං බුද්ධපමුඛස්ස.
භික්ඛු සංඝස්ස භත්තං කරෙය්‍යාසි' (චූල්ලවග්ග පාළි)

144. සච්ජති - හැපේ: ඇලේ
'සෙය්‍යථාපි භගිනි පුරිසො හත්ථිං දන්වා කචෙජ සජ්ජෙය්‍ය - නැගනිය, යම්සේ පුරුෂයෙක් තමාගේ ඇතු දන්දී උගේ බඳෙහි බඳින පොරොද්ද දීමෙහි පසුබසීද. (පරාජිකාපාළි)

145. සඤ්ජම්බරී, අවකාශයක් නැතිවෙන සේ පහරදීම. 'පොට්ඨ පාදං පරිබ්බාජකං සමන්තා වාචාසත්තිතොදකෙහි සඤ්ජම්භරිං අකංසු' - පොට්ඨපාද පරිව්‍රාජකයාට හාත් පසින් වචන නමැති ශස්ත්‍ර හා කෙවිටි වලින් පහර දුන්හ. (පොට්ඨපාද සුත්ත දීඝ)

146. සත්‍ථ - වෙළඳාම් පිණිස ගැල්වල හෝ සතුන් පිට බඩු පටවා ගෙනයන පිරිස.
'අතරො සත්‍ථො රාජගහා පටියාලොකං ගන්තු කාමො හොති.' (පාචිත්තියපාළි)

පටියාලොකං, පටියාලා ප්‍රදේශයට

147. සපත්තී - සමාන ස්වාමියකු ඇති ස්ත්‍රී (එක් පුරුෂයකුට එක් භාර්‍යාවකට වඩා ඇතිකල්හි ඒ භාර්‍යාවෝ සපත්ති නම් වෙති)
'අහං මත්තා තුවං තිස්සා
සපත්තී තෙ පුරෙ අහුං.' (මත්තාපෙතිවත්ථු)

148. සම්මති - වසයි: සංසිඳේ: ප්‍රමාණවේ
(1) 'පිතා මය්හං ජනෙත්තී ච
උභො සම්මන්ති අස්සමෙ' -මාගේ මවත් පියාත් දෙදෙන ආශ්‍රමයෙහි වසත්. (සොණනන්ද ජාතක)
'වෙරානි න ච සම්මෙය්‍යුං' - වෛරයෝ නොසන්සිඳෙන්නාහුය. (දෙවතාසංයුත්ත)

භික්ඛුනියො අනුවස්සං වුට්ඨාපෙන්ති: උපස්සයො න සම්මති' - භික්ෂුණීහු වර්ෂයක් පාසා උපසම්පන්න කෙරෙත්, විහාරය නොපොහොනේ වෙයි. (පාචිත්තිය පාළි)

149. සණ්ඨාන ශබ්දය 'සටහන' යන අර්ථයෙහි පමණක් නොව දුර බැහැරින් ආ මිනිසුන් බඩු බහා තබා විශ්‍රාම ගන්නා තැන යන අර්ථයෙහි ද වැටේ. 'සණ්ඨානෙති නගරද්වාරස්ස ආසන්නෙ

මනුස්සානං භණ්ඩකං ඔතාරෙත්වා විස්සමනට්ඨානෙ'
(වන සංයුත්ත අටුවා 227)

150. සරසී-විල
'භූතපුබ්බං භික්ඛවේ අරඤ්ඤායතනො මහාසරසී......... තෙ තං සරසිං ඔගාහෙත්වා' (ධම්මසංයුත්ත)

151. සංසාදෙති - නවත්වා තබයි.
(1) පඤ්හං පුට්ඨො සංසාදෙති, නො විස්සජ්ජෙති.' (ඛිකංගුත්තර)
(2) සංසාදෙති එ හි නිසිදපෙති.' (එම අටුවා 397)

152. සංසති - කියයි
'තස්ස සො පුරිසො තස්ස ගාමස්ස වා නිගමස්ස ව කෙමත්තං ව ..................... සංසෙයා' (සුනක්ඛත්ත ම.)

153. සුකති - යහපත් ක්‍රියා ඇත්තා: පිනැත්තා
'ගබ්භමෙකෙ උපපජ්ජන්ති
නිරයං පාපකම්මිනො
සගගං සුකතිනො යන්ති
පරිනිබ්බන්ති අනාසවා.' (ධම්මපද)

සංලක්ෂ්‍යය:
මෙරට මුද්‍රිතපොත් සියල්ලෙහිම මේ පද 'සුගති නො' යි පෙනේ. 'සුගති ඇත්තෝ ස්වර්ගයට යෙති' යි කීමෙහි තේරුමක් නැත්තේය. ' මෙය පාපකම්මිනො යන්නට විරුඩපක්‍ෂයෙහි වූ සුකතිනො (- සුකෘති කුශල කර්ම - ඇත්තෝ) යයි ගැනීම වටී.

154. සෙට්ඨි - අලු
'අඤ්ඤෙ පංසුං ඛිපන්ති, අඤ්ඤෙ සෙට්ඨිං ඛිපන්ති, අඤ්ඤෙ ගොමයං ඛිපන්ති.' (අග්ගඤ්ඤසුත්ත)

155. හදති - මලපහ කෙරේ
'යං හදන්තෙ හදන්ත'ඤ්ඤෙ

එතං මෙ හොති භොජනා:
අහං ච බො යං හදමි
එතං සො උපජීවති' (ගූථඛාදකපෙතවත්ථු)
(ස්වාමීනි අන්‍යයෝ යමක් පහරත්නම් එය මට ආහාරය වේ, මම යමක් පහරම් නම් මෙතෙම එය අනුභව කොට ජීවත් වේ.)

## පූර්වක්‍රියාවන් හා සමාසවූ පද.

උද්දිස්සකට (උදෙසා කළ දෙය) 'උද්දිස්ස' යන පූර්වක්‍රියාව හා 'කත' ශබ්දය සම සර්මෙන් සෑදී තිබේ. පූර්වපදයෙහි සිටි පූර්වක්‍රියා (නිපාත) පදයන් හා සමාසය නොවළක්වන ලදී.

අනුවිච්චකාර = පරීක්ෂණය කොට කිරීම.

පටිච්චකම්ම = නිසා හෝ උදෙසා කළ දෙය

නිසම්මකාරී = සමීක්ෂකාරී පුද්ගලයා

පටිච්ච සමුප්පාද = නිසා හැට ගැන්ම.

ආදියත් මෙසේ වූ සමසපද යි.

මහාවග්ග (විනය) පාළියෙහිඃ

අනුවිච්චකාරො තුම්හාදිසානං ඤාතමනුස්සානං සාධු හොති' (= තොප වැනි ප්‍රකට මිනිසුන්ට සමීක්ෂ්‍යකාරිත්වය යහපත් වේ.

මහාග්ගපාළියෙහි හා ජීවකසූත්‍රයෙහිත,

සමණො ගොතමො ජානං උද්දිස්සකටං මංසං භුඤ්ජති පටිච්චකම්මං' (ශ්‍රමණ ගෞතමතෙමේ දන්නේම උදෙසා කළ, නිසා මැරූ මස් අනුභව කෙරේ.)

නිග්ගය්හවාදී = නිග්‍රහකොට කියාන්නා, ධම්මපදයෙහි හා සාරිපුත්තත්ථෙරගාථාවන්හිඃ

'නිග්ගය්හවාදිං මෙධාවිං තාදිසං පණ්ඩිතං භජෙ.'

විභජ්ජවාදි = විභාගකොට කියන්නා විනයඅටුවාහිඃ

'කිංවාදි භන්තෙ සම්මාසම්බුධො? විභජ්ජවාදි මහා රාජාති

අපච්චක්ඛකාරි = ප්‍රත්‍යක්ෂයෙන් නොදැන ක්‍රියා කරන්නා මහාබොධිජාතකයෙහිඃඃ 'පණ්ඩිතා නාම තාදිසෙන පරපත්තියෙන අපච්චක්ඛකාරිනා සඞ්ං න වසන්ති.' පරපත්තිය = අනුන්ගේ වචන අනුව යන.

අවෙච්චප්පසාද = නොසෙල්වෙන ශ්‍රද්ධාව, දැන පැහැදීම. සොතාපත්තිසංයුත්තයෙහිඃ 'ඉධ භික්ඛවෙ අරියසාවකො බුධෙ අවෙච්චප්පසාදෙන සමන්නාගතො හොති.'

# ගැටපදය

උදහරණයන්හිත් අභ්‍යාසයන්හිත් ගැටලු තැන් මෙහි විස්තර කරනු ලැබේ. සම්පූර්ණ වාක්‍යයන්ට අර්‍ථ දියයුතු තැන්හි එසේත් කරනු ලැබේ.

## උදාහරණ i

1. දකුණු මුහුදට බැස නැවත එයින් නැගී සක්විති රජු සමගම පශ්චිම දිශාවට පෙරළී ගියේ ය.

අධි + ඔ + ගහෙත්වා = අජ්ඣොගහෙත්වා

අනු + එව = අන්වෙව.

3. භික්ෂූන් දහසකට වැඩි ගණනක් සර්වඥයන් වහන්සේට සේවය කෙරෙත්. (මෙහි පරොසහස්සං යන්න කර්තෘවාචකයයි. එය බලාගෙන ක්‍රියාව ඒකවචනයෙන් යොදා තිබේ.)

5. බහුදෙවරත්තිං, රෑ බොහෝ වේලාවක්, රැයෙන් වැඩි කාලයක්.

6. මා පැවිදිවූ තැන් සිට විසි පස් වසක් ගතවිය. (මේ තාක් කල්) අසුරගසන කාලප්‍රමාණකුත් සිතේ එකඟබවක් නො ලදිමි.

7. ජමා = ජමාය = පොළොවෙහි.

8. වණ්ණ = රූපෙන, ශරීරවර්ණයෙන් හා මනාරූපයෙන්

9. උදිච්චො උභතො අහුං, මවුපිය දෙපාර්ශ්වයෙන් උසස් කුල ඇත්තේ වීමි.

10. අතිප්ප ............ චරිතුං, සැවැත් නුවර පිඩු පිණිස හැසිරීමට තවම කල් වැඩිය.

11. දනංදජ්ජා, දන් දෙන්නේය.

16. සැප - දුක් දෝණයකින් මැන්නාක්හු මෙනි, (සමසමයේ පවතිත්.) පිරිහීම් වැඩීම් නැත්තාහ, උස් පහත්කම් නැත්තාහ.

## උදාහරණ ii

3. මුඩා විපතෙය්‍ය, හිස ගැලවී වැටෙන්නේය.

4. යම්සේ බල්ලෝ ඌරන් එළවත් ද එමෙන් ඔවුහු භායර්‍යාවන් නිසා මුළාවී මා එළවාදමත්.

5. A හෙතෙම සැළියක කටින් (ගෙන දෙන ආහාර) පිළි නොගනී, යම් තැනක බල්ලෙක් පැමිණ සිටියේ නම් (එතැනින්ද) නොගනී. (සැළිකටේ සැන්ද වැදීමෙන් හැළියට හිරිහැර වේ යන බියෙන් එසේ කරයි.)

B. බල්ලෙක් යමකුගේ පය ඩසින්නේ නම් ඒ (ඩසිනු ලැබූ) අය බල්ලාගේ පය නොසපයි.

6. ගල්පර්වතයක් මුදුනේ සිටියෙක් යම්සේ එය හාත්පස සිටින ජනසමූහයා දක්නේද.

13. (මේ තෙම) පෙර මාගේ සියගම්වැස්සෙක් විය, මිත්‍රයෙක් ද විය.

14. A. එබැවින් සත්පුරුෂයන්ගේ ද අසත්පුරුෂයන්ගේ ද මෙලොවින් (ච්‍යුතව) යාම වෙනස් වේ.

B. සග්ගපරායණා, ස්වර්ගය පිහිට කොටගෙන ඇත්තෝ හෙවත් එහි උපදින්නෝ.

18. සෙහි දරේ හසන්තුවෙඨා, ස්වකීය භාර්‍ය්‍යාවන් ගෙන් තෘප්තියට නොපැමිණියේ.

B. දරුවන් හා අඹුවන් කෙරෙහි යම් බලාපොරොත්තුවක් වේ නම් එය දැඩි බැම්මක් යයි පණ්ඩියෝ කීහ.

20. වහල්පලයේ ජලය වැටෙන තැන සිටි ස්ත්‍රියගේ කුල්ල දැමිය හැකි ප්‍රමාණය හෝ මෝල විසිකළ හැකි ප්‍රමාණය හෝ ගෙයි උපචාරය (= පරිසරය නම්වේ.)

24. සම්පටියකින් බැඳ ශක්තිමත් උලක හෝ කණුවක ගැට ගසනු ලැබූ බල්ලා ඒ කණුව හෝ උල හාත්පස ඇවිදියි.

## උදහරණ iii

2. A. ස්වකීය ධර්මයෙහි පිහිටා මා (මවුහු) නොපෙළන්නාහ.

B. සතුටු සිතැත්තෝව ස්වකීය ආසනයන්හි හුන්හ.

3. අයිතිකාරයෝ යම් යම් තැනකදී තමන්ට අයිතිදේවල් දකින්නාහු නම් ඒ ඒ තැන්හිදීම ඒවා ගෙනයන්නාහ.

4. යම්සේ මනුෂ්‍ය සමූහයා විසින් සේවිත වූ බොහෝ ගංගාවෝ බසිමින් සාගරය කරා එළඹෙත් ද.

6. පූජස්ථාන වශයෙන් සලකන ආරාමයෝ (උයන්වතු) ද වනයෝ ද මනාසේ සෑදූ පොකුණු ද මනුෂ්‍යයා පිළිබඳ රම්‍යභාවයාගේ සොළසින් කොටසකුත් නො අගිති.

8. දෙවියන්ට අධිපති වූ ශක්‍රය, (අපි) කර්මාන්තයක් නොකොට යම් සැපයක් විඳිමු ද.

9. දණසන්ධිවලින් මාගේ කෙණ්ඩාදෙක ගැළවී වැටෙත්වා.

11. රත්‍යා විවසානෙ, රාත්‍රියගේ ඇවෑමේ දී.

12. සං යුගං නාතිවත්තති, ස්වකීය ධූරය හෙවත් භාරය අත් නො හරියි හෙවත් හැර නො දමයි.

13. අපරීක්ෂාවෙන් ක්‍රියාකරන්නාවූ වහා පතිත ස්වභාව ඇත්තහු ස්වකීය ක්‍රියාවෝම තැවීමට පත්කරත්. (කුමක්මෙන්ද යත්?) මුඛයෙහි දැමූ උණු ආහාරයක් (මුඛය දවන්නාක්) මෙනි.

14. A. සෙන'සන්තුට්ඨං, ස්වකීය රාජ්‍යයෙන් තෘප්තියට නො පැමිණි.

B. ජීවගාහං අගාහයි, පණපිටින් අල්වන්ට සැලැස්විය.

17. නිදි දුරුකළවුන් අතරෙන් නිදන්නෝ කීදෙනෙක් ද? නිදන්නන් අතරෙහි පිබිද සිටින්නෝ කී දෙනෙක් ද? කරුණු කීයකින් කිලිටිවේ ද?

18. සබ්බස්සහරණාදිවධාදිකං, සියලු සම්පත් පැහැර ගැනීම ආදි දඬුවමක්.

19. උෂ්ණකාලයෙහි ග්‍රීෂ්මයෙන් පෙළුණේ යම්සේ ජලය කැමති වේ ද, එමෙන් (මම ඔබවහන්සේගේ) වචන අසනු කැමැත්තෙමි, (එබැවින්) ධර්මයක් දේශනා කළ මැනවි.

21. අව්ව ඇති තැනක පස් උඩ තැබූ මලක් මෙන් මේ ශරීරය එහා වියලේ.

22. බමුණ, මානය තාගේ කත් බරය, ක්‍රෝධය දුමකී, මුසා වාදය අලුය. (භස්මති = අලුකෙරෙහි. මුසාවාදය අලුවලට සමානය යන අර්ථයක් ගෙන දේ.)

## උදාහරණ iv

1. මෙසේ ගිහිවූ ද පැවිදිවූ ද ඇතැම් කෙනෙකුන් කෙරෙහි විශ්වාසය නොතබන්නේය.

3. 'පාවී ආ ලිය උතුම්ය, ඇතැම් මනුෂ්‍යයෙක් (ඒ තරම්) උතුම් නොවේය' යි මෙසේ ලෝකයේ ඇතැම් කෙනෙක් සත්‍යයක්ම කීහ.

6. සුතවතො අරියසාවකස්ස, උගත් ආර්‍ය්‍යශ්‍රාවකයාහට.

16. භාග්‍යවත්තෙමේ හාත්පස පිහිටි ජනපදයන්හි ශ්‍රාවකයන් අරබයා 'අසවලා අසවල් තැන උපන්නේය. අසවලා අසවල් තැන උපන්නෙයයි උත්පත්තීන් ගැනකියන බව මා විසින් අසන ලදි.

## උදාහරණ v

සැට දහසක් නුවරවල ද අනූනවදහසක් ගං මෝයවල් අසළ ද හයානූලක්‍ෂකෝටියක් පටුන්ගම්වල ද සපණසක් රත්නාකර (ඇති පෙදෙස්) වල දැයි සිය දඹදිව දෙවියෝ රැස්වූහ.

## පාලිභාෂාවතරණය iii

9. අන්‍ය ශතවර්ෂයකට නොපැමිණ අවුරුදු 120 ක් හෝ 130 ක් හෝ 140 ක් හෝ ජීවත්වෙයි. අනුරුඬස්ථවිරතුමා වනාහි අවුරුදු එක්සිය පණසක් විසීය. බක්කුලස්ථවිරතුමා 169 හවුරුද්දක් ජීවත් විය.

11. සත්සියයක් උගත් බමුණෝ ද සමානතත්වයෙහි පිහිටි හායනීාවෝ ද සතළිස් දෙනෙක් ද නොයෙක් දහස්ගණන් ක්‍ෂත්‍රිය වංශිකයෝ ද අනුව පැවිදිවූහ.

## උදහරණ vi

2. එසේම ඉන්ද්‍රියසංයමයෙන් යුක්තව බ්‍රහ්මචාරීවූ තාපසයන්ට හිංසාකරන්නාවූ අධර්මයෙහි හැසිරෙන, ඒ ක්‍ෂත්‍රියතෙමේ ස්වර්ගීය හා විරුඬවෙයි හෙවත් ස්වර්ගයට නො යයි.

4. හෙතෙම තමාගේ සිතින් අන්‍ය සත්වයන්ගේ අන්‍ය පුද්ගලයන්ගේ සිත පිරිසිඳ දැනගනී.

5. අඥාන වූ තෙපි මානෙල් දඬුවලින් පර්වතයක් මඩින්ට උත්සාහ කරන්නාහුය, ගල් පර්වතයක් නියවලින් හාරන්ට උත්සාහ කරන්නහුය., දත්වලින් යකඩ විකන්නහුය.

6. නිර්මල ඇස් ඇති යහපත් මුහුණක් ඇති මහත් වූ සෘජුවූ ප්‍රතාපවත්වූ එතුමා ශ්‍රමණ සමූහයා මධ්‍යයෙහි හිරු මෙන් බබලයි.

8. එය වනාහි මගධදෙශීන්ගේ ගිරිව්‍රජ නුවර අසළ වූ ගිජ්ඣ කූටයට උතුරෙන් පිහිටි විශාල වූ වෙපුල්ලපර්වතයයි කියන ලදී.

9. හික්මුණු කොටළුවෝ ද කරුණු වටහා ගන්නා සෛන්ධව අශ්වයෝ ද කුඤ්ජර නම් වූ මහා හස්තීහු ද උතුම්වෙති. ආත්මය දමනය කළ තැනැත්තේ ඊට වඩා උතුම්වේ.

10. මහණ, තාගේ බඩ තියුණු ගෙරිකපන කැත්තකින් කපාදමන ලද්දේනම් යෙහෙකි, බඩ නිසා රාත්‍රී අන්ධකාරයෙහි පිඬු පිණිස හැසිරීම යහපත් නොවේ.

11. අඥානයන්ගේ ප්‍රශංසාවට වඩා පණ්ඩිතයන්ගේ ගර්හාව යෙහෙකි.

## උදහරණ vii

1. උපකට්ඨාය පවාරණය, වස් පවාරණය ලංවූ කල්හි.

3. ඕතොමෝ වැගිරෙන්නාවූ දියබින්දුවලින් යුක්තවූ අඩක් පිරූ හිසකෙස්වලින් යුක්තව වේගයෙන් අවුත්ඃ 'ස්වාමීපුත්‍රයා වහා හැරි එන්නෙහිය'යි කීය.

6. මහාසමත්තං, කසිණභාවනාවෙන් ඉපදවිය හැකි ආලෝක මාත්‍රයක්.

12. B. ඔවුහු ඇය නැතිවම ගෙට ගොස්

14. පරා - මරණ දෙක (මිනිසුන්) මඩිමින් පවත්නාකල්හි ධර්මයෙහි හැසිරීම, සම හැසිරීම කුසල්කිරිම හැර අන් කුමක් කළ යුතුද?

17. ඉදින් ඔබට කාමයන්ගෙන් අඩුවක් වේ නම් මම එය සම්පූර්ණ කරන්නෙමි.

18. ආයුෂ්මත් අංගුලිමාලතෙමේ බිඳුණු හිසින් ද ගලන ලෙයෙන්ද බිඳුණු පාත්‍රයෙන් ද ඉරීගිය දෙපට සිවුරෙන් ද යුක්තව භාග්‍යවතුන් වහන්සේ කරා පැමිණියේය.

19. රජතෙමේ ගිනිගත් උණවනයක් මෙන් ද ලුණු දැමූ උදුනක් මෙන් ද කෝපයෙන් සට - සටගාමින් 'වහා පිරිවර සහිත සාමාවතියට කැඳවව්' යයි කීය.

## උදහරණ viii

1. මේ කපටි තවුසා රජකුමරකු වූ මා ගැන නො සලකා තිරිසනුන්ට සැලකිලි කරයි.

6. මේ ලෝකයෙහි බ්‍රාහ්මණාදීහු කිඹිස හෝ පය පැකිල 'මහාබ්‍රහ්මයාට නමස්කාර වේවා'යි යමකු ගැන කියත් නම් ඒ මේ මහාබ්‍රහ්මයායි.

8. නිරන්තරයෙන් ශුද්ධිය සොයන්නාවූ නික්ලෙශී පුද්ගලයාහට අස්ලොම් අගක් පමණ වූ පාපය වළාකුළක්සේ (මහත්ව) වැටහේ.

11. තමාහුවරියං, එය උතුම් දෙයකැයි කීහ.

12. පඤ්ච ආරාමිකසතානි, ආරාමය සම්බන්ධ වැඩකරුවන් පන්සියයක්.

18. කිමෙක්ද? භාග්‍යවත්තෙමේ (අන්‍යයකු) රහත්බව ලැබීම ගැන මසුරුවේදැයි?

19. බ්‍රහ්මයා ගැන භාග්‍යවත්තෙමේ විස්තර කීයේය, එය අපට රුචිවේ, අපේ මතය හා ගැළපේ.

## උදහරණ ix

5. පුරත්ථිමතො නගරස්ස, නුවරට නැගෙනිරින්.

6. පෙරෙහි පුරෙතරමෙව, තෙරුන් (යන්ට) පෙරටුවම හෙවත් ඊට කලින්ම.

9. A. ඇතැම් කෙනෙක් ධනය ලැබ අශ්‍රද්ධානකම නිසා දැන් නොදෙත්. B. එබැවින් ප්‍රඥාවම ධනයට වඩා ශ්‍රේෂ්ඨ ය.

10. A. කෙළෙඹියාගේ ගෙයිදී ආහාර අනුභවකිරීමට වඩා අශුචි කෑම තට උතුම් ය.

18. ස්වයංජාත විලකට බැස නාන්නාවූ පසේ බුදුන්ගේ ඉවුරෙහි තැබූ සිවුරු අතුරෙන් (තනිපට) සිවුර සොරකම් කොට ඒ ඇතුන් යන මග හිස පටන් පොරවාගෙන හිඳියි.

25. පින්වත්නි, මම වනාහි දැන් රජුන්ට රජෙක් වෙමි, බ්‍රාහ්මණයන්ට බ්‍රහ්මයා වෙමි, ගෘහපතීන්ට දේවතාවක් වෙමි.

26. මාතාපිතුන්නං අපස්සන්තානං, මවුපියන් නොදක්නා කල්හි හෙවත් ඔවුන්ට නොපෙනී.

## උදහරණ x

1. අඩ්ඪානමග්ගපටිපන්නො, දිඝීමාර්ගයට බැස්සේ.

2. මුළු පොළොවට අධිපතිවූ රජකමටත් වඩා, දෙව්ලොව යාමටත් වඩා, හැමලොකයන්ටම අධිපතිබවටත් වඩා සෝවාන් ඵලය (ලැබීම) උතුම් වේ.

3. උතුරු දෙසින් පළල්වූ දකුණු දෙසින් ගැලක ඉදිරිපසට සමාන (වනසේ පටු) වූ මේ මහ පොළොව සත්කොටසක් වනසේ සමකොට මනාසේ බෙදන්ට කවරෙක් සමර්ථවේ ද? මෙහි (මහා පඨවි යන්නෙන් දඹදිව පොළොව අදහස් කරන ලදී. එය උතුරෙන් පළල් ව ද දකුණෙන් පටුව ද පිහිටියේය.)

6. නොදන්නන් වළක්වන්නාවූ හඳුනන්නන් ඇතුල්කරන්නාවූ නුවණැති දොරටුපාලයෙක් ඒ නගරයෙහි වන්නේය.

7. මේ ප්‍රතිහාර්‍ය්‍යය දක්නා වූ රජු ප්‍රීතියෙන් නිරතුරුව පිරුණු ශරීර ඇතිව ඇඳිලිබැඳ සිටියදීම මහාබෝධිය සියගණන් මුල්වලින් රන්කටාරමෙහි පිහිටියේය.

9. හෙ තෙමේ ශරීරය යටිපත්ලෙන් උඩ, කෙසගින් යට සමකෙළවරකොට නොයෙක් අශුචියෙන් පිරුණු සැටි නුවණින් බලයි.

11. **සඩස්ස කුලපුත්තස්ස**, ශ්‍රද්ධාවත් කුල පුත්‍රයා විසින්.

12. **දිසම්පති** රජතෙමේ හවත් ජොතිපාල මාණවකයා දකිනු කැමැත්තේය.

15. **යම්කෙනෙකුත් විසින් කායගතාසතිය නොවඩන ලද්දී නම් ඔවුන් විසින් අමෘතය පරිභෝග නො කරන ලදී.**

17. ඔහුගේ පිටට නැග අං අල්වාගෙන එල්ලෙමින් නගුට අල්ලා ඔන්චිලි පදිමින් ක්‍රීඩා කළේය.

18. පූටකම්මස්ස කොවිදො, ගොටු සෑදීමෙහි දක්ෂයෙකි.

19. නච්චගීතස්ස කුසලා, නෘත්‍යගීතයන්හි දක්‍ෂවූ

20. පන්දම් දරනකල්හි මහත් රාජානුභාවයෙන් යුක්තව රජගහවෙන් නික්මුණේය.

## උදහරණ xi

3. අන්‍යයෙක් මාගේ අනභිරතිය ( = නො ඇලීම) දුරුකොට ඇලිමක් ඇතිකරන්නේය යන්න කොයින් ලැබියහැකිද?

## උදහරණ xii

3. මෙතෙක් ධනය විද්‍යමානකල්හි තමාත් පරිභොග නො කෙළේ ය, පින් ද නො කෙළේ ය.

4. තුමූ නොගන්නාහු කෙසේ නම් මටත් නො දෙවා යන්නා හු ද?

## උදහරණ xiii

2. ශික්‍ෂාව හැර දමන්නාවූ නුවණැත්තා කෙසේනම් කල් ගතකරන්නේද? (ශික්ෂාව හැරදැමීමෙන් පසුව යයි තේරුම්ගතයුතු. සිවුරු හැරයාමත් ශික්ෂාප්‍රත්‍යක්‍ඛ්‍යානය යි කියනු ලැබේ.

4. පුඤ්ඤස්ස උච්චයො, පින් රැස් කිරීම.

5. වදඤ්ඤූ, අනුන්ගේ වචන හේ අදහස් දන්නා ස්වභාව ඇත්තී හෙවත් දන්දිමෙහි ඇලුනී.

6. ගණම්හා වූපකට්ඨා, සමූහයාගෙන් වෙන්වූ.

8. අත්ථාය හෙහිති, වැඩ පිණිස (යහපත පිණිස) වන්නේය.

9. සාගින්නෙන් පෙළුණු චණ්ඩාලයන් බල්ලකු (මරාකන්නා) සේ කාමයෝ තා ද විනාශ කරන්නාහ.

10. ඒ අසූහාරදසක් පැවිද්දෝ අන්මගකින් ගියහ, විදර්ශී බෝධිසත්වතෙමේ අන්මගකින් ගියේය.

11. ගෙය සාදන්න, (තෝ මා විසින්) දක්නා ලද්දෙහි. නැවත ගෙය නො සාදන්නෙහිය.

12. දණ බිම හපා වැද ඉදිරියෙහි (සිට) ඇදිලි බැන්දෙමි.

13. B. ඕ තොමෝ කල්පාන්තයේදී මෙන් ලෝකය ගිනිදැල් සමූයෙන් ගැවසුනාක් කෙළේය.

16. යම්බඳු අයකු මිත්‍රයකු කෙරේද, යම්බඳු අයකු ආශ්‍රය කෙරේද, එය කරන්නාත් එවැනි අයෙක් වෙයි. සමග විසීම එබඳු එකකි.

17. A. අසත්පුරුෂයෝ දෙන්ට අපහසු දෙය දෙන්නන්ට ද කරන්ට අපහසු දෙය කරන්නන්ට ද අනුව ක්‍රියා නොකරත්. සත් පුරුෂ ධර්මය අනුව යාම අපහසුය.

18. C. බුදුරජුන්ගේ අනුශාසනාව අසා ඔවුහු ද (අමනුෂ්‍යයන් දැකීම සඳහා) උත්සාහ කළහ.

21. හිස, නෙළුම්අල, මුලාල, නෙළුම් අල හා සම්බන්ධව තිබෙන කෑමට ගතහැකි මුල්.

## උදහරණ xiv

2. B. උතුම් පිත්ලකුණු ඇති බුදුරදුන් දැක (ධූතීයාට උපුටා දුන්) ඇස පෙරසේ (ප්‍රකෘතිමත්) විය.

3. A පර්වතයන් අතරෙහි වෘක්ෂයක් මෙන් තිදන්නෙමි, ඒ තණ ඇතිරිය මට පුළුන් මෙන් (මෘදු) වන්නේය.

B. ඒ කරණකොට නොසතුටු සිතැත්තෙක් නොවන්නෙමි.

C. ශ්‍රෙෂ්ඨවාදියා වූ බුදුරදුන්ගේ දායාදයට හිමිකාරයෙක් වෙව.

5. උභකො උදිච්චො, මවුපිය දෙපාර්ශ්වයෙන් උසස් කුල ඇත්තේ.

12. සවාමීනි, මම පෙර සුමෙධ නම් බුදුන්ගේ ශ්‍රාවකයෙක් වීමි.

13. ඒ මම අද 'මම නිත්‍යවෙමි, සදකාලික වෙමි' යි කෙසේ නම් කියම් ද?

14. උපකාජීවකතෙමේ 'ඇවැත්නි, වෙන්වත් හැකිය'යි කියා හිස වනා වෙනමගක් ගෙන ( = අත්මගකට බැස) ගියේය.

16. රථාචාර්යය, මෙහි එව: (ගමට) යව: මේ රථය බාරදෙව: මා නිරෝගි බව බැමිණියට කියව: බ්‍රාහ්මණයා පැවිදිවියයිද කියව.

17. දැන් තෝ තිරුත්තරවූ ලෝකස්වාමීන්ට මාගේ වැඳීම ගැන කියව.

18. ඉදින් වනමැද්දේහි වසන්නෙමු නම් මම ඔබගේ වසභයට පැමිණියෙක් වන්නෙමි.

## උදහරණ xv

1. තිස්හයවෙනි කල්පයේදී අරුණක නම් ඇති මහාබලැති සක්විතිරජවරු සත්දෙනෙක් වූහ.

2. මාගේ පැවිදිවීම හෝ මරණය හෝ වන්නේය, විවාහ ගිවිසීම නො වන්නේය.

3. ගිහිව සිටිනතාක් ආහාර නො ගන්නෙමි. මරණයාගේ වශයට ගිය තැනැත්තියක් වන්නෙමි.

4. මේ කාරණයේදී තෙපි සහාය නො වූවහු.

7. යමක් කරන්නේ නම් එය කියන්නේය, යමක් නො කරන්නේ නම් එය නොකියන්නේය.

10. අල්පදෙයක් හෝ බොහෝ දෙයක් හෝ කිවමැනවි, ප්‍රයෝජනවත් දෙයක්ම මට කියෙහි.මට අර්ථවත් දෙයින්ම වැඩ ඇත්තේය. බොහෝ අකුරු (හෝ වචන වලින්) කුමක් කරන්නෙහි ද?

13. ස්වාමීනි, භික්ෂූහු ජීවිතාන්තය දක්වා ආරණ්‍යකයෝ වන්නාහු නම් පිණ්ඩපාතිකයෝ වන්නාහු නම් යෙහෙකි.

14. යක්ෂය, යම්කලක මෙවැනි දෙයක් දක්නෙහි නම් නැවතත් මට කියව.

15. සියා ව්ස්ස කායෙ බලමත්තා, ඔහුගේ සිරුරෙහි ප්‍රමාණවත් ශක්තියක් ඇති වන්නේ ය.

16. කුපිතා වා අනත්තමනා වා අස්සථ, කිපියාහු හෝ නො සතුටු සිතැත්තෝ වන්නාහු නම්

## උදහරණ xvi

3. මාරය, යම්සේ මා ගිය මගවත් තෝ නොදක්නෙහි ද එසේ කරන්නෙමි.

5. A. අනිත්‍ය දෙය අනිත්‍ය වශයෙන් දක්කාහ: දුක්වූ දෙය දුක් වශයෙන් දැක්කාහ.

B. යමෙක් සැපය දුක් වශයෙන් දුටුවේද, දුක හුලක් වශයෙන් දුටුවේද.

9. තාගේ දූ වූ අනෝපමාව යම් පමණ ධනයක් දී ගත යුක්තීයයි නියම කරන ලද්දීද එමෙන් අටගුණයක් අමුරන් හා රත්නවගීයන් මම දෙන්නෙමි.

11. පිරිස් මැද නාද කරන්නාවූ, වාදීන්ගේ එඩි මඩින්නාවූ ඔබගේ මූණ යම් කෙනෙක් දකිත්, නම් නරශ්‍රෙෂ්ඨයාණෙනි, ඔවුහු පිනැත්තෝය.

15. ධම්ය නමැති බෙහෙත සොයන්නාවූ මම සියලු ඖෂධයන්ට අග්‍රවූ, සියලු (දුක් නමැති) හුල් දුරුකරන්නාවූ ශාක්‍ය ශාසනය දුටුවෙමි.

17. A එකල්හි ඔවුහු මාර්ගය ශුඩකිරීම පිණිස මට අවකාශයක් දුන්හ.

21. අනාගතයේදී යම් මහණ බමුණුකෙනෙක් ලෝකයෙහි වූ ප්‍රියභාවය ගෙනදෙන සැප එළවන රූපය අනිත්‍ය වශයෙන් දකින්නාහුද, දුක්වශයෙන් දකින්නාහුද, අනාත්මවශයෙන් දකින්නා හුද (ඒ මහණබමුණෝ) තෘෂ්ණාව දුරුකරන්නාහ.

22. ඇතැම් කෙනෙක් අමනුෂ්‍යයන් පිළිබඳ සියදහසක් දැක්කාහ: ඇතැම් කෙනෙක් කෙළවරක් නැති අමනුෂ්‍යයන් දුටහ හැම දිසාවෝ ම දෙවියන්ගෙන් පිරුණාහුය.

## උදහරණ xvii

5. තද එහින්ති මෙ වසං, එකල්හි මාගේ වශයට පැමිණෙන්නාහ.

6. B. පිළියෙළ කළ උතුම් මාර්ගයෙන් බෝරුකමුලට එන්නේ ය.

7. සියලුදෙන තෙත්වූ වස්ත්‍ර ඇත්තාහු තෙත් හිසකෙස් ඇත්තාහු ඇඳිලි බැඳගෙන බුදුරදුන්ගේ පාමුල වැටී මේ වචන කීහු.

8. වදතං සෙට්ඨො, වාදීන්ට ශ්‍රේෂ්ඨවූ බුදුරද

11. උත්තම රත්නය වූ ඔබගේ ධර්මය අසා එල පිළිපදින්නෙමියි ජත්තමානවකයා කීය.

13. මා මේ ශරීරය ගැන දන්නාසේ මහජනයාත් දන්නේ නම් (මේ ශරීරය) වැසිකලක අශුචි ඇතිතැනක් මෙන් (මහජනයා) දුරුකරන්නේය.

14. සියක් පලමක් බරැති සියගණන් රේඛාවලින් යුත් රන් තලිය හැරදමා මැටිපාත්‍රය ගතිමි: මෙය මාගේ දෙවෙනි අභිෂෙකයයි.

15. කාමයෙහි ඇලීමයයි තෝ යමක් කියෙහි නම් එය මට දැන් නො ඇලීමකි.

17. B. භාග්‍යවතුන්වහන්සේ ඉවත්ව ගිය නොබෝ වේලාවකින් මේ අතුරු කථාව උපන්නේ ය.

19. අහොරත්තං අච්චයෙන, රෑ දවල් ඉක්ම යාමෙන් ( = කල් ගතවීමෙන්.)

20' A. අතිමනොඥ රූප ඇති උන්වහන්සේ දැක මට ප්‍රීතියක් උපන්නේය.

B. ලෝකයෙහි කිසිවෙක් පව්වූ සිතැත්තෙක් නොවේවා.

## උදහරණ xviii

3. ඔබගේ ධර්මය අසන කල්හි වස්සන් රකින්නෙක් (මා) මැරුවේය.

A. මට කිසිවෙක් හිංසා නො කෙරේ: (නමුත්) මම ඉසි දසිය සමග නො වස්නෙමි.

B. මම නාලාගමින් යන්නෙමි. මේ නාලාවෙහි කවරෙක් වසන්නේ ද?

8. B. මනාසේ හික්මුණවුන්ගේ වචන අසා ඇති රජතෙමේ සියලු ගුණයන්හි පිහිටියේය.

11. (මාගේ) ශරීරයෙහි විෂ ගමන් නොකෙරේ. ආයුධයෝ මට තුවාල නොකෙරෙත් (හෙවත් මා නො නසත්.)

13. පරපණ නොනසන්නේය: නුදුන් දෙය නොගන්නේය. බොරු නොකියන්නේය, මත්පැන් බොන්නෙක් නොවන්නේය.

14. යමෙක් මේ ධර්මානුගත හික්මීමෙහි අප්‍රමාදීව වෙසේ නම් හෙතෙම නැවත උපදිමින් ඇවිදීම හැරදමා දුක කෙළවර කරන්නේය.

15. කවර කලෙක්හි මම පර්වත කඳුරුවල දෙවැන්නෙක් නැතිව වසන්නෙම්ද?

16. මානෙල් මිටි පසක් මාගේ මුදුන් මල්කඩ සඳහා ගෙන ආහ.

19. A. සොරුන්ගෙන් මැදිවූ දෙවට පාරක ගියෙමි: ඔවුහු ධනය සඳහා මා මැරූහ.

B. ඒ අපි නැවත මනුෂ්‍යාත්මයක් ලබා (යහපත් මගට) පිළිපන්නාහු සිල්වත්ව වසන්නෙමු.

21. මේ ලතා දෙව්දුව යම් සම්පතක් ගැන කියානම් අපි හැම දෙන ස්වාමිපුරුෂයන් කෙරෙහි ධර්මය පරිදි හැසිර ඒ සම්පත ලබන්නෙමු.

22. දෙවෙනි පෙළ: දරුගැබ කොටළුදෙන (නසන්නා) සේ සත්කාරය දුෂ්ට පුද්ගලයා නසයි.

## උදහරණ xix

1. තරුක්බා ............... බරිහිසත්පාය, යාගස්ථම්භ පිණිස ගස් නො කපන ලදහ.

3. මහලු වූ වැඩගත නොහැකි අශ්වයකු මෙන් (තෙමේද) ආහාරයෙන් ඉවත්කරනු ලැබේ.

4. පින්වත්නි, යම් සේ නිමිති පෙනෙත්ද, ආලෝකය හට ගනීද, බ්‍රහ්මයා පහල වන්නේය. (බ්‍රහ්මයා පහලවන කල්හි පෙනෙන නිමිති ද එළිය ද පෙනෙත්ය යන අදහසයි.

5. මහාජනතෙමේ ඔහු දැක 'එම්බා, මනොඥ - මනොඥ දෙයක් මෙන් මේ කුමක් ගෙනයනු ලැබේදැ'යි කියන්නේය.

6. මහණෙනි, මිනිසුන් මුළාකිරීම සඳහා මේ බඹසර රකිනු නො ලැබේ.

7. ඩූය්හරෙ, පාවී යති. න පමුචචරෙ, නොමිදෙන්නාහ.

9. A. ලෝක (සත්ව) තෙමේ සිත විසින් දක්කාගෙන යනු ලැබේ: සිත විසින් එහා මෙහා අදිනු ලැබේ.

10. නානාවිධ වූ එළු බැටළුවෝද ගවයෝද යම් තැනක නසනු ලැබෙත් නම් එවැනි යාගයකට නිවැරදි මාර්ගයෙහි පිළිපන් මහර්ෂීහු නොඑළඹෙති.

11. අකුශල කර්මය යම්තාක් කල් නොපැසේ නම් (= විපාක නොදේ නම්) ඒතාක් කල් අඥානයා ඒ පාපය මීපැණි සේ මධුර දෙයක් කොට සිතයි.

12. යම් තැනක සිටියේ පාපකර්මයෙන් මිදෙන්නේද එවැනි භූමිප්‍රදේශයක් (ලොකයෙහි) විද්‍යමාන නොවේ.

13. යමෙක් ශීලාදි ගුණයෙන් උසස් වූවන්ට (ආවාස) දේද හෙතෙම 'සියල්ල දෙන්නා'යයි කියනු ලැබේ.

11. A. අත්තා අභවිස්ස, ආත්මය වී නම්

B. එවං මෙ රූප මා අහොසීති, මාගේ රූපය මෙසේ නො පවතීනවායි.

15. චතුබ්බණ්ණා, ක්ෂත්‍රිය-බ්‍රාහ්මණ-වෛශ්‍ය-ශූද්‍ර යන සිවු කුලයට අයත් මනුෂ්‍යයෝ.

16. මැණියෙනි, මළ එකකු ගැන හෝ හඬත්, නැතහොත් ජීවත්ව සිටියදී දකින්ට නොලැබෙන එකක ගැන හෝ (ලොවැසියෝ) හඬත්.

17. එහි (ගින්නෙන් දැවෙන ගෙයි) යමක් නොදැවේ නම් එය ඔහුට (පසුව) ප්‍රයෝජන පිණිස පවතී

18. මේ බමුණා තමාගේ සිත කරණකොට වෙහෙසේ.

19. B. අපුබ්බං අචරිමං, ඉදිරිපසු නොවී.

20. වස්ත්‍ර ද ආහාර ද කාම සේවනය හා ක්‍රීඩාව ද යම් තැනක දුකසේ ලැබේනම් (එවැනි දිළිඳු කුලයක උපදී.)

## උදහරණ xx

1. බ්‍රාහ්මණය, මම කාය දුශ්චරිතයෙන් (යුක්තවීම) පිළිකුල් කෙරෙමි; නොයෙක් ලාමක අකුශලධර්මයන්ට පැමිණීම ගැන පිළිකුල් කරමි.

3. උරගානං පවරො, නාගරාජතෙම; පමොක්ඛං ඉච්ඡං, ගැලවීම කැමැතිවන්නේ, සෙලස්ස වණ්ණෙන, කළුගලක පැහැයෙන් යුක්තව, ඉධ පවිට්ඨො, මෙහි ඇතුල්විය.

බ්‍රහ්මං ච වණ්ණං අපචායමානො, බ්‍රාහ්මණ කුලයට ගෞරවකරන (මම); බුභුක්ඛිතො, බඩගිනි ඇත්තේද; හොත්තුං න විසහාමි, (නාගයා) කන්ට අසමර්ථවෙමි.

ගුරුළෙකු නයකු එළවා ආ කල්හි නයා තාපසයකුගේ වැහැරී සිවුර යටට වැදී සැඟවුණි. එවිට ගුරුලා බ්‍රාහ්මණ තාපසයා කෙරෙහි ගෞරවයෙන් උඩ අල්වන්ට නොහැකිව මෙසේ කීය.

4. යමකුගේ ප්‍රියභාවය කැමැතිවන්නේ නම් ඔහුගෙන් (කිසිවක්) නොඉල්වන්නේය, අධික ඉල්ලීම නිසා (පුද්ගලයා) අප්‍රිය කෙනෙක් වේ.

6. දූෂ්‍ය නොවූ සිතැත්තේ එක් සත්වයකුටවත් මෛත්‍රී කෙරේ නම් ඒ කරණකොට (හෙතෙම) යහපත කරන්නෙක් වේ.

8. ස්වාමීනි, මම යම් පෙදෙසක වසන්නෙම් නම් ඒ පෙදෙස දඩ - දඩ - යන ශබ්දය පවත්වයි.

9. පටිපෙසෙසි, නැවත යැවීය.

10. කේවට්ටය, සෘද්ධි ප්‍රාතිහාර්‍ය්‍යයෙහි මේ දෝෂය දක්නා මම එයින් පෙළෙමි, ලජ්ජාවෙමි, පිළිකුල් කෙරෙමි.

13. ශක්‍රය, තෝ තමා ඉදිරිපිටදීම කියන වෙපචිත්ති අසුරේන්ද්‍රයාගේ පරුෂවචන ඉවසන්නේ භය නිසා ද නැතහොත් දුර්වලත්වය නිසාද?

## උදාහරණ xxi

2. බිත්තියක් මුල හිඳගෙන (= ආශ්‍රය කොට) ඒ ආහාරය (හෝ බත් පිඩ) අනුභව කෙළෙමි.

3. මණ්ඩනං අනුයුඤ්ජිසං, සැරසීමෙහි යෙදුනෙමි.

4. වන්දිස්සං, වැන්දෙමි.

5. බමුණා, එවැනි භික්ෂුවට පහර නොදෙව; තමා විනාශයට නොපමුණුව.

6. කුසලං ච පුච්ඡිසං, නිරෝගිබව විචාළෙමි.

7. අනුවඩ්ඪකම්ස්සං, අනුව සක්මන් කෙළෙමි.

9. මා පච්ඡා විප්පටිසාරිනො අහුවත්ථ, පසුව විපිළිසර (= පසුතැවිලි) ඇත්තෝ නොවව්.

10. තස්ස තෙ විඤ්ඤුස්ස සතො මහල්ලකස්ස, කාරණ තේරුම් ඇති වැඩිවියෙහි සිටි ඒ තට.

## කර්තෘ වෙසෙසෙන අන්තර්වාක්‍ය.

A. යම් ශ්‍රමණ කෙනෙක් ස්ත්‍රීන් කෙරෙහි නො බැඳෙත් නම් ඔවුහු සැපසේ නිදත්.

B. පක්ෂීහු යම් වෘක්ෂයක් ආශ්‍රිතව වෙසෙත් න්ම් ඒ ගස ගිනි පිටකරයි.

C. බ්‍රහ්මචාරීන් කෙරෙහි ගෞරවයක් යමකුට නැත්නම් හෙතෙම සද්ධර්මයෙන් දුරුවේ. (කුමක් මෙන් ද යත්) අහසෙන් පොළොව දුර වූවාක් මෙනි.

පාලිභාෂාවතරණය iii

කර්මය වෙසෙසෙන අන්තර් වාක්‍ය

A. සෙන චෙතසා, ස්වකීය සිතින්.

B. යමෙක් අසත්පුරුෂයකුට උපකාර කෙරේ නම් අසත්පුරුෂයකු සේවනය කෙරේ නම් (ඒ අසත්පුරුෂයා) ඔහු කා දමයි. (හෙවත් විනාශයට පමුණුවයි.) කුමක් මෙන්දයත්, මළ ව්‍යාඝ්‍රයාට පණ දුන් සඤ්ජීවකමාණවකයා ඒ ව්‍යාඝ්‍රයා විසින්ම කා දැමීම මෙනි.

ක්‍රියාවිශේෂණාන්තර්වාක්‍ය.

A. බළලෙක් යම් තැනක (ආහාරයක්) ලබා නම් එතැනට දෙවැනි බළලෙක් ද පැමිණේ.

B. යම්කලක පිරිසිදු - සුදු පියාපත් ඇති කොක්කු කළු පැහැති වලාකුළට හයින් තැතිගත්තාහු වාසස්ථාන සොයමින් ඒ ඒ වාසස්ථානයන්ට පලායත් ද එකල්හි අජකරණී ගඟ මා සතුටු කරවයි.

C. පුත්‍රය, යම් යම් දිශාවෙක්හි සුභික්ෂස්ථානයෝ වෙත් නම්, ක්ෂෙමස්ථාන හා නිර්භයස්ථාන වෙත් නම් ඒ ඒ තැන් කරා යව; ශෝකයෙන් පෙළුනෙක් නොවෙව.

F. ඒ පක්ෂිතෙම යම්තාක් කල් භෝජනයෙහි ප්‍රමාණය දත්තේද ඒතාක් ජීවිතය රැකගත්තේය. මව ද පෝෂණය කෙළේය.

G . සර නමැති තෘණවර්ගය අත්වලින් කඩා කුටියක් සාදාගෙන විසුවෙමි; එහෙයින් මට සරභඞ්ග යන නම සම්මුතියෙන් ඇතිවිය.

උදාහරණ xxii

1. A. යම්තැනක දූසී නමැත්තා පැසුණේ (විපාක වින්දේ) නම් ඒ නරකය කෙබඳු වීද?

B. මාරය: යම් භික්ෂු නමක් පයේ මාපටඟිල්ලෙන් (ශක්‍රයාගේ) වෛජයන්තප්‍රසාදය කම්පාකළේ ද එවැනි භික්ෂුවකට ළංව හිරි හැරකොට දුකට පත් නොවෙව.

2. මහාවීරයන්වහන්ස, යම්සේ කීයෙහි ද, එය එසේමය. ඇතැම් කෙනෙක් මහලු ගවයකු මඩෙහි (ගැලෙන්නා) සේ මෙහි ගිලෙත්.

4. නුවණැති ධෛර්‍යවත්, සමග හැසිරෙන, මනාපැවැතුම් ඇති මිත්‍රයෙකු ඉදින් නොලබන්නේ නම් රාජ්‍යය අත් හැර හැසිරෙන රජකු මෙන් ද වනයෙහි ඇතිරජකු මෙන් ද තනිව හැසිරෙන්නේයි.

5. (ඒ පක්ෂියා) යම් හෙයකින් බොහෝ ආහාර අනුභව කෙළේද එහෙයින් එහිම ගිලා බැස්සේය. (හෙවත් විනාශයට පැමිණියේය.) හෙතෙම පමණ නොදන්නෙක් විය.

6. යම්සේ ශරත්කාලයෙහි හටගත් බීජය කෙතෙහි වපුරන ලද්දේ වැඩේද එමෙන් තාගේ නාසිකාව වැඩේවා. ( මා විසින්) ඉල්වන ලද්දේ පියුමක් (මට) දෙව.

7. මේ අනාගත මහත් භය පැමිණෙන්නන්ට මත්තෙන් අන්‍යෝන්‍යයන්ට ගෞරව ඇත්තෝ ද සුවචයෝද මෘදුවචන ඇත්තෝ ද වව්.

8. ආමජාතො, දසියගෙන් උපන්.

B. ඵුල්ලානි ගජ්ජති, උදරම් වචන කියයි.

9. අපගතකාළකං, පහවූ පැල්ලම් (කෝ කිලුටු) ඇති.

10. භවත් චෝරඝාතකයෙනි මා ඔවුන්ට පෙන්වා එනතාක් (=ඔවුන් හා කථාකොට එනතෙක්) බලාපොරොත්තු වෙත්වා.

## 134 සංහත වාක්‍ය.

(3) භවත් ආනන්දතෙමේ බොහෝ කලක් ඒ භවත් ගෞතමයන්ගේ උපස්ථායක විය. අතවැසියෙකු හා සමග හැසිරෙන්නෙක් විය, (එබැවින්) ඒ භවත් ගෞතම තෙමේ යම් ධර්‍මයන්ගේ වර්ණනාව කියන්නෙක් ද වීද යම් ධර්‍මයෙක්හි මේ ජනසමූහය සමාදන් කරවී ද වාසය කරවී ද යන මෙය භවත් ආනන්දතෙමේ දන්නේය.

## 141 ස්ථානප්‍රතිබද්ධ ආඛ්‍යාතවිස්තාර

1. A. එසේ කියන්නාවූ ඒ මට සර්වඥතෙමේ මෙසේ කීය: 'ගෝතමිය, තී යම්සේ වදින්නෙහිද, බුදුවරයෝ එසේ වැන්දයුත්තාහු නොවෙති'යි.

2. රන්කරුවා රිදියෙහි මලය පිළිවෙළින් ටිකෙන් ටික දුරු කරන්නාසේ නුවණැත්තා තමාගේ මලය දුරුකරන්නේය.

6. භවනිස්සිතා, නැවත ඉපදීමෙහි ඇලුනාහු.

## 143. හේතුප්‍රතිබද්ධ ආඛ්‍යාතවිස්තාර

(ඉ) A. තමා පිණිස හෝ අනුන් පිණිස හෝ පුත්‍රයකු (ලබන්ට) නොකැමති වන්නේය, ධනය හෝ රටක් හෝ (ලබන්ට) නොකැමැති වන්නේය.

## උදාහරණ xxiii

2. යම්කෙනෙක් පරතෙරට යන්නාහු නම් එවැන්නෝ මිනිසුන් අතර දුර්ලභ වෙති. අවශෙෂ සත්වසමූහයා වනාහි මෙතෙරම අනුව දුවයි.

3. උඩඟු නොවූ චපල නොවූ නුවණින් යුත් සංයත ඉඳුරන් ඇති (භික්ෂුනම) පාංශුකූල සිවුර කරණකොට පර්වතගුහාවක සිංහයෙකු මෙන් හොබියි.

7. කපණ්ඩිකාදීනං, දිළින්දන්ට හා මඟීන් ආදීන්ට

9. යම්සේ සිදුරුරහිත පර්වතයක් වාතයෙන් කම්පා නොවේද එමෙන්ම නුවණැත්තෝ නින්දා -ප්‍රශංසා දෙක්හි නොසැලෙත්.

10. දෙවතාමඞ්ගලිකා, දෙවියන්ගෙන් යහපත පතන්නෝ,

# පාලි - සිංහල වචන මාලාව

**උපග්‍රන්ථයෙහි දැක්වූ අප්‍රකට වචන මෙහි ඇතුළත් නොවේ.**

අකණ්හනෙත්ත, 3. කළුනොවූ ඇස් ඇති.
අකතත්තා, නි. නොකළබැවින්.
අකරණීය, 3. නොකටයුතු: න. නොකටයුත්ත
අකරම්හසෙ, ක්‍රි. කෙළෙමු.
අකාමක. 3. නොකැමැති
අකිලන්ත, 3. නොවෙහෙසුණු
අකුතොභය, 3. කිසිතැනකින් භයනැති.
අක්ඛ, පු. දාදුකැටය, දූ කෙළිය.
අක්ඛොභිණී, ඉ. ඉලක්කම් 44 කින් ලියයුතු ගණනක්.
අගරු, 3. බරනොවූ: බරපතළ නොවූ.
අගා, ක්‍රි. ගියේය.
අගාරමජ්ඣෙ, ගිහිගෙයි.
අගාරියභූත, 3, ගිහිවූ.
අගාරී, පු. ගිහියා.
අග්ගය්හ, පු.ක්‍රි, රැගෙන.
අග්ගවාදී, පු. ශ්‍රෙෂ්ඨවාදියා.
අග්ගික්ඛන්ධ, පු. ගිනිකඳ
අග්ගිසාලා. ඉ. ගිනිහල් ගෙය
අඞ්ගාරකාසු, ඉ. ගිනිඅඟුරුවළ.
අචපල, 3. චපල නොවූ: වෙනස් නොවන.
අචරිමං, ක්‍රි.වි. පසුනොවී.
අචලසද්ධා, ඉ. නොසැලෙන ශ්‍රද්ධාව.
අචිරපක්කන්ත, 3, ළඟදී ඉවත්ව ගිය
අච්චන්තං, ක්‍රි.වි. අතිශයෙන්,
අච්චුග්ගත, 3. ඉතා උස්ව නැගී.
අච්ච, 3 පිරිසිදු
අච්ඡති, ක්‍රි. සිටියි: නැවතී සිටියි
අච්ඡරා, ඉ. දෙවඟන: අප්පුඩිය
අච්ඡරාසඞ්ඝාත, පු. අසුරගැසීම
අජිනසාටි, ඉ අඳුන් දිවිසමින් සැදූ ඇඳුම.
අජිනි, ක්‍රි. දිනුවේය.
අජ්ජතග්ගෙ, නි. අද පටන්.
අජ්ජුණ්හො, නි. අද දවස.
අජ්ඣපත්ත, 3. මැඩගෙන පැමිණි.

අජඣිට්ඨ, 3. අයදනාලද.
අජ්ඣුපාහරි, ක්‍රිත අනුභව කෙළේය.
අජෙඣාගහෙත්වා, බැසගෙන.
අජෙඣාහිත, 3. ඇතුළත දැමූ.
අඤ්ජනී. ඉ. අඳුන් ගාන කූර
අඤ්ජස, න. මාර්ගය.
අඤ්ඤදත්ථු, නි. ඒකාන්තයෙන්.
අඤ්ඤදෙය්‍ය, 3. අනුන් අයත්
අඤ්ඤත, 3 නොදත්, අප්‍රකට
දන්නාලද.
අටට, න. ඉලක්කම් 79 කින්
ලියයුතු විශාල ගණනක්.
අට්ටියති, ක්‍රි. පෙළේ.
අට්ඨිත, 3. නොපිහිටි; නො
නැවතුණු.
අතිපණ්ඩිත, 3. ඉතා උගත්:
පණ්ඩිතමානියා.
අතිප්පගො, නි. උදෑසන
අතිභාර, පු. මහත්බර.
අතියාචනා, ඉ. අධික ඉල්ලීම
අතිරෙකතරං, ක්‍රි. වි. අධිකලෙස.
අතිවත්තති, ක්‍රි. ඉක්මවයි
අත්තහෙතු, නි. තමා සඳහා;
අත්ථඞ්ගත, 8. බැසීමට හෝ
විනාශයට ගිය
අත්‍රජ, පු. දරුවා
අදුට්ඨචිත්ත, 3. දූෂ්‍යනොවූ සිතැති.
අද්ධ, පු. කාලය; මාර්ගය
අද්ධානමග්ග, පු. දීර්ඝමාර්ගය
අධිකරණ, න. නඩුව; කාරණය
සිද්ධිය
අධිගණ්හාති, අයත්කොට ගනී.
අධිවත්තති, මැඩගෙන පවති.
අධිවත්තමාන, 3. මැඩගෙන
පවත්නා
අධිවාසාපෙති, ඉවසන්ට සලස්වයි.
අධිසෙස්සති, හොවින්නේය.
අනංගණ, 3. කෙලෙස් නැති
අනච්ඡරිය, 3. ආශ්චර්යවත්
නොවූ.
අනත්තමන, 3. නොසතුටු
සිතැති
අනනුබොධ, පු. අවබෝධ
නොකිරීම.
අනප්පක, 3. බොහෝවූ.
අනභිරත, 3. නොඇලුණු;
කලකිරුණු
අනස්සව, 3. නොකීකරු.
අනාසව, 3. ආශ්‍රව නැති.
අනීඝ, 3. විපත්නැති.
අනිපජ්ජිත්වා, නොනිද,
අනිබ්බිසන්ත. 3. සොයාගත
නොහැකිවූයේ
අනුකම්පක. 3. අනුකම්පාකරන
අනුකුබ්බති, අනුව ක්‍රියාකෙරේ
අනුට්ඨහන්ත, 3. නොනැඟිටින.
අනුද්ධත, 3. උඩඟුනොවූ
අනුධාවති, අනුව හෝ
පසු පස්සේ දුවයි.
අනුපරියායති, හාත්පස
කැරකේ.
අනුපුබ්බේන, ක්‍රි.වි. පිළිවෙළින්.
අනුප්පදස්සති, දෙන්නේය
අනුබන්ධමාන, 3 ලුහුබඳිමින්.
ලුහුබඳිනු ලබන
අනුයන්ත, 3. අනුවයන
අනුයුඤ්ජති, යෙදේ; පිළිපදී.
අනුවිච්න්තයන්ති, 3. අනුව
සිතන; අනුව සිතමින්
අනුසාසනී. ඉ. අනුශාසනාව
අනෙකවිහිත, 3. නානවිධ වූ,
අන්තරාකථා, ඉ. අතරතුරේ;

කථාව: අතුරු කථාව
අනේවසන්ත, සොයන, සොයමින්
අපගතකාළක, 3. පහවූ කිලුටු
හෝ පැල්ලම් ඇති.
අපචායමාන 3. පුදනා: පුදමින්.
ගෞරව කරමින්.
අපචායී, පු. පුදන්නා
අපද, 3 පා නැති
අපරජ්ජු, නි. පසුද අපරිභුත්ත, 3.
පරිභොග නොකළ
අපරිමිත, 3. ප්‍රමාණරහිත
අපුබ්බං, ක්‍රි.වි. ඉදිරිනොවී,
අප්පටිවිජ්ඣන්ත, 3 අවබෝධ
නොකරන
අප්පටිවෙධ, පු. අවබොධ නොකිරීම.
අප්පවත්ති, ඉ. නොපැවතීම
අප්පායුකතා, න. මඳ ආයු ඇති
බව
අබ්බුද, පු. භෙදය: එනම් ඇති
නිරය. න. ඉලක්කම් 58 කින්
ලියයුතු විශාල ගණනක්.
අබ්භක්ඛාන, න. බොරුවෙන් දොස්
නැගීම
අබ්භාචික්ඛන න. අසත‍දෙසා
රෝපණය.
අබ්භාමත්ත, 3. වලාකුළක්
පමණැති.
අබ්භාමුත්ත, 3. වලාකුළෙන් මිදුණු.
අබ්භුත,න. ආශ්චරිය: ඔට්ටුව
3. ආශ්චර්යවත්.
අබ්භොකාස, පු. ආවරණයක්
නැති තැන.
අභායනක, 3. භය නොවන
අභාවිත, නොවැඩූ
අභික්කන්ත, න. ඉදිරියට යාම
3. ඉතා සිත්කලු
අභිජ්ජමාන, 3. නොබිඳෙන
අභිජ්ඣිත, ත 3. ආලය කරන
ලද
අභිණ්හසන්නිපාත, 3. නිතර
රැස්වීම් ඇති.
අභිනිම්මිණාති, මවයි
අභිප්පසන්න, 3. ඉතා පැහැදුණු
අභිභූ, පු. මැඩපවත් වන්නා.
අභිරත, 3 ඇලුණු
අභිරමිත්ථා, අභිරමණයකොට.
අභිරුහිය, පු. ක්‍රි. නැගී.
අමත්තඤ්ඤු 3. ප්‍රමාණය නොදත්
අමිලාත, 3. නොමැලවුණු.
අමූළ්හ, 3. මුලානොවූ
අය්‍යකා, ඉ. ආත්තා
අය්‍යපුත්ත, පු. ස්වාමිපුත්‍රයා.
අරති, නොඇලීම.
අරහති, සුදුසුවේ: වටී.
අරහන්ත, පු. රහතන්වහන්සේ
අලද්ධා, පු.ක්‍රි. නොලැබ
අලාත, පු. නමක් න.
ගිනි පෙනෙල්ල
අවකංස, පු. පහත්බව.
අවධි, ක්‍රි. නැසුවේය.
අවන්දිය, 3. නොවැන්දයුතු
අවස්සං, ක්‍රි. වි. ඒකාන්තයෙන්.
අවිරුළ්හ 3. වරද්දානොගත්.
අසජ්ජමාන, 3. වැද්ද නොගත්.
අසන්තුට්ඨිය 3. නො ගැටෙමින්
අසද්දහන්ත, 3. නොඅදහන
අසන්තුට්ඨ, 3. නොසතුටුවූ
අසමෙක්ඛිත: 3. විමසා නොබැලූ
අසංඛෙය්‍ය, න. ඉලක්කම් 142
කින් ලියයුතු අති විශාල
ගණන.
අසංසයං, ක්‍රි.වි. නිසැකසේ

අසිකොට්ඨ, පු. සම්කරුවා
අසිස්සති, ක්‍රි. කන්නේය
අසිතිහත්‍ථගම්භීර, 3. අසූ රියනක් ගැඹුරැති.
අසුචි, පු. මල; අපිරිසිදු දෙය; 3. අපිරිසිදු වූ.
අස්සතරි. ඉ. අශ්වයකුට දව කොටළුදෙනගෙන් උපන් වෙළඹ.
අස්සමපද, න. ආශ්‍රම ප්‍රදේශය
අස්සවණතා, නොඇසීම නිසා
අහහ, න. ඉලක්කම් 72 කින් ලියයුතු ගණනක්.
අහොරත්ත, න. රෑ දවල
ආගතමග්ග, පු. ආමග.
ආගන්තබ්බ, 3. ආයුතු
ආඝාත, පු. කෝපය: හැපීම.
ආචරියමහයුග, පු. ආචාර්ය ප්‍රාචාර්ය පරම්පරාව
ආචික්ඛපෙත්වා, කියවා
ආජාඤ්ඤ, අජානීය, පු. උසස් වර්ගයේ අශ්වයා
ආජීවක, පු. අන්‍යදෘෂ්ටික ශ්‍රමණයෙක්.
ආණත්ත, 3. අණ ලැබූ
ආතප්ප, පු. උත්සාහය
ආතාපී, 3. කෙලෙස් තවන වීර්‍ය්‍ය ඇති.
ආතුරන්න, 3. ගිලනා ගේ ආහාරය.
ආදිච්ච, පු. සූර්‍ය්‍යයා.
ආදීනව, පු. දෝෂය: වරද
ආනුපුබ්බිකථා, ඉ. පිළිවෙළින් කියන කථාව
ආපුච්ඡිතුන, පූ. ක්‍රි. විචාරා.
ආමජාත, 3. දසියගෙන් උපන්.
ආමුත්ත, 3. පැලඳගත්,
ආරකා, නි. දුරින්: දුරදී
ආරක්ඛාධිකරණ, 3. රැකීම නිමිති කොට ඇති.
ආරඤ්ඤක, 3. වනයෙහිවසන
ආරද්ධවිරිය, 3. පටන්ගත් වීර්‍ය්‍ය ඇති.
ආරාමික, පු. ආරාමයේ මෙහෙ කරුවා
ආරොපිතනියාම පු. පත්‍රයේ ලිවූ පිළිවෙළ
ආලපති, කථා කෙරේ.
ආලය, පු. වාසස්ථානය
ආලයෙසිනී, ඉ. වාසස්ථාන සොයන්නී.
ආලොකිත, න. ඉදිරිය බැලීම. 8. ඉදිරි බැලූ.
ආවජ්ජිත්වා, නුවණැසින් බලා.
ආවජ්ජෙන්ත, 3. සලකාබලන: සලකා බලමින්.
ආවිභාව, පු. ප්‍රකටවීම, පහළවීම
ආවි. නි. ප්‍රකටෙ ලෙස
ආවෙල, පු. මුදුන්මල්කඩ
ආසජ්ජ, පූ. ක්‍රි. හැපී: ගටා.
ආසවක්ඛය, පු. ආශ්‍රවයන් නැසීම
ආසාදිත, 3. ගටන ලද
ආසාදෙති, ගටයි: හිරිහැරකරයි.
ආසිවිස, පු. සර්පයා
ආහනිය. පූ. ක්‍රි. පහරදී
ඉච්චෙවං, නි. මෙසේ
ඉද්ධිපාටිහාරිය, න. ඍද්ධියෙන් විස්මයජනක දේ කිරීම
ඉතිහිතිහ, න. ඉතිහාසය: අනුන්ගෙන් දැනගත් දෙය.
ඉන්ද, පු. ශක්‍රයා: අධිපතියා.

ඉරියාපථ, පු. ශරීරයේ ක්‍රියා
පැවැත්වීම; ඉරියව්ව
ඉසිපබ්බජ්ජා, ඉ. තාපස පැවිද්ද
ඉස්සර, පු. අධිපතියා;
ස්වාමියා.
ඉස්සරියාධිපච්ච, න.
ස්වාමිත්වය හා අධිපතිත්වය
උක්කංස, පු. උසස් බව
උක්කන්තිත්වා, මස් කපා
උක්කුටික, 3. මැදින් නැමුණු.
උග්ගච්ඡති, උඩට නැගේ;
මතුවේ.
උග්ගතප, 3. උසස් තපස් ඇති.
උග්ගන්ත්වා, උඩනැගී; මතුවී.
උච්චය, පු. රැස්කිරීම.
උච්චාරපස්සාවකම්ම, න.
මළමූත්‍ර පහකිරීම
උච්ඡිජ්ජති, නැවත හට නොගන්
නාසේ විනාශයට පත්වේ.
උජ්ජුගත, 3. ඍජු බවට පත්
උජ්ඣිත, 3. හැරදැමූ.
උත්තරසීසක, 3. උතුරට හිසලු
උත්තරස්වෙ, නි. අනිද්දා.
උදපාන, පු. ළිඳ.
උදයබ්බය, පු. හටගැන්ම හා
විනාශය
උදරහෙතු, නි. බඩ සඳහා
උදිච්ච, 3. උසස්; උතුරුදෙසින්
පැමිණි.
උදිත. 3. ප්‍රකට; උදවූ.
උද්දසෙත්වා, (තමා සිටින බව)
පෙන්වා.
උඩන, න. උඳුන, ලිප.
උඩමුඛ, 3. උඩුකුරු මුහුණු ඇති
උන්නාදි, පු. මහත් නාද කරන්නා
උන්දුර, පු. මීයා.
උපකට්ඨ, ළංවූ; කිට්ටුවූ.
උපකූලිත, 3. හැකුළුණු
උපට්ඨාක, පු.
උපස්ථානකරන්නා
උපට්ඨාත, 3. එළඹ සිටි
උපජීවති, නිසා ජීවත්වේ
උපනිබද්ධ, 3. බඳනා ලද.
උපනිස්සයසම්පන්න, 3. පෙර
වාසනා ඇති
උපපත්ති, ඉ. පැමිණීම; ඉපදීම
උපවත්තන, 3. සමීපයෙහි
පවත්නා
උපසම, පු. සංසිඳීම. හික්මීම;
සංයමය
උපපරික්ඛන්ත, 3. විමසා බලන;
බලමින්
උපලබ්භති, ලැබේ.
උපසෙවති, සේවය කෙරේ.
උපපොසථ, පු. පෝය; ශීලය.
උපොසථදිවස, පු. පෝයදවස
උප්පල, න. ඉලක්කම් 100 කින්
ලියයුතු විශාල ගණනක්;
එනම් ඇති නිරය
උප්පණ්ඩුප්පණ්ඩුකජාත,
සුදුමැලිවූ
උප්පාත, පු. අස්වාභාවික සිද්ධිය
උප්ලාවිත, 3. පාවීගිය
උබ්බාළ්හ, 3. පීඩිත වූ
උබ්භින්දිත්වා, බිඳ
උම්මග්ග, පු. විරුද්ධ මග;
නොමඟ; උමග.
උම්මීලෙත්වා, ඇස් දල්වා
උම්මුජ්ජති දියෙන් මතුවේ
උල්ලිඛිත. 3. පීරූ
උල්ලොකෙන්ත, උඩබලන;
උඩබලමින්.

උළුංකමත්ත 8. දඬුකැටයක් පමණ.
ඌණ, 3. අඩු.
එකග්ග 3. එකඟ: එක් අරමුණක පිහිටි.
එකඝන, 3. සිදුරු නැති.
එකච්චිය, 3. ඇතැම්
එකජ්ඣං, නි. එක්තැනක
එකතිය, 3. ඇතැම්
එකායන, පු. එකම මාර්ගය
එතෙනා, නි. අරහෙන්
එවංකාරි පු. මෙසේ කරන්නා.
එහිති, ක්‍රි. එන්නේය.
ඔකම්පෙත්වා, වනා: සොලවා
ඔචිනන්ති, ඉ. රැස්කරන්නී.
ඔතාරෙන්ත. 3. බස්වන
ඔපපාතික, 3. ගැබ්විසීමාදියක් නැතිව එක්වරම උපදනා සත්වයා.
ඔරක, 3. පහත්: ලාමක
ඔරොධ, පු. අන්තඃපුර ස්ත්‍රියː අන්තඃපුර ස්ත්‍රී සමූහය.
ඔලම්බක, න. ලඹය
ඔලම්බන්ත, එල්ලෙනː එල්ලෙමින්
ඔලුබ්භ, පු. ක්‍රි. පහතට ඔබාගෙන.
ඔසරති, ඇතුල්වේ: රැස්වේ.
කචඡ, පු. න. කැසපට: කිසිලල
කටච්ඡුමත්ත, 3. සැන්දක් පමණ
කටසි, ඉ. සොහොන
කටුවියකත, 3. ඉඳුල්කල
කතිපාහ. න. කීපදිනක්.
කත්තබ්බයුත්තක, න. කටයුතු දෙය.
කථම්භූත, 3. කෙසේවූ
කථංවිධ, 3. කෙබු. ආකාර ඇති.
කඨාන, නංත. ඉලක්කම් 128 කින් ලියයුතු විශාල ගණනක්.
කන්ත, 3. කටින ලද.
කන්දරා, ඉ. කඳුර: හොය.
කප්පරප්පහාර, පු. වැලමිටි පහර
කප්පට්ඨිතික, 3. කල්පයක් පවත්නා
කප්පිය, 3. කැපවූ: නිවැරදි වූ: ශික්ෂාවට විරුද්ධ නොවූ.
කමති, ගමන් කෙරේ.
කම්මාර, පු. ලොහොකරුවා
කම්මික, පු. කාර්මිකයා: නිලධාරියා.
කලුණා. ඉ. කරුණාව
කලෙබර. න. ශරීරය
කසි, ඉ. සීසෑම
කළිර, කරටිය: න. කරටියේ බඩය
කාජ, පු. කඳ
කානනන්තර, පු. වනය ඇතුළ
කාමදද, 3. කැමති දේ දෙන
කාමරති, ඉ. කාමාශාව
කායගතාසති ඉ. ශරීරයේ කොටස් පිළිබඳව භාවනාව
කාලඤ්ඤු, 3. කල්දන්නා.
කාලස්සෙව, කලින්ම: කල් ඇතිවම.
කාහිති, ක්‍රි. කරන්නේයෙ
කිච්චකාරී, පු. කටයුත්ත කරන්නා
කිත්තයති, වර්ණනා කරයි.
කිත්තිසද්ද, පු. කීර්තිරාවය
කිමත්ථාය, කුමක් පිණිස
කිදිස, 3. කෙබඳු
කුක්කුර පු. බල්ලා: බලුපැටියා
කුටිද්වාර, න. පැලේ දොරටුව

කුටුම්බික. පු. පවුල්කාරයා
කුඩ්ඩමූල, න. බිත්තිපදනම
කුමුද, න. එළමාලේ: ඉලක්කම්
107 කින් ලිය යුතු
ගණනක්.
කුලවංස, පු. පරම්පරාව
කුසග්ග, පු. කුසතණඅග.
කුසල, 3. දක්ෂවූ, න. යහපත:
නිරෝගී බව.
කුසලී, පු. කුසල් ඇත්තා.
කුසිත, 3. අලස වූ.
කුසුල, න. අටුව: වීකොටුව.
කූටජටිල, පු. කපටි ජලටිලයා
කූඩ තාපස, පු. කපටි තවුසා
කෙලාස, පු. කෛලාශ පර්වතය
කෙලාස කූටපටිභාග, 3.
කෛලාෂ පර්වතයේ මුදුන
මෙන් සුදුවූ.
කොටිප්පකොටි, ඉ.
1000,000,000,000,000,000,000
කොට්ටෙත්වා, කොටා: ඇනලා.
කොණප, න. කුණපය,
මළසිරුර.
කොත්‍ථු, කොත්‍ථුක, පු. හිවලා,
කොවිද, 3. දක්ෂවූ
කොසම්බී, ඉ. කොසඹෑ නුවර
කොසල්ල, න. දක්ෂ බව
කොසිනාරක, 3. කුසිනාරා
නුවර වැසි
ඛග්ගහත්‍ථ, 3. කඩු ගත් අත්
ඇති
ඛත්තිය, පු. කෂත්‍රියයා
ඛන්ධාවාර, පු. කඳවුර.
ඛමති, කැමතිවේ: ඉවසයි.
ඛමාපෙති, සමාකරවයි.
ඛර, 3. කර්කශ: දළ
ඛාරිභාර, පු. කත් කෙළවරේ
බර
ඛාදන, න. කුම.
ඛිඩ්ඩා, ඉ. ක්‍රීඩාව
ඛීල, පු. හුල.
ඛෙම, 3. නිර්භය. න.
නිර්භයසථානය.
ගජුත්තම, පු. උතුම් ඇතා.
ගණ්ඩී, ඉ. ශබ්ද නැංවීම පිණිස
සැදූ කුහර සහිත ලී කොටය.
ගණ්හනක, 3. ගන්නාවූ:
ඇතුළත් කරන්නට සමර්ථ වූ:
අල්වන්නා.
ගණ්හිය, පු. ක්‍රි. ගෙන: අල්වා
ගෙන
ගතයොබ්බන, 3. පහවගිය
තරුණ බව ඇති
ගත්ත, න. ශරීරය.
ගන්තුකාමතා, ඉ. යනු කැමැත්ත
ගද්දූලබද්ධ, 3. සම්පටියෙන් බැඳී.
ගබ්භසෙය්‍යා, ඉ. මවුකුස වීසීම.
ගම්භීර, 3. ගැඹුරු: න. ගැඹුරු.
ගයාසීස, න බුඩගයාවට තුදුරු
ගයා ශීෂීනම් තැන
ගය්හති, ගනු ලැබේ.
ගය්හූපග, න. ගතයුතු දෙය
ගරහා, ඉ. ගර්හාව: නින්දාව
ගලාගලායති, න. ගඩගඩ යන
ශබ්ද පවත්වයි
ගවඝාතන, න. ගවයන් මරණ තැන
ගවෙසන්ත, 3. සොයන:
සොයමින්
ගහකාරක, පු. ගෙය සාදන්නා.
ගහට්ඨ, පු. ගිහියා: ගෘහස්ථයා
ගාල්හ, 3. දැඩි
ගාල්හං, ක්‍රි.වි. දැඩිසේ

ගිනි, පු. ගින්න
ගිරිගබ්බර, පු. පර්වතගුහාව.
ගිරිරාජ, පු. මහමෙර
ගුණඝෝස, පු. කීර්තිරාවය
ගුණෝදිත, 3. ගුණයෙන් උසස්වූ
ගුම්බ, පු. පඳුර.
ගුළකීළා, ඉ. බෝල කෙළිය.
ගූථආවට, පු. අශුචිවළ.
ගූථකලල, න. අශුචි මඩ.
ගූථට්ඨාන, න. මළ පහ කරන
තැන
ගෙධ, පු. ඇලීම: ආශාව
ගෙහපරිජන, පු. ගෙයි වැසි පිරිස
ගොත්‍රභූ, පු. ගෝත්‍රය. මඩින්නා
න. එනම් සිත.
ඝම්ම, නං ග්‍රීස්මය.
ඝම්මතත්ත, 3. ග්‍රීෂ්මයෙන් මැඩුණු.
ඝරමෙසි, පු. ගිහියා.
ඝරාවාස, පු. ගිහි ජීවිතය
ඝරූපචාර, පු. ගෙ අවට භූමි
භාගය.
ඝොර, 3. දරුණු
චංකම, පු. සක්මන
චතුදෙණික, 3. ද්‍රෝණ සතරක්
දැමිය හැකි.
චතුඛණ්ණ, ප. කුලසතරට
(අයත් මිනිස්සු)
චම්ම, න. සම
චමූ. ඉ. සේනාව: භට සමූහය.
චාතුම්මහාභූතික. 3. ධාතු
සතරෙන් හටගත්.
චාරණික, න. ජංගම චිත්‍රය
චිකිච්ඡති, පිළියම් කරයි.
චිත්තකූට, පු. එනම් ඇති පර්වතය
චිත්තසහූ, 3. සිත හා උපන්.
චිත්තාගාර න. චිත්‍ර පෙන්වන
ශාලාව.
චිරට්ඨිතික, 3. බොහෝ කල්
පවත්නා
චිරප්පවාසි, පු. බොහෝ කලක්
ගමින් පිට විසූ අය.
චිරාය, නි. බොහෝ කලකට
චූලා, ඉ. හිසේ කුඩුම්බිය.
චෙටක, පු. කොල්ලා
චොරඝාතක, පු. සොරුන්
මරන්නා
චොළ, පු. වස්ත්‍ර.
ජඩ්ඩාපෙත්වා, ඉවත දමමවා
ජඩ්ඩිතභාව, පු. හැරදැමූ බව
ජපකී.ඉ. සැඩොල් ස්ත්‍රිය
ජමා,ඉ. පොළොව
ජමාමසික, 3. හමසකට සෑහෙන.
ජාත - බඩගිතිවූ
ජගතිප්පදෙස, පු. පෘථිවි ප්‍රදේශය
ජගතිරුහ, පු. ගස
ජච්චන්ධ, 3. ඉපදීමෙන් අන්ධවූ
ජස්සුදා, 3. පිරිසිදු,
ජටා, ඉ. අවුල: එකාබද්ධ වූ
හිස කෙස්: හැඩපලු
ජණ්ණුකසන්ධි, ඉ. දණහන්දිය
ජනපදචාරිකා, ඉ. රටේ ඇවිදීම.
ජනකුහනත්ථං, මිනිසුන් මුළා
කිරිම පිණිස.
ජනතු, පු. සත්වයා.
ජම්බොනද, න ජම්බුනදියෙන්
ලබාගත් රන්
ජරග්ගව, පු. මහලු ගවයා
ජාගර, 3. පිබිද සිටින.
ජාණු, පු. දණ
ජාතස්සර, න. ස්වාභාවික විල
ජාතිධම්ම, 3. නැවත උපදින
ස්වභාව ඇති

ජාතිසංසාර, පු. නැවත ඉපදීම.
ජානන, න. දැනගැන්ම
ජානි, ඉ. හානිය, විපත
ජාල, න. දැල.
ජාලාමාලාකුල, ගිනිදැල් සමූහයෙන් ගැවසුණු
ජිගිංසති, දිනනු කැමතිවේ. ලබනු කැමතිවේ.
ජිගුච්ඡති, පිළිකුල් කරේ
ජිඝච්ඡති, කනු කැමතිවේ
ජීවිකා, ඉ. ජීවනෝපාය: ජීවත්වීම
ජුතින්ධර, ජුතිමන්තු, 3. ප්‍රභාඇති.
ඣත්වා, දවා: පුලුස්සා
ඤාණදස්සන, නං නුවණින් දැකීම
ඤාත, 3. දන්නලද: ප්‍රකට
ඤාතක, පු. නෑයා
ඨිතට්ඨාන, න. සිටිතැන.
ඩහති, දවයි: පුළුස්සයි.
තක්කසිලාමග්ග, පු. තක්සලාවට යන මග.
තචපරියන්ත, 3. සමකෙළවර කොට ඇති
තටතටායති, තට-තට යන ශබ්ද පවත්වයි.
තණ්හාසොත, පු. තෘෂ්ණා නමැති සැඩපහර
තථාවාදිනී, ඉ. එසේ කියන්නී
තලතො, නි. මතුපිටින්
තලුණ, 3. තරුණවූ, නොමේරු
තසති, තැතිගනී.
තාදිසක, 3. එවැනි
තාදී, පු. කම්පා නොවන ස්වභාව ඇත්තා
තාවතක, 3. එපමණ.
තිකිච්ඡක, පු. වෙද.
තිකිච්ඡති, වෙදකම් කරයි
තිතික්ඛති, ඉවසයි.
තිත්තිර, පු. වටුවා.
තියාමරත්ති, ඉ. යාම තුනක් ඇති රාත්‍රිය.
තිරොකරණී, ඉ. තිරය.
තිරොකුඩ්ඩං, ක්‍රි.වි. බිත්තිසරස
තිරොපාකාරං ක්‍රි.වි. ප්‍රාකාරය සරස
තුච්ඡහත්ථ, 3. හිස් අත් ඇති.
තුට්ඨපහට්ඨ, 3. තුටුපහටු වූ
තුම, පු. තෙමේ.
තුරිතාභිනිපාතී, පු. වහා පතින්නා.
තුලිත, 3. කිරූ: ප්‍රමාණ කල
තුලසන්නිභ, 3 පුළුන් වැනි
තෙවිජ්ජ, තෙවිජ්ජක, 3. ත්‍රිවිද්‍යා ඇති.
ථණ්ඩිල, න. උස්බිම: කර්කශ භූමිය.
ථාලිපාක, පු. දසදෙනෙකුට සෑහෙන කෑම අඩුක්කුව
ථුල්ලානි න. (බහු) පරුෂ වචන.
ථූණෙය්‍යක, 3. ථූණනියම්ගම්වැසි
ථෙනෙත්වා, සොරකම් කොට
දක්ඛති, දැකී
දක්ඛිණා, ඉ. දනමය කුශලය.
දජ්ජා, ක්‍රි. දෙන්නේය.
දබ්බ, පු. කුසතණ
දස්සනකාම, දකිනු කැමති.
දස්සනීය. 3. දැක්කයුතු: මනාරූ ඇති.
දහති, දවයි: කියයි.
දහර, පු. ළදරුවා.
දානග්ග, න දන්දෙන තැන.
දනවෙය්‍යාවටික, පු. දන්විධාන

කරන්නා.
දාය, පු. වනය
දායාද, පු. උරුමය
දායාදක, 3. උරුමය බලන
දරහරණ, නං. භායර්‍යාවක් රැකීම
දිට්ඨධම්මික, 3. මෙලොව පිළිබඳ
දිට්ඨෙව ධම්මෙ, මේ ආත්මයේදීම.
දිපද, 3. දෙපා ඇති.
දිබ්බගන්ධ, පු. දිව්‍ය සුවඳ
දිවසකර, පු. සූර්‍යයා.
දිවස-සන්තත්ත, 3. දවස මුළුල්ලේ රත්වූ
දිවාවිහාර, පු. දවල් විසීම හෝ වසන තැන.
දිස, පු. සතුරා
දීඝායු, පු. දිර්ඝායුෂ ඇත්තා.
දුක්ඛම: ඉවසිය නොහැකි.
දුක්ඛිසති, දුකට පත්වේ.
දුව්ජන්න, 3. නොමනාසේ වැසූ හෝ සෙවිලි කළ
දුද්දද, 3. දීමට අපසු
දුබ්බල, 3. දුර්වලවූ.
දුබ්භණිත, න. නපුරු කථාව
දුබ්භිස්සති, ක්‍රි. ද්‍රෝහකරන්නේය
දුරන්නය. 3. අනුවයාමට අප හසුවූ
දුස්සයුග, න. වස්ත්‍ර ජෝඩුව
දූහති, ද්‍රෝහකෙරේ; හිංසා කෙරේ.
දෙවදෙව, පු. දෙවියන්ගේ දෙවියා
දෙසස්, 3. අප්‍රියවූ
දෙණ්මුඛ, න. ගංමුවදොර
දෙහග්ග, න. දුර්භාග්‍යය: අවාසනාව.
දෙලායන්ත, 3. එහා මෙහා වැනෙන.

දවාරමජ්ඣ, දොරටුව මැද.
ද්වෙපථ, පු. දෙවටපාර: දෙපා මග
ධඤ්ඤා. 3. භාගය ඇති: න. ධාන්‍ය
ධනවෙජ්ද, පු. ධන විනාශය
ධනතණ්හා, ඉ. ධනාශාව
ධමනිසන්ථතගත්ත, 3. නහර ඉල්පුණු ශරීර ඇති.
ධම්මනිම්මිත, 3. ධර්මයෙන් මැවූ
ධම්මවිනය, පු. ධර්මයෙහි හික්මීම හෝ පිළිපැදීම.
ධම්මාගද, පු. ධර්ම නමැති බෙහෙත
ධම්මාභිසමය, පු. ධර්මාවබෝධය.
ධංසති, පිරිහේ
ධාතී, ඉ. කිරිමව.
ධාරයමාන, 3. දරනඃ දරමින්.
ධුර, න. තනතුර: රථයේ ඉදිරි කොටස: භාරය.
ධුරස්සහ, 3. ධුරය උසුලන.
ධූමායති, දුම්දමයි.
ධොන, පු. පණ්ඩිතයා.
ධොනා, ඉ. ප්‍රඥාව
නගන්තර, පු. ගස් අතර හෝ කඳු අතර.
නග්ග, 3. වස්ත්‍ර රහිත.
නග්ගචරියා, ඉ. නිර්වස්ත්‍රව හැසිරීම
නරපුඞ්ගව, පු. ශ්‍රෙෂ්ඨ මනුෂ්‍යයා.
නහුත, න. වෙඩරු
නහාතක. පු. උගත් බ්‍රාහ්මණයා
නහුත, න. දසදහස: ඉලක්කම් 30 කින් ලියයුතු තවත් ගණනක්.

නළ, පු. බටගස
නානාභාව, පු. වෙන්වීම
නික්ඛමනවේලා, ඉ. නික්මෙන වෙලාව
නිගච්ඡති, පැමිණේ.
නිගණ්ඨ, පු. නිවටා: නිර්වස්ත්‍ර ශ්‍රමණයා.
නිච්ච, 3 නිත්‍යවූ
නිච්චකාලං, ක්‍රි.වි. හැමකල්හි
නිච්ඡරති, පිටතට විහිදේ
නිච්ඡුභති, කෙලගසයි
නිද්ධමති, දුරුකරයි.
නින්න, පහත්බිම: තැනිතලාව
නින්නහුත, ඉලක්කම් 37 කින් ලියයුතු ගණනක්
නිපජ්ජමාන, 3 හොවින: හොවිමින්.
නිපජ්ජාපෙත්වා, හොවා බිම ඇලකරවා.
නිපක, 3. නුවණැති: දක්ෂවූ
නිපතිත්වා, බිමවැටී.
නිප්පභ, 3. තේජස් නැති.
නිබ්බත්තිතභාව, පු. ඉපදවූ බව
නිබ්බාණාභිරත, 3. නිවණෙහි ඇලුණු.
නිබ්බෙහාග, 3. වැඩකට නැති: ප්‍රයෝජන රහිත.
නිමන්තෙතුං, නි, ආරාධනා කරන්ට.
නිමුජ්ජති, කිදබසී.
නිය, 3. ස්වකීය
නියක, 3. නියතවූ
නියුත්තක පුරිස, පු. නියෝජිත මිනිසා.
නියාදෙත්වා, පාවාදී,
නියාසි, ක්‍රි. පියත්විය.
නිරබ්බුද, න. ඉලක්කම් 65 කින් ලියයුතු ගණනක්.
නිරාස, 3. ආශානැති
නිරුජ්ඣති, නිරුධවේ: අභාවයට පත්වේ.
නිරුපධි, 3. ක්ලෙශ රහිත
නිල්ලජ්ජ, 3. ලජ්ජානැති
නිල්ලොකෙති, හෙමින් බලයි.
නිවාරෙතු, පු. වළක්වන්නා
නිවෙසනද්වාර, න. ගෙදොර
නිවෙසෙති, වාසයකරවයි. පිහිටුවයි.
නිසින්නට්ඨාන, න. හුන්තැන
නිස්සජ්ජිත්වා, හැරදමා
නිස්සන්ද, පු. විපාකය
නිහත. 3. නැසූ: යටපත්කළ.
නීයාතයතී, පාවාදෙයි.
නෙක්ඛ, න. විශාල රන් කාසියක්
නෙක්ඛම්ම, න. නික්මයාම
නෙගම, පු. නියම්ගම්වැසියා.
නෙමිත්තික, පු. නිමිතිකියන්නා
පකුබ්බන්ත, 3 කරන: කරමින්.
පකිත්තෙති, වර්ණනාකරයි.
පකිත්තෙන්ත 3. වර්ණනාකරන
පකොටි, ඉ. ඉලක්කම් 15 කින් ලියයුතු ගණනක්.
පක්කොසාපෙසි, කැදෙව්වේය.
පක්ඛලිත්වා, පැකිල: හැපී.
පක්ඛායති, වැටහේ.
පගෙව, නි. කල්ඇතුවම
පග්ගණ්හාති, දැඩිකොටගනී.
පග්ඝරන්ත, 3. වැහෙන: වැගිරෙන

පචරිත්වා, පූ. ක්‍රි. හැසිර
පච්චක්ඛාන, න. නැතැයිකීම
පච්චති, පැසේ
පච්චත්ථිකසඤ්ඤා, ඉ. සතුරුය යන හැඟීම.
පච්චන්තිම, 3. ප්‍රත්‍යන්තයෙහිවූ
පච්චවෙක්ඛන්ත, 3. නුවණින් සලකා බලන.
පච්චාගමන, න. හැරීඒම.
පච්චාජාත, 3. නැවත උපන්
පච්චුට්ඨාති, හුන්තැනින් නැගිටියි.
පච්චුත්තරිත්වා, ගොඩනැගී.
පච්චුපට්ඨිත, 3. (එළඹ හෝ ළංව) සිටි
පච්චූසකාල, පූ. ඉතා උදෑසන් කාලය
පච්චොරොහිත්වා, (බිමට) බැස
පච්ඡාබාහං, ක්‍රි.වි. අත්පිටිපසට තබා.
පජා, ඉ. සත්වසමූහය.
පජාපති, ඉ. භාර්යාව.
පජානාති, දනී.
පජ්ජලති, දැල්වේ.
පජ්ජලිත. 3. දැල්වුණු
පඤ්චපතිට්ඨිත, න. පසගපිහිටුවීම
පඤ්ජලී, පූ. දෙඅත් ඔසවා එක් කොට තබාගත්තේ.
පටික්කන්ත, 3. ඉවත්වගිය: න. පස්සට යාම.
පටිගච්ච, නි. කල්ඇතිව
පටිඝාත, පූ. හැපීම: නැසීම
පටිනිවත්තති, හැරී නවතී.
පටිපන්න, 3. පිළිපන්: යෙදුණු.
පටියත්ත, 3. පිළියෙළ
පටිපුච්ඡිතුං, නි. නැවත විචාරන්ට
පටිසන්ථාර, පූ. පිළිගෙන සංග්‍රහ කිරීම
පටිසම්භිද, ඉ. විශේෂ ඥානය
පටිසල්ලාන, න. හුදකලා විවේකය.
පටිසංවෙදෙති, විඳියි.
පටිසෙධිතු, පූ. වළක්වන්නා
පටිස්සුණාති, පොරොන්දුවේ: පිළිතුරු දෙයි.
පටිස්සුත්වා, පොරොන්දු වී: පිළිතුරු දී.
පටිභඤ්ඤති, හැපේ
පණ්ඩරවණ්ණ, 3. සුදු පියාපත් ඇති.
පණ්ණකුටි, ඉ. අතුපැල.
පණ්ණවීසති, ඉ. විසිපහ.
පතාපවන්තු, 3. ප්‍රතාපවත්.
පතිට්ඨිතකාල, පූ. පිහිටිකාලය.
පතිට්ඨිතට්ඨාන, න. පිහිටිතැන
පත්තබ්බ, 3. පැමිණියයුතු
පත්ති, ඉ. පින: පැමිණීම.
පදුම, න. ඉලක්කම් 121 කින් ලියයුතු විශාල ගණනක්: පූ. එනම් නරකය.
පබ්බතපාද, පූ. කන්දපාමුල
පබ්බාජනා, ඉ රටින් පිටිවහල් කිරීම
පබ්බාජයති, පබ්බාජෙති, පිටි වහල් කරයි: පැවිදි කරයි.
පභාසෙති, බබලවයි.
පභූ, පූ. සමර්ථයා: පොහොසතා

පමුච්චති, මිදේ: නිදහස්වේ.
පමුඤ්චති, පිටකෙරේ.
පමොක්ඛ, පු. නිදහස, මිදීම.
පයිරුදහාති, දේශනාකරයි.
පයිරුපාසති, සේවනයකෙරේ.
පයොජෙතුං, නි. යොදවන්ට.
පරපාණ, පු. අන්‍යයාගේ ප්‍රාණය
පරපුග්ගල, පු. අන්‍ය පුද්ගලයා.
පරම, 3. උතුම්: ශ්‍රෙෂ්ඨ
පරරජ්ජ, න. අනුන්ගේ රාජ්‍යය.
පරසත්ත, පු. අන්‍යසත්වයා.
පරාජිත, 3. පැරදුණු
පරිකස්සති, අදිනු ලැබේ.
පරිචාරික, පු. සේවකයා:
ශ්‍රාවකයා
පරිචාරිකා, ඉ. සේවිකා ස්ත්‍රිය.
පරිච්ච, පු. ක්‍රි. පිරිසිඳ.
පරිණායිකා, ඉ. නායක ස්ත්‍රිය
පරිතො, නි. හාත්පසින්: වටින්.
පරියන්ත, පු. කෙළවර
පරියාදියති, ක්ෂයකෙරේ.
පරියාය, පු. පිළිවෙළ: ක්‍රමය.
පරිවජ්ජනීය, 3. දුරුකළයුතු
පරිවජ්ජෙති, හාත්පසින්
දුරුකරයි.
පරිවිතක්ක, පු. සිතුවිල්ල.
පිරිවෙණ, න. භික්ෂුවක් වසන
ගෙය ඉදිරිපස.
පරිසුජ්ඣති, පිරිසිදු වේ.
පරිසුස්සති, වියලේ.
පරිහීනගත්ත, 3. කෘශ වූ ශරීර
ඇති.
පරොසත. 3. සියයට වැඩි.
පරිළාහ, පු. දහය.
පරොසහස්ස, 3. දහසකට වැඩි.

පලොකධම්ම, 3. විනාශවන
ස්වභාව ඇති.
පවට්ටෙති, පෙරළයි.
පවඩ්ඪති, වැඩේ.
පවාරණා. වස්අවසන් කිරීම
පවායන්ත, 3. වහනයකරන
පවාහෙති, පාකරහරියි: දුරු කරයි.
පවෙසෙතු, පු. ඇතුල්කරන්නා.
පසහති, මඩියි.
පසරෙති, දිගුකරයි: (කඩයක්)
විවෘත කරයි.
පසාධන, න. පලඳනාව
පසෙනදි. පු. පරසේනාවන්.
ජයගන්නා. එනම් රජ
පහට්ඨ, 3. ඉතා සතුටුවූ.
පහූත සත්තරතන, 3. බොහෝ
සත්රුවන් ඇති.
පලිබෝධ, පු. බාධකය.
පංසු, න. පස්.
පංසුකීළා. ඉ. වැලිකෙළිය.
පංසුකූල, න. අපෙක්ෂාරහිතව
හැරදැමූ දෙය.
පාචිත්තිය, න. ශික්ෂාපද
කැඩීමෙන් සිදුවෙන එනම්
ඇති වරද.
පාටලිපුත්ත, න. පැළලුප්නුවර.
පාටිකංඛ, 3. කැමතිවියයුතු.
පාණඝාතී, පු. සතුන් මරන්නා.
පාණාතිපාත, පු. පරපණ
නැසීම.
පාණුපෙතං, ක්‍රි.වි. ජීවිතාන්තය
දක්වා
පාතරාස, පු. උදෑසන් බත.
පාතුභූතසත්තරතන, 3. පහළ වූ
සත්රුවන් ඇති.

පාදංගුට්ඨ, පු. පයේ
මාපටැගිල්ල
පාදතල, න. යටිපතුල
පානීයථාලක, පු. පැන්බොන
භාජනය
පාපකම්මී, පු. පව්කම් ඇත්තා.
පාභත, න. පඬුරු; මාර්ගො
පකරණ.
පාරගාමී, පු. පරතෙරට යන්නා
පාරගු, පු. පරතෙරට පැමිණියේ
පාවුස, පු. වර්ෂාකාලය
පිටක, න. කුඩයක් වැනි
භාජනය
පියරූප න. ප්‍රිය රූපය
පිවනභාව, පු. බොනබව
පිවාසතී, බොනු. කැමතිවේ.
පිළකා, ඉ. පිළිකාව
පිළන්ධන, පළඳනාව
පුග්ගලවෙමත්තතා, ඉ. පුද්ගල
විශෙෂය.
පුඤ්ඤාභිසන්ද, පු. පින්රස
පුටකම්ම, න. ගොටු ගැසීම
පුණ්ඩරික, න. ඉලක්කම් 114
කින් ලියුයතු ගණනක්.
පුත්තතණ්හා, ඉ. පුතුන් කෙරෙහි
ආලය.
පුථුඅත්තා, පු. වෙන්වූ ආත්මය
පුථුජ්ජන, පු. නුගත් සාමාන්‍ය
මිනිසා
පුථුභූත, 3. පතළ: පැතුරුණු
පුථුල 3. පළල්වූ
පුනදිවස, පු. පසුද.
පුප්ඵගන්ධිය, න. මලින් සැරසූ
කණුව.
පුබ්බණ්හසමය, පු. පෙරවරු
කාලය
පුබ්බනිමිත්ත, න. පෙරනිමිත්ත
පුම, පු. පුරුෂයා.
පුරක්ඛත, 3. පෙරටුකළ:
පිරුවැරූ.
පුරත්ථතො, නි. ඉදිරියෙන්
පුරත්ථාභිමුඛ, 3. පෙරදිගට
අභිමුඛවූ
පුරා, නි. පෙර.
පුරිසාජඤ්ඤ, පු. ශ්‍රෙෂ්ඨ පුරුෂයා
පූජනා. ඉ. පිදීම.
පූතිකාය, පු. කුණුකය.
පූව, පු. කැවුම
පෙක්ඛමාන 3. බලන: බලමින්
පොථෙති. තළයි: බැටදෙයි.
ප්ලවති, පැනපනැයයි.
ඵලී, 3. ඵල ඇති
ඵාසුකට්ඨාන, න. පහසුතැන.
ඵාසුකා, ඉ. ඉලඇටය.
ඵුට, 3. පැතුරුණු.
ඵෙණුද්දෙහකං, ක්‍රි..වි. පෙණ
දමමින්.
බබ්බු, පු. බලලා.
බරිහිස, න. (යාගපිණිස
ගන්නා) කුසතණ.
බලනායක, පු. භටනායකයා.
බලාකා, ඉ. කණකෙකී.
බලිකම්ම, න. බිලිදීම.
බහතර, 3. අධිකවූ.
බහුභාණී, පු. බොහෝ කථා
කරන්නා.
බින්දු, නං. ඉලක්කම් 51 කින්
ලියයුතු ගණනක්.
බිල, න. බෙණය: සිදුර.
බීජපූර, පු. ලප්නාරන්. Citron.

බුජ්ඣති, අවබොධකෙරේ.
බුජ්ඣමාන, 3. අවබෝධකරන.
බුඩ්ඪ 3. මහලු.
බුඩථූප, පු. බුදුසෑය.
බුඩභූත, 3. බුදුවූ.
බුභුක්ඛති, කනුකැමතිවේ.
බුභුක්ඛිත, 3. බඩගිනි ඇති.
බ්‍රහන්ත, 3. මහත්.
බ්‍රහ්මජච්ච, 3. බමුණුකුල ඇති.
බ්‍රහ්මලොකූපග, 3. බඹලොව
උපදනා.
භච්ච, 3. පෝෂණය කළයුතු:
බැලමෙහෙකරුවා.
භති, ඉ. බැලය: කුලිය.
භතිට්ඨාන, න. බැලමෙහෙකරන
තැන.
භත්තවිස්සග්ග, පු. ආහාර
ගැනීම.
භද්ද, භද්‍ර, 3. යහපත්
භර, 3. පින්වත්: භුවත්: වෙමින්.
භවනිස්සිත, 3. භවය හා
සම්බන්ධවූ.
භස්ම, නං අලු.
භාගිනි, ඉ. කොටස්කාරී.
භාවයති, භාවෙති, වඩයි.
භීයොසොමත්තාය, නි. වැඩි
වැඩියෙන්.
භුඞ්කරණ, න. බිරීම
භුඤ්ජන, න. අනුභවකිරීම.
භුස, න. බෙල්.
භූ, ඉ. භූමිය: පොළොව.
භූතපුබ්බං, නි. පූර්වයේදී.
භූතවිජ්ජා, ඉ. අමනුෂ්‍යයන්
පිළිබඳ ශාස්ත්‍රය
භූමිරාමණෙය්‍යක, න. රම්‍ය
භූමිය.

භෙසජ්ජමත්තා, ඉ. බෙහෙත්
ප්‍රමාණයක්. A dose
භොජනුප්පත්ති, ඉ. ආහාරයාගේ
හටගැන්ම
භොජෙත්වා, අනුභවකරවා.
මක්කටී, ඉ. වැදිරිය.
මඝවන්තු, පු. ශක්‍රයා
මච්ඡරායති, මසුරුවේ.
මච්ඡරිය, න. මසුරුබව.
මච්ඡෙර, න. මසුරුකම.
මණිකුණ්ඩල, න. මැණික් බැඳි
කඩුක්කම.
මත්තඤ්ඤු, 3. පමණ දන්නා
මත්තිකාපත්තා, පු. මැටි පාත්‍රය
මත්ථක, ප. හිස: මුදුන
මථිත, 3. මැඩුණු.
මධුරමංස, න. මිහිරිමස්.
මධුස්සව, 3. මී වැහෙන.
මනුජාධිප, පු. රජ.
මනුස්සභූත, 3. මිනිසෙක් වූ.
මනොරථ, පු. අභිලාෂය.
මරිතුයෙ, මැරෙන්ට
මහග්ඝ, 3, ඉතාවටිනා.
මහාකථාන, න. ඉලක්කම් 135
කින් ලියයුතු ගණනක්.
මහාමත්ත, පු. මහාමාත්‍යයා.
මහාභිනික්ඛමණ, නං. උසස්වූ
නික්මයාම.
මහාසාර, 3. මහාධනවත්.
මහෙසි, පු. මහාසෘජිවරයා.
මා. පු. චන්ද්‍රයා.
මාතඞ්ග, පු. ඇතා.
මාතුගාම, පු. ස්ත්‍රිය.
මානුසත්ත, න. මිනිසත් බව
මාරබන්ධන, න. මාරයාගේ
බැම්ම.

මාරයමානා, ඉ. මරනුලබන්නී.
මාරෙතුකාම, 3. මරනු කැමති.
මාලාවිලෙපනධර, 3. මල් හා විලවුන් දරාගත්.
මීගරාජ, පු. සිංහයා: මාගරාජයා.
මිථුභෙද, පු. අන්‍යොන්‍යභේදය
මියති, මැරේ.
මිළ්හ, පු. අශුචි.
මුධා, නි. නිකමට, නොමිලයේ.
මුලාල, න. නෙලුම් ආදියේ කෑහැකි මුල්.
මූසලපාත, පු. මොහොල වැටෙන පමණ දුර
මෙත්තායති, මෛත්‍රී කෙරේ
මෙත්ති, ඉ. මෛත්‍රිය
මොසවජ්ජ, න. මුසාවාදය
යජ්ජෙවං, නි. ඉදින් එසේනම්
යඤ්ඤ, පු. යාගය.
යථාකථිතං, ක්‍රි. වි. කී පරිදි.
යථාජ්ඣාසයං, ක්‍රි.වි. අදහස පරිදි.
යථාධිප්පෙත, 3. අදහසට එකහවූ
යථාබලං, ක්‍රි.වි. ශක්තිය ඇතිසේ.
යථාබුඩ්ඩං, ක්‍රි.වි. පහසු පරිදි.
යමකසාල, පු. බදසල්ගස
යාපනීය, 3. යැපියහැකි: පවත්වා ගතහැකි.
යාමුන, 3. යමුනා නදීවාසීවූ
යාවතායුකං, ක්‍රි.වි. ආයුෂ ඇතිතාක්
යාවදිච්ඡකං, ක්‍රි.වි. කැමතිතාක්.
යාවදෙව, නි. සදහා: පමණක්.
යුගන්ත, පු. කල්පාන්තය.
යුජ්ඣිතුකාම, 3. යුධකරනු කැමති.
යුව, පු. තරුණයා
යූප, පු. යාග පිණිස සිටවන වැඹ: ප්‍රාසාදය.
යෙභුය්‍යෙන, නි. බොහෝ සේ.
යොතත, න. යොත: රැණ
රජන, න. පඬු: පවේමට ගන්නා සායම.
රජ්ජප්පදෙස, පු. රාජ්‍යයට අයත් ප්‍රදේශය.
රත්තසාලි, පු. රත්හැල්
රත්තඤ්ඤු, 3. රාත්‍රි දන්නා: වයස්ගත පුද්ගලයා.
රත්තන්ධකාර, පු. රෑ අඳුර
රවනකාල, පු. නාදකරන කාලය
රාජදස්සන, න. රජු දැකීම.
රූපරාම්මණ, නං රූප අරමුණ: ඇසට පෙනෙන දෙය.
රොචති, කැමති වේ: රුචි කෙරේ.
රොස, පු. කෝපය
ලඩාන, පු. ක්‍රි. ලැබ.
ලහුතා, ඉ. සැහැල්ලු බව.
ලාප, පු. කැටකුරුල්ලා. (වටු වර්ගයකි)
ලිංගිය, පු. ක්‍රි. වැළඳගෙන
ලුයති, (දෑකැත්තෙන්) කපනු ලැබේ.
ලෙඩ්ඩු, පු. මැටිකැටය.
ලොකධාතු, ඉ. සමස්ත ලෝකය.
ලොකනාථ, පු. ලෝකස්වාමීවූ බුදුරජ.
ලොමහංසන, 3. ලොමුදැහ ගැන්ම කරවන.

ලොහිතක්ඛ, 3. රතු ඇස් ඇති.
වග්ගුස්සර, 3. මිහිරි නාද ඇති.
වච්ච, න. වර්චස්: අශුචි.
වච්ජති, වසන්නේය.
වච්ඡපාල, පු. වස්සන් රකින්නා
වජ්ජ්ඛාර, න. ගාල්දොර
වජ්ඣ, 3. වධයට පැමිණ විය
යුතු: මැරියයුතු.
වජ්ජිපුත්තක, 3. වජ්ජීන්ගේ දරු
වූ.
වණ්ණවාදී, පු. ගුණ කියන්නා.
වත්තිතුං, නි. පවතින්නට
වත්ථබ්බ, 3. විසියයුතු.
වදඤ්ඤූ, 3. වචනදන්නා:
ත්‍යාගශීලියා.
වධූ, ඉ. ස්ත්‍රිය.
වනන්තර, න. වනය.
වන්දිය, 3. වැන්දයුතු .
වර, පු. වරය: විශෙෂ අවසරය
A Boon
වරණරුක්ඛ, පු. ලුණුවහණගස.
වරඞ්ගලක්ඛණ, 3. උතුම් පින්
ලකුණු ඇති
වසල, පු. නීචයා.
වසානුග, 3. වසභයට ගිය.
වාතාහත, 3. සුළඟින් පහකරන
ලද
වාදකාම, 3. විවාද කරනු
කැමති.
වාදි දප්පාපහාරී, පු. වාදීන්ගේ
එඩිමඩින්නා.
වායිත, 3. වියන ලද.
වාරිජ, නං පියුම.
වාරෙය්‍ය, නං. විවාහ යෝජනාව.
වාරෙති, වළක්වයි.
වාලග්ග, පු. අස්කෙඳි අග
වාසි. ඉ. වෑය.
වාසිත, 3. සුවඳකැවූ
වාළව, පු. සාමාන්‍ය අශ්වයා.
විකුලාව, 3. විනාශවූ කූඩු ඇති.
විගය්හ, පු. ක්‍රි. බැස: ඇතුල්ව.
විචිනන්ත, 3. සොයන: විමසන
විජිත න. රට.
විජ්ජාචරණසම්පදා, ඉ. උසස්
ඥාණයෙන් හා හැසිරීමෙන්
යුක්තවීම.
විඤ්ඤූ, පු. පණ්ඩිතයා.
විත්ති, ඉ. සතුට.
විත්ථාර, පු. විස්තරය පළල.
විධූපන, න. වටාපත
විධූම, 3. දුම්නැති
විනාසන්ත, 3. විනාශය කෙළවර
කොට ඇති.
විනොදන, න. දුරු කිරීම.
විනොදෙත්වා, දුරුකොට.
විප්පවිසාරී, 3. බලාපොරොත්තු
කඩවූ
විප්පයොග, පු. වෙන්වීම.
විප්ඵාලිත, 3. පැළුණු : ඉරීගිය.
විධාතු, පු. බ්‍රහ්මයා: කරන්නා.
විමන, 3. නොසතුටු සිතැති
විමල, 3. නිර්මල: කෙලෙස්
නැති.
වියාකාසි, ක්‍රි. ප්‍රකාශ කළේය.
විරද්ධ, 3. වැරදුණු: වරද්දාගත්
විරවන්ත, 3. හඩන: හඩමින්.
විලපමාන 3. වැලපෙන
විලීන, 3. දියවගිය.
විලොකිත, න. වටපිට බැලීම
විවටච්ඡද, දුරු කළ වැස්ම
ඇති.
විවසාන, න. අවසානය

විවෙකසුඛ, න. විවේකසැපය.
විසය, පු. අරමුණ:
ගොචරසථානය.
විසහති, හැකිවේ: සමර්ථවේ.
විසිදති, ගිලෑබසී.
විස්සසති, විශ්වාසකෙරේ.
විහංගම, පු. පක්ෂියා.
විහෙට්ඨනජාතික, 3.
හිංසාකරන ස්වභාව ඇති.
වීමංසති, විමසයි.
වුච්චමාන, 3. කියනු ලබන.
වුත්ත, 3. වැපුරූ: කියන ලද.
වුත්තනය, පු. කී. ක්‍රමය.
වූපකට්ඨ, 3. හුදකලාව විවේකී වූ.
වුය්හති, පාවේ.
වුස්සති, වාසය කරනු හෝ
පිළිපදිනු ලැබේ.
වෙළුවන, නං. උණවනය
වෙදගූ, පු. වේදය දන්නා.
වෙදෙහීපුත්ත, පු. විදේහරට උපන්
දේවියගේ පුත්‍රයා.
වෙධමාන, 3. වෙවුලන
වෙස්ම, න. ගෘහය
වෙසාලික, 3. විශාලානුවර වැසි
වෙසියා, ඉ. වෙශ්‍යාස්ත්‍රී
වෙරොපෙති, තොරකයි:
වෙන්කරයි.
ව්‍යග්ඝුසභ, ව්‍යාඝ්‍රරාජයා.
ව්‍යඤ්ජන, න. අකුරු: ව්‍යඤ්ජනය.
ව්‍යන්තීහොති, ගෙවීයයි: අවසන්
වෙයි.
ව්‍යාකරොති, නියමකොට කියයි.
ව්‍යාකත, 3. ප්‍රකාශ කළ.
ස, 3. ස්වකීය, පු.න. තමාගේ
ගෙය.
සකටපරිවත්ත, පු. කරත්ත වට
කොට තැබීම.
සකුණග්ඝී, පු. උකුස්සා.
සක්ඛිදිට්ඨ, 3. ප්‍රත්‍යක්‍ෂයෙන්දුටු
සක්‍යසාසන, න. ශාක්‍යබුදුන්ගේ
ධර්මය.
සඛ, පු. මිත්‍රයා.
සඛිල, 3. මෘදුවචන ඇති.
සාගාමෙය්‍ය, 3. එකගමේ උපන්
සගාරව, 3. ගෞරව සහිත
සංගමම, පු. ක්‍රි. එකතුව.
සච්ඡිකිරියා, ඉ. ප්‍රත්‍යක්‍ෂකිරීම.
සජ්ජු, නි. වහා: එකෙණෙහි.
සද්ජානාති, හැඳිනගනී.
සඤ්ජායති, හට ගනී.
සතපල, 3. සියක් පලමක් බරැති.
සතිපට්ඨාන, න. සිහිය පිහිටුවීම
සත්තධා, නි. සත් ආකාරයකින්.
සත්තපදවීතිහාර, පු. සත්
පියවරක් ඔසවායාම.
සදත්ථ, පු. ස්වකීය යහපත.
සද්දහාපෙසි, ක්‍රිත අදහන්ට
සැලැස්වීය.
සනත, පු. සත්පුරුෂයා.
සන්තිකාවචර, 3. ළඟ හැසිරෙන.
සන්ථව, පු. සමාගමය: ආශ්‍රය
සන්දමාන, 3. ගලා බසින.
සන්ථත, න. ඇතිරිය.
සන්නිපාතබහුල, බොහෝ
රැස්වීම් ඇති.
සන්නිරුම්භිත්වා, ඔබා තදකොට
සන්නිසින්න, 3. සන්හුන්
සපරිස, 3. පිරිස් සහිත.
සපඤ්ඤ, 3. නුවණැති
සපදානං, ක්‍රි.වි. අතරනොහැර
සබ්බකිච්ච, නං සියලු වැඩ
සබ්බවිදූ, පු. සියලල දනනා.

සබ්බන්දද, 3. සියල්ල දෙන.
සබ්බසංඛත, න. සියලු දෙය
සබ්බස්සහරණ, න. සියලු
සම්පත් ගෙනයාම.
සබ්බාභිභූ, පු. සියල්ල මැඩ
පවත්වන්නා.
සබ්‍රහ්මචාරී, පු. ධර්මයෙහි
පිළිපැදීමෙන් සමානයා.
සමචාරියා, ඉ. යහපත් හැසිරීම.
සමතිවිජ්ඣති, විනිවිද යයි.
සමත්ථකාල, පු. හැකි කාලය.
සමන්නාගත, 3. යුක්ත වූ
සමය, පු. රැස්වීම: කාලය:
ආගම.
සමාගමම, පු. ක්‍රි. රැස්වී
සමාදපෙති, සමාදන් කරවයි:
පිළිගන්ට සලස්වයි.
සමාධිභාවනාලු ඉ.
සමාධියවැඩීම.
සමාසෙති, සේවනය කරයි.
සමිඤ්ජති, කම්පාවේ.
සමිති, ඉං. සභාව
සමීපචාරී, පු. ළඟ හැසිරෙන්නා
සමුපබ්බුළ්හ, හාත්පසින්
එළඹසිටි.
සමෙන, සමාදානයෙන්.
සම්පජ්ජති, සමෘඩවේ:
සම්පාදනය වේ.
සම්පජානමුසාවාද, පු. දැනදැන
බොරුකීම.
සම්පතිජාත, දැන් උපන්.
සම්භව, 3. හටගත්.
සම්මගගත, 3. යහපත් මග
පිළිපන්.
සම්මසති, විමසා බලයි.
සම්මාන, පු. බුහුමන් කිරීම.
සම්මිඤ්ජන, හැකිලීම.
සම්මුඛීභූත, 3. හැකුළු: න.
හැකිලීම.
සම්මුඛීභූත, 3. හමුවූ.
සම්මොදමාන, 3. සතුටුවෙන:
සතුටුවෙමින්.
සයම්භූ, පු. තෙමේම හට ගන්නා
සරි. පු. ඊතලය: බටවැනි තෘණ
වර්ගයක්.
සරබූ, ඉ. හූනා
සරභූ, ඉ. එනම් ගඟ
සල්ලවිනොදන, 3. හුල්දුරු
කරන
සල්ලාප, පු. ප්‍රීතිසහ ගත
කථාව.
සවන්ති, ඉ. ගඟ
සස්සත, 3. හැමකල්හිපවත්නා.
සහවාස, පු. සමඟ විසීම.
සහවුත්ථ, 3. සමගවිසූ.
සංඛත, න. හේතුවකින් හටගත්
දෙය.
සංඛිත්ත, 3. සංක්ෂේප කළ.
සංබොහෙත්වා, කලඹවා.
සංඝභෙද, පු. සංඝයා බිඳීම.
සංයමතී, හික්මේ.
සංයෝජන, න. එකට යෙදීම.
සංවත්තති, පවතී.
සංවත්තනික, පමුණුවන:
ගෙනදෙන.
සංවාස, පු. සමග විසීම.
සංවුත, 3. හික්මුණු
සංවුතින්ද්‍රිය, 8. හික්මවූ ඉඳුරන්
ඇති.
සංවෙග, පු. කලකිරීම: සංවේගය.

සංසිදී, ක්‍රි. ගිලා බැස්සේය.
සා.පු. බල්ලා.
සාතරූප, න. සැපඑළවන
රූපය
සාදුතර, 3. අතිමධුරඃ ඉතා
යහපත්.
සාධුවිහාරී, පු. මනාපැවතුම්
ඇත්තා.
සාප, පු. දෙස්කීමඃ ශාපකිරීම.
සායණ්හසමය, පු. හවස්කාලය.
සායමාස, පු. හවස්බත.
සික්ඛා, ඉ. ශික්ෂාවඃ ආගමික
නීතිය.
සිඛි, පු. ගින්න.
සිංසති. ඉඹියිඃ ගඳ බලයි.
සිප්පිකා, ඉ. සිප්පිකටුව.
සිංසපාවන, න. ඇට්ටේරිය.
වනය
සීතිභූත, 3. සිහිල්වූ
සීදති, ගිලාබසී.
සුඛජීවී, පු. සැපවත්සේ
ජීවත්වන්නා.
සුඛාය, සැප පිණිස.
සුඛාවහ, 3. සැපගෙන දෙන
සුඛුම. 3. සියුම්.
සුචාරුරූප, 3. අතිමනොඥ
රූප ඇති.
සුචිගවෙසි, පු. පිරිසිදුබව
සොයන්නා,
සුතවන්තු, 3, ඇසුදේ ඇතිඃ
උගත්.
සුනිම්මිත, 3. මනාසේ සෑදූ.
සුප්පපාත, පු. කුල්ල හෙළීම.
සුබ්බච, 3. කීකරු.
සුභික්ඛ, 3. සුලභාහාර ඇති.
සුමුඛ, 3. යහපත් මුණු ඇති.
සුලද්ධ 3, මනාසේ ලැබූ.
සුවණ්ණකටාහ, පු. රන්කටාරම.
සුසණ්ඨාත, 3. මනාස් හිකමුණු.
සුසති, වියලේ.
සුහද, පු. මිත්‍රයා.
සූපරස, පු. ව්‍යඤ්ජනයේ රසය.
සොකනුද, 3. ශෝකයදුරු
කරන
සොකාපහත, 3. ශෝකයෙන්
මැඩුණු.
සොඛුම්ම, න. සියුම් බව.
සොගන්ධි, න. ඉලක්කම් 93
කින් ලිය යුතු ගණනක්.
සොණ්ණමාලා, ඉ. රන්මාලාව.
සොවණ්ණමය, 3. රන්මුවාඃ රන්
පිළිබඳ.
සොළසකරිමනත, 3. කිරිය.
16ක් ඇති. (කිරිය නම්
අක්කරය වැනි
බිම්කොටසකි.)
හඤ්චි, නි. ඉදින්.
හඤ්ඤති, නැසේ. වෙහෙසේ.
හත්ථගත, 3. අතට
පැමිණි.හත්ථිනාග, පු. ඇත්රජ.
හරායති, ලජ්ජාවේ.
හාතවේ, නි. ගෙනයන්ට.
හායන, පිරිහීමඃ අවුරුද්ද.
හාසකාල, පු. සතුටුවිය යුතු
කාලය.
හිතාය, යහපත පිණිස.
හීයති, පිරිහේ.
හුරාහුරං, ක්‍රි.වි. එහාමෙහාඃ
අතතින් මෙතනට)

# සැලකියයුතු වචන හා කරුණුවල සූචිය.

**(මෙහි දැක්වෙන්නේ පොතේ පිටු අංකයි)**


අකා, 58.
අගා, 55.
අග්ඝිය, 152
අචිරං, 118
අච්චසරා, 152
අච්ඡන්ති, 152.
අජ්ඣුක, 153
අජ්ජ, අජ්ජතග්ගෙ, 118
අජ්ජුණ්හො, 118
අජ්ඣප්පත්ත, 153
අජ්ඣාචර, 153.
අඤ්ජති, 153
අඤ්ඤත්‍රයෝගය, 31, 41.
අඤ්ඤදත්ථු, 119
අඤ්ඤදසි, 73
අට්ටීයති 78
අතිප්පගෙව, 119
අතිප්පගෙව, 119
අතිප්පගො, 119
අතියාතුං, 153
අතිවිය, අතීව, 119
අථ, අථො. 120
අත්ථි, 61, 119
අත්ථු1, 61
අත්‍යන්තසංයෝගය, 29
අදු, අදදු, 69
අද්දක්ඛි, 70
අද්දස, 70
අධශබ්දය, 8
අධා, 120
අධිපති අර්ථය, 45
අනාදරාර්ථය, 43, 46
අනුපබජ්ජ, 153
අනු-පතියෝගය, 29
අනුපහච්ච, 154
අනුයුඤ්ජිසං, 94
අනුවිච්චකාර, 175
අන්තරායෝගය, 29, 120
අන්තරෙන, 120
අන්තර් වාක්‍ය, 100
අන්තො, 121
අපකස්ස, 154
අපච්චක්ඛකාරී, 175
අපරජ්ජු, 121
අපලොකොති, 154
අපවදති, 154
අපහන්තු, 154
අපි, අපිස්සු, 121
අප්පටිවාන, 154
අපි, අපිස්සු, 121
අප්පටිවාන, 154
අප්පටිවානිතා, 155
අප්පෙකච්ච, 5
අප්පෙව, 122
අබහුමෙම, 122
අබ්භාසය, 80
අභි-අධියෝගය, 29
අභික්ඛණං, 123
අභිණ්හං, 123
අභුඤ්ජිසං, 94
අමත්ත, 156
අමිශ්‍රවාක්‍ය, 100

අමුශබ්දය, 16
අම්භො, 123
අයිර, අයිරික, 155
අරහා, 25
අරෙ, 123
අලං යොගය, 31. 37. 123
අලංකම්මනිය, 123
අලංපතෙය්‍ය, 123
අලංවචනිය, 123
අවත්‍ථාති, 155
අවස්‍සං, 124
අවෙච්චප්පසාද, 175
අවොච, 65
අසිද්ධනිපාත, 117
අස්මා, 155
අසොසාසි, 74
අහාසි, 79
අහති, 79
අහුවා, 62
අහුවාසිං, 66
අහෙ, අහො, 124
අහොසි, 62
ආකාරප්‍රතිබද්ධ විස්තාර, 110
ආකාරාථීය, 42
ආඛ්‍යාත පූරණය, 108, 110
ආඛ්‍යාත විස්තාර, 108, 110
ආඛ්‍යාත විස්තාර, 108, 110
ආඛ්‍යාතාධීනය, 107
ආතුම, 155
ආදු, 124
ආදෙ, 25
ආමන්තිකාපණ, 156
ආයසක්‍ය 156
ආරකා, ආර 125, 41
ආරහති, 156
ආලිම්පෙති, 156
ආවි, ආවිභාව, 125
ආවිඤ්ජති, 156
ආවුසො, 125
ආසජ්ජ, 157
ආසාදිය, 157
ආසාදෙති, 157
ආසි, 61
ආසුම්භති, 157
ආහ, 72
ආහු, 72
ආහුන්දරික 158
ඉංඝ, 125
ඉත්‍ථම්භූතාථීය, 32
ඉරිණ, 158
උතෙකාටන, 158
උක්තය, 108
උක්තවිශෙෂණය, 108.
උක්තාධීනය, 107 - 8
උග්ගිරති, 158
උච්චාරෙති, 158
උජ්ජවති, 158
උජ්ජවනී, 158
උජ්ඣත්තවා, 158
උත්තරස්වෙ, 126
උත්තරි, උත්තරිං, 126
උත්තරිභංග, 126
උදපජ්ජා, 75
උද්දන, 159
උද්දිස්සකට, 175
උද්දීයති, 159
උද්දෙකනික, 159
උඩපාද, 127
උඩමුඛ, 127
උඩංවිරෙචන, 127

උඩංයෝගය, 41
උප-ධා යෝගය, 37
උපනිධාය, 159
උපමීයති, 85
උපවසිස්සං, 94
උපලක්‍ෂණාර්ථය, 32, 33, 46
උපහත්තු, 160
උප්පච්ච, 160
උප්පාතක, 160
උපාත්තර්වාක්‍ය, 101
උබ්බන්ධිත්වා, 160
උබ්බිල්ල, 160
උභො, 14
උම්මිහති, 160
උරුන්ද, 161
උසස්සංඛ්‍යා, 22
උස්සාරෙති, 161
උස්සීසකරණ, 161
ඌනාර්ථයේගය, 32
ඌහදති, 161
එකච්ච, 18
එකච්චිය, 19
එකජ්ඣං, 127
එති, 74
එත්තො, 128
එස්සති, 75
ඔකප්පනිය, 161
ඔකාසෙති, 161
ඔණොජෙති, 161
ඔපසිලෙසිකාධාරය, 44
ඔපෙති, 161
ඔමුත්තෙති, 162
ඔරංයොගය, 41, 128
ඔරෙන, 128
ඔරොධ, 10
ඔලුබ්භ, 162
ඔවච්චිත, 162
ඔසාදෙති, 162
කච්චි, 129
කටග්ගාහ, 162
කටසි, 162
කටුවියකත, 162
කති, කතිපය, 14
කථංකර, 129
කථංජීවි, 129
කථම්භූත, 129
කම්මශබ්දය, 13
කරහචි, 129
කර්තෘවාචකය, 100, 101 - 2
කර්තෘවෙසෙසනවාක්‍ය 104
කම්කර්තෘ, 27
කම්විශෙෂණ, 104, 108
කලි, කලිග්ගහ, 163
කසිණ, 163
කාමං, 130
කාරණාර්ථය, 42
කාලථිසප්තමිය, 110
කාලප්‍රතිබඩවිස්තාර, 110
කාලප5මාණය, 40
කාලසම්බන්ධය, 43
කිමංග, 130
කීරති, 163,
කිං ශබ්දය, 17
කුව, 131
කොචි, 18
කොලාප, 163
ක්‍රියාපවගගය, 32
ක්‍රියා විශේෂණ තතියාවෙන්, 33
ක්‍රියා විශේෂණත්තර්වාක්‍ය, 102, 104 - 5

ක්‍රියාසම්බන්ධය, 43
ක්‍ව, 131
ඛජ්ජති, 87
ඛටක, 163
ඛටොපිකා, 163
ඛු, 132
ඛුද්දප්ප, 163
ගලගලායති, 91
ගවජිත, 164
ගාමණ්ඩල, 164
ගීවා, 164
චත්තාළීසං, 21
චරහි, 132
චංගවාර, 164
චිකිච්ඡති, 90
චිච්චිටායති, 91
චිරනිවාසී. 132
චිරපටිකා, 132
චිරපබ්බජිත, 132
චිරප්පවාසී, 132
චිරරත්තං, 133
චිරස්සං, චිරාය, 133
චිරෙන, 133
චෙතාපෙත්වා, 164
ජත්තීයති, 90
ජන්දක, 165
ජපක, 165
ජව, 165
ජඤ්ඤ 73
ජහාති, 80
ජාතු, 133
ජිගිංසති, 89
ජිගුච්ඡති, 90
ජිඝච්ඡති, 90
ජෙ, 133
ඤස්සති, 7
ඨස්සති, 78
තග්ඝ, 134
තටතටායති, 91
තාවදෙ, 134
තාවබහුං, 134
තජ්ජති, 87
තුම, 165
තුවටං, 135
තෙක් දක්වා අර්ථ, 41
තෙමේ, තුමූ, 53
තිට්ඨති, 78
තිතික්ඛති, 90
තිංසං, 21
ත්වං ච අහං ච, 98
ථණ්ඩිල, 165
දක්ෂාර්ථය, 44. 46
දජ්ජා, 68
දට්ඨු, 166
දස්සති, 69
දරශබ්දය, 1
දිවා, 135
දිවිය, 165
දිශාර්ථයෝගය, 40
දිශාසම්බන්ධය, 43,
දීඝරත්තං, 135
දීපිනො, 25
දුක්ඛියති, 91
දුට්ඨු, 135
දුහයෝගය, 37
දෙසස, 166
දෙලායති, 91
දෙසිනා, 166
ධී. ධිරත්ථු, 135, 136
ධූමායති, 91

නජ්ජො. 12
නමො, 136
නහ, 136
නානායෝගය, 31
නාම, 120
නාම විශෙෂණානන්තර්වාක්‍ය,
102 - 103 - 5
නිගණ්ඨවාදී, 175
නිඩමනතුම්බ, 167
නිදංසනී, 170
නිබ්බසන. 167
නිමිත්තාර්ථය, 45
නියංපුත්තං, 5
නිර්ධාරණය, 44 . 46
නිසම්මකාරී, 175
නෙගම, 167
පච්ජානිපාතී, 138
පච්ජාබාහං, 138
පඤ්ඤාසං, 21
පටග්ගි, 168
පටිගච්චෙව, 138
පටිගගහ, 168
පටිච්චකම්ම, 175
පටිබාණවිතත, 168
පණාමෙති, 168
පත්තිනම්ම, 29
පදසා, 168
පබ්බතායතී, 90
පභුති, 138
පරිපතතිය, 173
පරාර්ථයොගය, 41
පරවචජ, 169
පහිණයෝගය, 37
පාතු, 138
පාමෙති, 169
පිඤ්ඤුක, 169
පිවාසති, 89
පුවජීසං, 94
පුටංස, 169
පූථගෙව, 3
පුථු, පුථුදිසා, 139
පුථුභූත, 139
පුමශබ්දය, 8
පුරත්ථං, 139
පුරත්ථා, 140
පුරා, 140
පූර්වාර්ථයෝගය, 40
පෙත්තණික, 169
පෙත්ති, පෙත්තික, 170
පොක්ඛරසෙඤ්ඤා, 2, 17
පොත්ථක, 170
ප්‍රධානානන්තර්වාක්‍ය, 100
ප්‍රමාණාර්ථය, 41
බජ්ඣති, 87
බලිවද්දේව ජීරති, 80
බාහුජඤ්ඤ, 170
බුභුක්ඛති, 90
බ්‍රහන්ත, 25
බ්‍රහා, 25, 168
බ්‍රහ්මචාරයො, 25
බ්‍රහ්මශබ්දය, 7
බ්‍රෑති, 72
භාගසම්බන්ධය, 43
ධාවසම්බන්ධය, 43
භීයොසොමත්තාය, 141
භූතපුබ්බං, 141
මංකු, 141
මංකුළි, 171
මණික, 170
මත්ති, මත්තික, 171

මත්තිස, 171
මනං, 142
මන්දමුඛී, 171
මහා, 142
මහාරාජ, 10
මා යෝගය, 93, 142
මාතුගාම, 10
මාර්ගප්‍රමාණය, 40
මිගමාතුකා, 172
මිච්ඡා, 142
මිථු 142
මිශ්‍රවාක්‍ය, 100 - 102
මූර්ධ ශබ්දය, 8
මුධා, 142
මුසා, 142
මුහුං, 143
මොසවජ්ජ, 173
යග්ඝෙ, 143
යදිදං, 143
යංනූන, 144
යාවකිවඤ්ච, 144
යාවදිච්ඡකං, 144
යාවදෙව, 144
යුව ශබ්දය, 7
රජකත්ථරණ, 172
රහො, 145
රෙ, 145
ලක්ඛඤ්ඤ, 172
ලබ්භ, 145, 52
ලාභා, 145
ලොණි, 172
වක්ඛති, 65
වජ්ජති, 63
වට්ටති යෝගය, 52
වඩ්ඪී, 172
වත්ථියති, 91
වන, වනථ, 172
වරං, 26
විකතිකම්ම, 29
විනා යොගය, 39
විභජ්ජවාදී, 175
විරමණාර්ථය, 40
විමංසති, 89
වියුළ්හ, 172
විසංවාදෙති, 172
විසෙවන, 173
විහාසි, 79
වීසං, 21
වුය්හති, 85
වුස්සති, 85
වෙයාායික, 173
වො - නො ආදේශ, 19
ව්‍යාපිකාධාරය, 44, 45
සකිදෙව, 146
සක්කායෝගය, 52. 146
සක්ඛි, 146
සඛි ශබ්දය, 7
සජ්ජති, 173
සජ්ජු,
සංජම්භරි, 173
සත ශබ්දය, 21
සදත්ථපසුත, 5
සත්ති ශබ්දය, 9
සත්ති, 61
සන්ධාවිස්සං, 94
සපතති, 173
සමන්තායෝගය, 31, 147
සම්තං, 147
සම්පති, 147
සම්පයොජෙති, 152

සමීප සම්බන්ධය, 42
සමූහ සම්බන්ධය, 42
සම්මති, 173
සයං 147
සරසී, 174
සසක්කං 147
සංසති, 174
සංඛ්‍යාශබ්දය ගැන, 23
සංසාදෙති, 174
සංහතවාක්‍ය, 100, 101, 107
සාමං, 148
සාමීපිකාධාරය, 44
සා ශබ්දය, 9
සාහු, 149
සිඬනිපාත, 117
සියා, 61
සු, 124
සුකතී, 174
සුට්ඨු 149
සුඤාති, 87
සුස්සුසති, 89
සූයතී, 85
සෙට්ඨී (අළු), 174
සෙය්‍යථාපි, 149
සෙය්‍යො, 26
සොත්ථිවියාගය, 36
ස්ථාන ප්‍රතිබඬවිස්තාර, 110, 111
ස්වාගතයොගය, 37
ස්වාමි සම්බන්ධය, 43
හඤ්චි, 150
හඤ්ඤති, 87, 2.
හදති, 174
හන්ද, 150
හලං, 150
හා, 150
හිරීයති, 91
හීයති, 85
හුරං, 151
හුරාහුරං, 151
හුවෙය්‍ය, 62
හෙතුප්‍රතිබඬවිස්තාර, 110, 111, 112
හෙසාති, 62

# සබ්බ දානං ධම්ම දානං ජිනාති



නිබ්බාන පච්චයෝ හෝතු